I

AC. 239

IV කොටස—අධ්‍යාපන, විද්‍යා සහ කලා (B)

1963-64 වර්ෂය සඳහා වූ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ පාලන වාර්තාව

වෛද්‍ය වී. ටී. හේරත් ගුණරත්න

1966 ජූලි

PART IV—EDUCATION, SCIENCE AND ART (B)

Administration Report of the Director of Health Services for the year 1963-64

Dr. V. T. Herath Gunaratna

July, 1966

MINISTRY OF HEALTH LIBRARY

17, H13:874.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංස්ථාවෙහි නිපදවන ලද කඩදාසිවල ආණ්ඩුවේ නියමයෙන් ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

කොළඹ මහ ලේකම් ගොඩනැගිල්ලේ පිහිටි තැ. පෙ. අංක 500 දරන රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල *Price* : 10/65 තැපැල් ගාස්තුව *Postage* : 1/-

කෙටුම්පත් ලැබුණු දිනය *Copy received*	66.3.7
ශුද්ධි පත්‍ර යැවූ දිනය *Proof sent*	66.5.29
ශුද්ධි පත්‍ර ආපසු ලැබුණු දිනය *Proof returned*	66.6.20
ප්‍රසිද්ධ කළ දිනය *Published*	66.7.11

WELLCOME INSTITUTE LIBRARY
Coll. welMOmec
Call No. Am Pap WA28 .JS8 C42 1963-64

22501398617

පටුන

පරිච්ඡේද		පිටු
	හැඳින්වීම	7–15
I	ජීවිත සංඛ්‍යා ලේඛන	16
II	වෛද්‍ය සැලකිල්ල	
	(අ) අභ්‍යන්තර රෝගීන්	16–18
	(ආ) විශේෂඥ සේවා	18–19
	(ඇ) බාහිරි රෝගී සේවය	19
III	වෛද්‍යමය සැපයීම්	19–21
IV	ජන සෞඛ්‍ය සේවා	
	(අ) මාතෘ හා ළමා සෞඛ්‍යය	21–24
	(ආ) පාසැල් සෞඛ්‍ය කටයුතු	24–25
	(ඇ) පෝෂණය	25–26
V	වසංගත රෝග වේදය	26–38
VI	විශේෂ සේවා	
	(අ) ක්ෂය රෝග මර්ධනය	38–44
	(ආ) මැලේරියා මර්ධනය	44–51
	(ඉ) බරවා රෝග මර්ධනය	51–54
	(ඊ) ලාදුරු මර්ධනය	54–58
	(උ) සමාජ රෝග මර්ධනය	58–62
	(ඌ) මානසික සෞඛ්‍ය	62–64
	(එ) නීති–වෛද්‍ය කටයුතු	64–68
	(ඒ) පිළිකා රෝගය	68–70
VII	වෛද්‍ය පර්යේෂණායතනය	70–81
VIII	පාරිසරික සනීපාරක්ෂාව	81–90
IX	මහජන සෞඛ්‍ය අධ්‍යාපනය	90–105
X	අභ්‍යාස පරිපාටි	105
XI	පරිපාලන හා සේවක සංඛ්‍යාව	105–106
XII	සෞඛ්‍ය සභාව	106–107
XIII	ප්‍රවාහණ සේවය	107–108
XIV	ජාත්‍යන්තර සම්මේලන	108–109
XV	සුභ සාධක කටයුතු	110
XVI	ගොඩනැගිලි	110
XVII	මිල මුදල්	111–112

සටහන් ලේඛනය

සටහන් අංකය		පිටුව
	ජීවිත සංඛ්‍යා ලේඛන	
I	සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශ අනුව ජනගහණය	113
II	1946–1963 පිළිබඳ උපත් හා මරණ	114
III	ලංකාවේ සහ රටවල් සමහරක බිළිඳු මරණ සංඛ්‍යාව	115
IV	උපතේ දී බලාපොරොත්තු විය හැකි ආයුෂ ප්‍රමාණය	116
V	ප්‍රමාණානුකූල මරණ සංඛ්‍ය දර්ශණය	116
	වෛද්‍ය සැලකිල්ල	
VI	රජයේ ආයතනවලින් ප්‍රතිකාර කළ අභ්‍යන්තර රෝගීන් වර්ෂ අනුව	117
VII	මධ්‍ය වාර්ෂික ජනගහණය සහ ප්‍රතිකාර කළ රෝගීන් වර්ෂ අනුව	117
VIII	සියලුම ආයතන සහ පළාත් අනුව අභ්‍යන්තර රෝගීන්ගේ සංඛ්‍යාවන්	118–119
IX	පළාත් සහ දිස්ත්‍රික්ක අනුව සියලුම රෝහල්වලට පැමිණි අභ්‍යන්තර රෝගීන්ගේ සංඛ්‍යා—1963–64 වර්ෂය	120
X	රජයේ රෝහල්වලින් පිටවූ ගණන සහ එහිදී මිය ගිය ගණන	121–127
XI	සෞ. සේ. අධිකාරී කොට්ඨාශ අනුව 1964.9.30 වන දින තිබූ රජයේ වෛද්‍ය ආයතන ගණන	128
XII	1964.9.30 වන දින රජයේ වෛද්‍ය ආයතනවල ඇඳන් ගණන	129–130
XIII	ජනගහනයේ 1,000ක් සඳහා ඇති ඇඳන් ගණන	131
XIV	ප්‍රාදේශිය රෝහල්වලද, පාදක රෝහල්වල ද, කොළඹ රෝහල් මණ්ඩලයේ ද තදබදය ...	132–133
XV	දිස්ත්‍රික් රෝහල්වල තදබදය	134–135
XVI	විශේෂිත ව්‍යාපාරවල රෝහල් හි තදබදය	136
XVII	රෝහල්වල පැවැත්වූ චිකිත්සාගාර සඳහා පැමිණීම	137
XVIII	රජයේ වෛද්‍ය ආයතනයන්හි බාහිර රෝගීන්ගේ පැමිණීම	138
	ජන සෞඛ්‍ය සේවා	
XIX	මාතෘ හා ළමා සෞඛ්‍ය කටයුතු	138–139
XX	මව්වරුන් සඳහා ඇඳන්	139
XXI	ආයතනවල ප්‍රසූති සහ මාතෘ මරණ	140
XXII	පාසැල් දත් හෙදියන් විසින් කර ඇති වැඩ	140
XXIII	පරීක්ෂා කළ පාසැල් සහ ළමුන් ගණන	140
XXIV	විශේෂ දුර්වලතාවයන් සහ හරිගැස්සූ දුර්වලතාවයන් ගණන	140
	වසංගත රෝග වේදය	
XXV	රජයේ රෝහල්වලදී ප්‍රතිකාර කළ උණ සන්නිපාත රෝගීන් හා 1,00,000කට වැලඳුන ප්‍රමාණය	141
XXVI	රජයේ රෝහල්වලදී ප්‍රතිකාර කළ බෝවෙන සෙංගමාල රෝගීන් සහ 1,00,000කට වැළඳුන ප්‍රමාණය	141

සටහන් අංකය		පිටුව
	විශේෂ සේවා—(අ) ක්ෂය රෝගය	
XXVII	1963.10.1 වන දින සිට 1964.9.30 වන දින දක්වා ක්ෂය රෝගින්ගේ මධ්‍යම ලෙබනයේ ලියා පදිංචි කිරීම් වයස සහ පලාත් අනුව වර්ග කිරීම	142
XXVIII	1963.10.1 වන දින සිට 1964.9.30 වන දින දක්වා රෙජිස්ත්‍රාර් ජනරාල්ගෙන් ලැබුණ ක්ෂය රෝගය නිසා සිදුවූ මරණ	143
XXIX	ලය රෝහල්වල සහ මහරෝහල්වල ඇති ක්ෂය රෝග වාට්ටුවල 1963–64 දී තිබූ ඇඳන් සංඛ්‍යාව සහ පළාත් අනුව ප්‍රතිකාර ලැබූ අයගේ සංඛ්‍යාව	144
XXX	1963–64 වර්ෂය තුලදී ලය චිකිත්සාගාරවලට සහ ශාඛා ලය චිකිත්සාගාරවලට පළමු වන පැමිණීම සහ පෙනහැල්ලේ ක්ෂය රෝග යයි නිශ්චිත රෝගින්—පලාත් අනුව	145
XXXI	තුන් අවුරුදු බී.සී.ජී. වැඩ සටහන—1963.10.1 දින සිට 1964.9.30 වන දින දක්වා ක්ෂෙත්‍ර කණ්ඩායම් පාසැල්වල කළ කටයුතු	146
XXXII	1963/64 වර්ෂය තුල දී කරන ලද සමූහ කුඩා ඇක්ස්රේ පරික්ෂණ ගණන … …	147
XXXIII	1963/64 වර්ෂය තුල දී කරන ලද සමූහ කුඩා ඇක්ස්රේ පරීක්ෂණ ගණන … …	147
XXXIV	1963/64 වර්ෂය තුලදී ලය චිකිත්සාගාර වලදී ගණ්නා ලද ඇක්ස්රේ ගණන—පළාත් අනුව …	148
XXXV	1963/64 වර්ෂය තුල දී ලය රෝහල්වල දී ගන්නා ලද ඇක්ස්රේ ගණන—පළාත් අනුව …	148
	(ආ) මැලේරියාව	
XXXVI	1963/64 වර්ෂය තුලදී ආයතනවල සහ ක්ෂෙත්‍ර යේදි පරික්ෂා කළ ලේ තහඩු ගණන සහ ඒවා යේ රෝග සහිත ගණන දිස්ත්‍රික් හා පළාත් අනුව	149
XXXVII	බෙහෙත් ඉසීමේ කටයුතු … … … …	150
XXXVIII	1964.5.1 වන දින සිට 1964.9.30 වන දින දක්වා මදුරුවන් බෝවන තැන්වලට බෙහෙත් ඉසීම	151
XXXIX	පරික්ෂා කළ ලේ තහඩු ගණන සහ සොයාගත් මැලේරියා විෂබීජ සහිත අය—1963/64 මුදල් වර්ෂය (රෝගය සොයා ගන්නා විවිධ ක්‍රම අනුව)	152
XL	මැලේරිය රෝගින් මාසවලට සහ දිස්ත්‍රික්කවලට අනුව බෙදියාම … …	153
	(ඉ) බරවා රෝගය	
XLI	1960–1964 දක්වා වූ කාලය තුල දී බරවා පරපීවීන් සහිත සහ රහිත රෝගින් ගණන …	154
XLII	1960–1964 කාලය තුල දී බරවා පරජීවය සහිත රෝගින්ගේ සංඛ්‍යාව … …	154
XLIII	බී. මලායි වර්ගයේ බරවා පරජීවින් සහිත රෝගීන් සංඛ්‍යාව … …	154
XLIV	බරවා පරජීවය සහිත රෝගින්ගේ විග්‍රහය … … …	154
	(ඊ) සමාජ රෝග	
XLV	1963/64 වර්ෂයේ ලියා පදිංචි වූවන් පිළිබඳ විග්‍රහය … … …	155
XLIV	ප්‍රථමවරට සොයාගත් උපදංශ රෝගින්ගේ වස්තු පරික්ෂණ … …	156
	(උ) පිළිකා රෝගය	
XLVII	1963/64 වර්ෂයේ දී මහරගම පිළිකායතනයේ දී කළ කටයුතුවල සම්පිණ්ඩනය …	157

සටහන් අංකය		පිටුව

වෛද්‍ය පර්යේෂණා යතනය

XLVIII 1963/64 මුදල් වර්ෂය තුල දී කරන ලද රසායනාගාර පරීක්ෂණ … … 158–163

ප්‍රස්තාර සහ පරිශිෂ්ඨ ලේඛනය

I වන ප්‍රස්ථාරය—1963/64 දී ජනගහණයේ 1000කට මරණ … … 164

II වන ප්‍රස්තාරය—සජීව උපත් 1000කට බිළිඳු හා මව් මරණ … … 165

I වන පරිශිෂ්ඨය—1963/64 මුදල් වර්ෂය තුලදී මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය මගින් කළ කටයුතු 166–171

II වන පරිශිෂ්ඨය—1963/64 මුදල් වර්ෂය තුලදී සම්පූර්ණ කරන ලද ගොඩනැගිලි … 172–173

III වන පරිශිෂ්ඨය—1963/64 මුදල් වර්ෂය තුලදී සම්පූර්ණ කරන ලද ජලසම්පාදන සහ පල්දෝරු ක්‍රම 174–175

IV වන පරිශිෂ්ඨය—1964.9.30 වන දින දී තිබුණ පරිපාලන උප කොට්ඨාශ සහ එම කොට්ඨාශ වලට අයත් ආයතන 177

1963-64 වර්ෂය පිළිබඳ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ පාලන වාර්තාව

හැඳින්වීම

වෛද්‍ය ඩබ්ලිව්. ඒ. කරුණාරත්න මහතා විශ්‍රාම ගැනීමෙන් පසුව මෙම වාර්තාවේ කතෘ 1964 මැයි මස 27 වන දින සිට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ රාජකාරි භාර ගත්තේ ය. වෛද්‍ය හා මහජන සෞඛ්‍ය සේවා අංශවල වැඩිදුර ප්‍රගතියක් සමාලෝචනයට භාජනය කරනු ලබන වර්ෂය තුළදී දක්නා ලදී. උසස් පරමාර්ථ ඇතිව, ගොඩනැගිලි වැඩ සටහනක් සම්පාදනය කළ නමුත්, නානා විධ හේතූන් නිසා, වැඩි වශයෙන්ම කාර්මික පුද්ගලයින්ගේ හිඟය නිසා, ඉලක්කය කරා යා ගත නොහැකි විය.

වැය

1963-64 මුදල් වර්ෂය තුළදී දිවයිනේ සෞඛ්‍ය සේවාවන් සඳහා රුපියල් කෝටි 15.04ක් වැය කරන ලදී. මෙය, පසුගිය වර්ෂයට වඩා රුපියල් ලක්ෂ 35 කින් වැඩි ය. වර්ෂය තුළදී එකතු කරන ලද ආදායම රුපියල් 22,95,479කි. එම මුදල පසුගිය වර්ෂයට වඩා රුපියල් ලක්ෂ 2 කින් වැඩි වෙයි. විෂයයන් 10ක් සඳහා ලැබුණ විදේශ ආධාරවල එකතුව රු. 1,58,90,363කි.

ජීවිත සංඛ්‍යා

1963 වර්ෂය සඳහා ගණන් බලන ලද මධ්‍ය වාර්ෂික ජනගහනය 1,07,12,000කි. උපත් සංඛ්‍යාව දිගටම පහත බැසගෙන යන බවක් පෙනී ගිය අතර, උපත් ප්‍රමාණය ජනගහනයෙන් 1,000 කට 34.0කි. මෙය වර්ෂ ගණනාවක් තුළදී ඇතිවූ අඩුම උපත් ප්‍රමාණයයි. මරණ සංඛ්‍යාවේ ප්‍රමාණය ද 1962 මෙන්ම ජනගහනයෙන් 1,000 කට 8.5කි. පසුගිය වර්ෂයේ පරිදි සජීව උපත් 1,000 කට ළදරු මරණ 53කි. මාතෘ මරණ සංඛ්‍යාවේ ප්‍රමාණය 1,000 කට 2.9කි.

රෝගීන් රැකබලා ගැනීම

වර්ෂය තුළදී ප්‍රතිකාර ලැබූ අභ්‍යන්තර රෝගීන්ගේ සංඛ්‍යාව 16,14,664 කි. ඉහත වර්ෂයේ වාර්තාගත සංඛ්‍යාවට වඩා සියයට 3.16ක අඩුවක් මෙයින් පෙනී යයි.

පසුගිය වර්ෂයේ තිබුණ 33,636 ක්වූ ඇඳන් සංඛ්‍යාව සමග සසඳා බලන විට 818 කින් වැඩිවූ, ඇඳන් 34,454 ක සංඛ්‍යාවක් මෙම මුදල් වර්ෂය අවසානයේදී තිබිණ. මෙය, ලංකාවේ ජනගහනයෙන් 1,000 කට ඇඳන් 3.2ක අනුපාතයක් දක්වන අතර, මුලු ජනගහනයේම සෞඛ්‍ය අවශ්‍යතාවයන් සපුරා ලීමට ප්‍රමාණවත් නොවේ.

කලින් වර්ෂය තුළදී දිවයිනේ පිහිටි වෛද්‍ය ආයතන 793 ක්වූ සංඛ්‍යාව 814 දක්වා වැඩිව ඇත. මෙයින් 710ක් නානාවිධ රෝග සුව කරන ආයතන වෙයි. රෝහල්වල තදබදය ප්‍රධාන ගැටලුව වශයෙන් පවතී. පළාත්බඳ රෝහල්වල තදබදය සියයට 145 කි; පාදක රෝහල්වල සියයට 117 කි. ගතවූ වර්ෂයේ සියයට 118 ක්ව පැවති කොළඹ රෝහල් මණ්ඩලයේ තදබදය මෙම වර්ෂයේ දී සියයට 102 දක්වා

පහත බැස ඇත්තේය. රිජ්වේ ආර්යා රෝහලේ තදබදය සියයට 159 දක්වා ඉහළ නැගී ඇත්තේය. විශාල දිස්ත්‍රික් රෝහල්වල තදබදය සියයට 99 කි ; කුඩා දිස්ත්‍රික් රෝහල්වල සියයට 105කි. අංගොඩ මානසික රෝහලේ තදබදය සියයට 189කි. එසේ වුවත් මෙය ගිය අවුරුද්දේ තිබූ සියයට 273 ක තදබදයට වඩා බෙහෙවින්ම අඩුය. මීට ප්‍රධාන හේතුව වනුයේ මනෝවෛද්‍යවරයින්ගේ සංඛ්‍යාව වැඩිවූ හෙයින් රෝහලින් පිට කරන අයගේ සංඛ්‍යාව වැඩි වීම ය.

පළාත් බද රෝහල් වල ප්‍රධාන විශේෂිත සේවාවන්ද, පාදක රෝහල් වල හා විශාල දිස්ත්‍රික් රෝහල් වල මූලික විශේෂිත සේවාවන්ද දියුණු කිරීමේ ප්‍රතිපත්තිය නොකඩවා පවත්වා ගෙන යන ලදී. විශේෂඥ සුදුසුකම් ලබාගෙන වෛද්‍ය නිලධාරීන් 16 දෙනෙක් විදේශයන්හි සිට දිවයිනට පෙරලා පැමිණියහ. මෙයින් 7 දෙනෙක් සාමාන්‍ය ශල්‍ය වෛද්‍ය විද්‍යාවෙහි විශේෂඥතා ලබා ඇති අතර ඉතිරි අය, ප්‍රසව චිකිත්සාව, ස්ත්‍රී චිකිත්සාව, සාමාන්‍ය වෛද්‍ය කර්මය, ඖෂධ විද්‍යාව, නිර්වින්දනය රෝගනිධාන විද්‍යාව හා අක්ෂි චිකිත්සාව යන විෂයයන්ගෙන් විශෙෂඥතාවය ලබා ගෙන ඇත. විශේෂඥ සුදුසුකම් ලබාගත් තවත් 7 දෙනෙක් නැවත සේවයට බඳවා ගන්නා ලදහ. මීට කුමාර චිකිත්සා විශේෂඥයින් තිදෙනෙක් ඇතුළත් වෙති. මේ වර්ෂය තුළදී වෛද්‍ය නිලධාරීන් 27 දෙනෙක් වැඩිදුර සුදුසුකම් ලබා ගැනීම සඳහා විදේශයන් බලා ගියහ.

නොයෙක් රෝහල් වල පැවැත්වූ විශේෂ චිකිත්සාගාර සඳහා 35,53,479 දෙනෙක් පැමිණියහ. පළමුවන වාරයේ හා ඊට පසු වාරවල පැමිණීම් මීට ඇතුළත් වෙයි. මෙම වර්ෂය තුළ රජයේ වෛද්‍ය ආයතන වලට බාහිර රෝගීන්ගේ පළමුවන පැමිණීම් 2,61,67,540ක සංඛ්‍යාවක් වාර්තා විය. මේ අනුව රජයේ වෛද්‍ය ආයතනයකට එක් අයකු 2.5 වාරයක් පැමිණ ඇත.

වෛද්‍ය කටයුතු සඳහා අවශ්‍ය සැපයීම්

නැව් ගමනා ගමනයෙහි ප්‍රමාදය නිසාද, වරායේ පැවති අනෙකුත් තත්ත්වයන් නිසාද ඖෂධ වර්ග හා අනෙක් වෛද්‍යෝපකරණ ලබාගැනීම සහ ආයතනයන් අතර බෙදා හැරීම සම්බන්ධයෙන් ප්‍රමාද ඇති විය. ඖෂධ වර්ග බෙදා හැරීමේ දී ඇති වන ප්‍රමාදය පරීක්ෂා කර බලා ඊට ප්‍රතිකර්මයන් නිර්දේශ කිරීමට මෙම වර්ෂයේ අග භාගයේදී, ලංකා විශ්ව විද්‍යාලයේ උප කුලපති තැන්පත් මහාචාර්ය නිකොලොස් ආටිගල මහතාගේ ප්‍රධානත්වයෙන් ඖෂධ පරීක්ෂණ කමිටුවක් පත් කරණ ලදී.

රජයේ බෙහෙත් ගබඩාව සඳහා නව ගොඩනැගිල්ලක් වැලිසර ඉදි කිරීමට අදහස් කොට, සැලසුම් සම්පාදනය කර තිබුණද, පසුව එම යෝජනා ක්‍රමය අත්හැර, ඒ වෙනුවට දිවයිනේ නොයෙක් ප්‍රදේශවල විමධ්‍යගත ගබඩා 17 ක් ඇති කිරීමට තීරණය කරගන්නා ලදී. පටන් ගැන්මේදී ස්ථාන 5 ක ගබඩා ඇති කරණු ලැබේ.

නව ආයතන සඳහා උපකරණ ලබා ගැනීමට රුපියල් ලක්ෂ 15 ක මුදලක් වෙන් කරණ ලදී. පසුගිය වර්ෂවලදී ලබාගත් උපකරණ වෙනුවෙන් ගෙවීම පිණිස ඊට සමානම මුදලක් වෙන් කෙරිණ. විශේෂ උපකරණ ලබා ගැනීමට ද රුපියල් ලක්ෂ 3 ක මුදලක් වෙන් කරන ලදී.

ජන සෞඛ්‍ය කටයුතු

මෙම වර්ෂයේ සිදුවූ ළදරු මරණ සංඛ්‍යාවේ ප්‍රමාණය පසුගිය වර්ෂ වල මෙනි. එනම් සජීව උපත් 1000 කට මරණ 53 කි. මාතෘ මරණ සංඛ්‍යාවේ ප්‍රමාණය 1000 කට 2.9 කි. මෙම වර්ෂයේදී මාතෘන් රැකබලා ගැනීම සම්බන්ධයෙන් සම්මේලන වාරයක් පවත්වන ලදුව එහි නිර්දේශයන් සැලකිල්ලට භාජන වෙමින් පවතී.

මහජන සෞඛ්‍ය හෙදියෝ ද, වින්නඹු මාතාවෝ ද, පවුල් සංවිධාන ක්‍රමයේ කටයුතු වල නිරතවීම, සෞඛ්‍ය අධ්‍යාපනය, ළදරුවන්ට ප්‍රතිශක්තිකරණය දීම සහ රෝහලින් පිටවූ ක්ෂයරෝගීන්ට උපදෙස් දීම වැනි අතිරේක රාජකාරි වල යෙදීමට කැමැත්තක් දක්වති. ආයතනවල හා ක්ෂේත්‍රයේ සේවාවන් අතර වඩ වඩා සම්බන්ධතාව යක් හා සහයෝගතාවයක් ඇති කරණ ලදී.

ලංකා පවුල් සංවිධාන සංගමයේද, ස්වීඩන්-ලංකා පවුල් සංවිධාන ක්‍රමයේද වැඩ කටයුතු සමග දෙපාර්තමේන්තුව ඉතා කිට්ටු සම්බන්ධතාවයක් ඇති කරගන්නා ලදී. මෙම කටයුතු සඳහා ජාත්‍යන්තර ආධාරෝපකාර ලැබිණ.

පාඨශාලා සෞඛ්‍ය කටයුතු නොකඩවාම කරගෙන යන ලදී. පළාත්බද හා අනෙක් රෝහල්වල සිටින කුමාර චිකිත්සා විශේෂඥයෝ නුදුරුව පිහිටි තෝරගත් පාසැල් වල සෞඛ්‍ය කටයුතු සඳහා උපකාර වූහ. මෙම කටයුතු සඳහා සිටින නිලධාරීන්ගේ සංඛ්‍යාව ප්‍රමාණවත් නොවේ. මේ සඳහා සිටින්නේ පාඨශාලා වෛද්‍ය නිලධාරීන් 5 දෙනකු ද, පාඨශාලා සෞඛ්‍ය ඇපොතිකරි වරුන් 22 කු ද පමණකි. පාඨශාලා සෞඛ්‍ය කටයුතු කළ යුතු වන්නේ විශේෂ ශ්‍රේණිවල, එනම් මුලු කාලයම මේ සඳහා යෙදිය හැකි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් බව දතයුතුය. පර්යන්ත රෝහල් භාර වෛද්‍ය නිලධාරීහුද, බෙහෙත් ශාලා භාර ඇපොතිකරි වරුද මෙම කාර්ය සඳහා ඉමහත් ලෙස ආධාර කරති.

පාසැල් නොයන වයසේ ළමුන්ටද, ගැබිණි හා කිරි මව්වරුන්ටද, ක්ෂය හා ලාදුරු රෝගීන්ටද, මධ්‍යස්ථාන 380 කදී ඇදිහැස කිරි බෙදා දෙන ලදී. කිරි මධ්‍යස්ථානවලින්ද කිරි බෙදා දීම නොකඩවා කරගෙන ගිය අතර කිරි මණ්ඩලයෙන් හා සමුපකාර කිරි පට්ටි වලින් වෙන වර්ෂ වලට වැඩියෙන් අලුත් කිරි ලබාගෙන බෙදා දෙන ලදී.

මෙම වර්ෂය තුළදී සිටි බාලක පක්ෂාගාත රෝගීන්ගේ සංඛ්‍යාව 126 කි. මෙයින් වැඩිම දෙනකු සිටියේ කොළඹ කොට්ඨාශයේය. ප්‍රතිශක්තිකරණ කටයුතු වැඩි දියුණු කරන ලදී. මූලික වශයෙන්ම එසේ කරන ලද්දේ අලුත උපන් ළදරුවන් අතර ය. කොළඹ, මඩකලපුව, බදුල්ල, යාපනය හා කුරුණෑගල වැනි තෝරාගත් ප්‍රදේශවල විශේෂ ප්‍රතිශක්තිකරණ වැඩකටයුතු සංවිධානය කරන ලදී.

මෙම වර්ෂය තුළදී වසූරි රෝගය වැළඳුණ අය නොසිටියහ.

හම්බන්තොට නව ජනපද ව්‍යාපාරයක්වූ බදගිරියේද, වැලිමඩ ප්‍රදේශයේ හරක්-ගමනකන්දේ ද උණ සන්නිපාත රෝගය පැතිරිණ. මෙම ප්‍රදේශවල ප්‍රතිශක්ති කරණ කටයුතු කරගන යන ලදී.

බෝවන සෙංගමාල රෝගය හට ගැනීමේ අධික භාවය තෙත් කලාපයේ ප්‍රදේශවල එලෙසම පැවතිණ. විශේෂයෙන්ම කොළඹ නගරය තුළ මෙම රෝගයේ වැළඳීම අධිකය.

උපත් විගසම පිටගැස්ම වැළඳුණු 12 දෙනකු ගැන වතුපිටිවල හා කුරුණෑගල රෝහල් වලින් වාර්තා විණි.

මහ ලේකම් කාර්යාලයේද, කොච්චිකඩේ හා මොරටුව යන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ කොට්ඨාශ තුළද දියවැඩියා රෝගය පිළිබඳ සමීක්ෂණ කරගන යන ලදී.

ක්ෂය රෝග මර්ධනය

සමාලෝචනය වන වර්ෂය තුළදී තුන් අවුරුදු බී. සී. ජී. සැලැස්ම සම්පූර්ණ කර දෙවන තුන් හවුරුදු සැලැස්ම පටන් ගැනිණි. ද සොයිසා කාන්තා රෝහලේ දී ද, කාසල් වීදියේ කාන්තා රෝහලේ දී ද, අලුත උපන් ළදරුවන්ට බී. සී. ජී. එන්නත් කිරීම කරගෙන ගිය අතර 1964-65 මුදල් වර්ෂය තුළදී මෙය අනිකුත් රෝහල් කරා පැතිරවීමට යෝජනා කර ඇත්තේය.

සියලුම පාසැල් වල සිටින ගුරුවරුන් ඇක්ස්රේ මගින් පරීක්ෂා කිරීම මෙම වර්ෂයේදී පටන් ගන්නා ලදී. එහි ප්‍රගතිය සතුටුදායක ය.

ක්ෂය රෝග මර්ධන ව්‍යාපාරයේ අධිකාරී වෙත රෝගීන් 8,834 දෙනකු පිළිබඳ දැනුම් දීම් ලැබුණ නමුත් කලින් වර්ෂයේ එසේ ලැබුණ සංඛ්‍යාව 9,339 ක් විය. මෙයින් 4,657 ක් ම ලැබුණේ ළය චිකිත්සාගාර හා ශාඛා ළය චිකිත්සාගාර වලිනි. වර්ෂය තුළදී රෝගීන් 7,791 ක් දෙනකු ක්ෂය රෝගීන්ගේ ප්‍රධාන ලේඛනයට ඇතුළත් කරණ ලදී. 1964 සැප්තැම්බර් 30 වන දින දී ප්‍රධාන ක්ෂය රෝගීන්ගේ ලේඛනයේ ලියා පදිංචි වී සිටි සංඛ්‍යාව 55,160 දෙනෙකි. මෙම වර්ෂයේදී ක්ෂය රෝගීන් 903 දෙනෙක් මිය ගියහ.

ක්ෂය රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා වර්ෂය අවසානයේදී තිබුණ ඇඳන් සංඛ්‍යාව 3,646 කි. මෙයින් ඇඳන් 2,094 ක් ළය රෝහල් වල තිබුණ අතර ඉතිරි සංඛ්‍යාව තිබුණේ පළාත්බද හා අනෙක් රෝහල්වල ක්ෂය රෝග වාට්ටු වලය. වර්ෂය තුළ දී ප්‍රතිකාර කළ ක්ෂය රෝගීන් 13,611 දෙනාගෙන් 705 දෙනෙක් මිය ගියහ.

ප්‍රධාන ළය චිකිත්සාගාර 12 ක් ද ශාඛා ළය චිකිත්සාගාර 48 ක් ද දිවයින පුරා ක්‍රියාත්මක වෙයි.

රුපියල් 71,68,436 ක මුදලක් ක්ෂය රෝග මර්ධන ව්‍යාපාරය සඳහා මෙම වර්ෂයේ දී වියදම් විය.

මැලේරියා මර්ධනය

1964 අප්‍රියෙල් මාසය අවසානයේදී වියලි කලාපයේ ඉතිරිව සිටි කෘමිනාශක බෙහෙත් ඉසීමේ කණ්ඩායම් 20 ආපසු ගෙන්වා ගන්නා ලදී. මේ වර්ෂයේදී මැලේරියා රෝගය වැළඳුණවුන් 29 දෙනෙකු සොයා ගන්නා ලදී. එයින් 15 දෙනෙක් ම මාලදිව සින් වලින් රෝගය වැළඳගෙන පැමිණි අය වෙති. අප්‍රියෙල් මාසයෙන් පසුව මෙරටින් සොයාගත් 7 දෙනෙක්, කලින් අධික ලෙස රෝගය මුල් බැස ගත් නැගෙනහිර කොට්ඨාශයටද, 2 ක් දකුණු කොට්ඨාශයටද, 2 ක් මධ්‍යම කොට්ඨාශයටද අයත් වෙති.

මැලේරියාව මුල් බැසගත් කලාපයේ යෝග්‍ය ස්ථානවල නවත්වා සිටි කණ්ඩායම් 40 ක් මගින් එදිනෙදා පරීක්ෂණ කටයුතු කරගෙන ගියෝය. කුරුණෑගල නවත්වා සිටින කීට විද්‍යා කණ්ඩායම මගින් විශේෂ පරීක්ෂණ පවත්වා ඇත. 1964 මැයි මස 1 වන දින සිට මැලේරියා සමූල ඝාතනය ස්ථිර අවස්ථාවකට එළඹීමත් සමගම දිවයිනේ මදුරු නාශක බෙහෙත් ඉසීම නවතා දමන ලදී.

බරවා මර්ධනය

මෙම රෝගය මර්ධනය කිරීමේ කටයුතු තවදුරටත් ශක්තිමත් කරන ලදී. මෙම ශක්තිමත් කිරීමෙන් විපුල ප්‍රයෝජනය ලැබී ඇත්තේය. 1960 වර්ෂයේ සිට අඩු-වැඩි වීමක් නොමැතිව පැවතුණ සූක්ෂම බරවා රෝගය අඩුවී යන බවක් දක්වා ඇත. මෙහි පවතින බරවා රෝගය වෙඩ්මන් බැන්ක්‍රොෆ්ටයි ජීවීන්ගෙන් සිදුවීගන යන අතර, නිරිත දිග මුහුදු බඩ තීරය රෝගය මුල් බැසගත් ප්‍රදේශය වී ඇත.

එක්කාසු කොට පරීක්ෂා කරන ලද ලේ තහඩු සංඛ්‍යාව 4,18,968 කට නැග හැමදටම වැඩි වාර්තාවක් ඇති කළේය. සොයාගන්නා ලද අලුත් සූක්ෂම බරවා රෝගීන්ගේ සංඛ්‍යාව 11,460 කි. සියයට 2.8 ක ප්‍රමාණයක් වූ මෙය වාර්තා ගතව ඇති අඩුම සංඛ්‍යාව ය.

ගෙන් ගෙට ගොස් කරන ප්‍රතිකාරය සියලුම රෝගීන්ට හා ඔවුන් ආශ්‍රිතයින්ට ලබා දෙන ලදී. රෝගය මුල් බැසගත් ප්‍රදේශයේ ඇති මධ්‍යස්ථාන 13 ක පිහිටුවා ඇති විශේෂ චිකිත්සාගාරවලින් රෝගීන් 5,495 දෙනකුට ප්‍රතිකාර කෙරිණ. මෙම වර්ෂයේදී සොයා ගන්නා ලද අලුත් රෝගීන්ගේ සංඛ්‍යාව 2,754 කි.

කීට විද්‍යා පරීක්ෂණ කරගන ගිය අතර, රෝගය පැතිරීම වළක්වා ලනු වස් පණුවන් මර්ධන කිරීම සඳහා සතිපතා බෙහෙත් ඉසීම සිදු කරන ලදී.

මෙම් වර්ෂය තුළදී බරවා මර්ධන ව්‍යාපාරය ලබාගත් උසස් ජයග්‍රහණය නම් සූක්ෂම බරවා වැළඳීමේ සංඛ්‍යාව අඩු කිරීමයි.

ලාදුරු මර්ධනය

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළදී අලුත් රෝගීන් 218 දෙනකු ලේඛනගත කරන ලදී. මෙයින් 122 දෙනකු බෝවන ලාදුරු වැළඳුණ අය වූහ. 96 දෙනෙක් බෝ නොවන ලාදුරු වැළඳුණ අය වූහ.

රෝගීන් ආශ්‍රිතයන් 15,137 දෙනෙක් පරීක්ෂණය යටතේ සිටිති. මෙම ආශ්‍රිතයන් සඳහා ඇදිහැස කිරිද, රෝගය වළක්වා ලන ඩී. ඩී. ඇස්. බෙහෙත් වේල්ද නිකුත් කරන අතර ඊට අතිරේකව, කොඩ්ලිවර් තෙල් පාවිච්චි කරන ලෙසද, ඔවුන්ගේ රෝගයට ඔරොත්තු දීමේ ශක්තිය වැඩි කරනු පිණිස ගත යුතු අනෙකුත් පියවරවල් ගන්නා ලෙසද උපදෙස් දී ඇත්තේය.

වර්තමාන ක්‍රම සමග සම තත්ත්වයෙහි සිටිනුවස් ලාදුරු රෝහල් වෙත තිබූ සැළකිල්ල දැනට ප්‍රතිකාර මධ්‍යස්ථාන කරා යොමුවෙමින් පවතී. වර්ෂය තුළදී බාහිර රෝගීන් උදෙසා පැවැත්වූ චිකිත්සාගාරවලට වැඩි සැළකිල්ලක් දැක්විණ. පැරණි ඇස් රෝහල් ගොඩනැගිල්ලේ පිහිටුවා ඇති මධ්‍යම ලාදුරු චිකිත්සාගාරය පුහුණුව ලත් නිලධාරීන් ගෙන් සමන්විත වෙයි.

සමාජ රෝග මර්ධනය

සමාජ රෝග හටගැනීම අඩුවී යන සවභාවයක් පැවතිණ. වර්ෂය තුළදී බෝවෙන උපදංශ රෝගීන් 310 දෙනකු ගැනද, සුදබින්දුම් රෝගීන් 1,757 දෙනකු ගැනද වාර්තා විය. වැඩි වශයෙන්ම රෝගය වැළඳීම වාර්තාවී ඇත්තේ අවුරුදු 20 සිට 29 දක්වා වයස් වූ කණ්ඩායම තුළය. වයස අවුරුදු 10 සිට 19 දක්වා වූ කණ්ඩායමේ, චිකිත්සාගාර කරා පැමිණීම සියයට 14.5 දක්වා අඩු විය. ඉස්මතු වී පෙනෙන වැඩි වීමක් කුරුණෑගල දී වාර්තා කරන ලදී. මෙහි පිහිටි චිකිත්සාගාරය කරා පැමිණි කාන්තා රෝගීන්ගේ ප්‍රමාණය ඉතාමත්ම අධිකය. එනම්, පිරිමි රෝගීන්ට වඩා සියයට 50 කින් වැඩිය. අනුරාධපුරයේද මෙම ලක්ෂණයම දක්නා ලදී.

චිකිත්සාගාර වෙත පැමිණෙන, වෘත්තීන්හි නියුක්ත කණ්ඩායම් අතුරින්, නැවතත් කම්කරුවන් සංඛ්‍යාව ඉහළ තැනක් ගනී. ඊළඟට වැඩි කණ්ඩායම වෙළඳුන්ය.

කොළඹ මධ්‍යම චිකිත්සාගාරය හැරුන විට තවත් පූර්ණකාලීන චිකිත්සාගාර 9 ක් පිට පළාත්වල ක්‍රියාත්මක විය.

බෝවෙන උපදංශ වැළඳුන සියලුම රෝගීන් උදෙසා සිරිත් පරිදි කරන කටයුත්තක් හැටියට වසංගත රෝග විද්‍යා පරීක්ෂණ පැවැත්විණ. සිරගෙවල්, රිමාන්ඩ් ගෙවල් හා බාලාපරාධ අභ්‍යාස පාඨශාලා යන ස්ථානවලට ඇතුළු කරගන්නා ලද සියලූ දෙනාම පසුගිය අවුරුදුවලදී මෙන්ම සිරිත් ප්‍රකාර ලේ පරීක්ෂණවලට භාජනය කරනු ලැබූහ. කොළඹ කාන්තා රෝහල්වලත් මහ නගර සභාවේ පූර්ව ප්‍රසව චිකිත්සාගාර වලත් සිරිත් පරිදි ලේ පරීක්ෂණය කරන ලදී. පළාත්බද රෝහල්වලද ගැබිණි මාතාවන් සඳහා සිරිත් ප්‍රකාර ලේ පරීක්ෂණ කරන ලදී. අර්ධකාලීන චිකිත්සාගාර සපයා ඇති දිස්ත්‍රික් රෝහල්වල පූර්ව ප්‍රසව හා ගර්භණී වාට්ටු වෙත ද මෙම කාර්ය පතුරුවා ඇත.

ලංකා විශ්ව විද්‍යාලයට ඇතුළු කරගන්නා අය උදෙසාද සමාජ රෝග පරීක්ෂණ පවත්වා ඇතත් " ප්‍රතික්‍රියා " සහිත වූ අය සමු නොවූහ.

මානසික සෞඛ්‍යය

මනෝවෛද්‍ය විද්‍යාවෙන් විශේෂඥතා ලබාගත් වෛද්‍ය නිලධාරීන් පෙරළා දිවයිනට පැමිණි පසු මනෝවෛද්‍යවරුන්ගේ හිඟය මගහරවා ගත හැකි විය.

විශාල අන්දමින් ප්‍රතිකාර කිරීමට හැකිවූ හෙයින් රෝහලින් පිට කරන්නන්ගේ සංඛ්‍යාවද අධික විය. මනෝනිවර්තන හා ප්‍රති-අවපීඩක ඖෂධ විශාල ප්‍රමාණයක් පාවිච්චියට ගන්නා ලදී.

මානසික රෝග උදෙසා වෘත්තීය ප්‍රතිකාර කිරීමද දිගටම කරගෙන යන ලදී. වැඩි දුරටත් රෝගීන් බෙහෝ දෙනෙක් කිරි පට්ටියේ වැඩ කළහ. වර්ෂය තුළදී රෝහලට කිරි පයින්ට් 78,675 ක් සැපයීමට කිරි පට්ටියට හැකි විය.

මනෝවෛද්‍යවරයින්ගේ වැඩිවීමත් සමගම නව මනෝවිද්‍යා චිකිත්සාගාර ගණනත් වැඩි විය.

පැලවත්තේ රෝහල පුනරුත්ථාපන මධ්‍යස්ථානයකට පරිවර්තනය කිරීමට ද තීරණය කර ගන්නා ලදී.

නීති වෛද්‍ය කටයුතු

පළාත්බද අධිකරණයද, පොලීසියද, නීතිපතිගේ දෙපාර්තමේන්තුවද සියලුම අමාරු නඩුවලදී ඔවුන්ට උදව් වන ලෙස අධිකරණ වෛද්‍ය නිලධාරියාගෙන් ඉල්ලා සිටියහ. පිට පළාත්වල වෛද්‍ය නිලධාරීහුද අධිකරණ වෛද්‍ය නිලධාරියාගෙන් උපදෙස් ලබා ගත්හ. දෙපාර්තමේන්තුව කරන ලද වැදගත් පරීක්ෂණයන් නම්, පාදුක්ක මිනීමැරුම, ගොමරන්කඩවල මිනීමැරුම හා මාතර ළිඳේ මිනීමැරුමයි.

දෙපාර්තමේන්තුව විසින් මරණ පරීක්ෂණ 3,569 ක් කරන ලදී.

පිළිකා රෝගය

මහරගම පිළිකායතනයේ දී බාහිර රෝගීන් 2,887 දෙනකුට ප්‍රතිකාර කරන ලදී. මෙම ආයතනයේ ඇත්තේ එකම කොබෝල්ට් චිකිත්සා අංශයකි. පොරොත්තු ලේඛනයේ සිටින විශාල සංඛ්‍යාව ගැන බලන විට මෙය ප්‍රමාණවත් නොවේ. තවත් යන්ත්‍රයක් සඳහා ඇනවුම් කරන ලදී.

කොළඹ ක්‍රමය යටතේ කැනඩා රජය මගින් කොබෝල්ට් 60 දූරචිකිත්සා යන්ත්‍රයක් පරිත්‍යාග කර ඇත. මෙම යන්ත්‍රය සවිකිරීමෙන් හා මධ්‍යම විකිරණ-සමස්ථානික පර්යේෂණාගාරයක් පිහිටුවීමෙන් පසුව රශ්මි මගින් කරනු ලබන සියලුම නවීන ප්‍රතිකාරයන් කිරීමට හැකි තත්ත්වයක් මෙම ආයතනයට ඇති වෙයි. මෙම අංශයෙන් ප්‍රතිකාර ලද සංඛ්‍යාව 491 දෙනෙකි. ඩීප් ඇක්ස්රේ අංශයෙන් 850 දෙනෙකි.

පැන්සිල්වේනියාවේ මහාචාර්ය චේම්බර්ලේන් මහතාගේ ප්‍රධානත්වයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් විකිරණ සෞඛ්‍යය පිළිබඳව සාකච්ඡා සභාවක් පවත්වන ලදී. මෙම පිරිස මහරගමටද පැමිණ එහි, විකිරණ රශ්මියෙන් වැළකීමට ලබා දී ඇති ආරක්ෂාව, ලංඩනයේ රාජකීය මාර්ස්ඩන් රෝහලේ ඒ සඳහා ලබා දී ඇති ආරක්ෂාව තරමට යෝග්‍ය යයි අදහස් කරන බව ප්‍රකාශ කළාය.

ආයතනය මගින් පවත්වන ලද චිකිත්සාගාර සඳහා පැමිණි රෝගීන්ගේ ගණන 7,337 කි.

වෛද්‍ය පර්යේෂණායතනය

වෛද්‍ය පර්යේෂණායතනයේ නොයෙක් අංශයන් මගින් කරන ලද කටයුතුවල සවභාවය පසුගිය අවුරුදුවල මෙන් විය. සිරිත් පරිදි කරන පරීක්ෂණ කටයුතු අධික බව පෙනී ගියේය; මේ නිසා පර්යේෂණ කටයුතුවලට බාධක පැමිණිනි.

මුලු දිවයිනටම අවශ්‍ය වන කොලරා නාශක හා උණසන්නිපාත නාශක එන්නත් ඖෂධ වෛද්‍ය පර්යේෂණායතනය විසින් සපයන ලදී.

දීර්ඝ කාලීන යෝජනා ක්‍රම මත පිහිටා, කීට විද්‍යා අංශය පර්යේෂණ කටයුතු කර ගන ගියේය. මෙයින් වටිනා කරුණු රැසක්, විශේෂයෙන්ම බරවා මදුරුවාගේ ව්‍යාප්තිය පිළිබඳව කරුණු සොයා ගන්නා ලදී.

පෝෂණ අංශයෙන් ගල ගණ්ඩය ගැන සමීක්ෂණ පවත්වන ලදුව, ප්‍රතිඵල හා සම්බන්ධ සංඛ්‍යා ලේඛන පරීක්ෂාකර බැලීම ඇරඹිණ.

පාරිසරික සෞඛ්‍යය

විවිධ අතුනු රෝග ඇති කරන වට පණු, කොකු පණු හා ඊට සම්බන්ධ අනිකුත් අතුනු පරපෝෂිතයින් විසින් සිදු කරනු ලබන රෝග වැළැක්වීමේ අදහස ඇතිව, වැඩිමහලු අයට හා පෙර-පාසැල් වයසේ ළමුන්ට වැසිකිළි සැපයීමට විශේෂ ප්‍රයත්න යක් මෙම වර්ෂය තුළදී දරන ලදී. විශේෂයෙන්ම, බරවා මුල් බැසගත් පෙදෙස් බාල්දි වැසිකිළි දිය-හිර වැසිකිළි බවට හැරවීමේ කාර්යය පිළිබඳව ප්‍රගතියක් ඇති කරන ලදී.

ආහාර හා ඖෂධ ආඥාපනතේ විධිවිධානයන්ද, ඒ යටතේ පනවා ඇති අනු රෙගුලාසි ද ක්‍රියාත්මකකොට, උල්ලංඝනය කරන්නන්ගෙන් ප්‍රවේසම් වීමට පියවර ගන්නා ලදී. ඖෂධ වර්ග බාල කිරීම් ගැන අනියම් ලෙස කරුණු හඳුරා බැලීමට බලය ලත් නිලධාරීන් විසින් භාරගන්නා ලදී.

මහජන සෞඛ්‍ය ඉංජිනේරු කටයුතු

දිවයිනේ ආරෝග්‍යශාලාවලට ජලය සැපයීමේ යෝජනා ක්‍රම හා පල්දෝරු යෝජනා ක්‍රම විශාල ගණනාවක් දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය විසින් ක්‍රියාත්මක කරන ලදී. මෙම කාර්යයන් ඉටු කරන ලද්දේ ප්‍රාදේශීය කාර්යාල 5 ක් මගිනි. අවශ්‍ය තරම් කාර්මික පුද්ගලයින් නොමැති හෙයින් වැඩ සටහන සහමුලින්ම ක්‍රියාත්මක කළ නොහැකි විය.

සෞඛ්‍ය අධ්‍යාපනය

රිජ්වේ ආර්යා රෝහලේ හා කොළඹ මහ රෝහලේ ආරම්භ කළ අධ්‍යාපන වැඩ සටහනත්, මාතෘ නිවාසවල හා ගැමි රෝහල්වල අධ්‍යාපන කටයුතු තර කිරීමත් සෞඛ්‍ය අධ්‍යාපන ක්‍රමයේ සැළකිය යුතු අංගයකි.

ග්‍රාම සංවර්ධන, ඉඩම් සංවර්ධන හා අධ්‍යාපන යන දෙපාර්තමේන්තුවල සහයෝගය ඇතිව සෞඛ්‍යය පිළිබඳ ප්‍රජා සංවර්ධන වැඩ සටහන මෙම වර්ෂය තුළදී තවදුරටත් තහවුරු කරන ලදී. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින්, වැඩ කිරීමේ ව්‍යාපාර හා නොයෙකුත් ප්‍රජා කටයුතු උදෙසා දිවයින පුරා සංවිධානය කළ ජාතික ශ්‍රමදාන ස්වේච්ඡාවන්ට සෞඛ්‍ය අධ්‍යාපන අංශය සහයෝගය දැක්වීය. බරවා මර්ධන ව්‍යාපාරය මගින් මාතර, වැලිගම හා අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ කොට්ඨාශ තුළ සංවිධානය කරන ලද යෝධ ශ්‍රමදාන ව්‍යාපාරය මෙහිලා සඳහන් කිරීමට හොබනේය.

සංවිධානය වූ කණ්ඩායම්වලටද, විශේෂයෙන් ම අභ්‍යාස විද්‍යාල, ග්‍රාම සංවර්ධන මධ්‍යස්ථාන හා මහිලා සමිතිවලට සෞඛ්‍ය අධ්‍යපනය ලබා දෙන ලදී.

ක්ෂය රෝග මර්ධනය, මැලේරියා මර්ධනය, බරවා මර්ධනය හා සමාජ රෝග මර්ධනය යන ව්‍යාපාරවල දෙපාර්තමේන්තුවේ ප්‍රචාරක කටයුතුවලදී සෞඛ්‍ය අධ්‍යාපන

අංශය විශිෂ්ට වැඩ කොටසක් ඉටු කළේය. ලේ බැංකු සේවයට ලේ දන්දෙන්නන් ලබා ගැනීම පිණිස මෙම අංශය බොහෝදුරට උපකාරී විය. කණිෂ්ඨ වෙළඳ මණ්ඩලය, පිළිකා සංගමය හා ලංකා පවුල් සංවිධාන සංගමය වැනි පෞද්ගලික සංවිධානවලට ද මෙම අංශය ආධාරෝපකාරී විය.

පරිපාලනය හා සේවක සංඛ්‍යාව

දෙපාර්තමේන්තුවට අනුමත කරන ලද සේවක සංඛ්‍යාව වර්ෂය අගදී 34,165 කි. මෙයින් 25,859 දෙනෙක් වෛද්‍ය සේවා අංශයට අයත් වෙති. පසුගිය වර්ෂයේ ගණනට වඩා මෙවර පුද්ගලයින් 2,000 ක් වැඩිවී ඇත.

දෙපාර්තමේන්තුවේ නානා විධ ශ්‍රේණිවලට අයත් සේවකයින් නියෝජනය කරන වෘත්තීය සමිති ගිය වර්ෂයේ 61 ක් වූ නමුත් මේ වර්ෂයේ 78 කි.

රාජ්‍ය භාෂාව ක්‍රියාත්මක කිරීමෙහිලා තවදුරටත් ප්‍රගතියක් ඇති කරන ලදී. දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් බොහෝ දෙනෙක් නොයෙක් මට්ටම්වල ප්‍රවීණතා විභාගවලින් සමත් වූහ.

සෞඛ්‍ය සභාව

සෞඛ්‍ය සභාව වර්ෂය තුළදී රැස්වීම් වාර 4ක් පැවැත්වූවාය. සාකච්ඡාවට භාජනවූ ප්‍රධාන විෂය නම් දෙපාර්තමේන්තුව් ප්‍රතිසංවිධානය කිරීම උදෙසා සම්පාදිත "ජයසිංහ වාර්තාව" ක්‍රියාත්මක කිරීමේ හැකිකම ය. මේ සඳහා අනුකාරක සභාවක් පත් කරණ ලදී. මෙම අනුකාරක සභාවේ වාර්තාව සෞඛ්‍ය සභාව මගින් සැලකිල්ලට භාජන කරන ලදුව, ජයසිංහ වාතර්වේ සඳහන් නිර්දේශයන් භාර නොගත හැකි බව ඇමති තුමාට නිර්දේශ කළාය ; ඒ වෙනුවට යෝජනා කිහිපයක් ඉදිරිපත් කළ හෙයින් මේ අවස්ථාවේ දී කිසිම ප්‍රතිසංවිධානයක් කිරීම අනවශ්‍ය යයි හැඟී ගියේය.

ප්‍රවාහන සේවා

ගිලන් රථ 8 කින් ද, එක් ට්‍රක් රථයකින් ද, ජීප්රථ 3 කින් ද සමන්විත අලුත් වාහන 12 ක් මෙම වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවට ලැබිණ. මේ සමග වර්ෂය අවසාන යේදී දෙපාර්තමේන්තුව සතුව තිබූ වාහන සංඛ්‍යාව 335 කි. අවශ්‍යතාවයන් පිරිමසා ලීමට ලැබී ඇති වාහන සංඛ්‍යාව ප්‍රමාණවත් නොවේ. පරණ වී ගිය ගිලන් රථ බොහෝ ගණනක් ඇතත් ඒ වෙනුවට අලුත් වාහන ගැනීමට මුදල් හිඟකම නිසා නුපුලුවන.

ජාත්‍යන්තර සම්මේලන

ජාත්‍යන්තර සෞඛ්‍ය සම්මේලන 11 කදී ලංකාව නියෝජනය කරන ලදී. මින් ප්‍රධානතම සම්මේලනය වූයේ ජිනීවා නුවර රැස් වූ 17 වන ලෝක සෞඛ්‍ය සභා වාරයයි. මෙහිදී ලංකාව නියෝජනය කරන ලද්දේ, ජර්මන් සමූහාණ්ඩුවේ ලංකා තානාපති බී. ඇප්. පෙරේරා හා සහකාර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෛද්‍ය පී. ඒ. ඞී. පෙරේරා යන මහතුන් විසිනි.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ විධායක මණ්ඩලයේ 33 වන හා 34 වන සභාවාර වලදී ලංකාව නියෝජනය කරන ලද්දේ, එවකට නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක (වෛද්‍ය සේවා) තැන්පත්ව සිටි මෙම වාර්තාවේ කතෘ විසිනි.

තවත් වැදගත් සම්මේලනයක් නම් ලෝක සෞඛ්‍ය ආයතනයේ අග්නිදිග ආසියාව් පිළිබඳ ප්‍රාදේශිය කමිටුවේ 17 වන රැස්වීම් වාරයයි. එහිදී කතෘ ලංකාව නියෝජනය කළ අතර ප්‍රාදේශිය කමිටුවේ සභාපති ධූරයටද තෝරා ගන්නා ලදී. තවද ඔහු සාක්ෂ්‍ය පත්‍ර පිළිබඳ අනුකාරක සභාවේ සභාපතිකමටද තෝරා ගන්නා ලදී.

සුභ සාධක කටයුතු

සුභ සාධක කටයුතු සඳහා වර්ෂය තුළදී භාණ්ඩාගාරයෙන් රු. 35,000 ක් ලැබිණි. මෙම මුදල නොයෙක් කොට්ඨාශයන් අතර බෙදා දෙන ලවදු අතිරේක අවශ්‍යතාවයන් ලබා ගැනීම සඳහා ප්‍රයෝජනයට ගන්නා ලදී.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා සංගමය, කොළඹ හා ඒ අවට සිටින සමාජිකයින්ට විනෝද වීමේ පහසුකම් සැලසීම දිගටම කරගෙන ගියාය.

ගොඩනැගිලි

රජයේ වැඩ දෙපාතර්මේන්තුවේ වැය ශීර්ෂය යටතේ වෛද්‍ය ගොඩනැගිලි සඳහා රු. 1,18,66,190 ක මුදලක් ඇස්තමේන්තුවේන් වෙන් කරන ලදී. නොයෙක් හේතූන් නිසා මේ මුදලින් සැහෙන ප්‍රමාණයක් වියදම් නොවී ඉතිරි විය. වියදම් කරන ලද්දේ රු. 39,02,000කි. ජල සම්පාදන හා පල්දෝරු යෝජනා ක්‍රම සඳහා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන විසින් වියදම් කළ මුදල රුපියල් ලක්ෂ 6 කි.

ස්තුතිය

නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන්ද, සහකාර අධ්‍යක්ෂකවරුන්ද, විවිධ ව්‍යාපාරයන්හි අධිකාරීන්ද විසින් මෙම වාර්තාවේ සාමාන්‍ය සංස්කරණය කරන ලදී. නොයෙක් ප්‍රස්තාර හා සංඛ්‍යාලේඛන සටහන් සම්පාදනය ගැන වගකිවයුතු වන්නේ වෛද්‍ය සංඛ්‍යාලේඛනඥ තැන හා ඔහුගේ කාර්ය මණ්ඩලයයි. ඔවුන් විසින් දෙන ලද සහයෝගය ගැන මෙම සියලුම නිලධාරීන්ට මම අතිශයින් ණයගැති වෙමි.

නියෝජ්‍ය අධ්‍යක්ෂක (පාලන) තැන්පත් වී. පී. ඒ. පෙරේරා මහතා සහ කාර්ය මණ්ඩලයේ අනෙකුත් නිලධාරීන්, විශේෂයෙන්ම මෙම වාර්තාව සංස්කරණය කිරීමට ආධාර කළ මධ්‍යම පාලන ශාඛාවේ නිලධාරීන්, විසින් ඉටු කරන ලද සේවය ද වාර්තාගත කර තැබීමට කැමැත්තෙමි.

වී. ටී. හේරත් ගුණරත්න,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක.

I වන පරිච්ඡේදය

ජීවිත සංඛ්‍යා ලේඛන

කිසියම් කාල පරිච්ඡේදයක් තුළ සෞඛ්‍ය අතින් ජාතියක් ලබා ඇති දියුණුව තක්සේරු කිරීම සඳහා ජීවිතයේ සිදුවීම් සම්බන්ධ තොරතුරු අත්‍යාවශ්‍ය වේ. මව් මරණ බැගිනුව, බිළිඳු මරණ බැගිනුව වැනි වටිනා සුචි අංක සෞඛ්‍ය කටයුතු වල විවිධ තලවල ලබා ඇති තත්ත්වය මැනීමෙහි ලා මිනුම් දණ්ඩක් වශයෙන් උපයෝගී වේ.

1963-64 මුදල් වර්ෂය සඳහා වාර්තාව ලියන මේ අවස්ථාවේදී රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ඇති අළුත්ම සංඛ්‍යා 1963 ලිත් වර්ෂය සඳහා ය. පහත දැක්වෙන සටහන් 1963 ලිත් වර්ෂයට අදාල වේ.

(අ) **ජනගහනය.**—1963 ජුලි මස 8 දින මෙහෙයවුණු 1963 සංගනනය අනුව ජනගහනය 1,06,24,507 ක්වූ අතර 1953 සංගනනය අනුව 80,97,895 කි. මේ අනුව වාර්ෂික වැඩිවීම 2,52,661කි. සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ ප්‍රදේශ අනුව සංගනනය දෙකේදී ජනගහනය බෙදී ඇති අයුරු 1 වන සටහනේ දැක්වේ. තක්සේරු කරණ ලද මැද-වසර ජනගහණය 1,07,12,000ක් විය.

(ආ) **උපත්.**—ලේඛනාරූඪවූ උපත් ගණන 3,63,918 කි. උපත් බැගිනුව දාහකට 34.0කි. මෙය සටහන් වී ඇති අඩුම උපත් බැගිනුව වේ.

(ඇ) **මරණ.**—සටහන් වී ඇති මරණ ගණන 91,066කි. 1962 වර්ෂයේ මෙන් ම මෙම වර්ෂයේද මරණ බැගිනුව ජනගහනය දාහකට 8 5 කි. මෙය සටහන් වී ඇති අඩුම මරණ බැගිනු වේ. 1946 සිට 1963 දක්වා උපත් හා මරණ සංඛ්‍යා II වන සටහනේ දක්වා ඇති අතර 1 වන ප්‍රස්ථාරයේ විදහා දක්වා ඇත.

(ඇ) **බිළිඳු මරණ.**—1963 වර්ෂය සඳහා සංඛ්‍යා රෙජිස්ත්‍රාර් ජනරාල් කාර්යාලයේ තවම පිළියෙල කොට නැත. සජීව උපත් දාහකට බිළිඳු මරණ බැගිනුව III වන සටහනේ තවත් සමහර රටවල බැගිනුව සමග දක්වා ඇත.

(ඉ) **මවු මරණ.**—1963 වර්ෂය සඳහා සංඛ්‍යා රෙජිස්ත්‍රාර් ජනරාල් කාර්යාලයේ තවම පිළියෙල කොට නැත. 1946-1962 කාලය තුළ ලංකාවේ සජීව උපත් 1,000කට මවු මරණ බැගිනුව IV වන සටහනේ දක්වා ඇති අතර II වන ප්‍රස්ථාරයේ විදහා දක්වා ඇත.

මරණ බැගිනුවට අමතරව සමානුපාත මරණ පැලුම ජාතියක සෞඛ්‍ය වර්ධනය මැනීම පිණිස යොදාගනු ලැබේ. 1961 දී අවුරුදු 50 ට සහ ඊට වැඩි වයස් වූවන්ගේ මරණ සංඛ්‍යාව 39,696 ක් වූ අතර සමානුපාත මරණ ප්‍රමාණ පැලුම 44.6 ක් විය. අවුරුදු 50 ට හා ඊට වැඩි වයස් වූවන්ගේ ගණන සහ මරණ ප්‍රමාණ පැලුම V වන සටහනේ දී ඇත.

1962 වර්ෂයේ උත්පත්තියේදී බලාපොරොත්තු විය හැකි ආයුෂ පිරිමියකුට අවුරුදු 61.9 ක් සහ ගැහැණියකුට අවුරුදු 61.4 ක් විය. 1952 වර්ෂයේදී එම ආයුෂ ප්‍රමාණය අනු පිළිවලින් 57.6 ක් සහ 55.5 ක් විය. බලාපොරොත්තු විය හැකි ආයුෂ ප්‍රමාණය 1921 වර්ෂයේදීට වඩා අවුරුදු 30ක් පමණ 1962 දී වැඩි වී තිබේ.

II වන පරිච්ඡේදය

වෛද්‍ය සැලකිල්ල

(අ) අභ්‍යන්තර රෝගීන්

1. සාමාන්‍ය

වෛද්‍ය සැලකිලි සේවය සඳහා ඉල්ලීම් කලින් මෙන් ම ඉතා අධිකව පැවතිනි. රජයේ සියලුම රෝහල් වල නැවතී ප්‍රතිකාර ලැබූ අභ්‍යන්තර රෝගීන්ගේ ගණන VI වන සටහනේ දක්වා ඇති පරිදි 16,14,664 කි. මෙයට අමතරව රෝගීන් 35,53,479 ක් චිකිත්සාගාරවලදී ප්‍රතිකාර ලබා ගත්හ.

රෝහල් වලදී මිය ගිය රෝගීන්ගේ සංඛ්‍යාව 25,433 ක් බව සටහන් වී තිබේ.

1954 වර්ෂයේ අභ්‍යන්තර රෝගීන් 9,13,034 ක්වූ අතර එය 1963-64 වර්ෂයේ 16,14,664 දක්වා සියයට 77.0 ක ක්‍රමික වැඩිවීමක් ඇතිවූ බව පසුගිය දස වර්ෂය තුළ අභ්‍යන්තර රෝගීන්ගේ සංඛ්‍යා ලේඛන අනුව පෙනී යයි. මේ කාලය තුළ ජනගහනය වැඩිවී අත්තේ සියයට 27.7 පමණ වේ. පසුගිය දස වර්ෂය තුළ බාහිර හා අභ්‍යන්තර රෝගීන්ගේ සංඛ්‍යාව සියයට 48.8 කින් වැඩිවී ඇති බව VII වන සටහනින් පෙනෙනවා ඇත.

විමධ්‍යගත කොට්ඨාශ හා ආයතන වර්ග අනුව රෝගීන්ගේ බෙදීම සහ සටහන් වී ඇති මරණ VIII වන සටහනින් දැක්වෙන අතර එම විස්තරම පළාත් හා දිස්ත්‍රික්ක අනුව IX වන සටහනින් දැක්වේ. වැඩිම රෝගීන් ගණනක් ප්‍රතිකාර ලබා ඇත්තේ කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ කොට්ඨාශයෙන් සහ කොළඹ රෝහල් මණ්ඩලයෙනි. මෙම කොට්ඨාශ දෙක තුළ ප්‍රතිකාර ලබා ඇති රෝගීන්ගේ සංඛ්‍යාව අනු පිළිවෙලින් 2,13,223 සහ 1,59,854ක් වේ. තවද 1,00,000 ට අධික රෝගීන් සංඛ්‍යාවක් මහනුවර, බදුල්ල සහ කුරුණෑගල සෞඛ්‍ය සේවා අධිකාරී කොට්ඨාශ වල ප්‍රතිකාර ලැබූ අතර, 75,000 ට අධික රෝගීන් සංඛ්‍යාවක් කළුතර, ගාල්ල, මාතර, රත්නපුර සහ කෑගල්ල කොට්ඨාශ වල ප්‍රතිකාර ලැබූහ. අඩුම ගණනක් (26,846) රෝගීන් ප්‍රතිකාර ලබා ඇත්තේ වවුනියාවේ සෞඛ්‍ය සේවා අධිකාරී කොට්ඨාශයෙනි.

කොළඹ පිහිටි මාතෘ රෝහල් දෙකේ (ද සොයිසා ගැහැණු රෝහල සහ කාසල් වීදියේ මාතෘ රෝහල) අභ්‍යන්තර රෝගීන් 40,279 ක්ද කොළඹ ළමා රෝහලේ අභ්‍යන්තර රෝගීන් 22,804 ක්ද ප්‍රතිකාර ලබාගත්හ. ළය රෝහල් වල රෝගීන් 14,299 ක්ද මානසික රෝහල් වල රෝගීන් 16,414 ක්ද ලාදුරු රෝහල් වල 1,353ක්ද බෝවන රෝග රෝහල්වල 4,895 ක්ද පිළිකා රෝහල් වල 1,799 ක්ද දන්ත ආයතනයේ 718 ක්ද ඇස් රෝහල් වල 7,097 ක්ද ප්‍රතිකාර ලැබූහ.

ඒ ඒ රෝග අනුව ප්‍රතිකාර ලැබූ හා මරණයට ගොදුරු වූ රෝගීන් පිළිබඳව වෙන්කොට බෙදා දැක්වීමක් X වන සටහනේ දැක්වේ. වර්ෂය තුළ රෝහල් වලින් මුදා හරිනු ලැබූ සම්පූර්ණ අභ්‍යන්තර රෝගීන් ගෙන් සියයට 8 කට වඩා ඉන්ෆ්ලුවන්සා උනෙන් පෙලුන අය වේ. ඔවුන්ගේ සංඛ්‍යාව 1,29,205 කි. එහෙත් මරණයට පත්වූ අයගේ සංඛ්‍යාව ඉතා සුවල්පය. නොයෙක් මාදිලියේ ලේ හිඟ රෝගීන් 59,442 ක් රෝහල් වලදී ප්‍රතිකාර ලබා තිබේ. නිවුමෝනියා රෝගයට රෝගීන් 35,709 ක් එනම්, මුදාහරින ලද අභ්‍යන්තර රෝගීන් ගෙන් සියයට 2.3 ක් ප්‍රතිකාර ලැබූහ. රෝහල්වල මරණයට පත් රෝගීන්ගෙන් නිවුමෝනියා රෝගයෙන් මරණයට පත් රෝගීන්ගේ ප්‍රතිශතකය 9.6 කි. ජ්වර-ආන්ත්‍රික ආබාධ වලට ප්‍රතිකාර ලබාගත් රෝගීන්ගේ සංඛ්‍යාව 1,08,434 කි. එය මුදාහරින ලද අභ්‍යන්තර රෝගීන්ගෙන් සියයට 6.8 ක්වූ අතර සම්පූර්ණ මරණවලින් සියයට 7.9 කි.

2. රෝහල්

කුඩා රෝහල් සමහරක් දිස්ත්‍රික්ක රෝහල් තත්ත්වයට උසස් කරනු ලැබූ අතර අසම්පූර්ණ පයඝීන්තික ඒකක සම්පූර්ණ පයඝීන්තික ඒකක බවට පරිවර්තනය කරන ලදී. රජයේ වෛද්‍ය ආයතන වර්ගය හා සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ කොට්ඨාශ අනුව XI සටහනේ විග්‍රහ කොට දක්වා ඇත.

3. ඇඳන් ගණන සහ ජනගහන අනුපාතය :

1963-64 වර්ෂය තුළ නොයෙක් රෝහල්වල අතිරේක ඇඳන් සපයන ලදී. සියළුම වෛද්‍ය ආයතනවල ඇඳන් සංඛ්‍යාව 34,454 කි. මෙය රෝහල් වර්ග අනුව හා සෞඛ්‍ය සේවා අධිකාරී කොට්ඨාශ අනුව විග්‍රහ කොට XII වන සටහනේ දක්වා ඇත. බටහිර බොහෝ ප්‍රගතිශීලී රටවල ජනගහනය 1,000ට සාමාන්‍ය අනුපාතය ඇඳන් 10ක් පමණ වේ. ලංකාවේ අනුපාතය 3.2ක් පමණි. XIII වන සටහනේ ඇඳන් සංඛ්‍යාව ජනගහන අනුපාතය දක්වේ. ඉතාම වැඩි අනුපාතය ඇත්තේ කොළඹ මණ්ඩලයේ සහ කොළඹ

කොට්ඨාශයේ රෝහල්වලය. එය ජනගහනය 1,000ට ඇඳන් 5.5ක් පමණ වේ. වවුනියාව හැර අනෙක් සෑම සෞඛ්‍ය සේවා අධිකාරී ප්‍රදේශයක අනුපාතය 1.7 සහ 3.1 අතර පවතී. වවුනියාවේ අනුපාතය 4.7ක් වෙයි. ඉතාම අඩු අනුපාතය ඇත්තේ කෑගල්ල කොට්ඨාශයේය.

4. තදබදය

XIV, XV සහ XVI සටහන් සමහර රෝහල්වල ඇති තදබදයේ තත්වය පෙන්වයි. තදබදයේ ප්‍රතිශතකය දක්වෙන තීරුවල 100ත් ඉහළ ගණන් තදබදයේ ප්‍රමාණය දක්වන අතර 100ත් අඩු ගණන් පරිහරණය කෙරෙන ඇඳන්වල ප්‍රතිශතකය දක්වේ. කොළඹ රෝහල් මණ්ඩලයේ රෝහල් අතුරින් ඉතාම දරුණු තදබදය පවතින්නේ රිජ්වේ ආර්‍යා ළමා රෝහලේ බව සංඛ්‍යා ලේඛනවලින් පෙන්නුම් කරයි. එහි තදබදයේ සුචිය 159ක් වන අතර මහරෝහලේ සුචිය 118කි. ඉතාම වැඩි වශයෙන් තදබදය පවතින ප්‍රාදේශික රෝහල් නම් කුරුණෑගල (145), බදුල්ල (142), ගාල්ල (134) සහ මහනුවර (134) වේ. කෑගල්ල (178), කරවනැල්ල (173), පොලොන්නරුව (169), අල්පිටිය (209), වැලිමඩ (177), වලස්මුල්ල (159), දිවුලපිටිය (102), තංගල්ල (204), දෙල්තොට (286), මහඔය (190), ඇඹිලිපිටිය (196), මාහෝ (178), රඹුක්කන (172) සහ අංගොඩ (189) ඉතා තදින් තදබදය පවතින රෝහල් ය. අවශ්‍ය ප්‍රමාණයට වඩා ඇඳන් තිබෙන රෝහල් ද බොහෝ ගණනක් තිබේ. මන්නාරම (53), තලගොල්ල (28), උණ රෝහල (49), මැදගම (40), උනවටුන (43) සහ අම්බලන්ගොඩ (53) එවැනි රෝහල් ය. මේ වන විට වැඩිපුර ඇති ඇඳන් නැවත බෙදා හැර තිබේ.

(ආ) විශේෂඥ සේවා

ප්‍රාදේශික රෝහල්වල සියළුම ප්‍රධාන විශේෂිත සේවා සහ මූලික රෝහල්වල හා ඇතැම් විශාල දිස්ත්‍රික් රෝහල්වල මූලික විශේෂිත සේවා දියුණු කිරීමේ ප්‍රතිපත්තිය දිගටම පවත්වාගෙන යන ලදී. වර්ෂය තුළ විශේෂඥ සුදුසුකම් ඇතුව නිලධාරීන් 16ක් දිවයිනට පෙරළා පැමිණියහ. ඔවුන්ගේ විස්තර පහත දක්වේ:—

පෙරළා දිවයිනට පැමිණි නිලධාරීන් 16 දෙනාට අතිරේකව විශේෂඥ නිලධාරීන් 7 දෙනකු දෙපාර්තමේන්තුව මගින් නැවත සේවයට බඳවා ගන්නා ලදී. එනම් ශරීර වෛද්‍ය 2, ශල්‍යවෛද්‍ය 1, අක්ෂි වෛද්‍ය 1 සහ ළමා රෝග විශේෂඥ 3ක් ද වේ. වර්ෂය තුළ නිලධාරීන් 27ක් වැඩිපුර සුදුසුකම් ලබා ගැනීම සඳහා රටින් නික්ම ගියහ.

දෙපාර්තමේන්තුවේ සහ කොළඹ ක්‍රමය යටතේ විශේෂිත උපාධි ලැබීම පිණිස දිවයිනෙන් පිටත්ව ගිය වෛද්‍ය නිලධාරීන්ගේ සංඛ්‍යාව සහ ඒ අය උපාධි ලැබීමට බලාපොරොත්තු විශේෂිත චිකිත්සා :—

ව්‍යාධි වෛද්‍ය	... 3
අක්ෂි රෝග	... 2
නිර්වින්දනය	... 1
ප්‍රසව විද්‍යාව හා ස්ත්‍රී රෝග	... 6
මනෝ වෛද්‍ය ක්‍රමය	... 4
ළමා රෝග	... 1
ස්නායු රෝග	... 2
චර්ම රෝග	... 1
සාමාන්‍ය ශල්‍ය වෛද්‍ය	... 2
සාමාන්‍ය වෛද්‍ය	... 3
ඇස් නාස හා උගුර රෝග	... 1
මහජන සෞඛ්‍ය	... 1
	27

උපාධි ලබා පෙරළා දිවයිනට පැමිණි වෛද්‍ය නිලධාරීන්ගේ සංඛ්‍යාව හා ලබාගත් විශේෂිත උපාධි චිකිත්සා :—

සාමාන්‍ය ශල්‍ය වෛද්‍ය	... 7
ප්‍රසව විද්‍යාව හා ස්ත්‍රී රෝග	... 1
සාමාන්‍ය වෛද්‍ය	... 1
ඖෂධ විද්‍යාව	... 1
නිරවින්දනය	... 2
ව්‍යාධි වේදය	... 2
අක්ෂි රෝග	... 2
	16

(ඇ) බාහිර රෝගී සේවය

රෝහල්වල බාහිර රෝගී අංශයට සහ බාහිර රෝගීන්ට ප්‍රතිකාර කරන වෙනත් ආයතනවලට ප්‍රතිකාර සඳහා පැමිණෙන රෝගීන්ගේ සංඛ්‍යාව කලින් මෙන්ම ඉතා අධිකව පැවතින. වර්ෂය තුළ සියළුම ආයතනවල බාහිර රෝගීන් 2,61,67,540 ක් ප්‍රතිකාර ලබා තිබේ. මෙයට අතිරේකව රෝගීන් 35,53,479 ක් චිකිත්සාගාරවලදී ප්‍රතිකාර ලබාගත්හ. පසුගිය වර්ෂයේ චිකිත්සාගාරවල ප්‍රතිකාර ලැබූ රෝගී සංඛ්‍යාවට වඩා ඉමහත් රෝගී සංඛ්‍යාවක් මේ වර්ෂයේදී චිකිත්සාගාරවලට ප්‍රතිකාර ලබාගැනීම සඳහා පැමිණියහ.

XVII වන සටහනේ කොළඹ රෝහල් මණ්ඩලය, දිස්ත්‍රික් හා වෙනත් රෝහල්වල සහ විශේෂිත ව්‍යාපාර රෝහල්වල පවත්වන ලද චිකිත්සාගාරවලට පැමිණීම චිකිත්සාගාර වර්ග අනුව බෙදා වෙන් කොට දක්වා ඇත. සෞඛ්‍ය කොට්ඨාශවල බාහිර-රෝගී බෙහෙත් ශාලාවල පැමිණීමේ ගණන් XVIII වන සටහනේ දක්වේ.

විශේෂඥ නිලධාරීන් පත් කිරීමෙන් හා විශේෂිත චිකිත්සා සඳහා චිකිත්සාගාර විවෘත කිරීමෙන් පිට පළාත්වල රෝහල් වැඩිදියුණු කිරීම, කොළඹ රෝහල් මණ්ඩලයේ පැමිණීමේ සංඛ්‍යා පහළ බැසීමටත් පිට පළාත්වල රෝහල්වල එවැනිම සංඛ්‍යාවක් වැඩි වීමටත් හේතුවී ඇත.

III වන පරිච්ඡේදය

වෛද්‍යමය සැපයීම්

(අ) රජයේ ඖෂධ ගබඩාව

(1) සමාලෝචනයට භාජනය වන වර්ෂයේ මුල් කාලය තුළ නැව්වල ප්‍රමාදය හා වරායේ ඇතිවූ අනෙක් අහිතකර තත්ත්වයන් නිසා වෛද්‍යමය සැපයීම් ලබාගැනීමේ ප්‍රමාදයක් ඇති විය. මේ හේතුවෙන් ආයතනවලට ඖෂධ බෙදා හැරීමේ සාමාන්‍ය වැඩ පිළිවෙළටද බාධා පැමිණියේය. ඖෂධ බෙදා හැරීමේ පමාවට හේතු පරීක්ෂා කොට කළයුතු පිළියම් නිර්දේශ කිරීම සඳහා ලංකා විශ්ව විද්‍යාලයේ උප කුලපති නිකුලස් ආට්ගල ශ්‍රීමතාගේ ප්‍රධානත්වය ඇති " ඖෂධ විමර්ශණ කමිටුව " වර්ෂයේ අග භාගයේදී පත් කරන ලදී.

ඉඩකඩ

(2) කලින් අවුරුදුවල මෙන්ම මේ වර්ෂයේද නගරයේ වෙන වෙන ස්ථාන 5ක ඖෂධ ගබඩා පවත්වා ගෙන යන ලදී. වැලිසර නවීන බෙහෙත් ගබඩා තැනීම සඳහා රජයේ වැඩ දෙපාර්තමේන්තුව විසින් සැලැස්ම සකස් කර ඇත. දැන් ටෙන්ඩර් කැඳවීමේ අන්තිම අවස්ථාවට පැමිණ තිබේ

සේවක මණ්ඩලය

(3) භෛසජ්ජකයෙක් විශ්ව විද්‍යාලයට නිදහස් කොට හැරීම කාර්ය මණ්ඩලයේ සැලකිය යුතු වෙනසක් විය. එයින් ඇතිවූ පුරප්පාඩුව ආධුනික සහකාර අධිකාරී නිලධාරියකු පත් කිරීමෙන් පුරවන ලදී.

කරන ලද වැඩ

(4) කලින් වර්ෂයේ මෙන් සියළුම ආයතන වලින් ඖෂධ හා උපකරණ අවශ්‍ය ප්‍රමාණය දැක්වෙන ඇස්තමේන්තු ඉල්වා යවන ලදී. මෙම ඇස්තමේන්තු ලබා ගැනීමට නොවැළැක්විය හැකි ප්‍රමාද ඇති වූ බැවින් පසුගිය අවුරුදු දෙකේ සාමාන්‍ය පරිහරන සංඛ්‍යා අනුව බඩු ඉල්ලුම් පත්‍ර හා ඇණවුම් සකස් කරන ලදී. සැපයීම් අර්ධ විමධ්‍යගත කිරීම බලාපොරොත්තු වූ ප්‍රමාණයට සතුටුදායක ප්‍රතිඵල ගෙනදීමට අපොහොසත් විය. කෙසේ වෙතත් තෙමසකට අවශ්‍ය ඖෂධ ප්‍රමාණය සෞඛ්‍ය සේවා අධිකාරීන් වෙත යැවීමේ වැඩ පිළිවෙල යාපනය සහ වවුනියාව ප්‍රදේශවල සතුටුදයක ලෙස ක්‍රියාත්මක විය. දෙපාර්තමේන්තුව මගින් ප්‍රවාහනය සඳහා වාහන සැපයුව හොත් මේ ක්‍රමය සතුටුදායක ලෙස ක්‍රියාත්මක වනවා ඇත.

ගිණුම්

(5) 1963-64 වර්ෂය සඳහා පැවැත්වූ වාර්ෂික හරිවැරදි බැලීමේ දී ගිණුම්වල තත්ත්වය පහත දක්වේ :—

වර්ෂය		බඩු තොගවල වටිනාකම		අඩුවීම්වල වටිනාකම		අධිකයේ අටිනාකම
		රු. ශ.		රු. ශ.		රු. ශ.
1962/63	...	93,82,692 81	...	1,17,515 62	...	1,12,517 67
1963/64	...	73,38,149 65	...	58,758 83	...	62,672 47

1959 සිට 1963 දක්වා කාලය සඳහා ඉතිරිවී ඇති විමසීම්වලින් සමහරක් තවම බේරුම් කර නැත. මේවා බේරුම් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරගෙන යනු ලැබේ.

1963-64 වර්ෂයේ වාර්ෂික හරිවැරදි බැලීමේදී දක්නට ලැබුණ ඌනතාවයන්ට හා අධිකයන්ට හේතු පරීක්ෂා කරගෙන යනු ලැබේ. විෂමතාවයන් හැකිතරම් ඉක්මණින් නිමාවකට පත් කරනු ඇත.

සමාලෝචන වර්ෂය තුළ පරීක්ෂණ සෝදිසි 72ක් පවත්වන ලදී.

(ආ) ඖෂධ සංග්‍රහ කමිටුව

ඖෂධ සංග්‍රහ කමිටුව ප්‍රතිසංස්ථාපනය කොට ගරු සෞඛ්‍ය ඇමතිතුමන්ට උපදේශක සභාවක් ලෙස පැවැත්වින. පෞද්ගලික අංශය මගින් ආනයන කරන ඖෂධ සම්බන්ධයෙන් නිර්දේශ කිරීම කමිටුව මගින් සිරිත් පරිදි කරන ලදී.

(ඇ) නව ආයතන සඳහා උපකරණ සැපයීම

1963-64 මුදල් වර්ෂයේදී නව ආයතන සඳහා උපකරණ සැපයීමට වෙන් කරන ලද මුදල රු. 15,00,000 කි. ඊළඟ වර්ෂයේදී ගෙවීමට සිදුවන බැඳීම් සඳහාද රු. 15,00,000ක ප්‍රතිපාදන වෙන් කරන ලදී. මේ මුදල් නව ආයතන 142ක් සඳහාත්, පවතින ආයතන සඳහා කොටස් එක් කිරීම සඳහාත් අළුතෙන් අරඹනු ලැබූ විශේෂිත සේවයන් සඳහාත් උපකරණ සැපයීම පිණිස යොදවන ලදී. වෙන් කරන ලද මුදලින් වියදම් කරනු හැකි වූයේ රු. 9,03,205 ක් පමණය. වෙන් කළ මුදලට අඩුවෙන් වියදම් වූයේ ඇතැම් බාහිර නියෝජිතයන් ඉල්වන ලද බඩු සැපයීමට ප්‍රමාද කළ හෙයිනි.

(ඇ) ආයතනවලට විශේෂ උපකරණ සැපයීම

1963-64 වර්ෂයේදී ආයතනවලට විශේෂ උපකරණ ලබාගැනීමට වෙන් කරන ලද මුදල රු. 3,00,000කි. මේ මුදල නොයෙක් ආයතනවලට විශේෂ උපකරණ ලබාගැනීම සඳහා වියදම් කරන ලදී. ඇතැම් බාහිර නියෝජිතයන් ඉල්වන ලද බඩු එවීමට ප්‍රමාද කිරීම නිසා වෙන් කළ මුදලින් වියදම් කළ හැකි වූයේ රු. 67,222ක් පමණි.

IV වන පරිච්ඡේදය

ජන සෞඛ්‍ය සේවා

(අ) මාතෘ හා ළමා සෞඛ්‍යය

1. ගැටලුව

1962 වර්ෂයේදී මාතෘ හා ළදරු මරණ බැගිනුවේ ඉතා සුළු වැඩිවීමක් තිබුණ නමුත් 1963 වර්ෂය සඳහා සංඛ්‍යාව තවම දැනගන්නට නැත.

ළදරු මරණ විමර්ෂණ කමිටුව විසින් සකස් කරන ලද මාතෘ මරණ විමර්ෂණ ආකෘති පත්‍ර රජයේ මුද්‍රණාලයේ මුද්‍රණය කරවා සම්පූර්ණයෙන්ම බෙදා දී ඇත.

2. සංවිධානය

වර්ෂය තුළ මාතෘ සැළකිල්ල පිළිබඳ සාකච්ඡා වාරයක් පවැත්විණ. එහි නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම දැනට සැළකිල්ලට භාජනය වී පවතී.

මෙම රටේ මාතෘ හා ළමා සෞඛ්‍ය පිළිබඳව කටයුතු ප්‍රතිසංවිධානය කිරීම සඳහා විදේශීය විශේෂඥයෙක් තවම පැමිණ නැත. එම විශේෂඥයා දිවයිනට පැමිණි පසු ඔහුට සහාය වීම සඳහා මෙරටින් අයකු පත් කරනු ඇත.

වෛද්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන මාතෘ හා ළමා සෞඛ්‍ය පිළිබඳ උපදේශක කමිටුව, සියළුම මාතෘ හා ළමා සෞඛ්‍ය ගැටලු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට දැනට උපදෙස් දීම කරගෙන යනු ලැබේ.

3. වැඩ කටයුතු

(අ) ක්ෂේත්‍රය.—දැනට මහජන සෞඛ්‍ය වින්නඹු සේවිකාවෝ මවුවරුන්ගේ ගෙදර වලදී දරු ප්‍රසූතියේ කටයුතු කිරීමට අමතර වශයෙන් පවුල් සංවිධානය, සෞඛ්‍ය අධ්‍යාපනය, ළදරුවන් ප්‍රතිශක්ති කිරීම, ක්ෂය රෝගීන් හා ඔවුන්ගේ ආශ්‍රිතයන් බලා ගනීම ආදී වෙනත් රාජකාරිවල නිරත වෙත්. කලින් වාර්තාවල සඳහන් කළ පරිදි ලෙහෙසියෙන් ලබා ගත හැකි පහසුකම් ඇතිවීම නිසා මවුවරු දරු ප්‍රසූතිය සඳහා රෝහල්වලට හෝ වෙනත් ආයතනවලට ඇතුල්වීමට වැඩි කැමැත්තෙක් දක්වන බව පෙනේ. සමාලෝචනය කරනු ලබන වර්ෂය තුළදී මහජන සෞඛ්‍ය වින්නඹු සේවිකාවන් දරු ප්‍රසූත 52,157 ක් මෙහෙයවන ලද අතර පුහුණුලත් වෙනත් නිලධාරීන් විසින් දරු ප්‍රසූත 1,04,810 මෙහෙයවන ලදී. පවුල් සංවිධාන සමිතිවල වැඩ කටයුතු තවදුරටත් දියුණුවූ අතර තව සුභ සාධක චිකිත්සාගාර සංවිධානය කරන ලදී. මහජන සෞඛ්‍ය හෙදියන් සහ වින්නඹු සේවිකාවන් විසින් ඉටු කළ වැඩ XIX වන සටහනින් දක්වේ.

(ආ) ආයතන.—ආයතන හා ක්ෂේත්‍ර සේවය අතර ඒකාබද්ධතාවය සහ සහයෝගය තවදුරටත් තහවුරු විය. රෝහල්වල නිරත ප්‍රසව රෝග විශේෂඥයෝ සහ ළමා රෝග විශේෂඥයෝ ආයතනයෙන් බැහැරවද චිකිත්සාගාර පැවැත්වූහ. ළමා රෝග විශේෂඥයෝ තෝරාගත් පාසල්වල පාසල් සෞඛ්‍ය කටයුතු කළහ.

XX වන සටහනේ මාතෘ ඇඳන් සංඛ්‍යාව දැක්වේ. ආයතනවල සිදුවූ දරු ප්‍රසූති සහ මාතෘ මරණ ගණන XXI වන සටහනේ දැක්වේ.

(ඈ) **අධ්‍යාපනය.**—අධ්‍යාපනය මාතෘ හා ළමා සෞඛ්‍ය වැඩ සටහනේ එක් අංගයක් වන අතර එදිනෙදා කෙරෙන සාමාන්‍ය කටයුත්තක් වශයෙන් සෑම සෞඛ්‍ය මධ්‍යස්ථානයකම අධ්‍යාන වැඩ සටහන ක්‍රියාත්මක වේ. එක් එක් විමධ්‍යගත ඒකකයට අයත් සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරීන්ගේ වැඩසටහනේ කොටසක් වශයෙන්ද අධ්‍යාපනික කටයුතු කරනු ලැබේ. ගැබිණි මව්වරු, කිරි මව්වරු හා ළමයි ඒ ඒ අවදිවලදී ගතයුතු කෑම්-බීම් හා ඒවායේ පෝෂ්‍ය ගුණය පිළිබඳ විශේෂ පොත් වෛද්‍ය පර්යේෂණ ආයතනයේ පෝෂ්‍ය අංශය මගින් මුද්‍රණය කරවා විසුරුවා හරින ලදී.

4. මාතෘ හා ළදරු මරණ විමර්ශන

විශේෂඥයන්ගේ විශේෂ කමිටුව මගින් සකස් කරන ලද ආකෘති පත්‍ර යෝග්‍ය අයෝග්‍යතාවය සොයා බැලීමට පාවිච්චි කිරීමෙන් පසු තවදුරටත් සංශෝධනය කරන ලදී. මේ ආකෘති පත්‍ර මුද්‍රණය කරවා පාවිච්චිය සඳහා බෙදා හැර තිබේ.

5. ජංගම සේවා

ඇපොතිකරි වරුන්ගේ බාරයේ පවතින, වටපණු රෝගයට ප්‍රතිකාර කිරීම සඳහා පිළියෙළවූ "ඇදිහැස" වෑන් රථ දෙක—එක් රථයක් අළුත්වැඩියා කිරීමට දී තිබූ මාස තුනක කාලය හැර—අවුරුද්දේ අනෙක් සෑම කාලය තුළම වැඩෙහි යොදවන ලදී. විමධ්‍යගත ඒකකයේ ප්‍රධානියා විසින් කල් තියා පිළියෙළ කරනු ලබන වැඩ සටහනක් අනුව මෙම වෑන් රථ වැඩෙහි යොදවනු ලැබුවේය. වෑන් රථය එක් ප්‍රදේශයකට එන්නට පළමු සෞඛ්‍ය සේවා අධිකාරි කොටසට අයත් සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරියා විසින් ප්‍රචාරක කටයුතු කරනු ලැබේ. වෑන් රථ දෙක මගින් රු. 14,468ක් වටිනා ඇන්ටිපාර් බෙහෙත් රාත්තල් 5,437 ක් බෙදා හරින ලදී. මාසයකට සාමාන්‍යයෙන් ළමයින් 13,419 කට ප්‍රතිකාර ලබා දුන්හ. මෙය ළමයින්ගේ වටපනු රෝග නාශක ව්‍යාපාරයේ එක් කොටසක් පමණි. පාසල්වල, රෝහල්වල හා සෞඛ්‍ය මධ්‍යස්ථානවලද ප්‍රතිකාර කරණ ලදී. සෑම මහජන සෞඛ්‍ය පරීක්ෂකයකුගේ කොට්ඨාශයේම පරිසර සනීපාරක්ෂාව පිළිබඳ වැඩ කටයුතු කරනු ලැබූ අතර පාසල් නොයන වයසේ ළමයින් සඳහා වැසිකිළි සෑදීම ගැන විශේෂ උනන්දුවක් දක්වන ලදී.

6. පාසල් දන්ත වෛද්‍ය සේවා

(අ) දත් හෙදි ඇබෑසි විදුහල. මහරගම පිහිටි අභ්‍යාස විද්‍යාලයේ දත් හෙදි සිසුන් 40 ක් කණ්ඩායම් දෙකකට පුහුණු කිරීම සඳහා පහසුකම් සලසා තිබේ. එහි පළමු අවුරුද්දේ සිසුන් 20 ක් හා දෙවන අවුරුද්දේ සිසුන් 20 ක් සිටිත්. මේ වර්ෂය තුළ සිසුන් 17 ක් ඇතුළත් කළ අතර දෑවුරුදු පුහුණුව සතුටුදායක ලෙස අවසන්කර පාසල් දත් හෙදියන් ලෙස 22 ක් පිටවී ගියහ. වැඩබලන ප්‍රධානාචාර්‍යා වරියක යටතේ පාසල පැවැත්වුනු අතර පළමුවෙන් නිව්සීලන්තයෙන් පැමිණි ශික්ෂක හෙද සොහොයුරියන් ඔවුන්ගේ කාලසීමාව අවසන් කොට පෙරළා ගම්රටබලා ගිය බැවින් සම්පූර්ණයෙන් ස්වදේශීය සේවක මණ්ඩලයක් එහි කටයුතු වල නිරත වූහ. පාසල් දත් හෙදියන් විසින් කරන ලද වැඩ XXII සටහනේ දැක්වේ.

(ආ) පාසල් දන්ත සේවා. දැනට දිවයිනේ පාසල් දන්ත සේවා චිකිත්සාගාර 55 ක් තිබේ. මේවා පහත දැක්වෙන අයුරු පිහිටා ඇත.

සෞ. සේ. අධි. කොට්ඨාශය	චිකිත්සාගාර ගණන
කොළඹ	33
කළුතර	4
ගාල්ල	5
මාතර	3
කෑගල්ල	1
මහනුවර	5

සමාලෝචනයට භාජනය වන කාලය තුළ පහත දැක්වෙන අළුත් පාසල් දන්ත චිකිත්සාගාර විවෘත කරන ලදී.

සෞ. සේ. අධි. කොට්ඨාශය	විවෘත කළ අළුත් චිකිත්සාගාර	පිහිටීම
කොළඹ	2 ...	(අ) නුගේගොඩ සාන්ත ජෝන්ගේ පිරිමි පාසැල.
		(ආ) නුගේගොඩ අනුලා විද්‍යාලය.
ගාල්ල	4 ...	(අ) බලපිටියේ සිද්ධාර්ථ විද්‍යාලය.
		(ආ) අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලය.
		(ඇ) ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලය.
		(ඈ) ගාල්ලේ සංඝමිත්තා පාසැල.
මාතර	2 ...	(අ) වැලිගම අර්පා මුස්ලිම් පාසැල.
		(ආ) දෙවුන්දර ප්‍රාථමික පාසැල.
මහනුවර	1 ...	(අ) පේරාදෙනියේ දන්ත පාසැල.

යට දැක්වෙන පරිදි අළුත් දන්ත චිකිත්සාගාර 9 ක් විවෘත කර ඇති අතර කොළඹ මියුසියස් විද්‍යාලයේ පිහිටි චිකිත්සාගාරය පාසල් කටයුතු සඳහා පාසල් බලධාරීන්ට අවශ්‍යවූ නිසා එය වසා දමන ලදී.

සේවක මණ්ඩලය. සේවයේ යෙදී සිටින සම්පූර්ණ පාසල් දත් හෙදි සංඛ්‍යාව 135 කි. 1964 ජනවාරි මස 1 දින ශික්ෂක දන්ත සොහොයුරියක් පත් කරණු ලැබුවාය. සමාලෝචන කාලය තුළ පාසල් දත් හෙදි 135 අතුරින් 27 ක් මාතෘ නිවාඩු පිට සිටියෝය.

පාසල් දත් හෙදියන් විසින් කර ඇති සම්පූර්ණ වැඩ මෙසේයි.

	මුළු ගණන
දත් පිරවීම	1,90,733
දත් ගැලවීම	52,164
සිල්වර් නයිට්‍රේට් ප්‍රතිකාරය	1,608
දත් මැලියම් කැඩීම හා ශුද්ධ කිරීම	94,733
විවිධ ශල්‍යකර්ම	69,501
ශල්‍යකර්ම	5,52,773
පැමිණීමේ සංඛ්‍යාව	1,04,972
ප්‍රතිකාර යටතේ සිටින ළමයින් සංඛ්‍යාව	56,041

දන්ත සෞඛ්‍ය අධ්‍යාපනය. ප්‍රතිකාර පටන් ගැනීමේදී හා අවසානයේ දීද, අතරතුර ප්‍රතිකාර අවසථාවේදීද, පාසල් දත් හෙදිය විසින් එක් එක් රෝගියාට මුඛයේ සවසථතාවය ගැන උපදෙස් දෙනු ලැබේ.

ළමයින්ට දත් පිළිබඳව හැඟීමක් ඇති කිරීමට හා ප්‍රතිකාර ලබාගැනීමට වැඩි වැඩියෙන් උනන්දු කරවීමට පුළුල් සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහනක් අසල පාසල් වල ක්‍රියාත්මක කරණු ලැබේ.

7. පවුල් සංවිධානය

පවුල් සංවිධානය පිළිබඳව කටයුතු කරන සංවිධාන දෙකක් ලංකාවේ තිබේ. එනම්,

(අ) ලංකා පවුල් සංවිධාන සමිතිය.

(ආ) ස්විස්ටර්ලන්ත ලංකා පවුල් සංවිධාන ක්‍රමය.

පළමුවෙන් සඳහන් කළ සමිතිය වෛද්‍ය නිලධාරීන් පුහුණු කිරීමත්, ස්විස්ටර්ලන්ත-ලංකා පවුල් සංවිධාන නියම ක්‍රමය යටතේ ඇති ප්‍රදේශ හැර අනෙක් ප්‍රදේශවල උපදෙස් මධ්‍යස්ථාන සහ පවුල් සංවිධාන චිකිත්සාගාර විවෘත කිරීමත් ගැන කටයුතු කරයි.

දෙවනුව සඳහන් කළ සංවිධානය වින්නඹු සේවිකාවන් හෙදියන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකයන් පුහුණු කිරීමත් ප්‍රචාරක කටයුතුත් තෝරාගත් ඇතැම් ප්‍රදේශවල ඇති චිකිත්සාගාර වල උත්පත්ති පාලන ක්‍රම බෙදා හැරීමත් කරනු ලැබේ. වර්ෂය තුළ වෛද්‍ය නිලධාරීන් 42 ක්ද වින්නඹු සේවිකාවන් 160 ක්ද පවුල් සංවිධාන කටයුතු සඳහා පුහුණුව ලැබූහ.

8. විශේෂ පාඩම් මාලා සමාලෝචනය කිරීම සහ පර්යේෂන

වෛද්‍ය පර්යේශන ආයතනයේ නිලධාරියෙක් පාසල් ළමුන්ගේ පෝෂණ තත්ත්වය පිළිබඳ වාර්ෂික තක්සේරුවක්ද, දෙපාර්තමේන්තුවේ තවත් නිලධාරියෙක් "පින්ක්ස් පෙති" පාවිච්චියේ මූලික ප්‍රතිඵල සම්බන්ධ විමර්ශනයක්ද පැවැත්වූහ. ගැබිණි මවුවරුන්ගේ ලේ හීන භාවයේ ප්‍රමාණය හා හේතු පිළිබඳ විශේෂ විමර්ශනයක් වෛද්‍ය පර්යේෂණ ආයතනය බාර ගත්තේය.

9. ජාත්‍යන්තර ආධාර

ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාතෘ හා ළමා සුභ සාධක උපදේශිකා දොස්තර වැන්ජික් මෙනෙවිය ඉන්දියවේ වැඩ කොටසක් බාරගෙන මෙරටින් බැහැරව ගියාය. ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාතෘ හා ළමා සුභ සාධක උපදේශිකා ගේඩ් මහත්මිය ලංකාවේ සංචාරයක් කළාය. සමාලෝචන වර්ෂය තුළ ලෝක සෞඛ්‍ය සංවිධානයේ හෙදකම පිළිබඳ උපදේශිකා ලොහෝර් මහත්මිය ලංකාවේ රාජකාරි බාර ගත්තාය.

(ආ) පාසල් සෞඛ්‍ය කටයුතු

1. සංවිධානය

ඉතා ස්වල්ප ප්‍රදේශයක හැර අනෙක් ප්‍රදේශවල මේ සඳහා විශේෂ සේවක මණ්ඩලයක් නොමැත. සිටින සේවක මණ්ඩලයද මදිය. දැනට ඇත්තේ පාඨශාලා වෛද්‍ය නිලධාරීන් 5 ක් සහ පාඨශාලා සෞඛ්‍ය ඇපෝතිකරි වරුන් 22 ක් පමණය. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සහ බෙහෙත් ශාලා භාර ඇපෝතිකරි වරුද මේ කටයුත්තට සහාය වෙත්.

ප්‍රාදේශීය සහ වෙනත් රෝහල් වල සිටින ළමා රෝග විශේෂඥයින් ඔවුන්ගේ රෝහල් වලට නුදුරින් තෝරාගත් පාසල් වල පාඨශාලා සෞඛ්‍ය කටයුතු කරත්.

2. කටයුතු

(i) පාසල් සනීපාරක්ෂාව. මෙය ලංකාවේ සෑම ළමයකුගේම අනිවාර්ය අධ්‍යාපනයට කලින් තිබිය යුතු වැදගත් අංගයකි. එම නිසා සෑම අවුරුද්දකම පටන් ගැනීමේදී මහජන සෞඛ්‍ය පරීක්ෂකයන් විසින් පාඨශාලීය සනීපාරක්ෂක සමාලෝචනයක්

පවත්වනු ලැබේ. අධ්‍යාපන අමාත්‍යාංශය මැදිහත් වීමෙන් ඒකාබද්ධ පාඨශාලා සෞඛ්‍ය මණ්ඩලයේද, ගුරු-දෙගුරු සංගම් වලද ක්‍රියාශීලී සහයෝගයෙන් පාසල් ළමයින්ට සනීපාරක්ෂික හා සෞඛ්‍යමය වටපිටාවක් සැලසීමට සෑම උත්සාහයක්ම දරණ ලදී.

(ii) **වෛද්‍ය පරීක්ෂණ හා අබුපාඩු හරිගැස්සීම.** පරීක්ෂා කරන ලද පාසල් සංඛ්‍යාවේ වැඩිවීමක් ඇතිවී තිබේ. පසුගිය අවුරුද්දේ පාසල් 2,683 ක් පරීක්ෂා කළ අතර මේ අවුරුද්දේ එය 3,082 දක්වා වැඩිවී ඇත.

පාසල් සහ පරීක්ෂා කරන ලද ළමුන් ගණන XXIII සටහනේ දැක්වේ. විශේෂ අබුපාඩු සහ හරිගස්සන ලද අබුපාඩු XXIV සටහනේ ඇත.

(ඇ) පෝෂණය

1. ගැටලුව.

මන්දපෝෂණය විශේෂයෙන් පාසල් නොයන වයසේ ළමුන් අතර ගැටලුවක් වී තිබේ. පාසල් නොයන වයසේ ළමයින්ගේ මරණ බැගිනුව අධිකවන අතර එයින් සියයට 40 කට වඩා හේතු වී ඇත්තේ මන්දපෝෂණය, වටපණු රෝගය සහ උදර රෝගයන්ය. දිවයිනේ ඇතැම් ප්‍රදේශවල ලොකු ළමයින් ගැබිණි මව් වරුන් සහ කිරි මවුවරුන් අතරද මන්දපෝෂණය ගැටලුවක් බවට පත් වී තිබේ.

2. පෝෂණයට අදාල වැඩ කටයුතු.

(අ) **දවල් ආහාරය.** "ඇදි හැස" සංවිධානය මගින් සපයනු ලබන යොදේ රහිත කිරි මේද නොමැති වන සේ නැවත සකස් කොට නිදහස් දවල් ආහාරය වශයෙන් සියළු ම පාසල් වලට බෙදා දෙනු ලැබෙත්. මේ කිරි පරිබෝගයට ඇතැම් ළමයින් තුළ මුලදී ඇතිවූ අකැමැත්ත මගහැරී ඇති අතර දැන් ළමයින් වැඩි දෙනෙක් ඉතා කැමැත්තෙන් මෙම ආහාරය ගනිත්.

(ආ) **පෝෂ්‍යදායකත්වය පිළිබඳ ක්ෂේත්‍රයේ අධ්‍යාපනය.** සෞඛ්‍ය ශික්ෂකයන් හා සෞඛ්‍ය කටයුතු වල නිරත සියළුම නිලධාරීන් ඔවුන්ගේ සෞඛ්‍ය වැඩ සටහන් වල පෝෂ්‍යදායකත්වය පිළිබඳ ක්ෂේත්‍රයේ අධ්‍යාපනය නිතිපතා අඩංගු කොට ක්‍රියාත්මක කරන ලදී. උපදේශමය සාකච්ඡාද පවත් වන ලදී.

(ඇ) **නොමිළයේ කිරි බෙදා හැරීම.** සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් නොමිළයේ කිරි බෙදා හැරීමේ ක්‍රම දෙකක් යටතේ කටයුතු කරන ලදී.

1. ජාතික කිරි බෙදා හැරීමේ ක්‍රමය.

ප්‍රෝටීන් හිඟකම නිසා ඇති වන මන්දපෝෂණය සහ ලේ හිඟවීම ගම්බද පෙදෙස් වල දක්නට ලැබෙන තත්ත්වයක් බැවින් මේ හිඟකම් නැති කිරීමේ මාර්ගයක් වශයෙන් කිරි බෙදා හරිනු ලැබේ.

ලංකාවේ නොයෙක් ප්‍රදේශවල ගමන් පහසුව ඇති කේන්ද්‍රගත මධ්‍යස්ථාන යන්හි කිරි මධ්‍යස්ථාන පිහිටුවා තිබේ. ඒවා සාමාන්‍ය කිරි හෝ යොදේ රහිත කිරි මධ්‍යස්ථාන වේ. ලංකා කිරි මණ්ඩලයේ ගබඩා හා සමුපකාර කිරි පට්ටි අසළ පිහිටි මධ්‍යස්ථානවල සාමාන්‍ය කිරි බෙදා දෙන අතර ඈත පිහිටි මධ්‍යස්ථාන වල යොදේ රහිත කිරි දෙනු ලැබේ. හැකි තරම් කිරි මධ්‍යස්ථාන සාමාන්‍ය කිරි මධ්‍යස්ථාන බවට පත් කිරීම දෙපාර්තමේන්තුවේ දැන් ප්‍රතිපත්තිය වෙයි. මේ මධ්‍යස්ථාන වල පාසැල් නොයන ළමුන් ගැබිණි මවුන් හා කිරි මවුන්හට කිරි බෙදා දෙනු ලැබේ. 1963-64 වර්ෂයේදී මධ්‍යස්ථාන 1966 කින් කිරි මණ්ඩලයෙන් සහ සමුපකාර කිරි පට්ටිවලින් මිළයට ගත් කිරි පයින්ට් 80,13,912 ක්ද, මධ්‍යස්ථාන 1,059 කින් ආහාර කොමසාරිස් ගෙන් මිලයට ගත් යොදේ රහිත කිරි රාත්තල් 5,40,972 ක් බෙදා හරින ලදී.

මෙම මධ්‍යස්ථාන පරිපාලනය කරන ලද්දේ දිස්ත්‍රික් පරීක්ෂක වරුන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන් විසිනි. දිස්ත්‍රික් පරීක්ෂකයන් ඇත්තේ සීමා සහිත සංඛ්‍යාවක් බැවින් වැඩි වැඩියෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකයන් මේ

මධ්‍යස්ථාන පාලනය කිරීමේ කටයුතු සඳහා යොදවනු ලැබේ. ළමුන් නොකඩවා කිරි මධ්‍යස්ථානවලට පැමිණෙන්නේද, නැද්ද සොයා බැලීමත් කිරි අවශ්‍ය අයට ඔවුන්ගේ අවශ්‍යතාවන් ළඟම පිහිටි මධ්‍යස්ථානවලින් ලබාගැනීමට උනන්දු කරවීමටත් මහජන සෞඛ්‍ය වින්නඹු සේවිකාවන්ට ඔවුන්ගේ ගෙවල් චාරිකාවේ දීම කිරීමට පවරා ඇත.

හැකි හැම අවස්ථාවේදීම කිරි මධ්‍යස්ථාන ස්වේච්ඡා සංවිධාන වලට පවරන ලදී. ඔවුහු වේතන ලබන සේවකයන් නොමැතිව දර ආදියට දෙපාර්තමේන්තුවෙන් වියදම් නොකරවා කිරි බෙදා දෙත්.

වර්ෂය තුළ කිරි මධ්‍යස්ථාන 1603 ක් ස්වේච්ඡා සංවිධාන යටතේ පැවැත්විනි. මෙම ව්‍යාපාරය පළාත් පාලන අමාත්‍යාංශයට බාර දීමට කටයුතු කරන බව පසුගිය වාර්තාවේ සඳහන් විය. එහෙත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අවශ්‍ය සංවිධානය සහ සේවකයන් ඇති නිසා මෙය සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ම පවත්වා ගෙන යා යුතු යයි තදනන්තරව කැබිනට් මණ්ඩලය තීරණය කළාය.

2. "ඇදිහැස" කිරි ව්‍යාපාරය

මේ දෙවන ක්‍රමය යටතේ "ඇදිහැස" මගින් ප්‍රදානය කරන කිරි පාසල් නොයන වයසේ ළමයින්, ගැබිණියන්, කිරි මවුවරුන්, ක්ෂය රෝගීන්, ලාදුරු රෝගීන් සහ ඔවුන්ගේ ස්පර්ශකයින් අතර බෙදා හරින ලදී. මෙය බෙදා හරින ලද්දේ මාතෘ නිවාස, ළමා සුභසාධක සෞඛ්‍ය මධ්‍යස්ථාන සහ ඇපොතිකරිවරුන් භාරයේ පවතින මධ්‍ය බෙහෙත් ශාලා මගිනි. එවැනි මධ්‍යස්ථාන 380 කින් යොදේ රහිත කිරි රාත්තල් 17,61,312 ක් බෙදා හරින ලදී.

V වන පරිච්ඡේදය

වසංගත රෝග වේදය

ගැටළු.—මුවෙන් ගන්නා බාලක පක්ෂාඝාත එන්නත් බෙහෙත යොදා 1963 දී විපුල ලෙස කරවන ලද ප්‍රතිශක්ති ගැන්වීමේ වැඩ පිළිවෙල අනුවැ සලකා, දැනුම් දෙන ලද හැම රෝගියෙකු මැ සුපරීක්ෂාකාරී විපිළිසරය යටතේ තැබීමෙන්, බාලකපක්ෂාඝාත රෝගාතුර තරමේ අඩු-වැඩි වීම් පිළිබඳ මැනවින් කරුණු හදාරන ලදී.

පාචන රෝග පිළිබඳ ජ. සෞ. සං. කණ්ඩායමේ නිර්දේශ ලුහුබැඳ යාමක් හැටියට, 1963 සැප්තැම්බරයේදී මෙහි පැමිණි ජ. සෞ. සං. සූක්ෂම ජීව වේදඥ තැන සිය කටයුතු දිගටමැ කැරැ ගෙනැ ගියේය. ඔහු කළ වැඩ කටයුතු අතරැ ප්‍රධාන තැන හිමි වූයේ අංගොඩ උණ රෝහලේ හා රාගම ළමා රෝහලේ හා පරීක්ෂණාගාර සංවිධානය කිරීමට යැ.

ජ. සෞ. සං. පුරෝහිතයෙක්, 1962, 1963 යන වකවානුවේ බාලකපක්ෂාඝාත ප්‍රතිශක්ති ගැන්වීමේ වැඩ සටහන අගය මැනීමක් ඉටු කළේ යැ.

බාලක පක්ෂාඝාත රෝගය

2. වාර්තා වූ රෝගීන් මුළු ගණන 126 කි. රෝගීන් විශාලතම ගණනක් වාර්තා වූයේ අඩුමැ ගණනක් ප්‍රතිශක්තියෙ පිහිටුවුණු පෙදෙස් වන කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරී පෙදෙසින් හා කොළඹ ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී පෙදෙසින් හා යැ.

රට තුළ රෝගය පැවැති තරම මෙසේ වෙයි:—

1961—1962	ජනගහණයෙන්	1,00,000 කට	15.9 යි.
1962—1963	,,	,,	2.7 යි.
1963—1964	,,	,,	1.15 යි.

බාලක පක්ෂඝාත රෝගීන් පිළිබඳ විපිළිසරය

3. රෝගාතුර වූවන් ගැන තතු-සෝදිසි කොට, ශායනික මෙන්ම පාරිසරික සාධක වල අගය මනින ලදී. දෙමාසයකින් පසු ගෙවල්වලට කෙනෙක් දුරට කොරවීම තිබුණේ දැ යි සොයනු සඳහා සමීක්ෂණ මෙහෙයවන ලදී. එකී සමීක්ෂණවලින් පෙනී ගිය පරිදි නිවාරුවේ (වාරු නැති බවේ) තරම මෙසේය:—

	1961–1962	1962–1963	1963–1964
කිසිවෙක් නැති ...	42·1% ...	37·8% ...	33·3%
සුළුවෙන්	27·6% ...	24·4% ...	30·0%
මැදි තරමින්	18·9% ...	16·7% ...	13·3%
තදින්	11·3% ...	2·2% ...	6·7%
මරණ	— ...	18·9% ...	16·7%

ප්‍රතිශක්තිකරණ වැඩ සටහන

4. බාලකපක්ෂඝාත ප්‍රතිශක්තිකරණ වැඩ සටහන අලුත උපන් බිළිඳුන් මුල් කොටගෙන මෙහෙය වන ලද්දකි. විත්නඹුවන් තම-තමන්ගේ පෙදෙස්වල උපත් දක්වෙන නම් වට්ටෝරු පිළියෙල කළ අතර, ළමා ශුභ සාධක චිකිත්සාගාර පවත්වන සෞ. වෛ. නි./පයඞ්න්ත රෝහල් වෛ. නි./ස්ථාන භාර වෛ. නි, විසින් එන්නත් ගැන්වීම කරන ලදී. යෙදූ එන්නත් නම්, 1963 දී යොදන ලද වර්ගය මැය. එනම් මැන්ගනීසියම් ක්ලොරයිඩ්වලින් තිරසාර වූ මුවැදි තිබල විෂානු (සේබින්යේ) එන්නතයි.

අලුත උපන් දරුවන්ට ප්‍රතිශක්තිය දීමට අමතර ව, ප්‍රතිශක්තිය කිසි දිනෙක නො ලබා සිටි ළමුන් ප්‍රතිශක්ති ගැන්වීමේ විශේෂ වැඩ සටහනක් ඇතැම් පෙදෙස් වල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් විසින් සංවිධානය කරනු ලැබියැ.

5. බාලක පක්ෂඝාතයේ තරම විමසීම

1962, 1963 දී කරන ලද බාලකපක්ෂඝාත ප්‍රතිශක්තිකරණයේ අගය විමසීමේ හදුරු වසංගතවේද මුළුවේ සහ වෛ. ප. ආයතනයේ විෂානුවේදඥ තැනගේ උදවු-උපකාර ඇතිව ජ. සෞ. සං පුරෝහිත කෙනෙක් අගය විමසීමේ හදාරු මෙහෙයැවී ය. විශේෂ යෙන්ම, අවුරුදු 12 ට පහළ වයස් ගොල්ලේ ළදරුවන්ගේ හා ළමුන්ගේ හා අතරු පැලුම් මාස්තුවේදී සමීක්ෂණවලට ගැනීම මුල් කොට, මෙය සමන්විත වී යැ. ප්‍රති ශක්තිය ලැබූවන් සියයට ගණන ඉතා අඩුවූ කොළඹ, මාතලේ යන සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශවලැ එකක් ද ප්‍රතිශක්තිය ලැබූවන් සියයට ගණන වැඩිවූ අනුරාධපුර වවුනියා යන කොට්ඨාශවල අනෙක ද යනුවෙන් දෙගොල්ලකට බෙදූ මේ සමීක්ෂණ පවත්වන ලදී. ගන්නා ලද මාස්තු පැලුම් ප්‍රතිශක්තිවේදී හදාරු සඳහා ජ. සෞ. සං. විසින් චෙකොස්ලෝවේකියාවේ, ප්‍රේග් නුවර, වසංගතවේදී සහ සූක්ෂම ජීවවේදී ආයතනයට යවන ලදී

වසූරිය

6. අවුරුද්ද තුළ දී වසූරිය රෝගීන් කිසිවෙකුත් නොවියැ.

7. සන්නිපාත උණ

සිරිත්පරිදි තිබූ හුරුව දක්නා ලද මුත්, රෝබිය හටගත් බවට—

(1) හම්බන්තොට සෞ. වෛ. නි.—බදගිරියෙන් ද

(2) වැලිමඩ සෞ. කා.—හරක්ගමනකන්දෙන් ද

වාර්තා ලැබිණි.

පසුගිය දස අවුරුද්දේ සන්නිපාත උණ පැතිර තිබූ තරම XXV සටහනේ දැක්වේ. 1962-1963 දී අටකලම්පන්න සෞ. කා. වසම තුළ දක්නට ලැබුණු සන්නිපාත උණ පැවැති ඉහළ මට්ටම 1963-1964 දී ද දක්නට ලැබුණි. සන්නිපාතයෙන් වැළැකීමේ ප්‍රතිශක්ති ගැන්වීමේ බලසම්පන්න වැඩ සටහනක් මේ පෙදෙසේ ක්‍රියා කරවන ලදී. රෝගය පැතිර තිබුණු තරම මෙහි දැක්වේ :—

	1961	1962	1963
සන්නිපාත උණ			
අටකලම්පන්න සෞඛ්‍ය වසම ...	... 95	... 123	... 165
දිගට පැවැති සුළු උණ ...	... 128	... 115	... 65

බදගිරියේ පහළ වූ රෝග බිය.—හම්බන්තොට සිටැ සැතැපුම් 8 ක් දුර පිහිටි බදගිරිය ජනපදයේ සන්නිපාත උණ රෝගය පැතිරෙන්නට වියැ. 1600 කට වැඩි ජනගහනයක් ඇති මේ ජනපදයේ පවුල් 24 කට වැඩියෙන් තිබේ. පෙබරවාරි අග හරියේ දී පමණ පටන් ගත් රෝබිය පැතිරීම 1964 මාර්තු අවසාන හරිය දක්වා තිබුණි. රෝගීන් 80 මුළු ගණනක් විෂයයෙහි තතු-සෝදිසි කොටැ තිබුණි. උන් හිටිගමන් රෝග බිය පහළවීමට හේතුව ආහාරයෙන් හෝ දියෙන් හෝ හටගත් රෝග පැතිරීමකැයි සිතිය හැක. රෝගීන්ගෙන් සියයට 95ක් වයස අවුරුදු 25 ට අඩු අය අතරේ දක්නට ලැබුණෙන් රෝගය වැළඳී වැඩි දෙනා තරුණ වයසේ උදවිය වෙති. මිට අදාල ජනයා බර පවුල්වලට අයත් තරුණ උදවිය යි. සියයට 61 ක් ගැහැණු උදවිය වෙති. මේ පෙදෙසේ ළිං නොමැතිවීම ජනපද වැසියන්ට ඉමහත් අවහිරයෙකි. ඔවුන් දිය ලබා ගත්තේ, එක් ගෙයකට ගැලුම් 4 ගණනේ ක්ලෝරින් නුමුසු දිය සැපයු බවුසරයකිනි. ගෙවල්වලට සැපයූ ඒ දියෙන් රෝග පැතිරීම සිදුවූ බව සැක කරනු ලැබේ. තතු-සෝදිසිය පටන් ගත් විගසින්, ගෙවලට බෙදා දීමට පෙරැ ක්ලෝරීන් යොදා දිය පිරිසිදු කිරීමට පියවර ගන්නා ලදී. ජනයාගෙන් සියයට 45 ක් පමණ ටී. ඒ. බී. බෙහෙතින් රක්ෂාවරණය ලැබූහ.

හරක් ගමන්කන්දේ පහළ වූ සන්නිපාත උණ.—වැලිමඩ සෞඛ්‍ය කාර්යාලයාධිපති වසමට අයත් හරක්ගමන්කන්ද නම් ගමෙහි, 1963 අගෝස්තු මාසයේ සන්නිපාත උණ පැතිරීමක් පහළ වි යැ. 1963 නොවැම්බරයේ දී රෝ බිය තුනී වූ කලැ මේ මුළුව විසින් තතු-සෝදිසි කරන ලදී.

මුළුමනින් මැ පාහේ යොනුන් (යෝනකයින්) ගෙන් සමන්විත 1422 ක ජනගහන යක් ඇති මේ ගමෙහි පවුල් 213 ක් වෙති. විවිධ දියාර කිහිපයකින් ඇදී නල මගින් සැපයෙන දිය ගෙවල් බොහොමයකට ලැබුණි. බොරගස් නම් අල්ලපු ගමේ අතරින් පතර රෝගීන් කිහිප පෙනෙකු 1963 මුල් හරියේදී දක්නට ලැබී ඇත. ඊළඟ මාස කිහිපයේදී මේ ගමේ ද රෝගීන් කිහිප දෙනෙකු සිටි අතරැ, 1963 අගෝස්තු මැද හරියේදී පමණ රෝ බිය පැතිරෙන්නට වී තිබේ. සම්පූර්ණ සමීක්සුමක් කරනු ලැබ, රෝගීන් 199 දෙනෙකු සිටි බව දැන ගන්නට ලැබුණි. රෝගීන් සිටි ගෙවල් 93 කි. අනෙක් 120 හි රෝගීන් නොවූහ. එය උන්හිටි ගමන් සිදුවූ පිපිරීමක්වැන්න. බත් පිසැ මුළු ගමටමැ බෙදා දී මෙහි යෙදුණු මුස්ලිම් දේවස්ථානයේ තිබුණු බොජුන් සාදයකට නෑකම් කියන හෙයින්, රෝබිය පැතිරීමට මුල ආහාර හා දිය හා යැයි සිතීමට ඉඩ ඇත. රෝගීන් වැඩි ගණනක් දක්නට ලද්දේ රෝගීන්ගෙන් සියයට 26.0 ක් වූද ජනගහනයෙන් සියයට 14.2 ක් වූද 10—14 වයස්ගොල්ලේ යැ. මේ වැලට අයත් රෝගය පැවතීමේ සාමාන්‍ය කාල-සීමාව දින 22.2 ක් වී යැ. රෝගීන් 177 දෙනාගෙන් රෝහල්ගත ප්‍රතිකාර ලැබුවෝ 62 දෙනෙක් (35.0) පමණි. ඉතිරි අය බාහිර රෝගීන් ලෙස ප්‍රතිකාර ලැබූහ.

රෝග බෝවීම වැළැක්වීම සඳහා පියස්ස භාර නිලධාරි තැන නොවළහා ක්‍රියා කොටැ තිබුණි. ප්‍රතිශක්තිකරණය පටන් ගන්නා විටැත් රෝගීන්ගෙන් සියයට 75 කට රෝගය සෑදී තිබුණි. ප්‍රතිශක්තිය ලැබිය යුතු අයගෙන් සියයට 86 කට එය දී තිබුණි.

8. බෝවෙන සුලු යකෘත් දාහය

බෝවෙන සුලු යකෘත් දාහය හටගැනීම විශේෂයෙන් නෙත් කලාපයට අයත් පෙදෙසේ දිගට මැ ඉහළ මට්ටමකින් තිබුණි. කොළඹ නගරයේ ද බෝවෙන සුලු යකෘත් දාහය තදින් තිබූ බවට වාර්තා වී යැ. මේ රෝගය තිබූ තරම XXVI සටහනේ දැක්වේ.

වසංගතවේදී මුළුව විසින්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ හා වසම් භාර සෞඛ්‍ය කාර්යාලයාධිපතීන්ගේ හා අනුබලය ඇතිවැ, රෝගය තදින් බලපැවැත්වූ පෙදෙස්වලැ විශේෂ තතු-සෝදිසි මෙහෙයවා ඇත.

9. පාචන රෝග මැඩලීමේ අරමුණ

ජ. සෞ. සං. පාචන රෝග අනුශාසක කණ්ඩායමේ වාර්තාව පදනම් කොට ගෙන, ජාඇල සෞ. වෛ. නිලධාරියගේ හා රාගම මහ රෝහලේ ළමා රෝග විද්‍යාඥයාගේ ඟ අනුබලය ඇතිව වසංගතවේදී මුළුවේ මග පෙන්වීම යටතේ, ලුහුබැඳුම් ක්‍රියා දිගටමැ කරවන ලදී. ජ. සෞ. සං. සාකවේදඥ පැමිණි පසු මේ වැඩට නව පණක් ලැබුණි. ජාඇල සෞ. වෛ. නි. පියසට අයත් පැලියගොඩ හා හොරපේ හා. ජ. සෞ. සං. පුරෝහිත තැනගේ පිරිවහල ඇතිවැ ඇස්කේරිස් නම් අතුණු පණුවන් මැඩලීමේ අරමුණක් අරඹන ලදී.

10. ඇස්කේරිස් නම් අතුණු පණුවන් මැඩලීමේ අරමුණ

මේ අරමුණ, වසංගතවේද මුළුව, ජ. සෞ. සං. සූක්ෂම ජීවවේද පුරෝහිත, ම. සෞ. පශු වෛද්‍ය නිලධාරියා, ජාඇල සෞ. වෛ. නිලධාරි යන අය එකමුතුවීමෙන් ගන්නා ලද අරමුණෙකි. අරමුණුවූ පෙදෙසේ, එනම් පැලියගොඩ-නෙල්ලිගහවත්ත පෙදෙසේ සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහනකින් හා ගෙන්ගෙට ගොස් පැවැත්වූ සමීක්ෂුමකින් හා මේ අරමුණු 1964 අගෝස්තුවේ දී පටන් ගැණුනි. අනතුරුවැ සාකවේදීය-පරපුටු වේදීය සමීක්ෂුමක් වී යැ. සමීක්ෂුමේ ප්‍රතිඵල අනුවැ බලන කළ, අවුරුදු 10 ට පහළ ළමුන්ගෙන් සියයට 85 ක් මතු සඳහන් රෝග එකකින් නොහොත් වැඩි ගණනකින් පෙළෙන බව දක්නා ලදහ :—

1. ඇස්කේරිස් ලම්බ්‍රි කොයිඩිස්,
2. ට්‍රයිකියුරිස් ට්‍රයිකියුරා,
3. කොකු පණු රෝගය.

සියලු වර්ගවල පරපුටුවන් බලපැවැත්වූ තරම අවුරුදු 10 ට පහළ ළමුන් අතරේ සියයට 98.75 ක් වී යැ. දක්නා ලද ගොදුරු වූවන් ගණන මෙසේ වී යැ :—

1.	ඇස්කේරිස් ට්‍රයකියුරා	78.%
2.	ඇස්කේරිස් ලම්බ්‍රිකොයිඩස්	64%
3.	කොකු පණු	17·8%

වයස අවුරුදු 1 ට බාල ළමුන්ගෙන් සියයට 20 ක් දෙනා අතරැ ඇස්කේරිස් නොහොත් ඇස්කේරිස් ට්‍රයිකියුරිස් වැදී තිබුණි. පා. රෝ. අනුශාසක කණ්ඩායම හොරපේ කළ සමීක්ෂුමේදී මෙය නො දක්නා ලදී.

11. ගෙදර-දොරේ සතුන් අතරැ පණු රෝග සමීක්ෂුම

මේ සමීක්ෂුම ම. සෞ. පශු වෛද්‍ය නිලධාරියා විසින් කරන ලද්දකි. පැලියගොඩ සතුන් අතරැ සියයට 45 ක්, මිනිසුන්ගෙන් බෝවූ අතුණු පරපුටුවන් සිය වසුරු සමඟ පිට කළ දක්නට ලැබුණි. බල්ලන් ලබා සිටි තැන නම් කැපී පෙනෙන්නට වී යැ.

සීමාසහිත කාලයක් තුළැ කරන මේ සමීක්ෂුමේ දී සතුන් 28 දෙනෙකු කොකු පණුවන් පිට කළ බව පෙනී ගියේය. බිජු පිට කළ සතුන්ගෙන් සියයට 64 ක් බල්ලෝය. සමීක්ෂුම දිගටම මැ යයි.

12. ප්‍රතිශක්ති ගැන්වීමේ වැඩ සටහන

ගලපටලය, පිටගැස්ම, කක්කල් කැස්ස සහ වෙනත් රෝග වැළැක්වීමේ සමූල ප්‍රතිශක්ති ගැන්වීම පිළිබඳ, ගරු සෞඛ්‍ය ඇමැති තුමන්ගේ විශේෂ කමිටුව නිර්දේශ කළ ප්‍රතිශක්තිකරණී උපලේඛනය, වෛද්‍ය වෘත්තියේ සිටින සියල්ලන් වෙත දැන ගැනීම සඳහා වටේ යවන ලදී. ළදරුවන්ට හා ළමුන්ට හා ප්‍රතිශක්තිය දීමෙහි දී මේ උප ලේඛනය අනුවැ ක්‍රියා කරන ලදී. ප්‍රතිශක්ති ගැන්වීමේ වැඩ සටහන—

1. වසූරියෙන් වැළැකීමේ ප්‍රතිශක්තිකරණයෙන් ද
2. සන්නිපාතයෙන් වැළැකීමේ ප්‍රතිශක්තිකරණයෙන් ද
3. ගලපටලය, උත්කාසය, පිටගැස්ම යන රෝගල්වලින් වැළැකීමේ ප්‍රතිශක්ති කරණයෙන් ද සමන්විත වූයේ යි.

එන්නත් කිරීම

රට තුළ කරන ලද වසූරි එන්නත පිළිබඳ තතු හදාරන ලදී. 1963-1964 දී කරන ලද එන්නත් කරණය පිළිබඳ විග්‍රහයක් මෙසේ දැක්වෙයි :—

(1) වසූරියෙන් වැළැකීමේ එන්නත

		කරන ලද එන්නත් මුළු ගණන (මුල්වරය)
අවුරුදු 1 ට පහළ	... ...	76,772
අවුරුදු 1–5	... ...	2,09,499
අවුරුදු 5 ට ඉහළ	... ...	97,318
	එකතුව ...	3,83,589
දෙවන වර—සියලු වයස්	...	35,953

සන්නිපාත උණෙන් වැළකීමේ ප්‍රතිශක්තිකරණය

ප්‍රතිශක්තිය ගන්වන ලද ගණන මතු පෙනෙන ගණන් සටහනෙන් දැක්වේ. මේ වැඩ කොටස ද පරිපාලක ම. සෞ. පරීක්ෂකයින් විසින් කරන ලද හෙයින්, කරන ලද ප්‍රතිශක්ති ගැන්වීම්වලැ වැඩීමෙක් දක්නට ඇත.

(2) සන්නිපාත උණෙන් වැළකීමට

1 වන වඩිය — 3,11,649
2 වන වඩිය — 2,32,429
ඌන පූරක — 1,49,766

ගලපටලය, පිටගැස්ම, උත්කාසය යන්ගෙන් වැළකීමට ප්‍රතිශක්ති ගැන්වීම

මෙය බොහෝ කොටැ බලවත් කරනු ලබන්නේ ළමා රෝග විද්‍යාඥයින් සිටින පෙදෙස්වලැ යැ. මතු සඳහන් සෞඛ්‍ය වසම් තුළැ විපුල වැඩකොටසක් ඉටු කැරැ ඇත :—

කළුතර
පානදුර
මොරටුව
දෙහිවල
කෝට්ටේ
කොච්චිකඩේ,

කරන ලද ප්‍රතිශක්තිකරණ ගණන මෙසේ වී ඇත:—

(3) තුන්බල එන්නත

1 වන වටය — 5,085
2 වන වටය — 2,576
3 වන වටය — 694
ඌන පූරකය— 605

13. සුව කිරීම අතින්—අංගොඩ උණ රෝහල

සූක්ෂම ජීවවේදය විෂයයෙහි ජ්‍යෙ. සෞ. සං. පුරෝහිතයා විසින් රෝහලේ පරීක්ෂණාගාර සේවාව සංවිධානය කොට ඇත. තමන්ට අවශ්‍ය සියලු සාකවේදී පිරික්සුම් කිරීමට රෝහල දැන් මුළුමනින් මැ පාහේ පොහොසත් යැ. ජ්‍යෙ. සෞ. සං පුරෝහිත තැනගේ හා වෛද්‍ය විද්‍යා පීඨයේ ඖෂධවේදී අංශයේ හා පිටිවතල ඇති වූ අංගොඩ උණ රෝහල, බැසිල අතිසාරයට ටෙට්‍රසයික්ලින් එක් වඩියකට විශ්වාසය තැබීමේ ඖෂධයීය අත්හදා බැලීම් කළා යැ.

14. අධ්‍යාපනය

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් හා මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් හා පුහුණු කරවීමේ වැඩ සටහනෙහි දී මේ මුළුව සහාය දුන්නා යැ. වසංගතවේද පොත්පත් සඟරාදිය ද බෝවෙන රෝග පිළිබඳ වැදගත් මැයෙන් යුත් පුවත් ද නිකුත් කරන ලදී.

15. බරපතල රෝග පැනැනැඟීම

(i) **දෙදුගලු අතිසාරය පැනැනැඟීම.**—දෙදුගල අතිසාරය රෝගය සුළුවෙන් පැන නැඟී රෝගීන් 28 දෙනෙකු සිටිය බවට දෙහිඹිවිට සෞ. වෛ. නිලධාරීගෙන් සැලවී ඇත. ඔහු තතු සෝදිසි කළෙන්, දොලොස්බාගේ මඟුල් ගෙයකට ගොස් පෙරළා පැමිණි ගැහැණියකගෙන් රෝගය බෝවීම පටන් ගත් බව ඔහුට පෙනී ගොස් තිබුණි. දිය සැපයීමේ ආරය වූ කෙළෙසුණු දිය හොයකින් බෝවීම සිදු වූ බව හේ පළ කරයි. යාබද ගම්වලට රෝගය පැතිර ගියේ සමහර විට අහර මඟින් වියැ හැක. රෝගය වැඩිදුර පැතිර යාම වැළැක්වීම සඳහා සෞ. වෛ. නිලධාරියා සියලු පියවර ගෙනැ තිබුණි. ගමේ තිබෙන සනීපාරක්ෂා පහසුකම් ඉතා මද බව පෙනී යයි.

(ii) **නවජ සුති (වැදුම්ගෙයි) පිටගැස්ම.**—නවජ සුති (හෙවත් වැදුම් ගෙයි) පිටගැස්ම පැනනැඟීම රෝහල් දෙකක සිදුවී ඇත. එනම්, වතුපිටිවෙල රෝහල සහ කුරුණෑගල මහ රෝහල වෙයි.

වතුපිටිවෙල රෝහල.—64.5.7 සිට 64.5.13 දක්වා වකවානුවේ දී මේ රෝහලට ඇතුළත් කරන ලද නවජ සුති (වැදුම් ගෙයි) පිටගැස්ම රෝගීන් 6 දෙනෙක් වූහ. මේ රෝගීන් සියලු දෙනාමැ, 64.5.1 සිට 64.5.8 දක්වා වකවානුවේ දී මේ ආයතනයේ මැ මෙලොවැ එළිය දුටු අය යැ. රෝහලේ දී මැ රෝගයට ලක්වූ එක් අයෙකු හැර අනෙක් සියලු දෙනා මැ රෝහලෙන් පිට වීමෙන් පසු රෝගයට ලක් වී සිටියෝ වූහ. එකී කාලය තුළ ප්‍රසූත කරන ලද දරුවන් 30 ක ගෙනි මේ රෝගීන් 6 දෙනා. සියලු බිළිඳුන්ට පොදුවූ එක මැ අවධිය නම් තිඹිරි ගෙයි සහ පශ්චාත්-ප්‍රසව වාට්ටුවේ බිළිඳුන් වෙලීමේ තැන යි.

සාකවේදඥ තැන සමඟින් රෝහලට බැලීමට ගොස්, තිඹිරි ගෙයි ද පශ්චාත්-ප්‍රසූති වාට්ටුවේ ද කිහිප පොළකින් වැඩීම සඳහා මාත්තු ගන්නා ලදී. ක්ලොස්ට්‍රිඩියම් ටෙටනයි නම් විෂානුව මාත්තු කිහිපයකින් වෙන් කැර ගන්නා ලදී. කවුළු අතරින් පිට වායුව නිදහසේ ගලා ඒමට අවසර තිබූ හෙයින් වෙලීමට ගන්නා ඇඳ සහ කිළිය කෙළෙසී තිබුනු බැව් පෙනී ගියේ යැ.

කුරුණෑගල රෝහල.—1964 මැයි 24 වන දා සිට මැයි 28 වන දා දක්වා කාලයේ දී කුරුණෑගල රෝහලේ මාතෘ වාට්ටුවේ වැදුම් ගෙයි පිටගැස්ම හය දෙනෙකුට වැළඳුණි. මේ අයට රෝගය වැළඳීම තුන් දිනක තරම් කෙටි කාලයක් ඇතුළත සිදුවූ හෙයින්, එකී කාලය තුළ තිබිරිගෙයි දී ඉවු කළ විෂ මැකීමේ පිළිවෙලේ යම් පලුද්දක් නිසා මේ ආපදා සිදුවන්නට ඇතැ යි අනුමාන කරන ලදී.

වසංගතවේද, සාකවේද සෝදිසි කරන ලද නමුත් බෝවීමට මූල දැන ගන්නට නොලැබිණ.

(iii) **පිටගැස්ම.**—පසුගිය අවුරුදුවල නැවැතී ප්‍රතිකාර ගත් රෝගීන් අනුව, රජයේ රෝහල්වලදී අවුරුදුපතා රෝගීන් දහස් දෙනෙක් පමණ ප්‍රතිකාර ලබති. සපයන ලද තොරතුරු අනුව වසංගත වේද මූළුව විසින් රෝගයේ වසංගතවේදය පිළිබඳ තතු-සෝදිසියක් මෙහෙයවනු ලැබේ. මේ වනවිට පෝම් 230 ක් පමණ ලැබී ඇත.

1961 දී මියගිය තරම පිළිබඳ ලද හැකි තොරතුරු සෞ. සේ. අධිකාරි කොට්ඨාශ අනුව විග්‍රහ කැර බලන කල, ඒ ඒ කොට්ඨාශ අතර මරණ ගණනේ කැපී පෙනෙන වෙනසක් නොවේ. මරණ ගණන ඉහළින් ම තිබුණේ 100,000 කට 5.7 ක් දක්වූ කොළඹ, 5.6ක් වූ යාපනේ, 4.8 ක්වූ කළුතර යන සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශ වල යි. අඩුම ගණන දක්නට ලැබුණේ 1.4ක්වූ කෑගල්ලේ කොට්ඨාශයේ ය. 1961 දී පිටගැස්මෙන් සිදුවූ මරණ 462 න් සියයට 16.8 ක් වයස අවුරුදු එකට බාල ළදරුවන් අතරේ වූ වැදුම්ගෙයි පිටගැස්ම යැ යි සිතිය හැක.

16. **විශේෂ හදාරු සහ සමීක්ෂුම්**

(1) දියවැඩියා සමීක්ෂු

(2) රෝගාතුර තරම පිළිබඳ සමීක්ෂු.

(1) දියවැඩියා සමීක්ෂුම් මතු කියැවෙන තැන්හිදී කරන ලදී:—

(අ) **මහ ලේකම් පායේ.**—ලිපිකාර සහ සුළු සේවක පිරිස් අතරේ දියවැඩියා සහ ලේ තෙරපුම් (රුධිර පීඩන) සමීක්ෂුවක් වූ මෙය සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් ම පටන් ගැනිණි. සතියකට වරක් පිරික්සීම කරන ලදී. සේවක-පිරිස දක්වූ උනන්දුව අල්පය. මෙබඳු රැකියා කරන අය අතරේ දියවැඩියාව තිබෙන ප්‍රමාණය, කලින් බලන ලද කය වෙහෙසා වැඩ කරන කම්කරුවන් අතරේ තිබුණාට වඩා ඉහළ බව පෙනී ගියේය. සමීක්ෂුව තාවකාලික ලෙස අත්හිටුවා ඇත දැනට.

(ආ) මොරටුවැ සෞ. වෛ. නි. වසම තුළ අතරින් පතර තෝරා ගත් ජනයා අතරේ ද සමීක්ෂුවක් අරඹන ලදී. එය කරනු ලබන්නේ ම. සෞ. පරීක්ෂකයින් ද මහජන සෞඛ්‍ය හෙදියන් ද විසිනි.

(ඉ) කොච්චිකඩේ සෞ. වෛ. නි. පියසේ මුළු පෙදෙසම ඇතුළත් වන සෝඑහි සමීක්ෂුවක් කරවන ලදී. එය විත්තඹුවන් විසින් මෙහෙය වන ලදී. පාත්‍ර වර්ගයා ඇතුළත් රාමුව ඡන්දදායක ලැයිස්තුව අනුසාරයෙන් සපයා ගැනීමෙන් එක් විත්තඹුවකට 60-75 දෙනා පමණ ලැබුණි. ග්ලූකෝස් උදෙසා වඩා නිශ්චිත පිරික්සුමක් (එනම් ශාය-පිරික්සුම් කරදහි) යෙදීමෙන් රෝගීන් විදහා ගත් අතර, ශාය-පිරික්සුම් පෙති

යොදා අනතුරු වැ සෞ. වෛ. නිලධාරියා විසින් තහවුරු කරන ලදී. පිරික්සුම් දහසකට වැඩියෙන් කැරැ, රෝගීන් 15 දෙනෙක් සොයා ගෙනැ ඇත.

(ඊ) ගැබිනි මව්වරුන්ගේ මුත්‍රා පරික්සනු සඳහා මොරටුව, කෝට්ටේ යන දෙපොලේ ගැබිනි චිකිත්සාගාර දෙකක සමික්සුමක් කරවන ලදී. සමික්සුව තව මැ කැරී ගෙනැ යයි.

(ii) **රෝගාතුර තරම පිළිබඳ සමික්සුව**

හොරපෙ.—හොරපේ පටන් ගන්නා ලද රෝගාතුර තරම මැනීමේ සමික්සුව පැවතුණි. එහෙත්, මහජන සෞඛ්‍ය හෙදිය ඉල්ලා අස්වීම, ස්ථාන මාරු, ම.සෞ. පරීක්ෂක විශ්‍රාම ගැනීම යන හේතු නිසා මේ වැඩ කටයුතු අවහිර වී යැ.

(iii) **කොච්චිකඩේ.**—කොච්චිකඩේ සෞ. වෛ. නි. පියස තුළැ ද මෙබඳු හදාරුව කට මුල පුරන ලදී. ම. සෞ. පරීක්ෂකයින් පස් දෙනෙකු තෝරා ඒ එක් එක් අයට ගෙවල් 25 ක වැසියන් පිරිසක් ගැනැ සෙවීමට පවරන ලදී.

(4) යට කී දෙයට අමතර වැ, ජ.සෞ.සං. වසංගතවේදඥ තැනගේ පිටවහල ඇති වැ විෂානුබැඳි නිධිකර්පරදාහය නම් ගැටළුව පිළිබඳ විශේෂ හදාරුවක් ඇරඹුණි. කරවන ලද අනෙකුත් හදාරු නම්—

(1) පිටගැස්මේ වසංගතවේදය

(2) බෝවෙනසුලු යකෘත්දාහයේ වසංගතවේදය වෙයි.

17. ජාත්‍යන්තර නිරෝධානය

(අ) **පොදුවේ—**

(i) නීති විරෝධි ලෙස එන නොරටුන් නම් ගැටළුව, නිරෝධායන රීති බලගැන්වීමෙහි ලා අසීරුකම් දිගට මැ ඇති කළේ යැ.

(ii) මාලදිවයින්වලින් පැමිණෙන අය සමඟ මැලේරියාව මෙහි වැදීම නොවුපල සෞඛ්‍ය නිලධාරීන්ගේ සැලකිල්ල යොමුවූ තවත් මහජන සෞඛ්‍ය ආපදාවක් ලෙස දිගට මැ රැදී තිබුණි.

(iii) දකුණු ඉන්දියාවේ නිරෝධායන කඳවුර මේ අවුරුද්දේදීත් සාත්තුව සහ රැකවරණය දීමේ පදනමකින් බලා ගන්නා ලදී. ඉන්දියාවේ සිටින ලංකා මහ කොමසාරිස් තුමා විසින් ඉන්දීය රජය සමඟ නිල සාකච්ඡාවේ යෙදුනු නමුත් අප දේපළ ඉන්දීය රජයට පැවරීම ගැනැ අවසාන තීරණයකට නොඑළඹියේය. පවත්වා ගැනීමේ වියදම කපා හැරීම උදෙසා කඳවුරේ යෙදී සිටි සේවක පිරිස තවදුරටත් අඩු කරන ලදී.

(iv) විපිළිසරයේ තබන ලද නැවියන් හා මඟීන් හා අතරේ නිරෝධ්‍ය කටයුතු රෝග කිසිත් නො දක්නා ලදී.

(v) විපිළිසරය පැහැර හරින ගණන නම් එන්න එන්න අඩු වී යයි.

(vi) හොරෙන් මෙහි ආ නොරටුන් 3,900 දෙනෙක් සිර අඩස්සියට ගන්නා ලදහ. ගිය අවුරුද්දේ සිර අඩස්සියට ගත් ගණනට වඩා මෙය සියයට 20 කින් වැඩි වෙයි.

(vii) කොළඹ තොටෙහිත් ඒ අවටත් සනීපාරක්ෂා සංවිධානය සතුටුදයක්වියෙන් තොර වියැ. මෙය තොටමුණේ සෞඛ්‍ය කටයුතු පිළිබඳ වැදගත් අත්තක් වනුයේ, විශේෂයෙන් මැ තොටමුණ පියසේ රක්තාපානි උණ බීජ භාරකයින් නිදැල්ලේ හැසිරෙන හෙයිනි.

(ආ) වැඩ කටයුතු

කොළඹ තොටමුන—නැව් ගමන.

නැව් 2,754 කට තොටමුණු අවසරපත් දෙන ලදී. මෙයින් 1,821 ක් තෙලෙන් දුවන ඒවා ද 933ක් රුවල් නැව් සහ වෙනත් යාත්‍රා ද වී යැ. නාවික සහ වෙනත් මගින් නැව් 85 කට ගුවන් විදුලියෙන් අවසර දෙවුණි. මගින් 8,061 දෙනෙක් විපිළිසරය යටතේ රඳවන ලද්දාහ.

මෙයින් 1,615 දෙනෙක් නියමිත දිනැ පෙනී සිටීමට අපොහොසත් වූහ. නීතියට පිටු පෑ මගින් වෙත පැනවූ රජසතු කිරීම්වලින් රු. 439.50 ක් ලැබුණි. මේ මගින් අතර නිරෝධ්‍ය කටයුතු රෝග කිසිවක් දක්නට නො වී යැ.

වසූරියෙන් වැළැකීමට 8,850 ක්ද, කොලොරාවෙන් වැළැකීමට 11,571 ක්ද, ටී. ඒ. බී යෙන් වැළැකීමට 133 ක්ද, කහ උණෙන් වැළැකීමට 807 ක්ද යනුවෙන් එන්නත්කම් කරන ලදී. එකතුවූ ආදායම රු. 48,552.75 ක් විය. කිළුටු රෙදිවල විෂ බීජ වද කිරීම සඳහා අය කළ ගාස්තු රු. 4,339.00 ක් වීයැ. මිනිස් බොදුනට නුසුදුසු වූ නැව් බඩු අතර තොටමුණේ ආහාර සහ ඖෂධ පරීක්‍ෂක තැන විසින් හෝ රේගු නිලධාරීන් විසින් හෝ හෙළා දක්නා ලදී. හෙළා දක්නා ලද ආහාර වර්ග බැහැරලීම නිසි පරිදි සොයා බැලීම තොටමුණු සෞඛ්‍ය නිලධාරීන් වෙත පැවරිය යුත්තකැයි මම සලකමි.

දිය බෝට්ටු පිරික්සීම් 62 ක් වී යැ. තෙමස් සහතික නිකුත් කිරීමෙන් රු. 78ක ආදායමක් ලැබුණි. දැනට යෙදෙන දිය පඩවු යල් පැනපු, පිරිමැස්මදායක ලෙස පිරියම් කළ නොහැකි ඒවා යැ. ඒවා වෙනුවට අලුත් පඩවු යෙදීම වරාය සංයුක්ත මණ්ඩලයේ සැලකිල්ලට භාජන වියැ යුතුයි. නගරයේ සූක්ෂම ජීවවේදඥ තැන මේ පඩවුවලින් ගත් දිය පැලුම් පිරික්සූ අතර, එය මිනිස් බොදුනුව සඳහා යෝග්‍ය බව පිරික්පම්වලින් හෙළි වී යැ. පෝර ගුදම එය දැනට තිබෙන තැනින් ඉවත් කිරීමට වරාය සංයුක්ත මණ්ඩලය කිසිවක් නොකළ හැඩයි. තොටමුණේ නිසි සනීපාරක්ෂාව තබා ගැනීමට නම් මේ අතින් වහා ක්‍රියා කිරීම අවශ්‍යයි.

මීයන් මර්දනය කිරීමේ කටයුතු වරාය කොමිසමේ මහජන සෞඛ්‍ය පරීක්‍ෂකයා විසින් කරන ලදී. අවුරුද්ද තුළැ දී මහාමාරියා රැගත් මීයන් එකෙකු ද නොදක්නා ලදී. නගරයේ සූක්ෂම ජීවවේදඥ විසින් දිනපතා කරන ලද මී පිරික්සුම්වලින්, කොළඹ නගරය මහාමාරියෙන් තොර බව හෙළි වී යැ. මීයන්ගෙන් තොර බවට සහතික නිකුත් කිරීම සඳහා නැව් යාත්‍රා පිරික්සීම, තොටමුණේ සෞඛ්‍ය නිලධාරියා යටතේ ධූමායන සේවක පිරිස විසින් ඉටු කරන ලදී. මහාමාරිය පිළිබඳ සාක කටයුතු සියලු නැව්වලට දුම් ගසන ලදී. චීනයේ වරායවලින් සහල් පටවන ලද නැව් නිරෝගී තත්ත්වයේ තිබී, ගමනේ දී අමුතු අන්දමකින් මීයන් මියයාමක් නො වී නම්, බඩු බෑමට පෙර දුම් ගැසීමේ නියමයෙන් ඒ සියලු නැව් නිදහස් කරන ලදී. කුඩා රුවල් නැව් සහ බත්තල් [illegible] දුගම් යොදා දුම් ගැසීම දිගට මැ කරන ලදී.

නැව් 56 ක සහල් මලු 45,13,850 කට හා වෙනත් වෙළඳ බඩු මලු 1,10,125 කට හා දුම් ගසන ලදී. මීට අමතරවැ බත්තල්වලැ තිබූ සහල් මලු 1,46,864 කට ද වෙනත් වෙළෙඳ බඩු මලු 5,91,883 කට ද කපු පොදි 90 කට ද දුම් ගසන ලදී. එච්. සී. එන්. රාත්තල් 5,492 ක් දුම්ගැසීම සඳහා යොදා ගන්නා ලදී. දුම් ගැසීමෙන් ලත් ආදායම රු. 2,06,980.13 කි.

තොටමුණේ සෞඛ්‍ය කටයුතු, දුම් ගැසීම සහ විෂබීජ පහ කිරීම පිළිබඳ කැරු පෙන්වන දෙසුම් පශ්චාත්-උපාධි වෛද්‍ය නිලධාරීන් ද, වෛද්‍ය ශිෂ්‍ය ශිෂ්‍යාවන් ද මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් ද උදෙසා පවත්වන ලදී.

තොටමුණු පෙදෙසේ සනීපාරක්ෂාව නිසි තනි බලධාරියෙකු යටතට නොගෙනැ ඇත. භාවිතා වෙන පිළිවෙළ නම් සතුටුදායකත්වයෙන් තොරයැ. අවුරුද්ද තුළැ දී

ඊඩිස් සමීක්ෂණයක් පවත්වන ලදී. මේ සඳහා වරාය පෙදෙස කට්ටි 26 කට බෙදුණි. 12 වටයක දී ස්ථාන 3,497 ක් පිරික්සන ලද අතර ස්ථාන 294 ක මදුරුවන් ගැවසෙන බව පෙනී ගියේය. මදුරුවන් ගැවසෙන ස්ථානවලින් ලබාගත් මදුරුවන් වර්ගී කිරීමේ දී ඔවුන් මතු පෙනෙන කුල-ගෝත්‍රවලට අයත් බව දක්නා ලදී:—

කුල-ගෝත්‍ර වර්ගය		එකතු කළ ගණන		සියයට ගණන
ඊ (එස්) ඊජිප්තායි ...	...	390	...	39.2
ඊ (එස්) ඇල්බොපික්ටස්	...	12	...	1.2
සී. පැටිගන්ස් ...	...	585	...	58.9
වෙනත් වර්ග ...	...	5	...	0.6

පිරික්සන ලද බෝවෙන තැන්වලින් පිළවුන් 2,735 ක මුළු ගණනක් එකතු කරන ලද අතර, ඔවුන් මතු සඳහන් කුල-ගෝත්‍ර අනුව බෙදී යෙයි:—

කුල-ගෝත්‍ර වර්ගය		එකතු කළ ගණන		සියයට ගණන
ඊ (එස්) ඊජිප්තායි ...	...	874	...	31.8
ඊ (එස්) ඇල්බොපික්ටස්	...	400	...	14.6
සී. පැටිගන්ස් ...	...	1414	...	51.8
වෙනත් වර්ග ...	...	47	...	1.8

ඊ (එස්) ඊජිප්තයි :—ටයර්, යන්ත්‍ර කොටස්, පීප්ප, බෝට්ටු, සිමෙන්ති වළවල්.

ඊ (එස්) ඇල්බොපික්ටස්—ටයර්, බෙලෙක්ක, පීප්ප.

සී. පැටිගන්ස්—බෝට්ටු, කාණු, සිමෙන්ති වළවල්, මැටි බඳුන්, යන්ත්‍ර කොටස්, යකඩ කඳන්, පීප්ප.

වරායේ තිබුණු යාත්‍රා 353 ක් වට 12 කින් පිරික්සන ලදී. එයින් 50 ක් සහගැති වී යැ. එයින් එකතු කළ මදුරුවන් 257 මතු සඳහන් කුල-ගෝත්‍ර අනුව බෙදේ :—

කුල-ගෝත්‍ර වර්ගය		එකතු කළ ගණන		සියයට ගණන
ඊ (එස්) ඊජිප්තායි ...	...	183	...	71·2
ඊ (එස්) ඇල්බොපික්ටස්	...	1	...	0.4
සී. පැටිගන්ස් ...	...	73	...	28.4

යාත්‍රාවලැ බෝවෙන තැන් 569 ක් පිරික්සන ලදින් පිළවුන් සිටි තැන් 24 කින් එකතු කළ පිළවුන් මතු සඳහන් කුල-ගෝත්‍ර අනුවැ බෙදේ :—

කුල-ගෝත්‍ර වර්ගය		එකතුකළ ගණන		සියයට ගණන
ඊ (එස්) ඊජිප්තායි ...	...	177	...	59.1
ඊ (එස්) ඇල්බොපික්ටස්	...	7	...	3.5
සී. පැටිගන්ස් ...	...	73	...	36.9
වෙනත් වර්ග ...	...	1	...	0.5

(ii) **සෙසු තොටමුණු.** ගාල්ල, ත්‍රිකුණාමලය, යාපනේ, කයිට්ස් යන තොටමුණුවලැදී නැව් 563 කට තොටමුණු අවසර පත් දෙන ලදී. වෙනත් කුඩා තොටමුණුවලදී කුඩා යාත්‍රාවලට ද තොටමුණු අවසරය දෙන ලදී. ත්‍රිකුණාමලය වරායට එන නැව් ගණන වැඩි වූ බවක් ද දක්නා ලදී. ගමන් යාත්‍රාවක් නොමැති නිසා එහි තොටමුණු සෞඛ්‍ය නිලධාරියාගේ වැඩ කටයුතු අවහිරවී යැ.

(iii) **තලේමන්නාරම නිරෝධායන රෝහල සහ කඳවුර.** මේ තැනින් රටින් පිටවන සියලු මැ මගීහු, ඔවුන්ගේ සෞඛ්‍ය සහතිකවලැ යථා තත්ත්වය විමසනු පිණිසැ පිරික්සන ලදහ. වලංගු සහතික නො ලබා සිටි අයට එතෙරවීමට අවසර දීමට පෙරැ ප්‍රතිශක්ති ගන්වන ලදී. එන මගීහු ද එසේ මැ පිරික්සන ලදහ. වලංගු සහතික නො

දූරු අය ප්‍රතිශක්ති ගත්වා නිරෝධායන රෝහලේ රඳවන ලදහ. අවුරුද්ද තුළ දී මගින් 35,734 දෙනෙක් ඉන්දියාවට ගියහ. මෙහි ආ ගණන 23,417 කි. ප්‍රතිශක්තිය දීමේ ගාස්තු හැටියට රු. 13,151.25 ක් ලැබුණි.

සෑහෙන පමණ දිය නොසැපයීම හේතුවෙන් බොයිලේරු වැඩ නොකළ හෙයින්, කොළඹ වරායේ නැව් ඇල්ලීමට මෙතැනින් ගමන් ගත් නැව්වලට නැවියන්ගේ බඩු බාහිරාදියට දුම් ගැසිය නොහැකි විය. තොටමුණ තුළ ස්ථාන 20 ක් ද පිරියත් පෙදෙසේ ස්ථාන 49 ක් ද දෙසතියකට වරක් බැගින් නිතිපතා පිරික්සන ලදී. පිරිස්සුම් වට 24 පිළිබඳ ප්‍රතිඵල මෙසේ දැක්වෙයි :—

වැඩිහිටි	ගුවන් තොටමුණ	සියයට ගණන	පිරියත් පෙදෙස	සියයට ගණන
පිරික්සූ ස්ථාන ගණන	414	—	997	—
ඒ (එස්) ඊජිප්තායි සහගැති ගණන	—	—	—	—
ඒ (එස්) ඇල්බොපික්ටස් සහගැති ගණන	2	—	5	1.1
කියුලින්වලට සහගැති ගණන	65	15.5	332	33.3
එරියොප් සහගැති ගණන	—	—	—	—
පිළවුන්				
පිරික්සූ ස්ථාන ගණන	480	—	1,155	—
ඒ (එස්) ඊජිප්තායි සහගැති ගණන	1	0.2	8	0.7
ඒ (එස්) ඇල්බොපික්ටස් සහගැති ගණන	21	4.4	97	8.4
කියුලිසීන්ස්වලට සහගැති ගණන	40	8.3	119	10.3
එරියොප් සහගැති ගණන	1	.2	—	—

ගුවන් යානා 340 කට තොටමුණු අවසරය දෙන ලදී. මගින් 8,910 දෙනෙක් මෙහි ආ අතර පිට වී ගිය ගණන 9,125 කි. කටුනායක ගුවන් තොටමුණේ සනීපාරක්ෂා පහසුකම්, දිය සැපයුම්, කසළ බැහැරලීම් සතුටුදායක වී යැ. ඊඩස් ඊජිප්තයි සමීක්සුම කර වන ලදී. එහි ප්‍රතිඵල මෙසේ වෙයි :—

වැඩිහිටි	ගුවන් තොටමුණ	සියයට ගණන	පිරියත් පෙදෙස	සියයට ගණන
පිරික්සූ ස්ථාන ගණන	108	—	226	—
ඒ (එස්) ඊජිප්තායි සහගැති ගණන	—	—	—	—
ඒ (එස්) ඇල්බොපික්ටස් සහගැති ගණන	—	—	—	—
කියුලිසීන්ස් සහගැති ගණන	—	—	46	20.4
ඒරියොප් සහගැති ගණන	—	—	—	—
පිළවුන්				
පිරික්සූ ස්ථාන ගණන	312	—	1,188	—
ඒ (එස්) ඊජිප්තායි සහගැති ගණන	—	—	1	0.08
ඒ (එස්) ඇල්බොපික්ටස් සහගැති ගණන	1	0.3	36	3.0
කියුලිසීන්ස් සහගැති ගණන	14	4.8	94	7.9
එරියොප් සහගැති ගණන	—	—	—	—

ගොඩ බසින මගින් 12,535 දෙනෙකු හා මෙරටැ ඔස්සේ අන් රටක් බලා යන මගීන් 16,437 දෙනෙකු හා සිටි ගුවන් යානා 758 කට තොටමුණු අවසරය දෙන ලදී. කංකසන්තුරය—සතුටුදායක ලෙස පැවතුණි.

18. **මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය සේවා.**—සතුන් හා මිනිසුන් හා අතර සියයට 75 ක් තරම පිස්සු බලු රෝගය පවත්නා බටහිර පළාතේ බල්ලන්ට ප්‍රතිශක්තිය දෙනු සඳහා, 39 මාසයකට ප්‍රතිශක්තිය රඳා තබන වඩා බලගතු පිස්සු බලු රෝග

එන්නත් වඩි 50,000 ක් ගෙන්වීමට ඉල්ලුම් පත් යැවීමෙන්, රටේ පිස්සු බලු රෝගය මුලිනුපුටා දමනු පිණිස ක්‍රියා කොට තිබුණි. සහමුලින් වඳකිරීමේ ක්‍රමය අවුරුද්ද අගැ දී පටන් ගැනීමට බලාපොරොත්තු වෙමු.

වෛද්‍ය පර්යේෂණායතනය පිස්සු බලු රෝගය සොයනු වස් හිස්-මොළ 1,002ක් පිරික්සුවාය. එයින් 669 ක් සහගැති වී ය. 205 ක් නොගැති වී ය ; 128 ක් පිරික් සීමට තරම් සුදුසු තත්ත්වයක නො වීය. විස්තර මතු දැක්වේ. එළුවන්, බළලුන්, දෙනුන්, වඳුරන් වැනි වෙනත් සතුන් ද මීට ගොදුරු වූ බව දක්නට තිබේ.

පිස්සු බලු රෝගය බැලීමට පිරික්සන ලද බල්ලන්ගේ සහ වෙනත් සතුන්ගේ හිස්-මොළ

පළාත	සහගැති	නොගැති	නුසුදුසු	එකතුව
(බටහිර පළාත හැර) කොළඹ මහ නගර සභා සීමාව (කොළඹ මහ නගර සභා සීමාව හැර)	134අ	64	2	200
බටහිර පළාත	366ආ	90	53	509
මැද පළාත	79ඉ	32	23	134
සබරගමු පළාත	17ඊ	2	3	22
ඌව පළාත	25	2	8	35
උතුරු පළාත	1	4	7	12
උතුරු මැද පළාත	2	1	5	8
වයඹ පළාත	23	3	9	35
දකුණු පළාත	19උ	6	17	42
නැගෙනහිර පළාත	3	1	1	5
	669	205	128	(x)1,002

ලකුණු විස්තර

(X) ජීවවේද පිරික්සුම් 346ක ප්‍රතිඵල මීට අයත් වේ. සහගැති වූ ගණන 147කි.

අ. එළුවන් එකෙක්, බළලුන් 6ක්, දෙනුන් 2ක්, වඳුරන් එකෙක් ද මීට ඇතුළත් ය.

ආ. බළලුන් 8 ක්, වඳුරන් 3 ක්, හෝතඹුවන් 1 ක්, වසු පැටවුන් 2 ක් ද මීට ඇතුළත් ය.

ඉ. දෙනෙක් ද මීට ඇතුළත් ය.

ඊ. බළලෙක් ද මීට ඇතුළත් ය.

උ. බළලෙක් සහ එළුවෙක් ද ඇතුළත් ය.

අවුරුද්ද තුළ දී පිස්සු බලු රෝගය නො සෑදීමට බල්ලන් 12,788 ක් එන්නත් ගන් වන ලද අතර, 9,348ක් වනසන ලදහ. අවදානමට මුහුණ පෑ අය 3,419 දෙනෙක් පිස්සු බලු රෝග චිකිත්සාගාරවල දී ප්‍රතිකාර ලදහ.

මතු දැක්වෙන චක්‍ර සටහන ඒ ඒ සෞ. සේ. අධිකාරි කොට්ඨාස අනුව ගණින් පෙන්වයි. ලද හැකි ගණන් අනුව ඉහළ මැ ගණනක් පුද්ගලයින් ප්‍රතිකාර ලබා ඇත්තේ මාතලේ, බදුල්ල, ගාල්ල යන කොට්ඨාශවලින් ය.

චක්‍ර සටහන

පිස්සු බල්ලු රෝගයේ තරම සහ සෞ. සේ. අධිකාරීන් හා කොළඹ මහ නගර සභා බලධාරීන් හා විසින් සිය සිය පෙදෙසේ තුළ අවුරුද්දේ දී ගන්නා ලද පියවර

සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය	වනසන ලද බල්ලන්	එන්නත් කරන ලද බල්ලන්	ප්‍රතිකාර ලද ජනයා
අනුරාධපුර	538	47	7
බදුල්ල	690	1,827	597
මඩකලපුව	294	119	155
කොළඹ	178	1,457	175
ගාල්ල	149	13	479
යාපනය	424	372	51
කලුතර	27	270	152
මහනුවර	478	220	385
කෑගල්ල	504	586	64
කුරුණෑගල	214	298	29
මාතර	530	1,135	441
මාතලේ	160	140	782
පුත්තලම	214	93	90
රත්නපුර	58	1,041	11
වවුනියා	908	—	1
කොළඹ මහ නගර සභාව	3,982	5,170	—
	9,348	12,788	3,419

19. **සේවා-සන්ත පුහුණු කිරීම්.**—ජ්‍යෙෂ්ඨ මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් 27 දෙනෙක් උදෙසා, මස් පිරික්සීමේ ප්‍රමේය යෑ ප්‍රායෝගික යෑ යන දෙ අතින් මැ සති හයක අභ්‍යාස පාඨ මාර්ගයක් පවත්වන ලදී. මස් පිරික්සීමේ හැම අතකින් මැ පුහුණු ගැත්තන් ඉතා ඉහළ ප්‍රවීණත්වයක් ලැබූ බව සති හය කෙළවර පවත්වන ලද සෝදිසියේ දී පෙනී ගියේ යෑ.

20. **කලුතර ම. සෞ. ප. ශිෂ්‍යයින්.**—කලුතර සෞඛ්‍ය මුළුවේ ඉගැනීමේ යෙදී සිටි ම. සෞ. ප. ශිෂ්‍යයින්ට මස් පිරික්සීම පිළිබඳ පාදක අභ්‍යාස පාඨ මාර්ගයක් ලබා දෙන ලදී. ඒ පාඨ මාර්ග කට්ටි දෙකකට බෙදා මෙහෙයවන ලද්දකි.

සෞ. වෛ. නිලධාරීන් පුහුණු කරවීමේ පාඨ මාර්ග—සංස්කරණ පාඨ මාර්ග හැදෑරීමේ යෙදී සිටි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් දෙ කට්ටියකට සත්ව රෝග පිළිබඳ දෙසුම් දෙසන ලදී.

VI වන පරිච්ඡේදය

විශේෂ සේවා

(අ) ක්‍ෂයරෝග මර්දනය

ක්ෂය රෝගය තවමත් මහජන සෞඛ්‍යයට අදාළ ප්‍රබල ගැටළුවකි. ක්ෂය රෝග මර්දන විධි-විධාන තර කිරීමත්, එය සියලු පෙදෙස් ඇතුළත් වන සේ දිවයින පුරා විහිදුවීම ත් අවශ්‍ය වෙයි.

පසුගිය දස අවුරුද්ද මුළුල්ලේ මේ ව්‍යාපාරයේ සුක්කානම මෙහෙයවමින් සිටියා වූ ද, තම මෙහෙයවීම යටතේ ඉමහත් දියුණුවක් ගෙනැ දුන්නා වූ ද වෛද්‍යාචාර්ය ජේ. ආර්. විල්සන් මහතා, කොලොඹ මහ රෝහලේ කාර්‍ය මණ්ඩලයට බැඳීම සඳහා 64.9.1 වනදා සිය රාජකාරි අත්හළේ යෑ. ඔහු වෙනුවට වැඩ බලන නියාවෙන් ඒ ධුරය දැරීමට වෛද්‍යාචාර්ය එස්. නඩරාජා මහතා පත් කරනු ලැබී යෑ.

අප දැන් එබී බලන අවුරුද්ද තුළ දී, තුන් අවුරුදු බී. සී. ජී. වැඩ සටහන සඵල ලෙස නිමාවට පත් වූ අතර, දෙ වන තුන් අවුරුදු සැලැස්ම ද පටන් ගැනිණි. ද සොයිසා ගැහැණු රෝහලේ ද කාසල් වීදි ගැහැණු රෝහලේ ද අලුතෙන් උපදින දරුවන්ට බී.සී.ජී. එන්නත දීමේ වැඩ පිළිවෙල දිගට මැ පවත්වා ගෙන ගිය අතර, 1964-65 වර්ෂය තුළ දී එය දිවයිනේ අනෙකුත් ලොකු රෝහලවිලට ද විහිදුවීමට අදහස් කරනු ලැබේ. පෙර-පාසල් වයසේ ළමුන්ට එන්නත් දීමේ වැඩ පිළිවෙල ද ඉක්මනින් පටන් ගනු ඇත.

සියලු පාසල්වලට අයත් ගුරුවරුන් තුන් අවුරුද්දකට වරක් විනිවිද සේයා රූ මගින් පරීක්ෂා කිරීම මේ අවුරුද්දේ දී පටන් ගනු ලැබ, එය සතුටුදායක ලෙස කෙරී ගෙනැ යයි. ක්ෂය රෝගය මර්දනය කිරීමේ නියමු අරමුණක් 1965 දී කුලියාපිටිය වසමෙහි පටන් ගැනීමට ත් එය සෑහෙන කාලයක් ඇතුළත දිවයින පුරා මැ විහිදුවා හැරීමටත් අදහස් කරනු ලැබේ. මේ අරමුණ එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා හදිසි ආපදා අරමුදලේ ත් ජගත් සෞඛ්‍ය සංවිධානයේ ත් උදවු ඇති වැ මෙහෙය වීමට යි අදහස.

1. **රෝගාතුර තරම.** 1962-63 අවුරුද්දේ දී ක්ෂය රෝග මර්ධන ව්‍යාපාරිය අධිකාරී වෙත ලැබුණු දැනුම් දීම් ගණන 9,339 ක් වෙතත් 63-64 වර්ෂයට ලැබුණු ගණන නම්, 8,834ක් පමණි. මෙයින් 4,657 ක් ආයේ ලය චිකිත්සාගාරවලින් හා ශාඛා ලය චිකිත්සාගාරවලින් හා යැ.

මේ කාලය තුළ දී මධ්‍යම ක්ෂය රෝග ලේකම් පොතෙහි නම ලියැවුණු රෝගීන් මුළු ගණන 7,791කි. මෙයින් 6,684 දෙනෙක් පුප්ඵුසීය ක්‍ෂය රෝග කාරියන් ද, 1,107 දෙ නෙක් වෙනත් ක්ෂය රෝගකාරයින් ද වූහ.

එක් එක් සෞ.සේ.අධි. කොට්ඨාශයෙන් සොයාගත් රෝගීන් ගණන මෙ සේ වෙයි :—

කොළඹ	1,993	ගාල්ල	352	මඩකළපුව	205
කළුතර	559	මාතර	431	කුරුණෑගල	405
මහනුවර	530	යාපනේ	454	පුත්තලම	206
මාතලේ	100	වවුනියාව	50	රත්නපුරය	409
බදුල්ල	207	අනුරාධපුර	300	කෑගල්ල	263

1963–64 දී රෝගාතුර තරම XXVII සටහනෙන් දක්වේ

රෝගීන් සෙවීමේ පහසු කම් ඇතැම් පෙදෙස්වලැ තව මැ විරල යැ. නිලධාරී මණ්ඩලය මදි-පාඩු හෙයින් බදුල්ල, මඩකලපුව, අනුරාධපුර, කලුතර යන තැන්වලැ චිකිත්සාගාර සම්පූර්ණතාවය දක්වා ක්‍රියා නො කරයි. විනිවිද සේයා රූ යන්ත්‍ර නොබෝ කලකින් බදුල්ලේ සහ මඩකලපුවේ පිහිටුවනු ඇත. ත්‍රිකුණාමලය, වවුනියාව, කල්මුනේ යන තැන්වලට මධ්‍යම චිකිත්සාගාර අවශ්‍ය වේ. කොළොඹ සෞ. සේ. අධිකාරි වසම තුළින් සොයාගත් රෝගීන් 1,993 දෙනෙකු ගෙන් 1,238 දෙනෙක් කොළඹ මහ නගර සභා සීමාවෙන් වූහ. මහ නගර සභා ඇති නගර තුනෙන් සොයා ගත් රෝගීන් මෙ සේ යි :

කොළඹ මහ නගර සභාව	...	1,238
මහනුවර මහ නගර සභාව	...	30
ගාලු මහ නගර සභාව	...	59

මධ්‍යම ක්ෂය රෝග ලේකම් පොතෙහි අවුරුද්දෙන් අවුරුද්ද නම ලියැවී, 1964 සැප්තැම්බර 30 වන දා දක්වා රැඳී සිටි රෝගීන් ගණන මෙ සේ යි :—

අවුරුද්ද		ලියැවුණු ගණන	ඉවත් වූ ගණන	64.9.30 වන දට රැඳී සිටි ගණන
1958	... ...	9,369	833	8,536
1959	... ...	8,321	730	7,591
1960	... ...	10,519	841	9,678
1961	... ...	8,411	370	8,041
1962	... ...	9,235	804	8,431
1963	... ...	8,135	471	7,664
*1964	... ...	5,349	130	5,219
	එකතුව ...	59,339	4,179	55,160

*1964 සැප්තැම්බර් 30 වනදා දක්වා පමණි.

2. **මරණ ගණන.** 1963-64 වර්ෂය වෙනුවෙන් මරණ ලේකම් තැනගේ වාර වාර්තා ලද හැක්කේ 1964 ජූනි 30 වනදා දක්වා පමණි. ඒ කාලය තුළ ක්ෂය රෝගය නිසා වූ මරණ 903 ක් ලියැවී ඇත. ලය රෝහල්වලින් සහ ලය චිකිත්සාගාරවලින් සැල වූ මරණ ගණන 705කි. xxviii සටහනෙන් වැඩි විස්තර සැපයේ.

3. **රෝහල්.** ක්ෂය රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා 1963-64 වර්ෂය අවසානය වන විටැ තිබූ මුළු ඇඳන් ගණන 3,649 කි. ප්‍රතිකාර ලැබූ රෝගීන් ගණන 13,611කි. එයින් 705 දෙනෙක් මිය ගියහ. නික්මැ ගිය රෝගීන් 9,710 දෙනාගෙන් 6,948 දෙනෙක් හොඳ අතට හැරුණාහ ; 1,803 දෙනෙක් වෛද්‍ය උපදෙස් නො තකා ගියහ. අංගොඩ මානසික රෝහලේ ද, හැඳැලැ ලාදුරු රෝහලේ ද සිටි ක්ෂය රෝගීහු, වැලිසර සහ රාගමැ ලය රෝහල් වලින් ඔවුන් බැලීමට ගිය විශේෂඥයින් අතින් ප්‍රතිකාර ලැබූහ. අංගොඩැ ඇඳන් 153 ක් ද හැඳලැ ඇඳන් 20 ක් ද තිබේ. චිකිත්සාගාරවලින් සහ ශාඛා චිකිත්සාගාරවලින් ප්‍රතිකාර ලැබීමට රෝගීන් වැඩි වැඩියෙන් කැමැති වන හෙයින්, රෝහල්වලැ තද-බදයක් නම් දක්නට නැත.

4. **චිකිත්සාගාර.** මේ අවුරුද්ද තුළැ මධ්‍යම චිකිත්සාගාර 12ක් ද ශාඛා චිකිත්සාගාර 48ක් ද වැඩ කරමින් තිබුණි. මධ්‍යම චිකිත්සාගාර දෙකකට (බදුල්ල සහ මඩකලපුව) විනිවිද සේයා රූ යන්ත්‍ර නො තිබේ. එහි රෝගීන්ගේ විනිවිද සේයා රූ ගන්නේ චිකිත්සාගාර අසල වූ මහ රෝහල්වලිනි. බොහොමයක් චිකිත්සාගාරවල විනිවිද සේයා රූ ගැනීමේ පහසුකම් නැතත්, කැහි පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය පරීක්ෂණාගාර පහසු කම් නම් සියලු ශාඛා චිකිත්සාගාරවල ඇත. මධ්‍යම චිකිත්සාගාර සහ ශාඛා චිකිත්සාගාර 60ක පළමු වරට රෝගීන් 1,63,908 දෙනෙක් පරීක්ෂා කරන ලදහ. පුප්ඵුසීය ක්ෂය රෝගය හැටියට 5,990 දෙනෙක් රෝග-විනිශ්චය කරනු ලැබූහ. මෙය ජනගහනයේ 10,000 කට 6 දෙනෙකි. රෝග-විනිශ්චයට පත් අයගෙන් සෑහෙන ගණනකගේ කැහි නොගැති බව පෙන්වී යැ. මේ රෝගීන් විෂයයෙහි රෝග විනිශ්චය දෙනු ලබන්නේ, විනිවිද සේයා රූ සහ චිකිත්සාගාර නිගමන ආධාරයෙනි. මැන්ටූ පරීක්ෂණය සියලු මධ්‍යම චිකිත්සාගාරවලැ කරනු ලැබේ.

රෝග ස්පර්ශී වූ අය 20,546 දෙනෙකු මේ චිකිත්සාගාරවලැ දී පරීක්ෂා කරන ලද අතර, එයින් 261 දෙනෙකු පුප්ඵුසීය ක්ෂය රෝගයෙන් පෙළෙන බව සොයා ගන්නා ලදි. රෝගීන් 40,107 දෙනෙක් මේ චිකිත්සාගාර වලැ දී ප්‍රතිකාර ලදහ. ප්‍රතිකාර ලත් රෝගීන් ගණන පළාතෙන් පළාතට දැක්වෙයි. XXIX සටහනේ.

පළාත් බද ලය චිකිත්සාගාර 12, තම-තමන්ගේ පෙදෙස්වල ක්ෂය රෝග මැඩ පැවැත්වීමේ වැඩකටයුතු සම්බන්ධයෙන් වගකීම උසුලන විශේෂඥ නිලධාරීන් භාරයේ පවිතී.

5. වැඩ කටයුතු

(ක) **රෝගීන් සෙවීම.**—රෝගීන් සෙවීමෙහි ලා ප්‍රධාන මධ්‍යස්ථාන වූයේ මධ්‍යම සහ ළය චිකිත්සාගාර යැ. රෝගීන් වැඩිතම දෙනෙක්, පපුවේ යම් යම් රෝග ලක්ෂණ හේතුවෙන් සිය කැමැත්තෙන් පැමිණියෝ වූහ. රෝගීන් ඇතැමෙක්, පරීක්ෂණය සඳහා වෙනත් වෛද්‍ය ආයතනවලින් සහ පෞද්ගලික වෛද්‍යවරයින් විසින් එවන ලද්දෝ වූහ. ලය චිකිත්සාගාරවලින් දැනුම් දෙන ලද රෝගීන් ගණන මෙ සේ යැ :—

කොළඹ ලය චිකිත්සාගාරය	1,044	මහනුවර	464	මඩකළපුව	197
වැලිසර ලය චිකිත්සාගාරය	974	ගාල්ල	498	අනුරාධපුර	97
කොළඹ ක්ෂය රෝග ආයතනය	467	යාපනය	218	කුරුණෑගල	322
රත්නපුර	370	බදුල්ල	106		

චිකිත්සාගාරවලට රෝගීන් පැමිණි ආකාරය (XXX) සටහනේ දැක්වෙයි.

වැලිසර විකිරණවේදඥ තැනගේ බැල්ම යටතේ වැලිසර ලය රෝහලේ සිටැ ක්‍රියා කරන සමූල කුඩා විකිරණ මූළු තුන, රජයේ රෝහල්වලැ අභ්‍යාස විද්‍යාලවලැ සහ ඇතැම් ගම්වලැ තෝරා ගන්නා ලද පිරිස් පරීක්ෂා කරනු සඳහා තෝරා ගන්නා ලද පෙදෙස් වලට යවනු ලැබුවෙන්, ඒ ඒ තැන්වලැ දී වයස 12 ඉක්මවූ අය පරීක්ෂා කරන ලදහ.

(කා) **රෝගීන් බලා-කියා ගැනීම.**—ඇවිදූ ප්‍රතිකාර ලබමින් සිටින ක්ෂය රෝගීහු දිවයින පුරා දහසක් ඉක්මවා වැඩෙහි යෙදී සිටින මානයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් විසින් බලනු ලැබේ. කොළඹ මහ නගර සභා සීමාවේ පමණක් මේ වැඩේ කරනු ලබන්නේ කොළඹ ඩාලි පාරේ ලය චිකිත්සාගාරයට අයත් සෞඛ්‍ය වික්ෂකයින් 11 දෙනෙකු විසිනි. රෝගියෙකු ගැනැ ම. සෞ. පරීක්ෂකයාට සැලවූ විගසැ, ඔහු රෝගියා ගැන තතු-සෝදිසි කොටැ, සිය නිගමන පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරයි. එ තැන් පටන් රෝගියාගේ නිවේසට නිති පතා යන එ තෙම, උප දෙස් පරිදි රෝගියා ලවා බෙහෙත් වර්ග ගැන්වීමටත් රෝග ස්පර්ශකයින් පරීක්ෂා කරවීමටත්, කැඟි නිසි අන්දමට බැහැර කරවීමට ත් වග බලා ගනී. ම. ජ. සෞ. පරීක්ෂකයාට මේ අවුරුද්දේ තවත් රාජකාරියක් ලැබේ. එ නම්,

රෝගියෙකුට දෙන ප්‍රතිකාරය පටන් ගැනීමේ දී ත් ඉන්පසු තුන් මාසයක් පාසා ත් නැති-බැරි රෝගීන්ගේ ආකෘති පත්‍රය පුරවා ඔවුන්ට ක්ෂය රෝග ආධාර දීමනාව ගැනීමට පිහිටවීම යි.

(කි) **ප්‍රතිකාරය.**—රෝග-විනිශ්චයෙන් පසු හැම රෝගියෙකුට මැ ක්ෂය රෝගීන්ගේ රෝහලකින් හෝ ලය චිකිත්සාගාරයකින් හෝ ප්‍රතිකාර දෙනු ලැබේ. කැඟි සහගැති රෝගීන්ට මෙන් මැ තම නිවෙසේ නිසි පරිදි ඉඩ-කඩ ලද නො හැකි රෝගීන්ට ද රෝහලකට ඇතුළත් වන සේ දැනුමැති කම් දෙනු ලැබේ. රෝගීන් බොහෝ දෙනා චිකිත්සාගාරවලට පැමිණ ප්‍රතිකාර ලැබීමට කැමැත්ත දක්වති. පළමුවෙන් දෙන ඖෂධවලට ස්ට්‍රෙප්ටොමයිසින්, පී.ඒ.එස්., අයි.එන්.ඒ.එච්. යන ඒවා අයත් වේ. මේ තුන් ඖෂධයේ සංයෝගයක් පළමු තුන් මාසය තුළැ දී රෝගියාට දී, ඉන් පසු පී.ඒ.එස්., අයි.එන්.ඒ.එච්., දෙ වගේ සංයෝග කොට දෙනු ලැබේ. යට කී පිළිවෙතින් ලද හැකි ප්‍රතිඵල සතුටුදායක වෙතත්, අතර මඟ ප්‍රතිකාර නවතාලන රෝගීන් ඇතැමෙක් ද සිටිත්. දෙ වන ප්‍රතිකාර වැලක් හැටියට පයිරසිනමයිඩ්, වොස්කවිල්, සයික්ලොසිරින්, කැනමයිසීන්, තියොසෙටසෝන් වැනි ඖෂධ ලද හැක. සියලු ඖෂධ වර්ග නොමිලේ රෝගීන්ට දෙනු ලැබේ.

බී. සී. ජී. එන්නත.—පළමු තුන් අවුරුදු බී. සී. ජී. එන්නත් වැඩ සටහන, වැඩ අතපසු වී තිබුණු පෙදෙස්වලැ නිමාවට පත් කරන ලදී. එබී බලන අවුරුද්ද ඇතුළතදී

පාසැල් ළමුන් 3,17,109 දෙනෙක් මැන්වූ පරීක්ෂණයට ගන්නා ලද අතර ඉන් 2,69,307 දෙනෙකුගේ ප්‍රතිඵල බලන ලදී. 1,92,373 දෙනෙක් නො ගැති බව දැක්වූ අතර, 1,88,727 දෙනෙකුට බී. සී. ජී. දෙන ලදී.

XXXI, XXXII යන සටහන්වලින් මෙය විදහා පෙන්වයි.

පාසල් නිවාඩු සමයේ දී බී. සී. ජී. කණ්ඩායම වතුවලට ත් ගම්වලට ත් ගියහ. 32,217 දෙනෙක් පරීක්ෂා කරන ලදහ. 31,991 දෙනෙකුගේ ප්‍රතිඵල බැලූ අතර නො ගැති බව දක්වූ 8,815 දෙනාගෙන් 8,813 දෙනෙකුට බී. සී. ජී. දෙන ලදී. මධ්‍යම චිකිත්සාගාරවලැ දී ද බී. සී. ජී. එන්නත් කරන ලදී. 1,04, 928 දෙනෙකු පරීක්ෂා කොටැ 10,228 දෙනෙකුට එන්නත් දෙන ලදී.

(කි) **අලුත උපන් බිළිඳුන් එන්නත් කිරීම.**—මෙය, ද සොයිසා සහ කාසල් වීදි ගැහැණු රෝහල්වලැ දිගට මැ පවත්වා ගනු ලැබී යැ. හෙදියන් තිදෙනෙක් මේ වැඩේ භාර වී සිටියහ. උපත් 25,468 ක් වූ අතර, 16,746 දෙනෙකුට එන්නත් දෙන ලදී. මෙය උපත්වලින් සියයට 66 කි.

(කු) **පුනරුත්ථාපනය.**—රාගම, තලගොල්ලේ පුනරුත්ථාපන මධ්‍යස්ථානය පසු ගිය අට අවුරුද්ද මුළුල්ලේ පැවතී ඇත. එය පටන් ගන්නා ලද්දේ ක්ෂය රෝගයට ලක් වී සිටිය අවාසනාවන්තයින් පුනරුත්ථාපනය කිරීම හෙවත් නැවත නගාසිටුවීම අරබයා ක්‍රම සහ විධි සෙවීමේ නියමු අරමුණක් විලසිනි. නැවතී සිටින පුහුණු ගැත්තන්ට සන්නාලි වැඩ, පෙහෙකම්, මැහුම් වැඩ, වඩු වැඩ, වතු වැඩ, කුකුළන් ඇති කිරීම, ලඝු ලේඛනය, යතුරු ලිවීම යන විෂයයෙහි පාඨ මාර්ග සලසා දෙනු ලැබේ. පිරිමි 40 කට ද ගැහැණු 40 කට ද යනුවෙන් 80 දෙනෙකුට මෙහි ඉඩ තිබේ. රැඳී සිටිය, ඇතුළත් වූ යනාදි රෝගී-පුහුණු ගැත්තන් ගණන මෙසේ වෙයි :—

	පිරිමි	ගැහැණු	එකතුව
අවුරුද්ද මුලදී රෝගීන් ගණන ...	37 ...	25 ...	62
ඇතුළත් වූ රෝගීන් ගණන ...	25 ...	15 ...	40
අවුරුද්ද කෙළවර රෝගීන් ගණන ...	47 ...	16 ...	63

(කූ) **විනිවිද සේයා රූ සේවය.**—වැලිසර ළය රෝහලේ විකිරණ වෛද්‍යඥයින් දෙදෙනෙක් සිටිත්. බටහිර පළාතේ ළය රෝහල්වලින් සහ චිකිත්සාගාරවලින් ගනු ලබන විනිවිද සේයා රූ වැඩිතම හරියක් ඔවුන් විසින්බලනු ලැබේ. මීට අමතර වැ දිවයින පුරා, සමූල කුඩා-විකිරණ වැඩ සටහන ද ඔවුහු මෙහෙයවත්.

XXXIII, XXXIV, XXXV යන සටහන්වලින් සංඛ්‍යා-ලේඛන දැක්වේ.

(කෙ) **පරීක්ෂණාගාර සේවා.**—ක්ෂය රෝග මර්දන ව්‍යාපාරය සතු නොයෙක් රෝහල්වලැ සහ චිකිත්සාගාරවලැ පරීක්ෂණාගාර 13 ක් ඇත. මීට අමතර වැ, ක්ෂය රෝග වාට්ටු තිබෙන මහ රෝහල් බද පරීක්ෂණාගාරවල ද ක්ෂය රෝගය බැලීමට සිරිත්හුරු කැහි පරීක්ෂණ සහ ලේ පරීක්ෂණ කරනු ලැබේ. වැලිසර ළය රෝහල බද මධ්‍යම පරීක්ෂාගාරයේ ව්‍යාධිවෛද්‍යඥයෙක් ද වෛද්‍ය පරීක්ෂණාගාර කාර්මිකඥයින් 11 දෙනෙක් ද පරීක්ෂණාගාර උප සහායකයෙක් ද වෙති. තව මැ පිරියම් කරනු ලබන දැවැන්ත බිජුරක්නාව ලද නො හැකි වූ හෙයින්, මේ පරීක්ෂණාගාරයේ සිරිත්හුරු වැඩීමේ කටයුතු කළ නො හැකි වී යැ. මෙය, 1965 පටන් ගන්නා විටැ වැඩ කළ හැකි තත්ත්වයට ගන්නවා ඇත.

රෝගාතුර පටකවේදය, ජීව-රසායනය, රක්තවේදය ද කිසි අවහිරයක් නැති ව මෙහි කරනු ලැබේ. රාගම මහ රෝහලෙන් එවන රෝගීන් ගැන ද මෙහි පරීක්ෂණාගාර වලදී මතු සඳහන් පරීක්ෂණ කරවන ලදී :—

ලය චිකිත්සාගාරවලදී :

ඉඳුරා වැකුම් සඳහා කැහි	...	...	...	35,566
සහගැති වූ ගණන	...	...	...	1,573
නරක් වූ ගණන	...	...	...	80
ලේ	...	...	...	40,025
මුත්‍රා	...	...	...	8,778
වෙනත් පරීක්ෂණ	...	...	...	3,237

ලය රෝහල්වලදී :

ඉඳුරා වැකුම් සඳහා කැහි	...	...	...	48,470
සහගැති වූ ගණන	...	...	...	3,803
කැහි වැඩීම (ගන්නා ලද)	...	...	...	859
අපවිත්‍ර වූ ගණන	...	...	...	30
සහගැති	...	...	...	50
ලේ පරීක්ෂණ	...	...	...	29,667
මුත්‍රා පරීක්ෂණ	...	...	...	23,046
වෙනත් පරීක්ෂණ	...	...	...	11,626

(කේ) **රෝගීන්ට ක්ෂය රෝග ආධාර දීමනාව.—**දිළිඳු රෝගීන්ට ප්‍රතිකාර ලබන සමයේ දී පිහිට වනු අටියෙන් මේ වැඩ පිළිවෙල 1953 දී අරඹන ලදී. මෙයට අදාළ ගණන අවුරුද්දෙන් අවුරුද්ද ඉහළ ගොස් ඇත. දිවයිනේ සිටින ක්ෂය රෝගීන් සියලු දෙනා මැ පාහේ ප්‍රතිකාර ලබන බව නො බා කිව හැක. අපහසුවක් නැති ව බොහෝ කාලයකට ආධාර මුදල් ලැබෙන හෙයින්, රෝග-විනිශ්චය සහ ප්‍රතිකාරය සඳහා රෝගීහු එක පයින් පැමිණෙති. මේ රෝගය කෙරෙහි ඇලී පවත්නා සමාජ කැළල, තුනී කිරීමට සෞඛ්‍ය අධ්‍යාපනය ද බොහෝ දුරට උපකාර වී ඇත.

පසුගිය අවුරුදුවලදී වැඩ කටයුතු නිසොල්මනේ ඉදිරියට ඇදී ගිය අතර, මහජනයා ගෙන් ද ඒ තරම් පැමිණිල්ලෙක් නො වී යැ. එ සේ ද වුවත් එ බඳු රෝගීන් සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබන මුදල් වරදවා ප්‍රයෝජන ගන්නා බවට නම් පැමිණිලි මහ ජනයාගෙන් ලැබේ.

මේ ක්‍රමය ඔස්සේ තැබූ තවත් කැපී පෙනෙන පියවරක් නම්, ආධාර මුදල සඳහා රෝගීන්ගේ ආරම්භක වාර්තාව ඉදිරිපත් කිරීමට ම. සෞ. පරීක්ෂකයින්ට අවසර දීම යි. මෙයින් සහනාධාර දීම ඉක්මන් වී ඇත. සහනාධාර දීමෙහි ලා අද දිනැ දෙපාර්තමේන්තුවේ සඳහන් ගණන මෙ සේ යි :—

1. ආධාර ලැබූ රෝගීන් මුළු ගණන—15,034
2. 1963-64 ට සම්මත වූ මුළු මුදල—83,50,000
3. 1963-64 මුදල් වර්ෂය අවසානයේ දී වියදම් වී තිබුණු මුළු මුදල—72,60,661

(කො) **ප්‍රජා අධ්‍යාපනය.—**සෞඛ්‍ය සතියේ දී ත්, සෞඛ්‍ය කටයුතු පිළිබඳ විශේෂ වෙනත් සමයන්හි දීත්, ව්‍යාපාරය සතු ප්‍රදර්ශන බඩු, සිනිමා දර්ශන, කතා, සංවාද, යනාදියෙන් ද සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරියා දිවයිනේ බොහෝ පෙදෙස්වල තමන් මැ සහභාගි වීමෙන් ද ඒ ඒ වැඩසටහන් මෙහෙයවා ඇත. සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු වලදී එකැලළුණු අර-ඇඳීමක් විලසින්, ලංකා ජාතික ක්ෂය රෝග මර්ධන සංගමය සහ එහි ශාඛා සංගම් සමග, එකැළුළුම් වැඩ බොහෝමයක් කරන ලදී. ප්‍රදර්ශන, සල්පිල්, ආදර්ශ රූප තොරතුරු පත්‍ර, පත්‍රිකා, සිනමා දර්ශන යනාදිය සලසා දීමෙන්, ග්‍රාම සංවර්ධන සමිති, ප්‍රජා මණ්ඩල නිලධාරීන්, තරුණ සංගම්, තරුණ ගොවි හමුදා, මහිලා සමිති, අධ්‍යාපන වැඩ සටහන් පිළිබඳ වෙනත් ස්වේච්ඡා සංවිධාන යන අංශ වලින් ආ ඉල්ලීම්, ඉටු කරන ලදී. අධ්‍යාපන වැඩ සටහන් මෙහෙයවීමෙහි ලා යට කී සංවිධාන වලට අවශ්‍ය උපදෙස්-අනුශාසනා සෑම විටෙකැ මැ දී ඇත.

(කෝ) **රෝගීන්ට උගැන්වීමේ වැඩ සටහන.**—රෝග-විනිශ්චය ලැබූ රෝගීන් හා ස්පර්ශකයින් හා විෂයයෙහි දෙන මේ දෙ වන වැඩ සටහන යොදවා ඇත්තේ, ප්‍රතිකාරය රෝග සුව කිරීමට පමණක් නො වැ රෝග වැළැක්වීමෙහි ද සංයෝග වන්නක් හෙයින්, රෝගීන්ට ද ප්‍රජාවට ද යහපතක් සිදු වන පරිදි රෝගීන්ගේ ගති-පැවතුම් සහ බාහිර පෙනුම හැඩ ගැසීමට ගන්නා තැනක් හැටියට යි. සියලු ලය චිකිත්සාගාර වලැ, බෙහෙත් ගැනීම, කෙළ ගැසීම, රෝග පැතිරීම සහ එය නැවැත්වීම වැනි අගනා අංග අලලා සෞඛ්‍ය අධ්‍යාපන කතා රෝගීන් හා ස්පර්ශකයින් හා වෙත මහජන සෞඛ්‍ය පරීක්‍ෂකයින් විසින් නිති පතා දෙනු ලැබේ. මෙය, රෝගීන්, ස්පර්ශකයින්, සෞඛ්‍ය නිලධාරීන් යන තුන් ගොල්ලන් අතරේ වඩා හොඳ අන්‍යොන්‍ය සම්බන්ධයක් ඇති කිරීමෙහි ලා සමත් වී ඇත.

(කෙ) **මිල-මුදල්.**—1963-64 දී ක්‍ෂය රෝග මර්දන ව්‍යාපාරය විසින් දරන ලද මුළු වියදම රු. 71,68,436 කි. 1962-63 දී නම් මෙය රු. 93,66,670 ක් වූ අතර 1961-62 දී රු. 88,77,650 ක් වී යැ.

නොයෙක් ගණ යටතේ මේ ගණන බෙදී යන හැටි මෙ සේ දැක්වෙයි :—

	රු.	ශ.
වෛද්‍ය සේවා	65,39,764	00
සම්බන්ධිත සේවා	2,32,915	00
මහජන සෞඛ්‍ය සේවා	2,77,048	00
පරීක්ෂණාගාර සේවා	1,18,709	00
එකතුව	71,68,436	00

ඖෂධ සඳහා දරන ලද වියදම රු. 12,60,407 කි.

(ආ) මැලේරියා මර්ධනය)

හඳුනාවුව

එබී බලන අවුරුද්ද යුගයක අවසානය දකියි. මැලේරියාව සාර්ථක ලෙස මැඩ පැවැත්වීමෙහි ලා උපයෝගී වූ ද, එ මෙන් මැ මැලේරියාව කලින් අතිශය ලෙස මුල් බැසගෙනැ තිබූ වියලි කලාපයේ බෙහෙත් ඉසීමෙන් කණ්ඩායම් 20ක් ඉවත් කිරීමෙන් බෙහෙත් ඉසීම, බලාපොරොත්තු වූ පරිදි 1964 අප්‍රේල් අවසානයේ දී මුළුමනින් මැ නවතා දැමීමට උපයෝගී වූ ද, ගෙන්-ගෙට බෙහෙත් ඉසීමේ ක්‍රමය කොඳුනාරටිය මෙන් තිබූ යුගය යි ඒ අවසන් වූයේ. ගෙන්-ගෙට බෙහෙත් ඉසීම අවසන් වන විටැ, රෝගය මුලින් මැ වඳ කිරීම රෝගීන් අල්ලා ගැනීමේ පිළිවෙල හා රෝග පැතිරීම වැළැක්වීමේ පියවර හා මතැ රඳා තිබෙන මෙ රටෙහි එක්පිඬු තලයට වැඩ සටහන සේන්දු වී යැ. රෝගීන් සොයා ගැනීමේ තන්ත්‍රයෙහි, විශේෂයෙන් මැ, සෝදිසි මුළු 3ක්, උපසෝදිසි මුළු (පිටියේ) 109ක්, ආයාසයෙන් රෝගීන් සොයා ගැනීම සඳහා ජංගම කණ්ඩායම් 5ක්, නිරායාසයෙන් රෝගීන් සොයා ගැනීම සඳහා (ආයතනගත) උප සෝදිසි මුළු 23ක් යනුවෙන් පිටියේ අමතර පිහිටුවීමෙහි මුළු කාලය සහ ඉඩ-කඩ යන දෙක මැ අලලා අගය කිරීමක් මෙහෙයැවුම් කටයුතු වල වෙනස නිසා අවශ්‍ය වී යැ.

නියම තැන් සොය-සොයා බෙහෙත් ඉසීම, සහගැති රෝගීන්ට වේගවත් ලෙස ප්‍රතිකාර දීම, ස්පර්ශ කළ අයට සහ උණ රෝගීන්ට වැඩි ප්‍රවේසමට ප්‍රතිකාර දීම, ප්‍රතිකාර ලත් සහගැතියන් සහ ස්පර්ශ කළ අය පසු පසැ සෙවිල්ලෙන් සිටීම, රෝග බෝවීමට මුල් වූ තැන සමුල සමීක්සුම් 4ක් මාස් පතා මෙහෙයවීම, යන කටයුතු ඉටු කිරීමෙන් සහගැත්තන් පිළිබඳ කීට විද්‍යානුකූල තතු සෝදිසිය සහ පිළියම් විධි පැනවීම ද වඩා තියුණු කරන ලදි.

මෙ රටට ගොඩබස්නා තොටුපළවලැ දී ලේ පිරික්සීමෙන් පමණක් නො වැ, මෙහි පැමිණි අය එ සේ පැමිණීමෙන් තුන් මාසයක් දක්වා මාස් පතා ද ඒ අයට උණක් වැළඳෙන හැම විටෙක ද ඔවුන්ගේ ලේ වැකුම් ගනිමින් ව්‍යාපාරයේ සහ පොදු සෞඛ්‍ය

සේවාවේ නිලධාරීන් ඔවුන් පසු පසැ ලුහුබැඳ ක්‍රියා කිරීමෙන් ද, පිටරටවලින්, විශේෂයෙන් මැ මාලදිවයින්වලින් මෙ රටට රෝගය පිවිසීමට ඇති ඉඩ-කඩ අවහිර කිරීමේ විධි-විධාන සලසන ලදි.

බෙහෙත් ඉසීම අත්හිටුවීමෙන් ඉක්බිති රෝගීන් සොයා ගැනීමේ කටයුතු ප්‍රබල කිරීමත් සමග, පරීක්ෂණාගාරයට අවශ්‍ය සේවක පිරිස, විශේෂයෙන් මැ අනුදක්න කරුවන්, සියයට 10.7කින් වැඩි කිරීමෙන් පරීක්ෂණාගාරයට පැවරෙන වැඩ කටයුතු හැකි තරම් හොඳින් කරනු පිණිසැ පරීක්ෂණාගාරයට අවශ්‍ය දෑ සලසන ලදි.

කීට විද්‍යා වැඩට මුළු කාලය යෙදවීම පිණිසැ ජංගම කංඩායම් තුනක් පිහිටුවීමෙන් ද, කාලයෙන් කොටසක් කීට විද්‍යා වැඩෙහි යෙදී සිටි සෝදිසි මුළු ඒ වැඩෙන් මුදා ලීමෙන් ද, වැඩ සටහනට වුවමනා පරිදි කීට විද්‍යා වැඩ කටයුතු ද ප්‍රතිසංවිධානය කරන ලදී. මෙසේ කිරීම නිසා එ කී සෝදිසි මුළුවලට රෝගීන් සොයා ගැනීමේ කටයුතු කෙරෙහි ත්, කීට විද්‍යා තතු—සෝදිසිය කෙරෙහිත්, සොයා ගත් සහගැත්තන්ට පිළියම් විධි සැලසීම කෙරෙහි ත් වඩා කාලය මිඩංගු කිරීමට පිළිවන් විය.

මෙ රටෙහි මැලේරියා රෝගය මුලිනුපුටා දැමූ බවට සහතික කිරීමේ යෙදෙන ජාත්‍යන්තර නිලධාරීන් කංඩායමකට පසු අවධියක දී ලද හැකි ප්‍රයෝජනය සලකා, දුර දක්නා නුවණින්, නොයෙක් තැන්වලැ තබා ගත යුතු වූ සඳහන්, සටහන්, සිතුවම් යන දෑ, වැඩ සටහන කීට විද්‍යානුකූල ලෙස මැනීමේ කටයුතු උදෙසා එක්වන් කරන ලදි.

මැලේරියා මුලිනුපුටා ඇමීමේ දැන් පවත්නා තත්ත්වය ගැනැ කීට විද්‍යානුකූල සහ සංවිධානාත්මක අංශ කෙරෙහි විශේෂ අවධානය ඇති වැ, ජාතික මැලේරියා සමූල නාශක වැඩ සටහන නිවහල් ලෙස මැන බලා, එම වැඩ සටහන නොවරදවා සාර්ථක ලෙස නිමාවට පත් කිරීමට සහ මැලේරියා සමූලනාශනය ඉදිරියට රැක ගැනීමට ගත යුතු අමතර පියවර ගැන නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා, ලංකාණ්ඩුවේ ඉල්ලීමක් පිටැ. ජ. සෞ. සංවිධානය විසින්, මැලේරියාවේදී පුරෝහිත වෛද්‍යාචාර්ය බී. ඒ. රාවෝ මහතාගේ නායකත්වයෙන් යුත් ත්‍රි-පුද්ගල කංඩායමක් මෙහි එවනු ලැබුවා යැ. එ කී කංඩායම මෙහි සති හයක් ගත කළා යැ. ඒ කාලය තුළ ජාතික වරම්දරුවන් සමග සංවාද පැවැත්වූ අතර, තම-තමන්ගේ වැඩ කොටස සපල කැරගැනීමේ අටියෙන් දිවයිනේ නොයෙක් පෙදෙස්වලැ වගකිව යුත්තෝ ඔවුන් බැහැදුටහ. ඔවුන්ගේ වාර්තාව 64.4.22 වන දා ලංකාණ්ඩුවට ලැබුණි. එහි ඇතුළත් නිර්දේශ බොහොමයක් දැනට ක්‍රියාවේ යොදවනු ලැබ තිබේ. ජ. සෞ. සංවිධනයේ මුදල් ආධාර 1963 සිට තුන් අවුරුද්දක් දිගට මැ තබා ගැනීම පිණිසැ ප්‍රතිශෝධිත මෙහෙයැවුම් සැලැස්ම, ජ. සෞ. සංවිධානය විසින් ඔක්තෝබරයේ දී ද, ලංකාණ්ඩුව විසින් දෙසැම්බරයේ දී ද අත්සන් තබන ලදි.

වර්ෂය තුළැ දී, ජ. සෞ. සං. වැඩ කොටසක් බාර ගනු පිණිස රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගිය වෛද්‍ය ටී. විශ්වලිංගම් මහතාගේ හා කීට වේදඥ ඇතුළු තවත් පළපුරුදු නිලධාරීන් කිහිප දෙනෙකුගේ හා සේවය අප ව්‍යාපාරයට නො ලැබී ගියේ යැ.

ජ. සෞ. සං. විසින් දිල්ලි නුවරැ පවත්වන ලද, ඉතා සැලකිය යුතු, ප්‍රබොධජනක මැලේරියා වසංගත වේදය පිළිබඳ සති තුනක උත්තුංග පාඨමාර්ගයක් හැදෑරීමේ වරය වැඩ බලන අධිකාරි තැනට හිමි වී යැ.

සහගැති රෝගීන් ගණන යන්තමට වැඩි වී ඇතත්, රෝග බෝවෙන මූලාශ්‍ර මේ වර්ෂය තුළැ දී මෙ රටෙහි සොයා ගනු ලැබුවත්, සමූලනාශන වැඩ සටහනේ ප්‍රගතිය සතුටුදායක සේ සැලකිය හැක. මීට හේතුව, කලින් මැලේරියාවට යට වී තිබුණු පෙදෙස්හි ජනයා වැඩි වැඩියෙන් ඇලළෙන පරිදි වඩා හොඳින් සංවිධානය වූ, රෝගීන් සොයා ගැනීමේ වඩා කාර්යක්ෂම වැඩ කටයුතු නිසා විය හැක. පසු ගිය අවුරුද්දට වඩා ලේ පටල 2,75,981ක් පරීක්ෂා කර තිබීමෙන් මෙය පැහැදිලි වේ.

පසුගිය වර්ෂයේ වූ සහගැතියන් 17 දෙනා හා සසඳා බලන කල මේ වර්ෂයේ සොයා ගත් සහගැතියන් ගණන 29කි. මෙයින් 15 දෙනෙක් මාලදිවයිනෙන් පැමිණි අය යැ; 10 දෙනෙක් රට තුළ රෝග පැතිරෙන්නට වූ සතර පොළකින් බෝවීම ගත් අය යැ; 2 දෙනෙක් ලේ මාරුවේ දී රෝගය වැළඳුණු අය වූහ. ඉතිරි 2 දෙනාට බෝවූ අන්දම හරියට කිය නො හැකි යැ.

ජාතික මැලේරියා සමූලනාශක වැඩ සටහන, එහි සංවිධානය සහ එයින් කෙරෙන වැඩ නිරික්සනු සඳහා ලෝකයේ නන් දෙසින් මැලේරියා වේදඥයින් සහ මැලේරියා සේවකයින් ඇදැ-ගැනීමෙහි ලා දිගට මැ සමත් වී යැ. වර්ෂය තුළ දී ඉන්දියාව, ඉන්දුනීසියාව, තායිලන්තය, සබාව, මලයාසියාව, මැක්සිකෝව, ආජෙන්ටිනාව, යුරෝපීය දේශ, මධ්‍යධරණී දේශ යන රට—රාජ්‍යවලින් මැලේරියාවේදඥයින් 13 දෙනෙක් හා මැලේරියා සේවකයින් 9 දෙනෙක් හා ජ. සෞ. සංවිධානයෙන් නොහොත් ඇමෙරිකානු ආධාර ක්‍රමයෙන් අනුබල ලත් ශිෂ්‍යත්ව මත ලංකාවට පැමිණ සතියක් වත් මෙහි ගත කළහ. අප රටේ මැලේරියා සමූල නාශන වැඩ සටහනේ දියුණුව බැලීමට පැමිණි වැදගත් ආගන්තුකයින් අතර ජිනීවාහි ජ. සෞ. සං. මැලේරියා අංශයේ ප්‍රධාන වෛද්‍ය අල්වරාදෝ මහතා ද, අග්නි දිග ආසියා දේශයේ දේශගත අධ්‍යක්ෂ වෛද්‍ය මානි මහතා ද, යුරෝපීය දේශයේ ජ්‍යෙෂ්ඨ මැලේරියා අනුශාසක වෛද්‍ය ග්‍රැමේසියා මහතා ද, අග්නිදිග ආසියා දේශගත කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ දේශගත අනුශාසක වෛද්‍ය ජී. සම්බාසිවන් මහතා ද වූහ.

1. **මැලේරියා මරණ.**—මැලේරියාව නිසා මරණ එකක් වත් සිදු නො වී යැ.

2. **කරන ලද වැඩ**

(ක) **ගෙන්-ගෙට කෘමි නාශක බෙහෙත් ඉසීම.**—

ගෙන්-ගෙට බෙහෙත් ඉසීම, කැලැ මුකලානවැලැ සිට අඩ සැතපුම් අරයක් තුළ පිහිටි සියලු ගෙවල්-දොරවලට ත්, සංවර්ධන අරමුණුවලට ත් අලුත් ජනපද යෙදුම්වලට ත් සීමා කරනු ලැබ, බලාපොරොත්තු වූ පරිදි එය අප්‍රේල් අගැ දී මුළු මනින් මැ අත්හිටවන ලදි. මෙහි දී ගත් කෘමි නාශක ද්‍රව්‍ය නම්, වර්ග අඩියකට මිලි ග්‍රෑම්ස් 100 බැගින් යොදන තෙමිය හැකි ඩී. ඩී. ටී. සුනු යැ. එය තුන් මාස චක්‍රයක් අනුවැ ගෙවලැ ඇතුළත බිත්තියෙහි සහ වහලේ යටි පැත්තෙහි ඉසින ලදි. ඔක්තෝබර-අප්‍රේල් වකවානුවේ දී ගෙවල් 1,61,710 කට බෙහෙත් ඉසින ලද අතර, එය වාර 2,27,153කින් සියයට 75 ඩී. ඩී. ටී. සුනු රාත්තල් 1,13,943ක් ඇවී යැ. මේ අනුවැ එක් වාරයකට වැය වී ඇත්තේ සාමාන්‍යයෙන් රාත්තල් බාගයකි.

බෙහෙත් ඉසීමේ වැඩ කටයුතු XXXVII සටහනෙන් ද එල්ලෙ බලා ඉසීම XXXVIII සටහනේ ද විදහා පායි.

(කා) **රෝගීන් සොයා ගැනීම**

(i) **ආයාසයෙන් රෝගීන් සෙවීම.**—රෝගීන් සෙවීමේ මේ ක්‍රමය, කාලය ත්, ඉඩ-කඩ ත් මුළු මනින් මැ ආවරණය කිරීමේ අටියෙන් ආයාස සෝදිසි ඔවසියර්වරුන් ගණන 186 සිට 295 දක්වා වැඩි කිරීමෙන් බලසම්පන්න කරන ලදි. ලේ වැකුම් 3,88,273ක් ගන්නා ලදින්, සහගැත්තන් 4 දෙනෙක් සොයා ගන්නා ලදහ. ඔවසියර්වරුන්ට යා නොහැකි පෙදෙස්හි මේ වැඩ කටයුතු කරනු වස්, ජීප් රථ ප්‍රයෝජනයට ගන්නා ආයාස ජංගම සෝදිසි කංඩායම් 5ක් පිහිටුවන ලදහ.

(ii) **සමූල සමීක්සුම්.**—උප සෝදිසි මුළු (පිටියේ) ආධාර ඇති වැ සෝදිසි මුළු නිලධාරින් විසින්, සහගැත්තන් පිළිබඳ කීට විද්‍යා පරීක්ෂණවල කොට සක් හැටියට ඉටු කරන ලද මේ කටයුතු ඊට අදාළ සහගැත්තා සිටින නිවසේ සිට සැතපුම් ½-1 අරයක් තුළ ඉටු වී යැ. මේ සමීක්සුම් කලින් අතිශය ජානපදික කලාපයට අයත් වූ පෙදෙස්වලැ හාරමාසයක්

දක්වා ද කලින් වසංගත කලාපයට අයත් වූ පෙදෙස්වලැ, දෙ මාසයක් දක්වා ද මාසයක් පාසා කරන ලදි. අවසාන වරට ගත් මාසික සමූල සමීක්ෂුම් දෙකේ දී සහගැත්තන් නො දක්නා ලද්දේ නම්, බීජාශ්‍ර මූලය ඉවත් කරන ලද සේ සැලකුණි.

(iii) **ලුහුබැඳි ලේ පරීක්ෂණ.**—ප්‍රතිකාර ලත් සියලු සහගැත්තන් සහ ගෙදර දොරේ ස්පර්ශකයින් විෂයයෙහි කරන ලද මෙය අවුරුද්දක් දක්වා මාස් පතා කරන ලද්දකි.

(iv) **නිරෝධායන පියවර.**—මාලදිවයින්වලින් මෙහි පැමිණෙන අය මෙ රටට මැලේරියා ගෙනීම වැළැක්වීම සඳහා, මාලදිවයිනෙන් මෙහි පැමිණි සැම කෙනෙක් මැ මෙ රටැ ගොඩ බස්නා තොටුපළවල දී ත්, එ තැන් සිටැ තුන් මාසයක් දක්වා මාස් පතා ත් මැලේරියා නාශක ව්‍යාපාරයේ හෝ පොදු සෞඛ්‍ය සේවාවේ හෝ නිලධාරීන් විසින් ලේ පරීක්ෂාවට භාජනය කරනු ලැබී යැ.

රෝගීන් සෙවීමේ නොයෙක් ක්‍රමවලින් ගත් ලේ වැකුම් ගණන ද, ඒ ඒ ක්‍රම අනුව සොයා ගත් සහගැත්තන් ගණන ද XXXIX සටහනේ දැක්වෙයි. පසුගිය අවුරුදුවලැ මෙන් නො වැ මේ වර ආයාසයෙන් රෝගීන් ඇල්ලීමේ පිළිවෙල වඩා සඵල වූ බව රෝගහස්ත කලාපය මුළු මනින් මැ පියවීමෙන් පෙනී යයි. ආයාස ක්‍රම යෙන් මේ අවුරුද්දේ දී සහගැත්තන් 4 දෙනෙක් ඇල්ලූ නමුත් ගිය අවුරුද්දේ නම් එක් අයෙකු පමණි. රෝගීන් සෙවීමේ මෙ වන් පිළිවෙලක් සැමත වසා සිටීමේ වැදගත් කම මෙයින් පැහැදිලි වේ. ගෙවල්වලැ රෝග වැළැඳී සිටින අය සොයා ගැනීමේ සාර්ථක ක්‍රියා මාර්ගයක් වූ මෙය, හොඳින් සැකසුණු සෞඛ්‍ය සේවාවන් ඇති ලංකාව වැනි රටෙකැ පවා රෝගීන් සෙවීමේ නිරායාස ක්‍රමය යොදා ඉවත් කළ හැකි නො වේ. රෝගීන් සොයා ගැනීමේ, ආයාස, නිරායාස දෙ ක්‍රමයෙන් මැ සංයෝග වූ පිළිවෙලකින් සැමත ආවරණය කිරීම, සමූල නාශක වැඩ සටහනක එකැලුම් තලයේ වැඩියෙන් හුවා දැක්විය නොහැක.

(කි) **සහගැති** (Positive) **රෝගීන් බෙදී යෑම.**—අවුරුද්ද තුළැ දී සොයා ගත් සහගැත්තන් 29 දෙනෙක් වූහ. එය පළාත් සහ දිසා අනුව බෙදී ගිය අයුරු මාසයෙන් මාසයට දැක්වෙයි. XL සටහනෙන් මාලදිවයිනෙන් රෝග බීජ ලැබ මැලේරියා තොර පෙදෙස්හි සිට සොයා ගන්නා ලද සහගැත්තන් 4 දෙනෙක් ඔක්තෝබර-මාර්තු වකවානුවේ වූහ. මින් අනතුරු වැ, මාලදිවයිනෙන් රෝග බීජ ලැබ, මැලේරියා—තොර පෙදෙස්වලින් ද කලින් වසංගත කලාපයට අයත් වූ නඩත්තු සහ එක්පිඩු තලයේ පෙදෙස්වලින් ද සහගැත්තන් 16 දෙනෙක් සොයා ගන්නා ලදහ. මේ රටේ දී රෝග බෝවූ අය ද කලින් අතිශය ජානපදික කලාපයට අයත් වූ පෙදෙස්වලැ දී සහ දකුණු වසංගත කලාපයේ දී අප්‍රේල් මාසයට පසු සොයා ගන්නා ලදහ. ඔවුනු නැගෙනහිර දේශයෙන් 7ක් ද, දකුණු දේශයෙන් 2ක් ද, මධ්‍යම දේශයෙන් 2ක් ද ලේ මාරුවෙන් පසු බෝවූ අය 2ක් ද යනුවෙන් වූහ. දකුණු දේශයේ සැතපුම් කාලක අරයක් තුළැ වූ ගෙවල් 3කට සීමාවූ බෝවීමේ ආර දෙකක් තිබුණි. මධ්‍යම දේශයේ නම් රෝගීන් දෙ දෙනා අතරින් පතර වූහ.

මෙ රටැ ආරයෙකින් රෝග බෝවූවන් ලක්වැසියන් වූ අතර, මාලදිවයිනෙන් බෝවීම ලැබ රෝගී වූ අය මාලදිවයින් වැසියන් 5 දෙනෙක් ද ලක් වැසියන් 10 දෙනෙක් ද වූහ.

(කි) **පරපුටු වර්ගවල බලපෑවැත්ම.**—මේ වර්ෂයේ දී සොයා ගන්නා ලද සහගැත්තන් 29 දෙනා කෙරෙහි ඒ ඒ වර්ගවල බලපෑවැත්ම, මෙ රටින් සහ පිට රටින් බෝවූ අවස්ථා අනුවැ වෙන වෙන මැ මෙහි මතු දැක්වේ.

බෝවූ අයුරු	පී. වයිවැක්ස්	පී. පැල්සිපාරම්	පී. මලේරියයි
මෙරටින්	— ...	7 ...	7
පිටරටින්	10 ...	5 ...	—
එකතුව ...	10	12	7

මේ රටැ රෝගීන් සම්බන්ධයෙන් පරපුටු තත්ත්වය, පී. වයවැක්ස් ප්‍රමුඛස්ථානයක් දැරූ පසු ගිය අවුරුදුවලට වඩා ඉඳුරා වෙනස් නමුත්, මේ අවුරුද්දේ සොයා ගන්නා ලද්දේ පී. මැලේරියා පී. පැල්සිපාරම් යන බෝවීම් පමණකි. පී. වැල්සිපාරම්, පී. වයිවැක්ස් නම් වඩා ප්‍රබල වර්ගවලින් මිදී වැඩ සටහන ඉදිරිය බලා පියවර ගත් මේ අවධියේ දී, පී. වයිවැක්ස් අතුරුදහන්වීම කැපී පෙනෙන්නක් නමුත්, පී. මලේරියයි ප්‍රමුඛස්ථානයක් ගැනීම නම් බලාපොරොත්තු නො වූවක් නො වේ. එ සේ වූවුව ත් පී. පැල්සිපාරම් දක්නට ලැබීම නම් කණස්සල්ලකි. ඊට හේතුව විෂබීජ පැතිරීම දැවුරුද්දකට වැඩියෙන් අවහිර කොට තිබුණේ නම් මේ වර්ගය මුළු මිනින් මැ, ඉවත් කරන්නට තිබූ හෙයිනි.

(කු) **සහගැති (Positive) රෝගීන්ට ප්‍රතිකාර, ලුහුබැඳි කටයුතු.**—මුල් බැසගත් ප්‍රතිකාර නියමය වෙනසක් නො වී යැ. එහෙත් ප්‍රතිකාර විධි මාලාවේ තුන්වන දිනයට ගන්නා ප්‍රයමැකුයින්, කැමකුයින් සමග පළමු දිනයට ගැනීමට පටන් ගැනීමෙන් ඒ ඒ පරපුටු වර්ගය අනුවැ ප්‍රතිකාර මාලාව දවස් 14කින් නොහොත් 15 කින් නිමාවට පත් කරන ලදි.

දින පතා බැලීමට යන සෝදිසි මුළු නිලධාරියා විසින් සොයා ගන්නා ලද සැකකළ හැකි අයට සහ සහගැත්තන් 29 දෙනාට මුල් බට ප්‍රතිකර විධි සලසන ලදි. එහෙත් මාලදිවයින් වැසියෙක් ප්‍රතිකාර මාලාව හමාරවීමට පෙර සිය රට බලා පෙරළා ගිය හෙයින්, ඔහු සම්බන්ධයෙන් මේ පිළිවෙත අත්හැරුණි.

සහගැති රෝගීන් පිළිබඳ ලුහුබැඳ ක්‍රියා කිරීමේ පිළිවෙල ද වෙනස් කරන ලදී. ඒ අනුව සහගැත්තන් මෙන් මැ ගෙවැසි ස්පර්ශකයින් ද අවුරුද්දක් දක්වා මාස් පතා ලේ පරීක්ෂණවලට භාජනය කරනු ලැබේ. අවුරුද්ද තුළැ දී සහගැත්තන් 40 දෙනෙකුගෙන් ලේ වැකුම් 69ක් ද ගෙ වැසි ස්පර්ශකයින්ගෙන් ලේ වැකුම් 38 ක් ද ගන්නා ලද නමුත්, සහගැත්තන් දක්නට නො ලැබී යැ. එහෙත්, පසුගිය අවුරුද්දේ දී සොයා ගන්නා ලද, පිටරටින් බෝවූ සහගැත්තෙකුගෙන් පසු විටෙකැ ගන්නා ලද ලේ වැකුමක් නම් සහගැති බව දැක් වී යැ. මේ රෝගියා සම්බන්ධයෙන් දිනපතා ඔහු බැලීමට යන සෝදිසි මුළුවේ නිලධාරියාට මුල් බට ප්‍රතිකාර මාලාව නිමාව දක්වා ඔහු වෙත ගැන්විය නොහැකි වූ යේ, ඔහු ප්‍රතිකාර මාලාව අතර මඟැ වන්දනා ගමන් ගොස් සිටි හෙයිනි. ඒ ගමන පිටත් වීමට පෙර අවශ්‍ය බෙහෙත් වර්ග ඔහුට දී තිබුණ මුත්, ඔහු ඒවා පාවිච්චි නො කොටැ තිබුණි.

(කූ) **පරපුටුවේද පරීක්ෂණාගාරය.**—රෝගීන් සොයා ගැනීමේ පිළිවෙල ප්‍රබල කරවීම සමඟ, කලින් නොතිබුණු විරූ වැඩිතර වැදගත් කමක් පරපුටුවේද පරීක්ෂණාගාරයට අත් වී යැ. කරන ලද වැඩ කොටස ද ඉකුත් අවුරුදුවලට වඩා වැඩි ය. මේ අවුරුද්දේ දී පරීක්ෂා කළ ලේ වැකුම් මුළු ගණන 11,94,846ක් නමුත්, ගිය අවුරුද්දේ නම් එය 9,18,835 ක් පමණි.

(කෙ) **කීට විද්‍යාව.**—එබී බලන කාල-සීමාව තුළැ මැලේරියා සමූලනාශක වැඩ සටහනේ කීට විද්‍යා වැඩ සීමා වූයේ—

(අ) සිරිත් හුරු තතු—සෝදිසි,
(ආ) වෙසෙස් තතු—සෝදිසි යන්නට යි.

(i) සිරිත් හුරු තතු—සෝදිසි මෙහෙයවන ලද්දේ, මැලේරියා නාශක ව්‍යාපාරයේ ම. සෞ. පරීක්ෂකයින්ගෙන් යුත් සෝදිසි මුළු හා ඕවර්සියර්වරුන්ගෙන් සහ පොදු මහජන සෞඛ්‍ය සේවාවේ නියුක්ත වසමේ ම. සෞ. පරීක්ෂකයින්ගෙන් සමන්විත උප සෝදිසි (කීට විද්‍යා) මුළු හා විසිනි.

සෝදිසි මුළු 36ක් විසින් ද, මහ ඔය නිම්නයේ කොච්චිකඩේ, පත්තල, බොල්ගහවෙල, කෑගල්ල යන වසංගත කලාපීය සන්ධිස්ථානවලට පිහිටි (කීට විද්‍යා) උප සෝදිසි මුළු 4ක් විසින් ද මේ තතු—සෝදිසි මෙහෙයවන ලදි.

සිරිත්හුරු තතු—සෝදිසිවලට අදහස වූයේ—

(අ) කෘමිනාශක ද්‍රව්‍ය ඉසීමේ සපලවත් පියවරක් හැටියට අතින් හා ඉසීමෙන් හා ඉසිතලද ගෙවලට හාරක වර්ගයන්ගේ බලපැවැත්ම ද;

(ආ) හාරකයින් එළිමහනේ ලැගුම් ගන්නා තැන් ද;

(ඉ) හාරකයින් බෝවීම සොයා ගැනීම අරබයා වූ මේ නිත්‍ය නිරික්සුම් තිප්පොළ අසළ මෙහෙයවන ලද පිළවුන් සමික්සුම් ද නිගමනය කිරීම යි.

මැලේරියා නාශක ව්‍යාපාරීය සේවකයින් විසින් ඉටු කරන කරන ලද කීට විද්‍යා වැඩට අමතර ලෙස, වසම්භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් විසින්, අතුරු නිරික්සුම් තිප්පොල වලට දෙ සතියක් පාසා පිළවුන් පරීක්ෂා කිරීම ද කරන ලදි.

(ii) කුරුණෑගල පිහිටි කීට විද්‍යා මුළුව විසින් වෙසෙසා තතු—සෝදිසි පවත්වන ලදි. මේ මුළුව භාර වී සිටියේ කීට වේදඥයෙකි.

සමූල නාශක වැඩ සටහන 64.5.1 වන දා සිට එකැලළුම් තලයට සේන්ද්‍ර වන්නා හා මැ, බෙහෙත් ඉසීම දිවයින පුරා සහමුලින් මැ අත්හිටවී ගියේ යැ. වසංගත රෝගවේදී වුවමනා කම්වලට අනුකුල සේ කීට විද්‍යා වැඩ ප්‍රතිසංවිධානය කරන ලදී.

සෝදිසි මුළු සහ උප සෝදිසි (කීට විද්‍යා) මුළු මගින් කරන ලද කීට විද්‍යා වැඩ, දැන් කරනු ලබන්නේ, පිළිවෙලින් මධ්‍යම, උතුරු, දකුණු, නැගෙනහිර යන දේශවලට වැඩ සැලසෙන පරිදි කුරුණෑගල, කහටගස්දිගිලිය, මොනරාගලැ යන ස්ථානවලැ පිහිටි ජංගම කීට විද්‍යා කංඩායම් තුනක් විසිනි.

කීට විද්‍යා කංඩායම් මේ වැඩ කටයුතු කරත් :—

(අ) දවල් කාලයේ එක් ගමෙකැ ගෙවල් දහයකින් ඉසීමෙන් ඇල්ලීමේ ක්‍රමයට එකතු කිරීම (රියැදුරු ඕවසියර් ගෙවල් 5 යි., පිටියේ සේවකයින්ගේ සහාය ඇති වැ ඕවර්සියර්වරුන් ගෙවල් 5 යි.)

(ආ) ගමේ බෝවෙන තැන්වලින් ද නිරික්සුම් ගම්වලැ ගං, හෝ වලින් ද පිළවුන් එකතු කිරීම.

(ඉ) එක් එකතු කිරීමකට විනාඩි 5ක් දෙමින් පස්වරු 7 සිට 10 දක්වා විනාඩි 15කට වරක් ගෙ තුළේ මෙන් මැ එළිමහනේ, මිනිස් ඇම දීමෙන් රෑයේ එකතු කිරීම.

(ඊ) ගෙවල් දෙකක කවුළු උගුල් ඇටවීම.

(කේ) ඈ. කියුලිපසීස් සොයා ගන්නා ලද ස්ථාන

(ඇ) කියුලිපසීස් සොයා ගන්නා ලද ස්ථාන 24 අතුරෙන්, වැඩිහිටි හාරකායින් වඩා බලපැවැත්වූ බව මේ ස්ථානවලින් පෙනී යයි·—

වවුනිකුලම්	මුතියන්කඩේ
අරුකුබෙලි	තන්නිමුරිප්පු
උලහිටියාව	දියකැපිල්ල

ගංවල ඇ—කියුලිපසීස් පිළවුන් බහුල වැ බෝවූ බව සියලු ස්ථානවලින් මැ පාගේ දක්නට ලැබී ඇත.

සහගැති අය සම්බන්ධයෙන් විශේෂ තතු—සෝදිසිවල දී, මතු සඳහන් ස්ථාන වලැ ඇ—කියුලිපසීස් බෝවෙන බවක් පෙනී ඇත :—

මහව,
තල්පිට ඔය පිළිවෙල,
නෙල්ලුල්ල,
තණමල්විල.

1963 ඔක්තෝබර—1964 මැයි වකවානුව තුළැ දී කුරුණෑගල කීට විද්‍යා කංඩායම් විසින්, නිරික්සුම් තිප්පොල 4ක දී, විශේෂ තතු—සෝදිසි පවත්වන ලදි. ඇනොපිලිසි කියුසිපසීස් වර්ගයේත්, ඇනොපිලින් පවුලේ අනෙක් වර්ගවලැත්, ගහණය සෘතු අනුව අඩු-වැඩි වන අන්දම හා කෘමි නාශක ද්‍රවයේ පීඩනය යටතේ ඔවුන් හැසිරෙන අන්දම හා මේ සෝදිසිවලින් හෙළි වි යැ. (වසංගත කලාපයේ) ආඩිමල්ල, මධ්‍ය-ජානපදික කලාපයේ නෙල්ලන්තැවුව, ජානපදික කලාපයේ උඩුගොඩගම, අත්තරගොල්ලාව, යන ස්ථානවලැ එකී නිරික්සුම් තිප්පොලවල් පිහිටියේ වෙයි.

එ කී නිරික්සුම් තිප්පොලවල් බැලීමට මාස් පතා ගමන් ගිය අතර, අත්තර ගොල්ලාව තිප්පොල නම් දෙ සතියකට වරක් බලන ලදී.

නිරික්සුම් තිප්පොල 4ක දී අතින් සහ ඉසීමෙන් අල්ලන ලද්දවුන් අතර ඇනොකියුලිසපසීස් එකෙක් හෝ නොවී ය.

අත්තරගල්ලේ මිනිසුන් වසන ගෙවලැ ඇට වූ කවුළු උගුල්වලින් ඇ: කියුලිසිප සීස් ගැහැණු සතෙක් දක්නට ලැබීයැ. අත්තරගොල්ලාවෙන් ලැබුණු ඇ: කියුලිසිපසීස් ගැහැණු සතාගේ ජීවන වේගය නිරික්සන ලදි. මේ වැඩිහිටි සතා පැය 24කට වැඩියෙන් ජීවත් වූයෙන්, යම් තරමක ඔරොත්තු දීමේ ශක්තියක් දක්නට ලැබී යැ. කවුළු උගුලකින් අල්ලන ලද ඇ. ටසලේටිස් සහ ඇ. වාගස් ගැහැණු සතාගේ ද ජීවන වේගය නිරික්සන ලද අතර ඒ දෙ දෙනා මැ පැය 24ක් තුළ මිය ගියහ.

සතුන් (ගවයින් සහ එළුවන්) ඇමට යොදු ඇ නොපිලින් එකතු කිරීමේ දී හාරක වර්ගයේ එක් වැඩිහිටියෙකු පවා දක්නට නො ලැබී.

එබී බලන අවුරුද්ද තුළැ දී තද වැසි සහ කඩින් කඩ එන වැසි නිසා ගං, හෝ ගලා ගියේ යැ. මේ හේතුවෙන්, ඇ. කියුලිසිපසීස් බෝවෙන වැලි තිඩස් මතුවීම අඩු වී ගියේ යැ.

ගංද, වැව්, කුඹුරු හෝ ළිං, අගල් වැනි වෙනත් බෝ වෙන තැන් ද පරීක්ෂා කිරීමේ දී ඇනොපිලිස් බෝවීම දක්නට ලැබිණ.

(කො) **මධ්‍ය වැඩ පොල.**—ව්‍යාපාරය සතු වාහන මෙන් මැ සෞඛ්‍ය දෙපාර්තමේන් තුවේ අනෙකුත් අංශ සතු වාහන ද පිරියම් කිරීම අවුරුද්ද තුළැ මේ වැඩ පොළෙන් ඉටු වී යැ. ප්‍රවාහන පෝමන් තනතුර මෙ තෙක් නො පුරවා තිබීම නිසා ජ්‍යෙෂ්ඨ රියැදුරු ඕවර්සියර් කෙනෙක් ඒ වැඩ කටයුතු බලා ගැනීමේ යෙදී සිටියේ යැ. රිය පිරියම් කිරීමේ මඩුව ප්‍රතිසංවිධානය කිරීම හා එය දෙපාර්තමේන්තුවේ සියලු වාහන පිරියම් කොටැ සාත්තු කිරීම පිණිසැ මධ්‍ය වැඩ පොළක් බවට හැරවීම හා පිළිබඳ සොයා බලා වාර්තා කරනු පිණිසැ කමිටුවක් පත් කරනු ලැබුවා යැ. ඒ කමිටුව විසින් සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන ලදි. සෑහෙන බඩු-මුට්ටු රැසක් ලබා දී ඇතත්, විදුලි බලය නැති හෙයින් එයින් සම්පූර්ණ ප්‍රයෝජනය ලැබීම අවහිර වී ඇත.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අනෙක් ආයතනවලට පිරුළට දෙන ලද වාහන ගණන 7කි. වාහන 6ක් පවරා දෙන ලදි.

(කෝ) විදෙස් උදවු—විහිදුවන ලද විපිළිසර වැඩ සටහනේ වියදමෙන් සියයට 75ක් පියවීම පිණිසැ පීඑල් 480 දනවූ අරමුදලෙන් රු. 2,69,192 ක මුදලක් එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධන ආධාර දූත මණ්ඩලය සම්මාදම් කළා යැ. ඉතිරි සියයට 25 පියවීම සඳහා ජ. සෞ. සංවිධානය රු. 86,894 ක් දුන්නා යැ.

(කො) එක් පුද්ගලයෙකු සඳහා දරන ලද වියදම.—මේ ව්‍යාපාරය අවුරුද්ද තුළැ රු. 26,00,597 ක මුළු වියදමක් දරුවා ය. රැකවරණය ලැබූ ජනගහනය අනුව එක් පුද්ගලයෙකු වෙනුවෙන් ගිය වියදම ශත 36½ කි. ගිය අවුරුද්දේ නම් එය ශත 63කි.

(කෞ) සැඳැහුම්.—එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධන ආධාර දූත මණ්ඩලයෙන් හා ජ. සෞ. සංවිධානයෙන් හා දෙන ලද ආධාර මුදලෙන් ද කාර්මික අනුශාසනයෙන් ද මේ වැඩ සටහනේ ඉදිරි ගමනට ලැබුණු රුකුල සුළු පටු නො වේ. එ කී සංස්ථා දෙක දුන් ඒ අනගි උදවු-උපකාර සම්බන්ධයෙන් අපගේ ස්තුතිය හදපත්ලෙන් පුදමු.

(ඉ) බරවා රෝග මර්දනය

බරවා රෝග බෝවීම් අතරැ ඉතා තදින් බලපැවැතුණේ ඩබ්ලිව්. බැන්ක්‍රොෆ්ටයි ආසාදනයයි. නිරිත දිග වෙරළාසන්න තීරය මේ රෝගය පැල පදියම් වූ පෙදෙස වෙයි. ලක් දිව පුරා මෙහෙයවන ලද පරපුටු වේද සමීක්ෂුවට වෙන යම් පෙදෙසක් හසු නො වී යැ. පසු ගිය පස් අවුරුද්ද තුළැ බැන්ක්‍රොෆ්ටයි බෝවීම පැතිර තිබුණ අයුරු "XLI" සටහනේ දැක්වෙයි.

මර්දන කටයුතු තර කිරීමෙන් හොඳ ප්‍රතිඵල ලැබුණු බව "XLII" සටහන බලන කලැ පෙනෙනු ඇතැ. 1960 සිටැ එක මැ මට්ටමේ මෙන් තිබුණු සියුම් බරවා බැගිනුව පහළ බසින හැඩ, දුන් දුන් පෙනේ. පෙදෙස් අනුවැ බැ ගිනුව විමසා බලන කලැ (ජා ඇල) සියයට 1.2 සිටැ (ගාල්ලේ) සියයට 4.9 දක්වා වෙනස් වූ බැව් පෙනේ. මේ හා සසඳා බලන කලැ ඉහළ බැගිනුවක් දක්නට ලැබුණු අනෙක් පෙදෙස් නම් අම්බලන්ගොඩ (4.7%) අලුත්ගම (4.4%) පැලියගොඩ (4.6%) වෙයි.

අවුරුද්ද තුළැ බී. මලයි පෙදෙස් දෙකෙකැ කරන ලද සමීක්ෂුමක ප්‍රතිඵල "XLIII" සටහනේ දැක්වෙයි.

2. සංවිධානය

රෝගය මුල් බැසගෙන තිබෙන පෙදෙස්වලැ කුඩා පුරවලට පරපුටු වේදි මර්දන කටයුතු යෙදවීමට ගත් තීරණය අනුවැ පිටියේ නිලධාරීන් ගණන වැඩි කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරන ලදි. ඊ ළඟ අවුරුද්දේ දී අලුත් කුඩා පුර තුනක් ගැනීමට මුදල් පිළිබඳ අනුදැනුම ලැබී ඇත.

3. කරන ලද වැඩ

රෝග හස්ත පෙදෙස්හි (කොළඹ මහ නගර සභා පෙදෙස හැරැ) සියලු නගර බද පෙදෙස්වලැ කරන ලද සිරිත්හුරු වැඩට පරපුටුවේදී සහ කීට විද්‍යා සෝදිසි සහ මර්දනය ද ඇතුළත් වී යැ.

පරපුටුවේදී සෝදිසි සහ මර්දන වැඩ.—එකතු කොටැ, පරීක්ෂා කරන ලද ලේ පටක ගණන (තැඹිල සහගැත්තන් ඇතුළු වැ) 4,18,968 ක් වීමෙන් මෙ තෙක් නො වූ විරූ වාර්තාවක් බිහි කළේ යැ. අලුත් රෝගීන් 11,460 ක් තුළැ සියුම් බරවා රෝගය දක්නට ලැබුණේන්, සඳහන් තැබීමේ ප්‍රතිශෝධිත ක්‍රමය යෙදීමෙන් පසු සඳහන් වී ඇති අඩු මැ බැගිනුව හැටියට 2.8 ක් පෙන්වී යැ.

සියුම් බරවා වැළඳි බාල මැ රෝගියා හැටියට සිටියේ ගිය අවුරුද්දේ ලියැවුණු මාස 8කුත් 4 දවසක වයසැති දරුවා මැ යැ.

ගෙදර-දොරේ ප්‍රතිකාරය වූ ඩයතිකාබමයිසින් සියලු සහගැත්තන්ට සහ ඔවුන් ගේ ආශ්‍රිතයින්ට දෙන ලදි. ප්‍රතිකාරයෙන් පසු ගත් ලේ පටක 22,194කින් සහගැති බව 3,978ක (17.9%) දක්නා ලදි. සහගැති බව කලුතර 6.6% කින් කෝට්ටේ 25.8% දක්වා අඩු වැඩි වී යැ. ඉහළ මට්ටමක් පෙන්වූ අනෙක් තැන් නම් බේරුවල (24.2%) පැලියගොඩ (23.9%) කොලොන්නාව (23.6%) ගාල්ල (21.5%) මාතර (20.0%) වෙයි. ප්‍රතිකාරයට මෙ සේ වෙනස් කම් දැක්වීමට හේතුව නම් ප්‍රතික්‍රියාවලට බියෙන් ප්‍රතිකාර ලැබීමට සහගැත්තන්ගේ මැලි කම යි. අවකැපෙන ප්‍රතිඵලවලින් තොර කෙටි ප්‍රතිකාර මාලාවක් සහිත සාර්ථක බරවා නාශකයක් දැකීමට කාලයක් තිස්සේ අපි බලා සිටිමු.

කීට විද්‍යා සෝදිසි සහ මර්දන.—රෝග හස්ත තිරුවේ ස්ථාන 29කින් ගන්නා ලද වැඩිහිටි මදුරුවන් 31,743 දෙනෙකුගෙන් 24,985 දෙනෙක් සී. පැටිගන්ස් වර්ගයේ එවුන් ලෙස හැඳින ගන්නා ලද හ. (විච්ඡේදනය කළ) එනම් කපා බලන ලද සී. පැටිගන්ස් වර්ගයේ එවුන් 14,727ක ගෙන් 244ක බරවා ආසාදනය දක්නට ලැබුණි. සී. පැටිගන්ස් වර්ගයේ ආසාදන බැගිනුව 1.7%ක් වූ අතර ආසාදනීය බැගිනුව 0.7%ක් වී යැ. ආසාදන බැගිනුව (ජාඇල) 0.0%ක සිට (පැලියගොඩ) 3.2% දක්වා අඩු වැඩි වී යැ. අවුරුද්ද තුළ කපා බලන ලද අනෙකුත් වර්ගවල මදුරුවන් 1,659ක් තුළ ආසාදනයක් දක්නට නො ලැබුණි.

භාරකයින්ට පහර දීමේ ප්‍රධාන ක්‍රමය වූයේ පිළවුන් වැනසීම යි. බෝවෙන තැන් 1,05,477 කට ඩීසල් තෙලේ මිශ්‍ර කළ මැලතියන්වලින් සතිපතා චක්‍රයක් අනුව සාත්තු කරන ලදි. සත අඩි 28,771ක් පස් දැමීමෙන් බෝවෙන තැන් 645ක් සදහට මැ නැති කරන ලදි. වැසිකිළි තැනවීමේ උදවු සැලැස්ම යටතේ, දියවල සහිත වැසිකිළි 1642ක් "දිය හිර" අන්දමේ වැසිකිළි බවට හරවන ලදි.

පිළවුන් මර්දන කිරීමේ වැඩට අමතර ලෙස "කපෝති" කිරීමේ කෘමිනාශක ද්‍රව්‍ය කින් මදුරුවන් මර්දනය කිරීමේ කටයුතු ද සීමා සහිත ප්‍රමාණයක් දෙහිවල-ගල්කිස්ස පෙදෙසේ හා මාතර පොල්හේන පියසේ හා මෙහෙයවන ලදි.

මෙහෙයවන ලද විශේෂ වැඩට අයත් කාර්ය මෙ සේ වී යැ :—

(අ) රෝගහස්ත පෙදෙසේ මායිම සනිටුහන් කිරීම. රෝග හස්ත නො වන පෙදෙසේ සියලු රෝහල්වලට ඇතුළුවන රෝගීන් පිළිබඳ පරපුටුවේදී සමීක්ෂණයක් කරන ලදි. ලේ පටක 1,32,099ක මුළු ගණනක් ගන්නා ලද අතර

ඩබ්ලිව්. බැන්ක්‍රොෆ්ටයි දක්නට ලබුණේ තිදෙනෙකුගේ පමණ යි. ඒ තිදෙනා ද රෝගහස්ත පෙදෙසේ වැසියන් බව තහවුරු කිරීමට පිළිවන් වී යැ.

(ආ) සතුන්ගේ, විශේෂයෙන් මැ, කුකුළන් ගේ බරවා රෝග හඳුරුව, කුකුළන් අතරින් තුන් වර්ගයකට අයත් බරවා බීජ දක්නට ලැබුණි.

(ඉ) යාපනය, අනුරාධපුරය, ත්‍රිකුණාමලය වැනි රෝගහස්ත නො වන මධ්‍යස්ථානවලැ සී (සී) පැටිගන්ස් වර්ගයේ භාරක ශක්තිය සනිටුහන් කිරීම.

(ඊ) විශේෂයෙන් මැ කසළ වල්වල දී පිළවු මැඩීමේ පිළිවෙලක් හැටියට කෘමිනාශක ගඩොලින් ලද හැකි අගය මැනීම.

4. **සුව කිරීමේ කටයුතු**

රෝග හස්ත පෙදෙසේ මධ්‍යස්ථාන 13 ක පවත්වනු ලද විශේෂ චිකිත්සාගාරවලැ දී රෝගීන් 5,495 දෙනෙකුට ප්‍රතිකාර දෙන ලදි. අලුතෙන් සොයා ගන්නා ලද රෝගීන් ගණන 2,754 කි. දෙහිවල පිහිටි මධ්‍යම චිකිත්සාගාරයේ දී ප්‍රතිකාර ලත් රෝගීන් පිළිබඳ විග්‍රහයක් "XLIV" සටහනේ දක්වේ. අවිඑණු කොටස් ගිය අවුරුද්දේ ඒවාට මුළු මනින් මැ පාහේ සමාන බව පෙනී යනු ඇත.

5. අධ්‍යාපනය

එක් එක් බරවා මර්දන මධ්‍යස්ථානයේ සිරිත් පරිදි කරගෙන ගිය එකී සතියේ සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන හැරුණු විට, මහජනයා සහභාගි වන ශ්‍රමදාන ව්‍යාපාර වැඩ සටහන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වන ලදි. මේ අදහස පෙරදැරිව බරවා මර්දන ව්‍යාපාරීය මධ්‍යස්ථාන සියල්ල සමීක්ෂණ ලද අතර, අම්බලන්ගොඩ සහ මීගමුව ශ්‍රමදාන ව්‍යාපාර ගැනීමට ද තීරණය කරන ලදී. අම්බලන්ගොඩ වැඩ කටයුතු නම් පෙර නොවූ විරූ තරම් සාර්ථක වී යැ.

පාසල් අමතා කතා 57ක් ද මහජනයා අමතා කතා 103ක් ද සිනිමා දැක්වීම් 68ක් ද විනාඩි 15ක ගුවන් විදුලි කතාවක් ද පවත්වන ලදී. ගාල්ල කොළොන්නාව, කොළඹ යන තැන්වල තුන් දැක්මක් සාර්ථක ලෙස පවත්වන ලදී.

බරවා රෝග හා එය මර්දනය කිරීම හා පිළිබඳ පෙන්වීම් සහිත දෙසුම් ව්‍යාපාරීය සේවක පිරිසට ද (18) වෛද්‍ය සහ අතුරු වෛද්‍ය සේවකයින්ට ද (60) අනෙක් අයට ද (234) දෙසන ලදී.

මීගමුව සහ අම්බලන්ගොඩ ශ්‍රමදාන ව්‍යාපාරය සම්බන්ධයෙන් පිළියෙල කරන ලද කොළ 2ක්, සේයා රූ දැන්වීම් 8ක්, සිනිමා රූ තහඩු 6ක්, කොළ කිහිපයක්, දැකුම් බඩු සහ රූ තහඩු යන දේවල් පිළියෙල කරන ලද ප්‍රචාරක ද්‍රව්‍යවලට අයත් විය.

6. පරීක්ෂණාගාර වැඩ

පිටියේ එකතු කරන ලද පැලුම් ව්‍යාපාරීය මූලස්ථානය බද මධ්‍යම පරීක්ෂණාගාර යේ දී පරීක්ෂණයට ගන්නා ලදි.

(පසු වැ ගන්නා ලද ලේ පැලුම් 22,194ක් ඇතුළු) ලේ පැලුම් 4,18,968ක් පරිපූර්ව වේ දී පරීක්ෂණාගාරයේ දී පරීක්ෂණයට භාජනය වී යැ. අතරින් පතර ගන්නා ලද පැලුම් 1,119ක් නැවත බලනු සඳහා වෛද්‍ය පර්යේෂණාගාරයට යවන ලද නමුත්, විරුද්ධ මත දක්නා ලද්දේ තහඩු 15ක් සම්බන්ධයෙන් පමණි.

කරන ලද කීට විද්‍යා වැඩට මදුරුවන් 31,743 ක් හඳුනා ගැනීම ද අයත් වී යැ. ඔවුනතර සී (සී) පැටිගන්ස් වර්ගයේ 24,985 දෙනෙක් ද එම්. (එම්) යුනිෆෝමිස්, ඒ. ඔබ්ටර්බන්ස්, සී. ත්‍රටැනියොහයින්කස්, සී. ජෙලිඩස්, ඒ (එස්) ඊජිප්තායි, ඒ (එස්) ඇල්බොපික්ටස් වැනි වෙනත් වර්ගවල එවුන් 6,758 ක් ද වූහ. කාලය තුළ දී කපන ලද මදුරුවන් ගණන 16,386 කි. ඒ අතර සී(සී) පැටිගන්ස් කුලයේ 14,727 ක් වූහ. මීට අමතර ලෙස මදුරු පිළවුන් 38,849 ක් එකතු කොට බලා හඳුනා ගන්නා ලදහ. වඩා බලගතු වර්ග වූයේ සී. (සී) පැටිගන්ස්, ඒ ඔබ්ටර්බන්ස්, සී. ට්‍රිටැනියො හයින්කස්, සී. ජෙලිඩස්, ඒ. (එස්) ඊ. ජිප්තායි, ඒ (එස්.) ඇල්බොපික්ටස් යන කුල යි.

7. මුද්‍රිත පමුණුවා ගැනීම්

මුද්‍රිත පමුණුවා ගත්දේ අතර කැපී පෙනී ඇත්තේ මේවා යැ :—

(අ) සියුම් බරවා බැගිනුවේ කැපී පෙනෙන අඩුවීම සහ මර්දන කටයුතු අරඹා එක් අවුරුද්දක් තුළ ජා—ඇල සියුම් බරවා බැගිනුවේ තිරසර අඩුවීම.

(ආ) දැනට තිබෙන ක්‍රමන හෝ අවියකින් බරවා මර්දන කටයුතු කරන ලෙසත් පර්යේෂණ කටයුතු මෙහෙයවන ලෙස ත්, ජාතික ආණ්ඩුවලට ජ. සෞ. සංවිධාන විසින් නිර්දේශ ඉදිරිපත් කිරීමේ අවශ්‍යත්වය හුවා දැක්වීම.

(ඉ) සතුන්ගේ බරවා රෝග සහ හස්ත නො වන පෙදෙස් හි සී(සී) පැටිගන්ස් කුලයේ භාරක බලය—පිළිබඳ පිරිසෙවුම් නිගමන.

(ඊ) සමූල පදනමක් පිට ශ්‍රමදාන ව්‍යාපාරයක් අම්බලන්ගොඩ දී සංවිධානය කොට පැවැත්වීම.

ලංඩනයේ, සර්ම කලාපීය වෛද්‍ය කර්මය සහ ස්වස්ථතාව නම් සඟරාවේ මතු සඳහන් ලිපි, රචනා පළ කරවන ලදි:—

(අ) ඩබ්. බෑන්ක්‍රොෆ්ටයි.—තිසා පහළ වර්ගයේ ආසාදනය පිළිබඳ චිකිත්සාගාර වල දී හෙළි වූ කරුණු හැදෑරීම.

පළ කරවීම සඳහා මතු සඳහන් ලිපි, රචනා ඉදිරිපත් කරන ලදි:—

(අ) ලංකාවේ බරවා රෝගය පිළිබඳ ගැටළු සහ මර්දනය අලලා විස්තරයක්.

(ආ) ලංකාවේ ගැටළුවක් වූ කුලෙක්ස් පිපියෙන්ස් පැටිගන්ස් කුලයේ විශිෂ්ඨත්වය.

8. **එක් පුද්ගලයෙකු සඳහා ගිය වියදම**

එක් පුද්ගලයෙකු වෙනුවෙන් ගිය වියදම රු. 1.78 කට කිට්ටු වේ.

(ඊ)—ලාදුරු මර්දනය

එකැලළුම් තලයට සම්පූර්ණයෙන් මැ පාගේ ළඟා වී ඇති හෙයින්, නිති පතා සෑහෙන තරම් ප්‍රතිකාර දීම නො වරදවා ඉටු වීම පිණිසැ රෝගීන් සහ ආශ්‍රිතයින් ලුහුබැඳ ක්‍රියා කිරීම ත්, ආශ්‍රිතයින් පරීක්ෂා කොටැ ප්‍රතිෂෙධ පියවර ගැනීමත්, සෞඛ්‍ය අධ්‍යාපනයත් යන කරුණු කෙරෙහි වැඩි සැලකිල්ලක් එබී බලන අවුරුද්දේ දී දක්වන ලදි.

හැම වෙරක් මැ යොදා දැනට දත්නා රෝගීන් පිළිබඳ දැනට ක්‍රියා කළ යුතු වේ. ප්‍රතිකාරය කෙරෙහි සුපරීක්ෂාකාරී ලෙස විමසිල්ලෙන් සිටීමෙන්, බෝවීමේ මූලාශ්‍රය හීන කොටැ අවසානයේ දී එය මුළුමනින් මැ අතුගා දැමිය හැකි වේ.

පුනරුත්ථාපන වැඩ සටහන සාර්ථක වීමට නම්, අංගවිකලත්ව සහ දුර්වල කම් මගහරවා ගනු පිණිසැ නැවත ගොඩනැගීමේ සැත්කම් විධි ඉක්මණින් භාවිතයට ගත යුතු වේ.

රෝගාතුර තරම

	බෝවෙන වර්ගයේ		බෝ නොවෙන වර්ගයේ		එකතුව
	පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු	
63.10.1 වන දට මුළු ගණන	1,444	312	1,600	761	4,117
නැවත වර්ග කිරීම	9	—	9	—	—
63/64 දී ලේඛ්‍යාරූඪ වූ අලුත් රෝගීන්	107	15	76	20	218
63/64 දී ලේඛනයෙන් ඉවත් කරන ලද ගණන	48	13	52	28	141
64.9.30 වන දට සිටි මුළු ගණන	1,512	314	1,615	753	4,194

ලංකාවේ දැනගත්තට ලැබුණු ලාදුරු රෝගීන් මුළු ගණන දැනට 4,194 ක් වෙයි. මේ අවුරුද්දේ දී අලුත් රෝගීන් 218 දෙනෙක් පොතට ගන්නා ලදහ. ගිය අවුරුද්දේත් එපිට අවුරුද්දේත් මේ ගණන පිළිවෙලින් 264 ක් ද 309 ක් ද වී යැ. පොතෙන් අස්කරන ලද රෝගීන් 141 දෙනාගෙන් 107 දෙනෙක් මළවුන් ය; 25 දෙනෙක් සුවපත් වූහ. ඉතිරි කොටස දෙ වතාවකින් නම් ලියැවුණු අය සහ දිවයිනෙන් නික්මැ ගිය අය වූහ.

වයස් ගොල්ල, ලිඟු, වර්ගය අනුව බෙදා දැක්වෙන මුළු රෝගීන් ගණන :—

වයස	බෝවෙන පිරිමි	බෝවෙන ගැහැණු	එකතුව	බෝ නොවන පිරිමි	බෝ නොවන ගැහැණු	එකතුව	මුළු එකතුව
0–4	—	—	—	—	1	1	1
5–9	1	—	1	10	11	21	22
10–14	10	7	17	57	34	91	108
15–19	31	10	41	77	51	128	169
20–29	191	59	250	213	91	304	554
30–39	400	79	479	349	148	497	976
40–49	379	62	441	337	129	466	907
50–59	273	46	319	279	136	415	734
60–69	171	34	205	208	105	313	18
70ට ඉහළ	56	17	73	85	47	132	205
එකතුව	1,512	314	1,826	1,615	753	2,368	4,194

පිරිමි 3,127 යි, ගැහැණු 1,067 යි.

රෝගීන් මුළු ගණන වයස්—ගොල්ල, ලිඟු, වර්ගය යනු විසින් බෙදා වෙන් කර ඉහත දැක්වෙයි. ඉහළ ම ගණන 30—39 වයස් ගොල්ලේ වූ අතර ඊ ළඟ තැන් ගත්තේ 40—49, 50—59 වයස් ගොල්ලෝ යැ. පිරිමි/ගැහැණු අනුපාතය 3 ට 1 කි. බෝ වෙන වර්ගයේ අනුපාතය 5 ට 1 ක් වන අතර බෝ නොවෙන වර්ගයේ නම් එය 2 ට 1 කි. පිරිමින් අතර වැඩිතරයක් දක්නට ඇත්තේ ඔවුන් වඩා පහසුවෙන් රෝගයට නැමෙන නිසා යැ. බෝ වෙන වර්ගයේ මේ අනුපාතය නංවන ලද්දේ වැඩි තර කාලයක් අල්ලා සිටීම නිසා යැ.

පළාත් ලිඟු, වර්ග අනුව මුළු ලාදුරු රෝගීන් ගණන

පළාත	බෝවෙන වර්ග පිරිමි	බෝවෙන වර්ග ගැහැණු	එකතුව	බෝ නොවෙන පිරිමි	බෝ නොවෙන ගැහැණු	එකතුව	මුළු එකතුව
බටහිර	759	177	936	838	427	1,265	2,201
දකුණු	219	44	263	239	128	367	630
සබරගමු	120	25	145	125	51	176	321
නැගෙනහිර	111	17	128	130	38	168	296
මැද	69	15	84	85	42	127	211
වයඹ	80	15	95	69	15	84	179
උතුරු	76	11	87	50	22	72	159
ඌව	52	8	60	67	22	79	139
උතුරු මැද	26	2	28	22	8	30	58
එකතුව	1,512	314	1,826	1,615	753	2,368	4,194

මුළුරෝගීන් ගණන පළාත් අනුවැ බෙදී යන අයුරු ඉහතින් පෙනේ. වැඩිතම රෝගීන් ගණනක් බටහිර පළාතේ දක්නට ලැබිණි. එය 2,201 කි. කොළඹ මහ නගර සභා ප්‍රදේශයෙන් ද රෝගීන් 574 දෙනෙක් මීට ඇතුළත් වෙති. දකුණු පළාතේ රෝගීන් 630 දෙනෙකු සිටිය අතර, 58 ක් වූ අඩු මැ ගණන උතුරු මැද පළාතේ වී යැ.

පළාත් අනුව, ස්පර්ශ ලැබූ මුළු ගණන

පළාත	බෝවෙන වර්ගය ස්පර්ශ කළ අය 15ට ඉහළ	15ට පහළ	එකතුව	බෝ නොවෙන වර්ගය ස්පර්ශ කළ අය 15ට ඉහළ	15ට පහළ	එකතුව	මුළු එකතුව
බටහිර	2,433	1,071	3,504	3028	1,361	4,389	7,893
දකුණු	766	294	1,060	995	473	1,468	2,528
නැගෙනහිර	238	173	411	348	270	618	1,029
සබරගමු	248	157	405	260	195	455	860
වයඹ	258	141	399	240	123	363	762
මැද	231	101	332	279	126	405	737
ඌව	167	103	270	231	122	353	623
උතුරු	168	92	260	164	96	260	520
උතුරු මැද	39	39	78	60	47	107	185
එකතුව	4,548	2,171	6,719	5,605	2,813	8,418	15,137

ස්පර්ශ ලැබූවන් 15,137 දෙනෙක් විපිළිසරය යටතේ සිටිත්. රෝගයට බෙහෙවින් නැමෙන සුළු වූ 15 ට පහළ වයස් ගොල්ලට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. ඇදිහැස කිරි සහ ඕ. ඕ. එස්. ප්‍රතිෂේධීය බෙහෙත් වඩි දීමට අමතර වැ, තම ප්‍රතිශක්තිය දියුණු කරවා ගනු පිණිසැ මෝර තෙල් ගන්නා ලෙසත් වෙනත් විධි—විධාන යොදා ගන්නා ලෙසත් ස්පර්ශය ලැබූවන්ට උපදෙස් ද දෙන ලදි. සමීක්ෂුම් වැඩ සටහනේ දී ස්පර්ශකයින් පිරික්සීම කෙරෙහි අවධාරණය යොමු කරන ලදි. ස්පර්ශකයින් පිරික්සා සැක කටයුතු වන දද ආදිය යමක් වෙතොත්, ඒ බව විගසින් දන්වනු සඳහා, හැම ගෙදරක මැ, ප්‍රධාන ගෙවැස්සා/ගෙවැස්සන්ගේ කැමැත්තෙන් නිල කරන ලදි. ලාදුරු රෝගයෙන් බේරීමට හැකි ශක්තියක් ලබා දෙන බී. සී. ජී. එන්නත ස්පර්ශය ලැබූවන් සියලු දෙනා වෙත, විශෙෂයෙන් මැ 15ත් පහළ වයස් ගොල්ලේ අය වෙත නිර්දේශ කරනු ලැබේ. සමූල බී. සී. ජී. එන්නතට ලාදුරු රෝගීන්ගේ ස්පර්ශය ලැබූවන් ද ඇතුළත් කරන සේ දන්වා දෙපාර්තමේන්තු උපදෙස් දැනට නිකුත් වී ඇත. එ කී වැඩ සටහන ලබන අවුරුද්දේ දී ප්‍රබල කරවනු ඇත.

වයස් ගොල්ල, ලිඟු වර්ග අනුවැ අලුත් රෝගීන්

වයස් ගොල්ල	බෝවෙන පිරිමි	ගැහැණු	එකතුව	බෝ නොවෙන පිරිමි	ගැහැණු	එකතුව	මුළු එකතුව
0–4	—	—	—	1	1	2	2
5–9	—	—	—	1	—	1	1
10–14	4	2	6	4	—	4	10
15–19	3	1	4	4	1	5	9
20–29	16	4	20	12	3	15	35
30–39	27	3	30	10	3	13	43
40–49	23	2	25	18	2	20	45
50–59	18	1	19	13	3	16	35
60–69	11	2	13	11	7	18	31
70ට ඉහළ	5	—	5	2	—	2	7
එකතුව	107	15	122	76	20	96	218

අවුරුද්ද තුළ දී අලුත් රෝගීන් 218 දෙනෙක් පොතේ ලියැවුණහ. වැඩිතම ගණනක් වූයේ 40—49 වයස් ගොල්ලේ යැ. බටහිර පළාතෙන් රෝගීන් 108 දෙනෙක් සිටි අතර ඔවුන්ගෙන් 30 දෙනෙක් කොළඹ මහ නගර සභා සීමාවෙන් යැ. සබරගමු පළාතේ රෝගීන් 30 දෙනෙක් වූහ. අඩු මැ ගණන දක්නා ලද්දේ උතුරු මැද පළාතේ යැ. එය 8 කි. සියලු රෝගීහු ප්‍රතිකාර යටතේ තබන ලදහ. ස්පර්ශ ලැබූවන් ගැන ලුහුබැඳ ක්‍රියා කරනු ලැබේ.

සමීක්ෂුම් වැඩ සටහන

අවුරුදු පතා රෝගීන් ලුහු බැඳ ක්‍රියා කිරීම දිවයිනේ සෑම සෞඛ්‍ය වසමක මැ ඒ ඒ ප්‍රදේශයේ සෞඛ්‍ය නිලධාරීන්ගේ හා මහජන සෞඛ්‍ය පරීක්ෂකයින්ගේ හා සහභාගිත්වයෙන් සැලස්ම අනුව ඉටු කරන ලදි. ස්පර්ශය ලැබූවන් පිරික්සීම, රෝගියාගේ දියුණුව මැනීම, ප්‍රතිකාරයේ ප්‍රමාණවත් බව සහ නිත්‍ය බව උරගා බැලීම, ප්‍රතිකාර විධි සැලසීම, ඇඳිහැස කිරි බෙදීම, ලේකම් පොත් සහ සඳහන් තබා ගැනීම මේ සමීක්ෂුම් සමයේ දී සොයා බලන ලද අංශවලින් සමහරෙකි.

චිකිත්සාගාර

අවධාරණය ලොව පුරා ලාදුරු ආයතනවලින් චිකිත්සක මධ්‍යස්ථාන කරා ගමන් කරයි. එ සේ හෙයින්, බාහිර රෝගීන් සඳහා වූ චිකිත්සාගාරවලින් දෙන ප්‍රතිකාරවලට විශේෂ සැලකිල්ලක් හිමි වී යැ. කොළඹ 7, පරණ ඇස් රෝහලේ පිහිටි මධ්‍යම ලාදුරු චිකිත්සාගාරයට හසළ නිලධාරීන් යොදවා ඇත. රෝග හස්ත පෙදෙසේ නම්, ම. සෞ. පරීක්ෂක, දි. වෛ. නි., ඇපොතිකරි යනාදි ප්‍රාදේශීය සෞඛ්‍ය නිලධාරීන්ගේ සහාය ඇති ව ව්‍යාපාරීය නිලධාරීන් විසින් චිකිත්සාගාර පවත්වන ලදි. අනෙක් සියලු සෞඛ්‍ය කාර්යාල රෝහල්, බෙහෙත්හල් ලාදුරු රෝගයට ප්‍රතිකර දීමේ මධ්‍යස්ථාන හැටියට ක්‍රියා කරයි. ඩී. ඩී. එස්. පෙති සෑම සෞඛ්‍ය කාර්යාලයයෙකැ මැ තිබෙන හෙයින්, රෝගියාට ප්‍රතිකාර සඳහා යා නො හැකි නම් ම. සෞ. පරීක්ෂක තැන විසින් ගෙදරට ගොස් ප්‍රතිකාර දිය හැක.

64. 9. 30 වන දා සිටි රෝහල් ගත රෝගීන් මුළු ගණන

	බෝවෙන			බෝ නොවන			
	පිරිමි	ගැහැණු	එකතුව	පිරිමි	ගැහැණු	එකතුව	මුළු එකතුව
හැඳල ලාදුරු රෝහල ...	273	45	318	204	88	292	610
මාන්තිවු ලාදුරු රෝහල ...	90	6	96	37	13	50	146
එකතුව	363	51	414	241	101	342	756

ආයතනගත ප්‍රතිකාර අවශ්‍ය රෝගීන්ට විශේෂ ආයතන දෙකක් තිබේ. උක්ත සටහනෙන් පෙන්වන පරිදි 64. 9. 30 වන දා, රෝහල්ගත රෝගීන් 756 දෙනෙක් වූහ.

මරණ

	බෝවෙන			බෝ නොවෙන			
	පිරිමි	ගැහැණු	එකතුව	පිරිමි	ගැහැණු	එකතුව	මුළු එකතුව
හැඳල ලැදුරු රෝහල ...	25	4	29	10	7	17	46
මාන්තිවු රෝහල ...	3	2	5	1	—	1	6
පිටියේ	17	4	21	25	9	34	55
එකතුව ...	45	10	55	36	16	52	107

මරණ 107 ක් මේ කාලයේ දී ලියැවුණි.

පුරුත්ථාපනය

නැවත ගොඩනැඟීමේ සැත්කම් හිඟය නිසා සාර්ථක පුනරුත්ථාපනය අවහිර වී ඇත. මේ විශේෂිතය සඳහා තෝරා ගත්තා ලද නිලධාරියා අන්තිම මොහොතේ ඉවත් වී යැ. මේ කාර්ය තලයේ ජ. සෞ. සං. අධි ශිෂ්‍යත්වය ඉක්මණින් ප්‍රයෝජන යට ගත යුතු වේ.

ප්‍රතිකාර දීමේ වැඩ සටහනට කායික චිකිත්සාව සහ වෘත්තීය චිකිත්සාව ආදා-ගනු ලැබේ. පුහුණු නිලධාරීන් ද ලද හැකි යැ.

මිල මුදලින් උදවු

උක්ත වැඩ සටහන යටතේ හැඳල, මාන්තිවු යන ලාදුරු රෝහල්වලින් රෝගීන් 112 දෙනෙකු පිට කරන ලෙස වෛද්‍ය නිලධාරීන් කමිටුවක් නිර්දේශය කළා යැ. මේ ක්‍රමය යටතේ රෝගීන් 480 කට කිව්වු ගණනකට සෙත සැලසෙන අතර, මේ වෙනු වෙන් අවුරුදු පතා රු. 3,00,000 ක වියදමක් සමාජ සේවා දෙපාර්තමේන්තුව දරයි.

වෙනත් පුවත්

අවුරුදු 50ක තරම් කාලයක් තිස්සේ හැඳල, මාන්තිවු යන ලාදුරු රෝගල්වලැ නියුක්ත වී සිටි ආගමික හෙදකම් මව්වරුන් ඉවත් කොටැ ඒ වෙනුවට 64.3.15 වනදා සිට මෙ රටැ හෙදකම් සේවක පිරිසක් යොදවන ලදහ.

ඌරගස්මන්හන්දියේ පුනරුත්ථාපන මධ්‍යස්ථානය 63.10.1 වනදා වසා දමන ලදි. සංවත්සර බිෂොප්ගේ සංග්‍රහය සහ ක්‍රීඩා හමුව 1964.2.29 වනදා හැඳල ලාදුරු රෝහලේදී පවත්වන ලදි.

(උ) සමාජ රෝග මර්ධනය

1. **රෝගාතුර තරම**

සමාජ රෝග හෙවත් රති රෝග නම් ගැටළුව පසුගිය අවුරුදුවලැ මෙන් මැ තිබුණි. බෝවෙන සුලු උපදංශ රෝගීන් 310 දෙනෙක් ද සුද බිංදුම රෝගීන් 1,757 දෙනෙක්ද වූහ. 1963 අවුරුද්දේ නම් බෝවෙන සුලු උපදංශ රෝගීන් 367 දෙනෙක් ද සුද බිංදුම රෝගීන් 1,969 ක්ද වූහ. ප්‍රතිකාර ලැබීමට පැමිණිය වුන් අතර මුල් තැන ගත්තේ මේ වරද 20-29 වයස් ගොල්ලේ අයයි. 10-19 වයස් ගොල්ලේ අය අතුරින් ප්‍රතිකාර ලැබීමට ආ අයගේ අනුපාතය 1963 දී සියයට 15.8ක් වී තිබී 1964 දී 14.5 දක්වා සුළු වෙන් පහළ බැස තිබේ. ස්පර්ශ ලද්දවුන් පරීක්ෂා කිරීමේ හා සෞඛ්‍ය බැස තිබේ. ස්පර්ශ ලද්දවුන් පරීක්ෂා කිරීමේ හා සෞඛ්‍ය අධ්‍යාපනයේ හා ප්‍රතිඵලයක් හැටියට බෝවෙන සුලු උපදංශ රෝගීන්ගෙන් සියයට 65.5ක් ප්‍රතිකාර සඳහා ගෙන්වන ලදහ. ගිය අවුරුද්දේ ගණන සියයට 74කි. බෝවෙන සුලු උපදංශ, සුද බිංදුම යන දෙ පක්ෂයේ මැ රෝගීන් ප්‍රතිකාර ලැබීමට පැමිණි ගණන පහත බැස ඇතත්, එය අපේ මර්දන කටයුතු ලිහිල් කළ හැකි තරම් තත්ත්වයකට බැස නැත.

පිට පළාත් චිකිත්සාගාර සියල්ලේ ගණන එකට ගත් කැලැ වෙනසක් නො පෙන් වන නමුත්, බෝවෙන සුළු උපදංශ රෝගීන් ගණන අනුව නම් කුරුණෑගල වැඩිවීමක ලකුණු පහළ කරයි. මේ චිකිත්සාගාරයේ ගැහැණු සුද බිංදුම රෝගීන් දැක්වෙන අනුපාතය ද ඉතා ඉහළ වේ. එය පිරිමින්ට වඩා සියයට 50කින් වැඩි යැ. බීජ වැඩිවීමේ පරීක්ෂණවලින් ද තොර වැ යි මේ ගණන.

අනුරාධපුර ද, ගැහැණු සුද බිංදුම රෝගීන් පැමිණි ගණන පිරිමින්ට වඩා සියයට 50කින් වැඩි වී යැ. මෙයින් ඇතැමෙකු "සුද බිංදුම යැයි සිතිය හැකි" රෝගීන් විය හැක.

2. සමාජය පැත්තෙන්

කොළඹ චිකිත්සාගාරවලට පැමිණි රෝගීන් අතුරෙන් වැඩියෙන් මැ කම්කරුවෝ යැ. බෝවෙන සුළු උපදංශ විෂයයෙහි සියයට 34.3ක් ද සුද බිංදුම විෂයයෙහි සියයට 31.3ක් ද ඔවුනතර දක්නට ලැබුණි. ගිය අවුරුද්දට වඩා මෙය යන්තමින් පහළ බැස ඇත.

ඊ ළඟ තැන ලැබුවෝ වෙළෙන්දෝ යැ. බෝවෙන සුළු උපදංශ විෂයයෙහි සියයට 15.2 ක් ද සුද බිංදුම විෂයයෙහි සියයට 16.6ක් ද ඔවුන් තර දක්නට ලැබේ.

රෝග බෝවීමේ මාර්ග පසු ගිය කාලයේ මෙන් මැ අහම්බෙන් හමු වී ලිංගික සම්බන්ධකම් ඇති කැර ගන්නා අය අතර හා ගණිකාවන් අතර හා ඉහළින් දක්නට ලැබුණි.

3. සංවිධානය

ව්‍යාපාරයේ සංවිධානයේ වෙනසක් සිදු වී නැත. කොළඹ පිහිටි චිකිත්සාගාරයට අතිරේක වැ මහනුවර (කටුගස්තොට), යාපනේ, ගාල්ල රත්නපුර, කුරුණෑගල, අනුරාධපුර, මීගමුව, හොරණ යන නගරවලැ පූර්ණ-කාල චිකිත්සාගාර 9ක් පැවැත් වුණි.

ව්‍යාපාරයේ දෙ විසි අවුරුද්දක් සේවය කළ පරිපාලක ම. සො. පරීක්ෂක ඩී. වී. එස්. එස්. ගුණවර්ධනයෝ ද තුදුස් අවුරුද්දක් සේවය කළ ප. ම. සෞ. ප. එස්. එල්. ප්‍රනාන්දුවෝ ද 1963 නොවැම්බරයේ දී සේවයෙන් විශ්‍රාම ගත්හ. ඔවුන් සමග ඇසුරට වැටී සිටි ජාතික, ජාත්‍යන්තර නිලධාරීන් විසින් මේ දෙ පොළගේ සේවය බොහෝ කොටැ පසසා ඇත.

ගිය අරවුද්දේ තීරණය කළ පරිදි, මස්තුවේද න්‍යායෙන් ලේ පරීක්ෂා කිරීම මඩකළපුවේ අරඹන ලදී. 1964 ඔක්තෝබරයේ දී අනුරාධපුර ලේ පරීක්ෂාව පටන් ගනු සඳහා කාර්මිකඥයෙක් 1964 සැප්තැම්බරයේ දී පුහුණු කරවන ලදී.

4 එක්තැන් කිරීම

(ක) ප්‍රාදේශිය වරම්දරුවන්

කොළොඹ හා මහනුවර හා මහ නගර සභා සෞඛ්‍ය නිලධාරිහු, තම තමන්ගේ චිකිත්සාගාරවලැ පොතේ ලියැවුණු සියලු අලුත් අය පිළිබඳ සිරිත්හුරු ගැබිණි ලේ පරීක්ෂණ දිගට මැ කළහ. ප්‍රතික්‍රියා දැක්වූ සියලු අයට කොළඹ හා කටුගස්තොට චිකිත්සාගාරවලැ දී ලුහුබැඳි පිළිවෙත් සපුරා ප්‍රතිකාර දෙන ලදී.

(කා) ස්වෙච්ඡා සංවිධාන

රති රෝග මර්දනයෙහි ලා අධ්‍යාපන වැඩ සටහන සහ සමූහ කතා, ඒ ඒ පෙදෙස්හි ස්වෙච්ඡා සංවිධානවලැ සහයෝගයෙන් මෙහෙයවන ලදී.

5. කරන ලද වැඩ

රෝගීන් සෙවීම, රෝග-විනිශ්චය, ප්‍රතිකාර විධි, ලුහුබැඳුම් පිළිවෙත් සියලු පූර්ණ කාල චිකිත්සාගාරවලැ දී ඉටු කරන ලදී. චිකිත්සාගාරවලැ ප්‍රතිකාර ලත් සියලු අලුත් රෝගීන් පිළිබඳ විග්‍රහයක් "XLV සටහනේ දැක්වෙයි.

(1) **වැළැක්වීම අතින්.**—සියලු බෝවෙනසුළු උපදංශ රෝගීන් විෂයයෙහි සිරිත් හුරු පිළිවෙතක් හැටියට වසංගතවේදී සෝදිසි ඉටු කරන ලදී.

සිර ගෙවල්, රිමාන්ඩ් ගෙවල්, බාලාපරාධකරුවන්ගේ අභ්‍යාස පාසල් යන තැන් වලට අලුතෙන් ඇද්ද ගන්නා සියලු දෙනා පසු ගිය කාලයේ මෙන් මැ සිරිත්හුරු ලේ පරීක්ෂණවලට භාජනය කරන ලදහ.

කොළඹ ගැහැණු රෝහල්වලැ හා මහ නගර සභාව සතු චිකිත්සාගාරවලැ හා සිරිත් හුරු ගැබිනි ලේ පරීක්ෂණ ගන්නා ලදි. ගැබිනියන් විෂයයෙහි සිරිත්හුරු ලේ පරීක්ෂණ සියලු පළාත් බද රෝහල්වලැ ඉටු කරන ලදි. අර්ධ කාල චිකිත්සාගාර පිහිටුවා ඇති දිසා රෝහල්වලැ ගැබිනි චිකිත්සගාරවලට ද මේ කටයුතු විහිදුවනු ලැබී යැ.

වැවිලිකරුවන්ගේ සංගමයේ වතු සෞඛ්‍ය යෙදුමේ වෛද්‍ය නිලධාරීන්ගේ සහයෝග ය ඇති වැ, එ කී සෞඛ්‍ය යෙදුමට අනුබැඳි වතුවලැ ගැබිනි මව්වරුන් පිළිබඳ සිරිත්හුරු ලේ පරීක්ෂණ 1964 මැයි මාසයේ දී ඇරඹිණි. නිවා බඳුන්වලට ලේ පැලුම් එකතු කිරීමෙහි ලා, වතුවලැ නියුක්ත ඇපොතිකරිවරු පුහුණු කරවන ලදහ.

මේ නිවා බඳුන් උපකරණ කට්ටල කිහිපයක් මේ සඳහා වතු පාලකයින් වෙත දෙන ලදී.

ගැබිනි මවුන්ගේ ලෙයින් ප්‍රතික්‍රියා දැක්වූ තරම කොළඹ නම් මේ අවුරුද්දේ සියයට 0.79ක් වූ අතර ගිය අවුරුද්දේ සියයට 1.34කි. පිටපළාත්වලැ නම් මේ වර 1.22ක් ද ගිය වර 0.85ක් ද වී යැ.

උපදංශ බැලීමට රතිරෝග පිරිසෙවුම් රසායනාගාර පිරික්සුම්, ලංකා විශ්ව විද්‍යාලය යට අලුතෙන් ඇතුළු වන සියල්ලන් විෂයයෙහි කරන ලද නමුත්, ප්‍රතික්‍රියා දැක්වූ වන් කිසිවෙකුත් නොවූහ.

(ii) **සුව කිරීමේ අතින්.**—සියලු උපදංශ සහ සුදබිංදුම රෝගීන්ට ප්‍රතිකාර කිරීමෙහි ලා වැඩි කැමැත්තක් කොළඹ දී හිමි වූයේ පී. ඒ. එම්. (හෙවත් ඇලුමිනියම් මොන්ස්ට රේට් සියයට 2ක් සමග ප්‍රොකේන් පෙනිසිලින්) ඖෂධ යි. පිට පළාත් චිකිත්සාගාර ඇතැමෙකැ බෙනසහීන් පෙනිසිලින් යොදන ලදි. පෙනිසිලිනයෙන් ප්‍රතිකාර දීමට පෙරැ පෙනිසිලින් නැම්යාව බලනු පිණිසැ සියලු රෝගීහු පිරික්සන ලදහ. ට්‍රිපොනැමා පැලිඩම් පෙනිසිලිනයට ඔරොත්තු දීමේ බලයක් නගා ඇති බවට කිසිදු ලකුණෙක් නො වී ය. ගොනොකුකුසයා දිගට මැ පෙනිසිලිනයට සහ ස්ට්‍රෙප්ටොමයිසිනියට අඩු නැම්යාවක් දක්වන්නට වී යැ. සුද බිංදුම මැඩලීමේ පියවර අසාර්ථක වීමට හේතුව මේ නැම්යාවේ වෙනස මැයි කිය නො හැක්කේ මේ ජීවානුවට ඔරොත්තු දෙන ප්‍රති ජීවක තවත් බොහෝ තිබෙන හෙයිනි. පුද්ගලයා තුළැ සුද බිංදුම මැඩලීම අපහසු නො වන නමුත්, ගැහැණිය තුළැ පවත්නා විපුල බෝවීම් රඳාර මෙ තෙක් සොයා ගත නො හැකි වීම නිසා මේ රෝගය ජනතාව තුළැ මර්දනය කිරීම තව මැ ගැටළුවෙකි. විවශි කම්පනය ලැබූ රෝගීන් කිසිවෙකු ද මේ අවුරුද්දේ නො දක්නා ලදහ.

6. අධ්‍යාපනය අතින්

පිට පළාත්හි ආයතනවලැ අර්ධ-කාල රති රෝග චිකිත්සාගාර පවත්වනු සඳහා වෛද්‍ය සහ අතුරු-වෛද්‍ය නිලධාරීන් පුහුණු කරවීම දිගට මැ කැරගෙනැ යන ලදි.

සේවයේ සිටි, පුහුණුවේ සිටියන් දෙගොල්ලට අයත් නො යෙක් සෞඛ්‍ය සේවකයින් වෙත දෙසුම් සහ දැක්වීම් සහිත දෙසුම් පවත්වන ලදි. කොළඹ චිකිත් සාගාරයට අයත් වෛද්‍ය නිලධාරියෙක් පශ්චාත්-උපාධි අධ්‍යයන නිවාඩු පිටැ 1964 ජූනි මාසයේ දී එක්සත් රාජධානියට ගොස්, වෛද්‍ය පොලර් මහතා සමග බර්මින්හම් චිකිත්සාගාරයේ වැඩ කළේ යැ.

රති රෝග මර්ධනයේ චිකිත්සාගාර සහ පරීක්ෂණාගාර අංශ පිළිබඳ සාකච්ඡාවක් 1964 සැප්තැම්බර් 23 වන ද කොළඹ චිකිත්සගාරයේ දී මෙහෙයවන ලදි. 1964 සැප්තැම්බර් 25 වන ද කොළඹ චිකිත්සාගාරයේ පැවැත්වුණු, රති රෝග මර්ධනයේ පරීක්ෂණාගාර කටයුතු පිළිබඳ සාකච්ඡාවකට සියලු පළාත් බද රෝහල්වලට අයත් ව්‍යාධිවේදීහු සහභාගි වූහ. අලුතෙන් පිළිගත් ප්ලුරෝසන්ට් ට්‍රිපොනිමල් ප්‍රතිදේහ

පරීක්ෂණය ගන්නා හැටි ඔවුන්ට පෙන්වන ලදි. මේ සාකච්ඡා දෙක මෙහෙයවන ලද්දේ, රතිරෝග මර්ධන ව්‍යාපාරයේ අධිකාරිනිය මුලසුන් දරන් දී, ජ. සෞ. සං. පුරෝහිත මදුරාසි වෛද්‍ය විද්‍යාල විමසුම් පරීක්ෂණාගාරයේ මහාචාර්ය සී. ඩබ්. චකෝ මහතා විසිනි.

7. පරීක්ෂණාගාර වැඩ

රති රෝග ගිරිසෙවුම් පරීක්ෂණාගාර පරීක්ෂණය කොළඹ චිකිත්සාගාර පරීක්ෂණාගාරයේ ත් මහනුවර (කටුගස්තොට රති රෝග පරීක්ෂණාගාරයේ) ත්, යාපනේ, රත්නපුර, කුරුණෑගල, ගාල්ල, බදුල්ල යන පිටපළාත් පරීක්ෂණාගාරවලැ ත් සතුටුදායක ලෙස පවත්වා ගන්නා ලදි.

ර. රෝ. පි. ප. පරීක්ෂණය සීමා සහිත තරමකට 1963 දෙසැම්බරයේ දී මඩකළපුවැ පළාත් බද පරීක්ෂණාගාරයේ පටන් ගන්නා ලදි. මේ පරීක්ෂණය 1964 ඔක්තෝබරයේ දී අනුරාධපුර පළාත් බද පරීක්ෂණාගාරයේ ද පිහිටුවනු ඇත. කාර්‍ය මණ්ඩලය සහ ඉඩ-කඩ ලැබුණු විගසින්, මස්තුවේදීය ලේ පරීක්ෂණ වැඩ වැඩි දුරටත් උතුරු කොළඹ, දකුණු කොළඹ රෝහල්වලටත් කෑගල්ල රෝහලටත් විමධ්‍යගත කොටැ බෙදා දීමට අර-ඇඳ තිබේ. කරන ලද පරීක්ෂණාගාර වැඩ "XLVI" සටහනේ දැක්වෙයි.

8. විශේෂ හදාරු—පිරිසෙවුම් සහ සමීක්සුම්

1964 ජූලි 24, 25 යන දිනවලැ ප්‍රතිජීවකයින් මැයෙන් වූ සමුනේරුවේ දී, "රති රෝගයෙහි ප්‍රතිජීවිකයින්" යන මැයෙන් මා ඇගි ලිපියක් කියැවූ වෛද්‍ය සී. එස්. රත්නතුංග මහතා ලංකාවේ ප්‍රතිඵල වෙනත් රටවලැ ප්‍රතිඵල හා සසඳා බැලී යැ.

පිටරට සඟරාවන්හි පළ කරවීමට අනුදැනුම පතා, වෛද්‍ය ඊ. බී. සී. පෙරේරා, සී. එස්. රත්නතුංග යන මහතුන් විසින් විරචිත "ලංකාවේ රතිරෝගයෙහි යටගියාව" යන මැයෙන් යුත් ලිපියක් ද "ලංකාවේ රති රෝග" මැයෙන් වෛද්‍ය සී. එස්. රත්නතුංග මහතාගේ ලිපියක් ද අමාත්‍යාංශයට ඉදිරිපත් කොටැ තිබේ.

මුල් අවධියේ ප්‍රතිකාර ලත් උපදංශ රෝගීන්ගේ මස්තිෂ්ක කණ්ටක ද්‍රව්‍ය (කොඳු නාරටියේ දියර) පිළිබඳ හදාරුව අවසන් කොටැ සිටින වෛද්‍ය ඩබ්ලිව්. එල්. ප්‍රනාන්දු මහතා, පළ කරවීම සඳහා එය ඉක්මනින් ඉදිරිපත් කරනු ඇත.

මාතර, ගාල්ල දිසාවලැ කොන්වී සිටි බෝවේන පරංගි රෝගීන් කිහිප දෙනෙකු අල්ලා ගැනීමෙන් පසු ඒ දිසාවලැ ගෙන්-ගෙට ගොස් සමීක්සුම් 6ක් පැවැත්වීමට ගාල්ල රතිරෝග චිකිත්සාගාරයේ වෛද්‍ය නිළධාරි වෛද්‍ය ආර්. මහෙන්ද්‍රන් මහතා බාර ගත්තේ යැ.

දෙ වන උපදංශ වැළඳුණු එක්තරා රෝගියෙකුගෙන් ට්‍රිපොනිමා පැලීඩියම් සාඵක ලෙස මෙ රටැ සාවෙකු තුළට මාරු කිරීමට සමත් වූ වෛද්‍ය ටී. ජේ. පී. රත්නායක මහතා, එ කී ගණයා රකිමින් සිටී.

ගොනොකුකුසයා ප්‍රතිජීවකයින් වේත නැමෙනසුලු ගතිය (හෙවත් නැමියාව) මැන බැලීමේ නැමියා පිරික්සුම්, දැනට ලද හැකි ගොනොකුකුස ගණ යම් යම් ඖෂධ කෙරෙහි දක්වන නැමියාව මැනීමේ අදහසින් සිරිත්හුරු වැඩ ලෙස දිගට මැ කරන ලදි.

9. ජාත්‍යන්තර උදවු

මදුරාසි වෛද්‍ය විද්‍යාලයීය විමසුම් පරීක්ෂණාගාරයේ මස්තු විද්‍යා පිළිබඳ මහාචාර්‍ය වර වෛද්‍ය සී. ඩබ්ලිව්. චකෝ මහතා ජ. සෞ. සංවිධානයේ කෙටි-කාල පුරෝහිතයෙකු හැටියට 1964 සැප්තැම්බර් 3 වනදා සිට සැප්තැම්බර් 28 වනදා දක්වා කොළඹ

චිකිත්සාගාරයීය පරීක්‍ෂණාගාරයේ සේවය කළේ යැ. අප පරීක්‍ෂණාගාරවලැ ප්ලූරොසන්ට් ට්‍රිපොනිමල් ප්‍රතිදේහ පරීක්‍ෂණය පිහිටුවාලීමට හේ අප නිලධාරීන්ට උදවු වී යැ. නිකොල්ගේ ට්‍රිපොනිමා පැලිඩියම් දිහරකින් ආසාදනය වූ සාවුන් දෙදෙනෙකු මෙහි ගෙනා හෙතෙම ඒ දහර මෙ රටැ සාවුන් හට කැවී යැ. මේ දහර දැනට සතුටුදායක ලෙස පිහිටා ඇත.

කොළඹ චිකිත්සාගාරයීය පරීක්ෂණාගාරයේ ප්ලූරොසන්ට් ට්‍රිපොනිමල් ප්‍රතිදේහ පරීක්ෂණය පිහිටුවීම සඳහා 1964 ජූලි මාසයේ දී අප වෙත ලැබුණු පාරජම්බුල අනුදක්නය සහ අනෙකුත් උපකරණ අපවෙත තෑගි කිරීම සම්බන්ධයෙන් ජගත් සෞඛ්‍ය සංවිධානයට හා යුනිසෙප් නම් එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා හදිසි ආපදා අරමුදලට හා අපගේ විශේෂ ස්තුතිය පිරිනැමේ.

(උ) මානසික සෞඛ්‍යය

හැඳින්වීම

පසුගිය අවුරුදුවල මුහුණ පා සිටි මනො වෛද්‍යවරුන්ගේ හිඟය, එක්සත් රාජ ධානියේ සිටැ නිපුණ මනො වෛද්‍යවරුන් පෙරළා පැමිණීමෙන් මේ අවුරුද්දේ දී මඟහරවා ගන්නා ලදී.

පැලවත්ත රෝහල පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් බවට හැරවීමේ යෝජනාව අවසානයේ දී පිළිගන්නා ලදී. මේ අරමුණ සාර්ථක කරවා ගැනීමෙහි ලා ලංකා මානසික සෞඛ්‍ය සංගමය උද්‍යොගයෙන් ක්‍රියා කළා යැ.

ඇඳිහැස සංවිධානය ජූලි 27 වන දා සිට මේ ආයතනයට පිටි දීමට පටන් ගත්තේ යැ. මේ ආයතනයට අවශ්‍ය පාන් පිළිස්සීම සඳහා මේ පිටි අලෙවි කිරීමේ දෙපාර්ත මේන්තුවට සපයනු ලැබේ. මෙයින් ඉතුරු වන මුදල, ගරා වැටුණු වාට්ටු ගෙයක් පාන් පෝරණුවක් බවට හැරවීමට අවශ්‍ය වෙනස් කිරීම්, එකතු කිරීම් ආදි ගොඩ නැගිලි වැඩෙහි යොදවනු ඇත. මේ අරමුණෙහි පළමු අඩිය හමාර යි. දෙ වන අඩියේ දී, විදුලි උදුනක් වැනි අත්‍යාවශ්‍ය බඩු-මුට්ටු මිලේට ගෙනැ සවි කරනු ඇත.

පොලිස් ඇණිය 1963.10.1 වන දා පටන් ගනු ලැබ, පාලක ගොඩනැගිල්ලේ සෙවන ලබයි.

අග්නිදිග ආසියා දේශ කාර්‍යාලයේ ජ. සෞ. සං.දේශ අධ්‍යක්ෂ වෛද්‍ය සී. එස්. මානි මහතා වර්ෂය තුළ දී රෝහලට පැමිණ, ඔහු තුන් අවුරුද්දකට එ පිටැ මෙහි පැමිණි අවස්ථාවට වඩා දැන් රෝහල පිරිසුදු බව ත් රෝගීන්ට උපස්ථානය හොඳ බව ත් වාර්තා කළේ යැ.

කරන ලද වැඩ

ප්‍රතිකාර

මනො වෛද්‍යවරුන් ළඟ දී වැඩි වීම නිසා ප්‍රතිකාර කිරීම වඩා බලවත් ලෙස ඉටු කරන ලදී. රෝහලෙන් පිට වී ගියවුන් ප්‍රමාණය (බැගිනුව) අනුවැ බලන කලැ මෙය ඉන් පිළිබිඹු වේ.

කලින් වර්තාවලැ සඳහන් වෙන සියලු, මනො ඝර්ම සහ ප්‍රති අටපිඩක ඖෂධ වර්ග වැඩි වැඩියෙන් ප්‍රයෝජනයට ගනු ලැබේ. මේ ඖෂධ වර්ග රජයේ බෙහෙත් ගබඩාවෙන් නො ලද හැකි විටැ ඒවා විශාල තොග වශයෙන් මෙ රටැ වෙළෙඳ ආයත වලින් මිලේට ගනු ලැබේ.

අවුරුද්දට දැවී ගිය ප්‍රමාණය :—

ලාගැක්ටිල් පෙති	...	...	10,29,000
ස්ටෙලශීන් පෙති	...	...	1,45,000
ටොෆ්‍රනිල් පෙති	...	...	10,700
නාඩලශීන් පෙති	...	...	6,100
ස්පාරින් පෙති	...	...	21,000
ලිබ්‍රියම් පෙති	...	...	2,200

විදිලි කම්පන ප්‍රතිකාරය

විදිලි-වලිප්පු ප්‍රතිකාරය තව මැ ඉතාමත් ජනප්‍රිය ප්‍රතිකාරය හැටියට පිළිගෙන තිබේ. එය ප්‍රධාන වශයෙන් යොදනු ලබන්නේ, අවපීඩක මනොභාවය සහ විපාට ප්‍රේණියාවේ ඇතැම් වර්ග සම්බන්ධයෙනි.

ඉන්සුලින් කම්පන ප්‍රතිකාරය

තද ඉන්සුලින් කම්පන ප්‍රතිකාරය දැන් දැන් භාවිතයෙන් ඇත් වෙමින් පවත්නා අතර, ලිහිල් ඉන්සුලින් කම්පන ප්‍රතිකාරය වඩා ජනප්‍රිය වෙමින් එයි.

වෘත්තීය ප්‍රතිකාර

දැන් රෝගීන් වැඩි වැඩියෙන් වෘත්තීය ප්‍රතිකාරය සඳහා යවනු ලැබේ.

සිංගප්පූරු වැල් සහ දැව-දඬු වැනි ද්‍රව්‍ය වර්ග නො මැති කම නිසා මේ අංශයේ අප වැඩට එය අවහිරයකි.

මුල්ලේරියාව රෝහලේ නව වෘත්තීය ප්‍රතිකාර අංශය හොඳින් ඉදිරියට ඇදෙයි.

මනො වෛද්‍ය සමාජ සේවකයින්

මතු සඳහන් චිකිත්සාගාරවලැ හා ආයතනවලැ හා මනො වෛද්‍ය සමාජ සේවකයෝ යෙදී සිටිත් :—

(1) කොළඹ රිජ්වේ නම් ළමා රෝහලේ වැඩිහිටි මනො වෛද්‍ය චිකිත්සාගරය
(2) කොළඹ මහ රෝහලේ, අපස්මාර චිකිත්සාගාරය
(3) කොළඹ රිජ්වේ නම් ළමා රෝහලේ ළමා අනුශාසනා චිකිත්සාගාරය
(4) අංගොඩ මානසික රෝහල
(5) නාගොඩ රෝහලේ වැඩිහිටි මනො වෛද්‍ය චිකිත්සාගාරය
(6) නාගොඩ රෝහලේ ළමා අනුශාසනා චිකිත්සාගාරය

මනො විද්‍යා සේවය

පසුගිය අවුරුද්දේ මෙන් මනො විද්‍යාඥයින් එක් අයෙක් පමණක් සිටී. ඇය උදේ වරුවේ අංගොඩ සහ මුල්ලේරියාව රෝහල්වලැ ද පස්වරුවේ කොළඹ මහ රෝහලේ මනො වෛද්‍ය චිකිත්සාගාරයේ හා රිජ්වේ රෝහල බද ළමා අනුශාසනා චිකිත්සාගාරයේ හා සේවය කරන්නී යැ.

හෙදියන්ගේ ඇබැසි විදුහලේ දී හා පශ්චාත් පාදක හෙදකම් පාසැලේ දී හා ඇය දෙසුම් ද පවත්වයි.

කිරිපට්ටිය

රෝගීහු සැහෙන ගණනක් කිරි පට්ටියේ වැඩ කරති. එහෙත්, උපස්ථායකයින් මදිකම නිසා මීට වඩා ගණනක් රෝගීන් එහි යැවිය නොහැක. මෙහි ප්‍රතිඵලය නම්, ගොවිකම් අධ්‍යක්ෂ විසින් පත් කරන ලද කමිටුවේ ඇතැම් නිර්දේශ ක්‍රියාත්මක

කිරීම යම් තරමකට අවහිර වී පවතී. මේ අපහසුකම් මධ්‍යයේ, වඩා හොඳ නිවාස පහසුකම් නො තිබුණත්, වර්ෂය තුළ දී රු. 41,304.41ක මුදලක් උපයමින් කිරි පයින්ට් 78,675 ක් සැපයීමට කිරි පට්ටිය සමත් වූවා යැ.

අවුරුද්ද තුළ පට්ටියේ සිටි සතුන් මුළු ගණන 88කි. කිරි දෙනුන් 35 ක් ද ඒ අතර වූහ. තේරුණු සතුන් 20 දෙනෙකු සිටියත්, ප්‍රයෝජනවත් අරමුණු සඳහා ඔවුන් මුල්ලේරියාවැ රෝහලේ සහ පැලවත්ත රෝහලේ ඇති කළ හැකි බව රෝහල් කමිටුව පළ කළෙන්, උන් නො විකුණන ලදි. මේ ගැනැ අවසාන තීරණයකට ඉක්මනින් බසිනු ඇත.

බාහිර රෝගීන් උදෙසා මනෝ වෛද්‍ය සහ ළමා අනුශාසන චිකිත්සාගාර

කොළඹ මහ රෝහලේ ද, රිජ්වේ නම් ළමා රෝහලේ ද නාගොඩ රෝහලේ ද, සිරි ගෙදර රෝහලේ ද මේ චිකිත්සාගාර පැවැත්වුණි. අංගොඩ මානසික රෝහලේ වැඩි හිටි මනෝ වෛද්‍ය චිකිත්සාගාරයක් ද බදාදා පෙරවරුයෙහි පවත්විනු ලැබේ.

දැන් මනෝ වෛද්‍යවරුන් වැඩි ගණනක් සිටින හෙයින්, චිකිත්සාගාර ගණන වැඩි වී ඇත.

කොළඹ මහ රෝහලේ මනෝ වෛද්‍ය අංශය

පළාත් බද රෝහලෙකැ මනෝ වෛද්‍ය මුළුවක් පිහිටුවීමට අපි මෙතෙක් සමත් වී නැත්තෙමු. මහනුවර මහ රෝහලේ සුදුසු ගොඩනැගිල්ලක් ලද හැකි හෙයින් මේ අවුරුද්දේ දී එහි එකක් ඇරීමට අප සමත් වනු ඇතැයි සිතිය හැක.

මුල්ලේරියාව රෝහල

මුල්ලේරියාව රෝහලැ I වන මුළුව, කෙටිකාලයකට පමණක් නවතින රෝගීන්ගේ රෝහලක් ලෙස පැවතේ. එහි රෝගීන් 127 දෙනෙක් සිටිත්. අංගොඩ මනෝ වෛද්‍ය වරුන් බොහොමයකට මෙහි ද ඇදත් වෙත් වී ඇත.

II වන මුළුව තරමක කාලයක් නවතින රෝගීන් උදෙසා මුලින් අදහස් කරන ලද්දේ වී නමුත්, අංගොඩ පවත්නා තදබදය නිසා දිගු කාලයකට නවතින රෝගීහු ද මෙහි එවනු ලැබ සිටිති. මෙහි රෝගීන් 315 දෙනෙකි. II වන මුළුවේ ළමා වාට්ටුවක් ද වෙයි.

පැලවත්ත රෝහල

කලින් කීවාක් මෙන්, මේ රෝහල පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් බවට හැරවීමට අදහස් කරනු ලැබේ. දැනට එහි රෝගීන් 280 දෙනෙක් වෙත්.

(එ) නීති-වෛද්‍ය කටයුතු

පසුගිය කාලයේ දී මෙන් වඩා වැදගත් බැරෑරුම් නඩු-හබවලැ දී තමන්ට සහාය වන ලෙස ඉල්ලා පළාත් බද අධිකරණ, පොලීසිය, නීති පති දෙපාර්තමේන්තුව අධිකරණ වෛද්‍ය නිලධාරියාගෙන් ඉල්ලා සිටියහ. පිට පළාත්වලැ වෛද්‍ය නිලධාරීහු ද, පළාත් බද අධිකරණ වෛද්‍ය නිලධාරීහු ද බැරෑරුම් නඩුවලැ දී නිතොර නිතොර අධිකරණ වෛද්‍ය නිලධාරියාගෙන් උපදෙස් සෙවූහ.

නීති-වෛද්‍ය අංශය මගින් ක්‍රියා කරන ලද වැදගත් නඩු අතරැ පාදුක්කේ මිනී මැරුම, ගොමරන්කඩවලැ මිනී මැරුම, මාතර ළිඳේ මිනී මැරුම යන නඩු ද වී යැ.

කරන ලද වැඩ

අවුරුද්ද තුළ කරන ලද නොයෙක් වැඩ පිළිබඳ වර්ථෝරු පිළිවෙලට මතු දැක්වේ :—

(අ)—පශ්චාත්-මරණ පරීක්ෂණ

(ක) මිනී මැරුම් නඩු මුළු ගණන	... ...	85
(I) කැපීම් සහ පිහියා ඇනීම්	... ...	40
(II) මොට ආයුධවලින්	... ...	30
(III) වෙඩි පහරින් සහ පිපිරීම්වලින් තුවාල	... ...	7
(IV) සැහැසි හුස්ම හිර කිරීම්	... ...	—
(V) පිළිස්සීම්	... ...	3
(VI) වෙනත් ක්‍රම	... ...	5
(කා) මරණයෙන් කෙළවරවූ අනතුරු මුළු ගණන	... ...	217
(I) මහමඟ සහ දුම්රිය මඟ අනතුරු	... ...	118
(II) රැකියාවෙන් නැඟි අහඹු	... ...	1
(III) දියේ ගිලීම්	... ...	21
(IV) විදුලියනය	... ...	—
(V) අකුණු වැදීම	... ...	—
(VI) (පිළිස්සීම්, වැටීම් ආදි, ගෙදර-දොරේ අහඹු ඇතුළු) වෙනත් ක්‍රම	...	77
(කි) සිය දිවි නසාගැනීම් මුළු ගණන	... ...	61
(I) වස-විස ගැනීම්	... ...	27
(II) සැහැසි හුස්ම හිරකිරීම්-එල්ලීමෙන්	... ...	9
-ගිලීමෙන්	... ...	7
(III) දුම්රියට බිලිවීම	... ...	5
(IV) වෙඩි පහරින්...	... ...	—
(V) තියුණු ආයුධ ...	... ...	—
(VI) වැටීම්	... ...	3
(VII) පිළිස්සීම්	... ...	3
(VIII) වෙනත්	... ...	3
(කී) විවිධ මුළු ගණන	... ...	406
(I) සොබා දහම් හේතු	... ...	357
(II) සාපරාධී ගජසා	... ...	—
(III) සොබා දහම් ගබ්සා	... ...	5
(IV) බිළිඳුන් නැසීම	... ...	2
(V) වැඩ වැරදීම්	... ...	11
(VI) අවිනිශ්චිත	... ...	30
(VII) පණතොර උපත්	... ...	1
එකතුව	...	769

අපහසු අන්දමේ පශ්චාත්-මරණ පරීක්ෂණ ඉටු කරනු වස් පිටපළාත් මහෙස්ත්‍රාත් වරුන්ගෙන් කැඳවීම් 21 අධිකරණ වෛද්‍ය නිලධාරියාට ලැබුණි. මෙයින් පහක් වැලලූ මිනී ගොඩගැනීමෙන් කරන ලද්දේ වෙයි.

(ආආ)—තුවාල

	බරපතල	ලිහිල්	එකතුව
(I) තියුණු ආයුධවලින් සිදුවූ	285	624	909
(II) මොට ආයුධවලින් සිදුවූ	902	8,124	9,026
(III) වෙඩි පහරින් සිදුවූ	16	10	21
(IV) බෝම්බ, පිපිරීම්, පිළිස්සීම් යනු විසින් සිදුවූ	10	8	18
(V) මහ මඟ අනතුරුවලින්	482	1,623	2,105
(VI) රැකියාවේ අනතුරුවලින්	23	53	76
එකතුව ...	1,713	10,442	12,155

(ඉඉ)—වෙනත් සෝදිසි

(I) රීති ඊනියා තනිස් නඩු	41
(II) ඊනියා ගජසා	7
(III) ඊනියා බීමත්කම	1,321
(IV) වස–විස වැදීමේ	284
(V) අස්වාභාවික අපරාධ	31
(VI) බල්ලන් සැපීමේ	57
(VII) ඊනියා පහරදීම්	1,231
(VIII) වයස ආදී තීරණ	64
(IX) ඇසිඩ් ආදියෙන් සිදුවූ තුවාල	32
එකතුව ...	3,068

නීති-වෛද්‍ය පරීක්ෂණාගාර සෝදිසි

මෙමැ පරීක්ෂණාගාරයට ඉදිරිපත් වූ ද්‍රව්‍ය සෝදිසි කිරීම් පිළිබඳ විස්තර මෙසේ වෙයි :—

(ක) ගිලාන ඖෂධික වෛදය	304
(කා) මුත්‍රා—ගෙ–මැඩි පිරික්සුම	6
(කි) ලේ වර්ග කිරීම	8
(කී) සංරක්ෂණය	31
(කු) ඇට–කටු, මිනී ගොඩගැනීම්	19
(කූ) තැවරුම්, වැකුම් ආදිය	13
(කෙ) යෝනියේ වැකුම්	48
(කේ) කෙස් යනාදිය	11
(කො) ඇඳුම් යනාදිය	—
(කෝ) ආයුධ යනාදිය	—
එකතුව ...	440

මෙසේ ඉදිරිපත් කරන ලද ද්‍රව්‍ය බොහොමයක් පිට පළාත්වලින් නිදසුන් නීති-වෛද්‍ය කවුගෙයි නංවන ලද නමුත්, නිසි සේ ගොඩ නගන ලද ගොඩනැගිලි නැති හෙයින් මේ කවුගෙය විහිදුවීම අතින් දියුණුවක් නැත. නීති-වෛද්‍ය කටයුතුවල සේයා රු. 30ක් අවුරුද්ද තුළ ගන්නා ලදී.

සංස්කරණ පාඨ මාර්ග

නීති-වෛද්‍ය කර්මය විෂයයෙහි සංස්කරණ පාඨ මාර්ග 15ක් නොයෙක් නිලධාරීන් වෙත දෙන ලදී.

පිට පළාත්වලැ අධිකරණ වෛද්‍ය වැඩට අදාළ කෙරුවාවල් මෙසේ විස්තර කෙරේ:—

පශ්චාත්-මරණ පරීක්ෂණ

මිනීමැරුම්	ගණන
(ක) කැපීම් සහ පිහියා ඇනීම්	314
(කා) මොට ආයුධ	211
(කි) වෙඩි පහර සහ පිපිරීම් තුවාල	107
(කී) සැහැසි හුස්ම හිරකිරීම—එල්ලීමෙන්	26
දියේ ගිලීමෙන්	31
(කු) පිළිස්සීම්	31
(කූ) වස-විස ගැන්වීම්	52
(කෙ) අවිනිශ්චිත	49
(කේ) වෙනත්	39
එකතුව ...	860

මරණයෙන් කෙළවරවූ අහඹු	ගණන
(ක) මහ මඟැ අහඹු	292
(කා) දුම්රියට බිලිවීම්	53
(කි) රැකියාවේ ආපදවලින් සිදුවූ අහඹු	99
(කී) අවිනිශ්චිත	12
(කු) පිළිස්සීම් ආදි ගෙදර-දෙරේ වෙනත් අහඹුවලින් ...	144
එකතුව ...	600

සිය දිවි නසාගැනීම්	
(ක) වස-විස ගැනීමේ	421
(කා) සැහැසි හුස්ම හිර කිරීම—	
එල්ලීමෙන්	192
දියේ ගිලීමෙන්	138
(කි) දුම්රියට බිලිවීම්	23
(කී) වෙඩි පහරින්	16
(කු) තියුණු ආයුධ	24
(කූ) අවිනිශ්චිත	12
(කෙ) වෙනත්	14
එකතුව ...	840

වෙනත් දේ	
(ක) බිළිඳු පන නැසීම	26
(කා) ගප්සා	16
(කි) අවිනිශ්චිත	54
(කී) සොබා දහම් හේතු	1,173
එකතුව ...	1,269

මුළු එකතුව 3,569

කුවාල	බරපතල	ලිහිල්	එකතුව
(I) තියුණු ආයුධවලින් සිදුවූ	1,532	7,599	9,131
(II) මොට ආයුධවලින් සිදුවූ	3,017	29,065	32,082
(III) වෙඩි පහරින් සිදුවූ	179	344	523
(IV) බෝම්බ සහ පිපිරීම්වලින්	83	269	352
(V) පිළිස්සීමෙන්	225	1,109	1,334
(VI) මහ මාවතේ අනතුරුවලින්	829	2,409	3,238
(VII) දුම්රිය අනතුරුවලින්	45	85	130
(VIII) රැකියාවේ අනතුරුවලින් සිදු වූ	322	777	1,099
(IX) වෙනත්	346	2,959	3,305
එකතුව	6,578	44,616	51,194

*වෙනත් සෝදිසි

	එකතුව
(I) ඊනියා තනිස් කිරීම්	315
(II) ගජ්ජා	242
(III) ඊනියා බීමත් කම	2,362
(IV) වස-විස ගැන්වීම්	1,191
(V) සිහි මද කම නිසා	1,370
(VI) වෙනත්	590
එකතුව	6,070

කැටිය

	ගණන
පශ්චාත්-මරණ සෝදිසි	3,569
කුවාල ගණන	51,194
වෙනත් සෝදිසි ගණන	6,070
එකතුව	60,833

* අධිකරණ වෛද්‍ය නිලධාරීන් විසින් හා රජයේ රෝහල් භාර වෛද්‍ය නිලධාරීන් විසින් හා සපයන ලද වාර්තාවලිනි.

(ඒ)—පිළිකා රෝගය

1. වෛද්‍ය සාත්තුව

ඇඳන් අතර ඉඩ-කඩ ප්‍රමාණය අඩු කිරීමෙන් විකිරණ චිකිත්සා වාට්ටුවලැ ඇඳන් ගණන වැඩි කරන ලද්දේ වී නමුත්, ඒ වාට්ටු මුළුමනින් මැ පිරී තිබෙන්නට වී යැ. බොහෝ විටැ රෝගීන් ගණනක් බිම ද වැදහොත්තෝ වෙයි. මුළු දිවයිනට මැ විකිරණ චිකිත්සාව දෙන එක මැ ආයතනය මෙය හෙයින්, මේ ප්‍රතිකාර ක්‍රමය අවශ්‍ය රෝගීන් සියලු දෙනා මෙහි මැ පැමිණිය යුතු යි. පිට පළාත්වලින් එන රෝගීන්ට බාහිර ප්‍රතිකාර ගැනීම නො හැකි හෙයින්, ඒ හැම රෝගියෙකු මැ සම්පූර්ණ ප්‍රතිකාර මාලාව සඳහා වාට්ටුවේ නවත්වාගත යුතු යි. මේ අවුරුද්දේ දී රෝගීන් 2887 දෙනෙක් නැවැතී ප්‍රතිකාර ලදහ. පිළිකායතනයට රෝගීන් බාර ගනු ලබන්නේ, විකිරණ චිකිත්සකයින් විසින් මේ ආයතනයේ මැ පවත්වනු ලබන චිකිත්සාගාර හෝ වෙනත් තැන්වලැ ශාඛා චිකිත්සාගාර හෝ මඟිනි. දි. වෛ. නි. විසින් හෝ පුද්ගල වෛද්‍යවරයින් විසින් හෝ රෝගීහු එවනු ලබත්. ඇතැම් විටෙකැ කිසිවෙකු විසින් නො එව්නු ලැබ මැ රෝගීහු කෙළින් මැ මෙහි එති.

රේඩියම් වැඩ කරනු සඳහා භෞතික කාර්මිකඥයින් බඳවා ගෙනැ ඒ මගින් විකිරණ ශිල්පීන් රේඩියම් වැඩෙන් මුදවාලීමට ක්‍රියා කොටැ ඇත. එබී බලන අවුරුද්ද තුළැ දී ඇමෙරිකාවේ පෙනිසෙල්විනියාවේ මහාචාර්‍ය චැම්බලේන් මහතුන්ගේ ප්‍රධානත්වයෙන් යුත් ජ.සෞ.සං. කංඩායමක් විසින්, විකිරණ වේදී සෞඛ්‍ය අළලා සමුනේරුවක් මෙහෙයවන ලදී. මහරගමැ පිළිකා රෝග ආයතනය බැලීමට ගිය එකී කණ්ඩායම, එහි සලසා ඇති විකිරණ භාණ්ඩ රක්ෂාවරණය ලන්ඩනයේ රෝහල් මාස්ඩම් රෝහලේ සැලසී තිබෙන තරමට මැ හොඳ බව පළ කළා යැ. මේ ආයතනයේ තබා ගන්නා ලද ඉහළ තත්ත්වය ගැනැ ඔවුන්ගේ සිත් ඇදී ගියේ යැ.

දැනට තිබෙන්නේ එක මැ එක කොබල්ට් ප්‍රතිකාර මුළුවෙකි. මේ යන්ත්‍රය පෙරවරු 8·00 සිටැ නොකඩවා පස්වරු 4.00 දක්වා වැඩට ගනු ලැබේ. එ සේ ද වුවත්, පොරොත්තු නම් වැලක් ද තිබේ. තවත් යන්ත්‍රයක් ඉල්ලා යවා ඇති හෙයින්, ඒ ලැබුණු පසු පොරොත්තු නම් වැල ඉවත් කළ හැකි වෙතැ යි බලාපොරොත්තු වෙමි.

කායචික්ෂම සේවයක් සලසනු සඳහා දැනට සිටින (චිකිත්සාංගයේ) විකිරණ ශිල්පීන් පිරිස කිසි සේත් ප්‍රමාණවත් නොවේ. චිකිත්සාංශයේ විකිරණ ශිල්පීන් උදෙසා විකිරණ සිප්සලක් නිර්දේශය කිරීමට කටයුතු යොදාගෙනැ යනු ලැබේ. යෝජිත සිප්සලෙන් විකිරණ ශිල්පීන් බිහි කරන විටැ මේ හිඟය මග හරවා ගැනීමට හැකි වෙතැයි යනු අපේ බලාපොරොත්තුව යි.

2. විශේෂිත සේවා

කැනේඩියානු ආණ්ඩුව විසින් කොළඹ ක්‍රමය යටතේ, කොබල්ට් 60 තෙල චිකිත්සා මුළුවක් පරිත්‍යාග කරනු ලැබ තිබේ. අද පිළිකා රෝග ප්‍රතිකාරයෙහි ලා කොබල්ට් ප්‍රතිකාර ක්‍රමය වැදගත් තැනක් ගනී. පිළිකාවට මුහුණු දීම සඳහා අතට ගන්නා අලුත් මැ අවිය එය යි. මේ මුළුව සවිකොටැ මධ්‍යම විකිරණ-සමස්ථානික පරීක්ෂණාගාරයක් පිහිටුවීමෙන්, විකිරණයෙන් ප්‍රතිකාර දීමේ නූතන ක්‍රම සියල්ලක් සැලසීමට ආයතනය පොහොසත්වනු ඇත. මේ අවුරුද්දේ දී කොබල්ට් 60 තෙල-චිකිත්සා මුළුවෙන් රෝගීන් 491 දෙනෙකුට ප්‍රතිකාර දෙන ලදී. රෝගීන් 85 දෙනෙකුට තියුණු විකිරණ චිකිත්සාවෙන් ප්‍රතිකාර කරන ලදී. දින පතා කොබල්ටයෙන් රෝගීන් 51 දෙනෙක් පමණ ද තියුණු විකිරණ චිකිත්සාවෙන් 89 දෙනෙක් පමණ ද ප්‍රතිකාර ලබති.

ව්‍යාධිවේදී පරීක්ෂණාගාරයට හොඳින් උපකරණ සැපයී තිබෙන නමුත්, මේ ආයතනයේ ව්‍යාධිවේදඥයෙකු නො මැති නිසා, වෛද්‍ය පර්යේෂණ ආයතනයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් එහි සිව් පරීක්ෂණ පවත්වනු ලැබේ. අනෙක් පරීක්ෂණ මෙහි කරනු ලැබේ. ඖතික ව්‍යාධිවේදය-1126 රක්තවේදය 3071, ලේ වර්ග කිරීම 897, මළමුත්‍ර, අසූචි, ලේ රසායනය 2433 යනුවෙන් වේ ය.

රේඩියම් යැවීමෙන් රෝගීන් 499 දෙනෙකුට ප්‍රතිකාර දී තිබීමෙන් දවසට වැටෙන සාමාන්‍ය ගණන 3ක් වේ. විකිරණ සමස්ථානිකයින් ආධාරයෙන් රෝගීන් 74 දෙනෙකුට ප්‍රතිකාර දෙන ලදී. මෙහි ඇලළෙන කාලයේ දී විකිරණ සමස්ථානයික ප්‍රතිකාර 74ක් ද රේඩියම් ප්‍රතිකාර 777ක් ද ඉටු කරන ලදී.

පිළිකා සැත්කම් 157ක් ඒ කාලයේ දී කරන ලදී.

3. බාහිර රෝගීන්ට සාත්තුව

ඉරිදා හැර අනෙක් දිනවලැ පෙරවරු 8.00 සිටැ 11.00 දක්වා පිළිකා රෝග ආයතනයේ පවත්වනු ලබන බාහිර රෝගී අංශයට පැමිණෙන රෝගීන් ගණන වැඩිවී ඇති බවක් පෙනේ. බාහිර අංශයේ (චිකිත්සාගාරවලැ) රෝගීන් 7337 ක මුළු ගණනක් (අලුත් සහ පරණ) බලන ලදී.

පිළිකා රෝග ආයතනයේ චිකිත්සාගාරයට හැරුණු විට, කොළඹ, මහනුවර, යාපනේ, ගාල්ල, මඩකලපුව, බදුල්ල, කුරුණෑගල යන මහ රෝහල්වල ද උපදෙස් දීමේ චිකිත්සාගාර ආගන්තුක විකිරණ චිකිත්සකයින් විසින් පවත්වනු ලැබේ. චිකිත්සාගාරවලට පැමිණෙන රෝගීන් සාමාන්‍ය ගණන මහනුවර 15, මඩකලපුව 13, බදුල්ල 12, යාපනේ 18, ගාල්ල 10, කුරුණෑගල 4 යනුවෙන්වේ.

4. වෛද්‍ය සැපයීම

මේ කාල-සීමාවට වෛද්‍ය සැපයීම් සතුටුදායක වී ඇත. ඖෂධ වර්ග මෙහි දී මිලේට ගැනීමෙහි ලා ප්‍රමාදයක් තිබේ.

මේ ආයතනය සම්බන්ධයෙන් සංඛ්‍යා ලේඛන XLVII සටහනේ දැක්වෙයි.

VII වැනි පරිච්ඡේදය

වෛද්‍ය පර්යේෂණායතනය

වෛද්‍ය පර්යේෂණායතනය විසින් ආරෝග්‍යශාලා සඳහා රෝග විනිශ්චය පරීක්ෂණ සමග පර්යේෂණ කටයුතු ද විශාල තොගයක් වර්ෂය තුළදී කරන ලදී. නොයෙක් දෙපාර්තමේන්තු අතර කරන ලද වැඩවල පිළිවෙල පසුගිය අවුරුදුවල මෙන් වෙයි. සමහර අවස්ථාවලදී එදිනෙදා කරන වැඩවල වැඩිවීමක් දක්නා ලද මුත් අනෙක් අවස්ථාවලදී ඉතා සුළු වශයෙන් අඩුවූවත් භාරදූරය. එදිනෙදා වැඩ පර්යේෂණ කටයුතුවලට අවාසිය. විශේෂඥ චිකිත්සක මණ්ඩල විසින් රෝග විනිශ්චාධාරයෙන් කළ හැකි වැඩ සඳහා ආරෝග්‍යශාලා රසායනාගාරවලට අවශ්‍ය කාර්මික නිලධාරීන්ගේ ප්‍රමාණය අනුව සිරිත් හුරු වැඩ විමධ්‍යගත කිරීම රඳා පවතී. මේ වනතුරු බාහිර ආරෝග්‍යශාලා වලට කාර්මික නිලධාරීන්ට වඩා බෙහෙවින්ම විශේෂඥයින් වැඩිකර ඇතත් මෙම වෙනස අවුරුදු 2ක් හෝ 3 කට වඩා නොවේ යයි අදහස් කරනු ලැබේ.

මෙම ආයතන සංවිධානයේ එක් වෙනස්වීමක් විය. භිෂක්කර්මීය දෙපාර්තමේන්තුව සහ ස්වාභාවික නිෂ්පාදනයන්ගේ රසායන දෙපාර්තමේන්තුව යනුවෙන් භිෂක් කර්මීය දෙපාර්තමේන්තුවේ භිෂක්කර්ම සහ රසායනික වැඩ වෙන්කරන ලදී. ස්වාභාවික නිෂ්පාදනයන්ගේ රසායන දෙපාර්තමේන්තුව විසින් ස්වදේශික බෙහෙත් ගැන දිගටම කටයුතු කරනු ලැබේ. භිෂක්කර්මීය දෙපාර්තමේන්තුව විසින් තනිකර තැබූ ක්‍රියාකාරි ධාතුන්ගේ භිෂක්කර්ම වේදය කිරීමට සහ ඖෂධයන්ගේ මූලික පෙන්වීම්වලට සහායවනු ලැබේ.

ජාත්‍යන්තර සම්මේලනය සහ සංක්ෂේපය

පිටරට ජාත්‍යන්තර සම්මේලනවලට සහභාගිවීමට නිලධාරීන් තිදෙනෙකුට අවස්ථාව එළඹුනි. 1963 සැප්තැම්බර්-ඔක්තෝබර් යන මාසවල පීකින් නුවරදී ලෝක විද්‍යාත්මික කම්කරුවන්ගේ බල මණ්ඩලය විසින් පැවැත්වීමට බලාපොරොත්තුව සිටි සම්භාෂණයට සූදානම්වීමේ රැස්වීමට ලංකාවේ විද්‍යා දියුණු කිරීමේ සංගමයේ නියෝජිත යෙකු ලෙස වෛද්‍ය ජී. සී. ඇන්. ජයසූරිය සහභාගි විය.

1964 අගෝස්තු මාසයේදී පීකින් නුවරදී පවත්වන ලද මෙම බල මණ්ඩලයේ සම්භාෂණයට ලංකාවේ විද්‍යා දියුණු කිරීමේ සංගමයේ නියෝජිතයින්ගෙන් කෙනෙකු ලෙස වෛද්‍ය ඇස්. සෙන්ති ෂන්මුගනාදන් පත්කරන ලදී.

1964 ජූලි මාසයේදී නවදිල්ලියේදී "තුන්වැනි පස්අවුරුදු ක්‍රමයේ විද්‍යාව සහ ජාතිය" යන මැයෙන් පැවැත්වූ සම්භාෂණයට ද ලංකාවේ විද්‍යා දියුණු කිරීමේ සංගමය මගින් වෛද්‍ය ආර්. ඕ. විජේසේකර ඉදිරිපත් කරන ලදී.

වැඩ කටයුතු

මෙහි පහත දැක්වෙන්නේ මෙම ආයතනයේ නොයෙකුත් දෙපාර්තමේන්තුවල කරන ලද වැඩ පිළිබඳ සුළු විස්තරයකි.

ආරෝග්‍යශාලා සඳහා සිරිත්හුරු රෝග විනිශ්චය පරීක්ෂාවන් විශාල කොටසක් කිරීමට මෙම දෙපාර්තමේන්තුවට සිදුවිය. එම නිසා නිසි ක්‍රමයට පර්යේෂණ කටයුතු කිරීම සඳහා තිබුනේ ඉතා සුළු අවසථාවකි.

මුළුමනින්ම 15,000 කට වඩා ටිකක් වැඩිතරම් පැලුම් ශාකාණ සඳහා පරීක්ෂා කරන ලදි. වෙනත් අවුරුදුවල කරන ලද 18,000 ට වඩා මෙය අඩුය.

ඉතාමත් පොදු ඉල්ලීම් කරන්නේ ගලපටල රෝගය සඳහාය. මේ බෝවීම සඳහා මුළුමනින්ම (උගුර, නාසය, උර්ධව කණ්ඨීය යනාදි) 5,196ක් මුහුන්තැලි පරීක්ෂා කරන ලදී. මෙයින් 412ක් සහගැතිය. පසුගිය අවුරුදුවල කරන ලද 6,664ක් පරීක්ෂණ වලදී 367ක් සහගැතිය. සහගැතියන්ගේ පරතරය විශාල නූනත් පසුගිය අවුරුදුවලට වඩා ගිය අවුරුද්දේ ගණන සියේට 22ක් පමණ අඩුය. අනිකුත් පරීක්ෂණයන් බොහොමයක්ම බෝකරන ඉන්ද්‍රියන් හඳුනා ගැනීම සහ සශ්‍රික කිරීම ගැනය. මුළු මනින්ම 1,950 මුත්‍ර, 644 කැගි, 1,260 ලේ, 1,135 මස්තිෂ්ක කණ්ටක ද්‍රාවය, 2,034 සැරව යන මුහුන්තැලි සහ උච්ශ්වසන්වූ ද්‍රාවයන් පරීක්ෂා කරන ලදි.

ක්ෂය රෝග බෝවීම් සඳහා විශේෂයෙන්ම පරීක්ෂා කරන ලද මුහුන්තැලි ගණන 2,544කි. මෙයින් 99ක් (3.6%) සහගැතිය. ගිය අවුරුද්දේ ගණන 2,711කි. මෙයින් 86 (3.1%) සහගැතිය.

මදක් විරලබ පරීක්ෂණයන් නම් ගොනොකොකල් බෝවීම් 23 යි (2ක් සහගැතිය) පිටගැස්ම 68 යි (10ක් සහගැතිය).

සැකකල ස්ටැපිලෝකොකල් එන්ට්‍රෝකෝලයිටිස් (1ක් සහගැතිය) සහ කොළරා 3ක් (එකක්වත් සහගැති නොවේ) යන මේවායින් 17ක් පූයජනක සැටැපිලොකොකස්ය.

බලාපොරොත්තු නොවූ පරිදි මේ අවුරුද්දේ මයිකොබික් අනුවේදන පරීක්ෂණ ගණන ගිය අවුරුද්දට වඩා අඩුවිය. ගිය අවුරුද්දේ එය 2,822 ක්වූ වත් මේ අවුරුද්දේ 1,828ක් පමණි.

ලාදුරු සඳහා පරීක්ෂණ 486ක් විය. මෙයින් 479ක් කරන ලද්දේ මාලදිවයිනේ සිටින ජ.සෞ.ස. පුරෝහිත ඊ. නියමාර වෛද්‍යවරයාය. සහගැති සියල්ලක්ම (8) මේ මූහුන්තැලි වලින්ය.

ගිය අවුරුද්දේ හා සමාන ආරෝග්‍යශාලාවල ඇති තද පීඩනයෙන් යුත් විෂබීජ නාසක වන්ධ්‍යතා යන්ත්‍රයන්ගේ ශක්ති ප්‍රමාණය උරගා බැලීම සඳහා සාකවේදී පරීක්ෂා 27 ක් කරන ලදි.

සාකවේදය (ආහාර සහ වතුර : ලෙප්ටෝස්පිරෝසිස්)

(අ) **ආහාර සහ වතුර**—ඉල්ලීම් උඩ නොයෙකුත් කෑම වර්ගවල සාකවේදී පරීක්ෂණ පවත්වන ලදී.

සාකවේදි තත්ත්වයන් ගැන විරුද්ධතාවයන් ඇති වූ අවස්ථාවල මෙම රසායනාගාරය ආශ්‍රිත රසායනාගාරයක් ලෙස කටයුතු කරන ලදී.

වර්ෂය තුළදී කොප්පරා මුහුන්තැලි 282ක් පරීක්ෂා කරන ලදී. මෙයින් 204ක් සතුටු දයකය සිරිත්හුරු පරීක්ෂණ සඳහා පොල් මණ්ඩලයට දැන් තමන්ගේ පරීක්ෂණාගාරයක් තිබෙන හෙයින්, මේවර පරීක්ෂා කරන ලද මුහුන්තැලි ගණන ගිය අවුරුද්දේ ගණනින් අඩකටත් අඩුය.

අනෙක් කළ පරීක්ෂණයන් නම්.—16ක් සතුටුදායක වූ කිරි ආදර්ශයන් 30 ක් ද, සියල්ලම සතුටුදායක වූ ටින් කෑම ආදශියන් 16ක් ද, 6ක් පමණක් සතුටුදායක වූ විවිධ කොටස් 27 ක් ය.

පුද්ගලික හා ප්‍රසිද්ධ තැන්වලින් ලබාගන්නා ලද වතුර පරීක්ෂා කිරීම් ගණන සැලකිය යුතු ගණනකින් වැඩිවී ඇත. මෙය ගිය අවුරුද්දේ 176 ට එරෙහිව 272 කි. අසතුටුදායකසේ ගැණුනු මුහුන්තැලිවල ගණන 154 (56%) මෙය ගිය අවුරුද්දේ ගණන්වලට සමානය.

(ආ) **ලෙප්ටොස්පිරෝසිඩ්.**—මෙම කුඩා කොට්ඨාශයේ වැඩ සැලකිය යුතු ලෙස වැඩිවී ඇත. පරීක්ෂා කරන ලද මුහුන්තැලි ගණන 139 සිට 575 දක්වා වැඩිවී ඇත. වෙනත් උණ රෝග සම්බන්ධයෙන් රෝග බීජ තොර ලෙස දක්නා ලද නිදර්ශනයන් ගෙන් සැක කරන ලද ලෙප්ටොස්රොසිස් මුහුන්තැලි සඳහා කරන ලද ලේ පරීක් ෂණයන්ට අමතරව එම උණ රෝගවල ලෙප්ටොස්පිරල් බෝවීමේ ලකුණු තිබේද කියා පරීක්ෂා කරන ලදි. මේ ක්‍රමයට, ටයිෆොයිඩ් උණෙන් තොරවූ මුහුන් තැලිවල රෝග විනිශ්චික ටයිටර්ස් අතර ලෙප්ටොස්පිරල් ප්‍රතිදේහයන් පෙන්නුම් කරන ලදි.

වර්ෂය තුළදී කෙලින්ම සශ්‍රීක කරන ලද ලේ ආදශියන් 68 කින් 7 ක් සහගැති ලෙසද රෝගීන්ගේ ලේ එන්නත් කළ ගිනි ඌරන්ගෙන් සහගැති 2ක් ද විය.

තීක්ෂණ ලෙස කරන ලද ක්‍රිඩිත්‍රෝකයිට්ලිසිස් පරීක්ෂණ 394 න් 214ක් සහගැතිය.

දිලීර වේදය

අවුරුද්ද තුළදී දිලීර බෝවීම් සඳහා මුහුන්තැලි 546ක් කරන ලදි. මේවායින් 466ක් කොළඹ මහරෝග්‍යශාලාවේ චර්ම රෝග චිකිත්සාගාරයෙන් ලැබුන ඒවාය.

බලාපෙරෙත්තු වූ පරිදි සුලබම මුහුන්තැලි වූයේ සමෙන් සූරාගත් කොටස්ය. සුලභමවූ බෝවීම ඊ කෝපෝරිස්ය. දිලීර බොවීම්වල පිළිවෙල ගිය අවුරුද්දේ මෙන් මය.

සාක විද්‍යාව (සැල්මොනැල්ලා-ෂිගෙල්ලා අංශය)

අවුරුද්ද තුළදී අසූචි පැලුම් 9,214ක් සහ වෙනත් දෑ සැල්මොනැල්ලා සහ පිගෙල්ලා සහ එන්ටරෝ-පැතෝජිනික් කොයිල් බෝවීම් ලකුණ තිබේ දැයි බැලීමට පරීක්ෂා කරන ලදී මේ ගණන ගිය අවුරුද්දට වඩා 1,000 කින් පමණ අඩුය. අංගොඩ උණ රෝහලේද රාගම රජයේ රෝහලේ සහ කොළඹ ළමා රෝහලේ මේ ගැන පරීක්ෂණ වැඩ පටන්ගැනීම මීට හේතුවිය හැක.

මෙම පැලුම්වලින් 882 වාරයක් සැල්මොනෙලේ වෙන්කරන ලදී. (9.5%) මේවා විවිධාකාර මස්තු 20 කට අයත්ය. සුලභමවූ ජාතිනම් සැල්මොනැල්ලා, සැටැන්ලි සහ සැල්මොනැල්ලා බාසිලීය.

පැලුම් 350 කින් (3.7%) ෂිගෙල්ලා වෙන් කරන ලදී පසුගිය කාලේ පරිදි ඉතාමත් සුලබමවූ ජීවයෝ නම් ෂිගෙල්ලා පෙලෙක්ස්නේරි 2 ක සහ ෂිගෙල්ලා සොන්නෙයිය.

ලංකාවේ පළමුවන වතාවට ෂිගෙල්ලා ඩිසෙන්ට්‍රියා 8 වෙන්කිරීම සැලකිය යුතු කරුණකි.

අන්ත්‍ර-ව්‍යාඵජනක පුරිත වෙන්කරන ලද්දේ පැලුම් සියයකිනි. (0.1) එන්ට්රො කොලි 018: කේ 77 හැර අනික් සියලුම අන්ත්‍ර-ව්‍යාඵජනක පුරිතයන් සොයා ගන්නා ලදී. ඉතා බහුලවූවෝ නම් එන්ටරෝකොලි 0119 : කේ 69 සහ එන්ටරෝකොලි 0142 එල්කේ 86 ය.

මේ පරීක්ෂණයන් හැර ආන්ත්‍රික බෝවීම් ගැන ප්‍රමාණවත් සංලශ්නන පරීක්ෂා වන් සඳහා ලැබුනු ලේ පැලුම්වල ඇති ලේ කැටි වඩවන ලදී. ඇස්.ඒ.ටී. පමණක් කරන වෙනත් රසායනාගාරයන්ගෙන් ලද ලේ කැටි පැලුම් ද මීට අතිරේකව වඩවන ලදී. මුළුමනින්ම එවැනි ලේ කැටි 15,517 ක් පරීක්ෂා කරන ලදී. මේවායින් අවස්ථා 525කදී (3.4%) සැල්මොනැල්ලා ටයිපිද, 17 ත් වතාවකින් (0.1%) සැල්මොනැල්ලා පැරා ටයිපි ඒ ද වෙන් කරන ලදී.

පරීක්ෂා කරන ලද ලේ කැටිවල මුළු ගණන ගිය අවුරුද්දට වඩා 1,000 කින් පමණ වැඩිය. නමුත් සොයා ගන්නා ලද සහගැතිවල ගණනද මේ වැඩිවීම් හා අනුපාතික ගණනකි.

fපැගේටයිපින් සම්බන්ධ වැඩ දිගටම කරගෙන යන ලදී. සැල්මොනැල්ලා ටයිපි සඳහා කරන ලද 535 වැඩීම් fපැගේටයිප් විය. මේවායින් 222ක් (41.5%) fපැගේටයිප් "ඒ" ද, 216ක් (40.4%) ටයිප් ඊ1 සහ 97ක් පහත් තත්ත්වයකට ඇති ඒවා බව සොයාගන්නා ලදී.

මෙම දෙපාර්තමේන්තුව ආශ්‍රිත මධ්‍යස්ථානයක් සේද කටයුතු කරනු ලැබේ. ඇස්. ඒ.ටී. සඳහා ඇන්ටිජන්ද සැල්මොනැල්ලා, ෂිගෙල්ල සහ ඊ. කොලි හඳුනා ගැනීමට අවශ්‍ය ඇන්ටිසර්ස් ද මෙම දෙපාර්තමේන්තුව විසින් සපයන ලදී.

පර්යේෂණ අතින් හැඳිනගත් එන්ට්‍රො පැතෝජීනික් කොලි 14 ට විරුද්ධවූ ඇන්ටි සර්ස් වැඩිවීම් සඳහා සකස් කරන ලදී. (කෝපන්හේගන් ස්වේට් සීරම් ආයතනයේ ඈප්. ඔස්කාර් වෛද්‍ය තැන විසින් අවශ්‍ය වැඩීම් කරුණාවෙන් සපයන ලදි. පැතො ජීනික්කොලි සඳහා පැලියගොඩ පදිංචි වයස අවුරුදු 10 යෙන් පහල සාමාන්‍ය ළමයින් ගේ අසූචි පැලුම් 379 ක් පරීක්ෂා කරන ලදී.

ඒ සියල්ලකගේම රෝග නැති බව සොයා ගන්නා ලදී. අතික් අතින් කොළඹ ළමා රෝහලට පැමිණෙන අවුරුදු දෙකෙන් පහල ළමයින්ගෙන් ගන්නා ලද ගුද මාන්තු 263ක් පරීක්ෂා කිරීමේදී ඊ. කොලිවල මස්තුවිධි, සත් ආකාරයක් සොයා ගන්නා ලදී.

සාක විද්‍යාව (මස්තුවේදය)

අවුරුද්ද තුළදී මෙම දෙපාර්තමේන්තුව මගින් විශේෂයෙන් කරන ලද්දේ නොයෙක් බෝවීම් උදෙසා සිරිත්හුරු රෝග විනිශ්චිත මස්තුවේදීය පරීක්ෂා පැවැත් වීමය. මුළුමනින්ම පැලුම් 25,039ක් පරීක්ෂා කරන ලදී. මෙය ගිය අවුරුද්දේ ගණනවූ 29,019 ට වඩා ටිකක් අඩුය. මධ්‍යම සමාජ රෝග මර්ධන චිකිත්සාගාරය විසින් ස.රෝ.ප.ර. පරීක්ෂණ විශාල කොටසක් කරගෙන යන නිසා මෙවැනි පරීක්ෂණවල ගණන 9,990වෙන් 2,843 දක්වා පහත වැටී තිබේ. මේවායින් 196ක් (6.9%) සහගැත්තෝය.

ඉතුරු පරීක්ෂණවලින් විශාලම පරීක්ෂණ ගණනක් කලේ ඇස්.ඒ.ටී. සඳහා ය. එහි මුලු ගණන 14,689කි. මෙය ගිය අවුරුද්දේ ප්‍රමාණයට බෙහෙවින්ම සමානවේ.

මෙම දෙපාර්තමේන්තුව විසින් අනිත් ආරෝග්‍යශාලාවල රසායනාගාරවලට ඇස්. ඒ. ටී. සඳහා විල්පිලික්ස් ඇතුළත් ඇන්ටිජන්ස්, සකසා සපයන ලදී.

සාක විද්‍යාව (එන්නත් සාර)

පසුගිය කාලයේ මෙන්ම මෙම අංශය රටට අවශ්‍ය ටී.ඒ.බී. සහ කොලරා නාශක එන්නත් ද්‍රව්‍ය සියල්ලම සපයන ලදී.

අවුරුද්දට බෙදාහරින ලද ටී.ඒ.බී. එන්නත් මුළු තොගය ලීටර් 390 ක්වූ අතර කොලරා නාශක එන්නත් තොගය ලීටර් 25 කි. ගිය අවුරුද්දට වඩා නිකුත් කරන ලදි ටී.ඒ.බී. එන්නත් ද්‍රව්‍ය ප්‍රමාණය සියේට 28ක් වන අතර කොලරා නාශක

එන්නත් ද්‍රව්‍ය සියයට 136ක් පමණ වේ. විශේෂ රෝගීන්ගෙන් ස්වයංජනිත එන්නත් පිළියෙල කරන ලදී. සියල්ලම වඩි 9ක් විය.

ඖෂධ කර්මාන්ත අංශයෙන් ලත් නිෂ්පාදන මුහුනිති 108ක වන්ධ්‍යතා පරීක්ෂණ මෙහෙයවිණි.

ජීව රස විද්‍යාව

ලේ මස්තිෂ්ක කණ්ඨක ද්‍රාව මුහුනිති 16,593ක් ගැන මේ අංශය වර්ෂය තුළදී වාර්තා කලේය. මේ අනුව බලන කල ගිය අවුරුද්දේ කරන ලද (16,272) ගණනට වඩා ඉතා සුළු ගණනකින් වැඩිවී ඇත.

ගණන්කර බැලීමේදී සුලබම වූවෝ බිලිරුබිස් (2,495) සහ ප්‍රෝටීන්ස් සම්පූර්ණ ගණන හා ඒ/ජී. ප්‍රමාණයෝය. මේවායේ එකක ගණන 2,223 කි. ඊළඟට ලැබී තිබුන ගණන් නම් තයිමෝල් ටර්බිඩිටි (1,745) සහ සෙප්ලියා කොලස්ට්‍රෝල (1,721) ය. ඇස්.ජී.ඕ.ටී. වල එකතුවූ ගණන 1,285ක් සහ රුධිර ශර්කරා, රුධිරයුරියා හා මස්තු කොලස්ට්‍රෝල්වල ගණන අනුපිළිවෙලින් 9,80,917ක් සහ 993කි. තවත් ගණන්කර බැලු බොහෝ දෙයින් මස්තු ඉලෙක්ට්‍රෝලයිටස් එන්ඒ, කේසීඑ් සහ සීඇල් යන මේවායේ එකකින් 200 බැගින් විය.

අවුරුද්ද උදෙසා මේ අංශයේ ප්‍රසිද්ධ කිරීම් හා ලියකියවිලි මෙසේ විය :—

(1) ජේ. සී. ඇන් ජයසූරිය වෛද්‍ය තැනගේ "මයික්‍රොබයෝලජී ඉන් ඉන්ඩස්ට්‍රි" (1964 පෙබරවාරි මස (ලංකා කොටස) රාජකීය රසායන විද්‍යා ශාස්ත්‍ර සභාවේ සභාපති තැනගේ කථාව)

(2) ජේ. සී. ඇන්. ජයසූරිය වෛද්‍ය තැනගේ "කෙමිකල් කොන්ස්ටිටුවන්ට්ස් ඔෆ් එලිපන්ට් බ්ලඩ්" ලංකා විද්‍යා වර්ධන සංගමයේ (1964) 1.2 කලාපයේ

(3) "ලංකා වාසීන්ගේ මස්තුයකඩ හා යකඩ බැඳීම් ප්‍රමාණයන් ගණන් ගැනීම" ඇස්. සෙන්ති ෂන්මුගනාදන් විසින් ලංකා විද්‍යා වර්ධන සංගමයේ (1963) 1.31 කලාපයේ.

(4) "ඇසිඩ්පොස්පැටේසස් වල නොයෙක් ක්‍රමයන් ඉගැනීම"—කේ. ජෙග දේසන් විසින් ලංකා විද්‍යා වර්ධන සංගමයේ (1964) 1.2 කලාපයේ.

කීට විද්‍යාව

මෙම අංශයේ විශේෂ කාර්‍යයන්වූයේ පර්යේෂණ යයි. එහි සිරිත්හුරු වැඩ ඉතා සුළුය. fපයිලේරියාවල මදුරු භාරකයන් ගැන ඉගෙනීමේ දීර්ඝ යෝජනා ක්‍රම දිගටම කරගෙනයත්ම අවුරුද්ද තුලදී අළුත් යෝජනා ක්‍රමයක් බිහිකරවිය.

යෝජනා ක්‍රම නම්

(අ) **බරවා රෝග පැතිරයාම සම්බන්ධයෙන් කියුලෙක්ස් පැටිගන් වයඩ් නිර් මානය සහ සැපීමේ ශතිය.**—ගෙදරදී සී.fපැටිගන්ස් වර්ගය මනුෂ්‍යයකු ගෙන් ලේ බිව් විගසට අල්ලා මරා විකන්ඩනයකර ගත් ප්‍රතිඵල අනුව ස්ත්‍රී වර්ගය දෂ්ට කිරීමේදී තුන්වන වාරයේ බිජු තැන්පත් කරනු ලැබේ. එහෙයින් මේ ලේ බොන අවස්ථාවේ ඇත්ත වශයෙන්ම රෝග බෝකරන පණුවෝ ආසාදනය විහිදුවති. මෙය තවත් විග්‍රහ කර බැලීමේදී මේ ස්ත්‍රී වර්ගයාට රෝග බෝවෙන්නේ ඔවුන්ගේ මුල් දෂ්ට කිරීමේදීය. ගෙවල් තුළ සිටින විටදී සී.fපැටින්ගස්වර්ගයා ගැන මීට ඉහතදී කරන ලද පරීක්ෂණවලදී දැනගත් කරුණු මෙම ප්‍රතිඵලයන්ගෙන් සනාථ විය.

රාත්‍රි කාලයේදී සී.fපැටිගන්ස්ගේ දෂ්ට කිරීමේ ක්‍රමයන් අවුරුද්ද තුලදී ඉගෙන ගන්නා ලදී.

(ආ) **හයිර්කේනස් නිකායේ බරවා රෝග ආසාදනයවූ ඇනෝෆිලිස්.**—බරවා රෝග ආසාදනය සඳහා මදුරුවන් ගැන මෑතකදී කරන ලද පිරික්සීම්වලදී ඇනෝෆිලිසි පෙඩ්ටැනියැටස්වල සත්ව බරවා රෝගය පොදු වශයෙන් තිබෙන බව පෙන්වන ලදී. බෘගියා සිලේනෙන්සිස්, ඩිරෝෆිලැරිස් රිපෙන්ස්, සෙටෝරියා ඩිජිටැටිස්, සහ සෙක්ටේරියා ස්ප්‍රීසිස් ඒ. පෙඩ්ටි ඇනිස්ටස් මන්සෝනියා යුනිෆෝර්මිස් ආමිගේරිස් සබල්බැටස් (ඔබ්ටර්බන්ස්) යන වර්ගවල සංවර්ධනය ගැන රසායනාගාර පරීක්ෂණ පවත් වන ලදී. ෆයිලේරියා වර්ග හතරටම ශ්‍යොද සංග්‍රහ කරන්නෙක් ලෙස ඒ. පෙඩ්ටැනියාටස් සොයාගන්නා ලදී.

(ඉ) **ගෙදර ඇතිකරන කුකුලන්ගේ සිටින බරවා රෝග සහ පැලස්මෝඩියා භාරකයින්.**—ලංකාවේ ගෘහවල ඇති කරන කුකුලන් බරවා රෝග සහ පැලැස්මෝඩියාවලින් ආසාදනයවී ඇති බව දැනගත්ට ලැබුනත් මේ පරිපෝෂිතයින්ගේ ස්වාභාවික භාරකයින් හඳුනාගන නැත. වැඩියෙන්ම ඕනිතෝෆිලික්වූ මැන්සෝනියා කොකෙලටයිඩියා ක්‍රැසිපීස් ආහාර ගන්න අවස්ථාවන්හි පැස්මෝඩියා සහ බරවා රෝගයට භාරකයක් වන බව දැන් සොයාගෙන තිබේ.

(ඊ) **සිමියන් මැලේරියා ගැන ඉගැනීම්.**—ජා.සෞ.ස. විසින් පටන් ගත්තා වූ ලංකා විශ්ව විද්‍යාලයේ වෛද්‍ය අංශයේ පරිපෝෂිත විද්‍යා පිළිබඳ දෙපාතීමේන්තුව මගින් කරන ලද සිමියන් මැලේරියා පිළිබඳ යෝජනා ක්‍රමයේදී අලුතින් සොයාගත් මදුරුවන්ගේ පැලැස්මෝඩියාවට භාරකයින් වන මදුරුවන් ගැන ආධාරකාරි හැදෑරීම් මහාචාර්ය ඒ. ඇස්. දිසානායක සමග ආරම්භ කරන ලදී.

(උ) **කෘමිනාශකවලට ඇඳ-මකුණෝ ඔරොත්තුදීම.**—සාමාන්‍ය කෘමිනාශකවලට ඇඳ-මකුණෝ ඔරොත්තුදීම ගැන ජ. සෞ. ස. ක්‍රමවිලට අනුකූලව සාමාන්‍ය වශයෙන් සාධක සොයා ගෙන ඇත.

අවුරුද්ද තුළදී කරන ලද ප්‍රසිද්ධ කිරීම් පහත සඳහන් වේ : "ෆයිලේරියාව නිර්මානය කිරීම පිණිස ඇනෝෆිලිස් නිගෙර්රිමස් (හිර්කැනස් නිකාය) ගත්තා පියවර" ඩබ්. ජේ. නයිල්ස් විසින් ලංකා විද්‍යා වර්ධන සංගමයේ 19 වන සංවත්සරිකය (1963) 2.5 කලාපයේ.

"1 කොටස බෘගිස් ගැන තවදුරටත් ඉගැනීම (බෘගියල්ලා) බත්ලියා භාරකයින් දැනගැනීම සඳහා අත්හදා බැලීම්" ඒ. ඇස්. දිසානායක සහ ඩබ්. ජේ. නයිල්ස් විසින් ලංකා විද්‍යා වර්ධන සංගමයේ 19 වන සංවත්සරිකය (1963) 2.6 කලාපයේ.

"හැදින ගන නැත ප්ලැස්මෝඩියා සමග මැන්සෝනියා කොතලටයිඩියා ක්‍රැස්පීක්වලට ස්වභාවයෙන් රෝග බෝවීම" සර්ව කලාපීය වෛද්‍ය කර්ම හා ස්වස්ථතා සඟරාවේ 57—489.

අහස්යානා තොටුපලවල හා වරායන්වල ඒඩිස් ඊජිප්ටි සඳහා සිරිත් හුරු පරීක්ෂණ පෙරසේම පවත්වාගෙන යන ලදී. අවුරුද්දේ අවසාන භාගයේදී ගොඩනැගිලිවල අළුත්වැඩියා කිරීම නිසා මෙම රසායනාගාර පරීක්ෂණවලට බාධා ඇතිවිය.

අධ්‍යාපනික අංශයෙන් මහජන සෞඛ්‍ය ආධුනිකයන්ට (පැය 22 ක) දේශන මාලාවක්ද වෛද්‍ය රසායනාගාර කාර්මිකඥ ආධුනිකයින්ට (පැය 6 ක) දේශණමාලාවක්ද දෙනලදී.

පෝෂණය

පෙර වාර්තාකල පරිදි බී. ඇම්. ආර්. සහ නොයෙක් වැඩ කටයුතුවලදී ශක්තිය ගෙවී යාම පිළිබඳ ඇස්තමේන්තු සකස් කිරීමට ආධාර කරුවන් ලබාගැනීමේදී මෙම පර්යේෂණ ක්‍රමය බොහෝ දුරට ප්‍රමාදවිය.

ගලගන්ඩය සහ ඊට අදාල අනිකුත් දේ ගැන කලින් කරන ලද පරීක්ෂණ ගැන ඉගැනීම් තවදුර කරගෙන යන ලදී. සොයාගත් කාරණාවල සංඛ්‍යා ලේඛන විග්‍රහයක් පටන් ගත්තාලදී.

කැෂියෝකෝර් රෝගය වැළදෙන ළමයින්ට දෙන ආහාර වගේ ආහාර මීයන්ට දී ඔවුන්ට ඒවායින් සිදුවිය හැකිදේ ගැන ගිය අවුරුද්දේ කරගෙන ගිය පරීක්ෂා දිගටම කරගෙන යනලදී.

පාසැල් සිසුන්ගේ පෝෂණීය තත්ත්වය මැනීම පිළිබඳ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගෙන් සහ පාසැල් වෛද්‍යවරුන්ගෙන් ලද වාර්තා අනුව වාර්ෂික තක්සේරු කිරීම් දිගටම කරගෙන ගිය අතර ඒ ගැන රපෝර්තුද ඉදිරිපත් කරන ලදී.

කලින් සකස් කරන ලද අධ්‍යාපනික පත්‍රිකාවන් සිංහලට සහ දෙමළට පරිවර්තනය කිරීම පිණිස සෞඛ්‍ය සේවා පත්‍රිකා කොමිටුවට ආධාර දෙන ලදී.

ආහාර හා ඖෂධ කමිටුවට සහ කුසගින්නෙන් මිදීමේ ව්‍යාපාර කමිටුවට දෙපාර්තමේන්තුව සහභාගිවිය. පෝෂණය පිළිබඳ, කටයුතු මෙහෙයවීම පිළිබඳ, මධ්‍යම උප කමිටු පිළිබඳ සහ පරිසර යෝජනා ක්‍රම පිළිබඳ යටකී කමිටුවට අති විශාල කාලයක් ගතකරන ලදී. පන්නිපිටියේ ධර්මපාල විද්‍යාලයේ පාසැල් වතු යෝජනා ක්‍රමයක් සහ ලංකා මහිලා සමිති අභ්‍යාස මධ්‍යස්ථානයේ වතු යෝජනා ක්‍රමයක් පවත්වන ලදී.

ආරෝග්‍යශාලා ආහාර පිළිබඳ නොයෙකුත් අර්බුදයන් සඳහා දෙපාර්තමේන්තුවට ආධාර දෙන ලදී. පසුගිය කාලයේ පරිදි අධ්‍යාපනික වැඩ පිළිවෙල ඉතා භාරදූරවූ එකකි. වෛද්‍ය සහ අතුරු-වෛද්‍ය නිලධාරීන් හා අවශේෂ සංවිධායකයින්ට පෝෂණය පිළිබඳ දෙසුම් මාලා පවත්වන ලදී.

1963 දෙසැම්බර් සහ 1964 සැප්තැම්බර් යන මාසවලදී ලංකා විද්‍යා වර්ධන සංගමයේ සංවත්සරික සභාවලදී පහත සඳහන් පත්‍ර කියවන ලදී.

(1) "ළදරුවන් සහ ළමයින්ට ආහාරදීමේ පුරුදු වෙනස් කිරීම පිළිබඳ නියුමු ඉගැනුම"—වෛද්‍ය කේ. මහාදේව විසිනි.

(2) "ලංකාවේ ගලගණ්ඩ ගැටළුව" වෛද්‍ය කේ. මහාදේව විසිනි.

(3) "ළමුන්ගේ වැඩීමේ පිළිවෙලවල් ගැන සමානාත්මක ඉගැනුම"—වෛද්‍ය කේ. මහාදේව විසිනි.

පරපෝෂික විද්‍යාව

ගිය අවුරුද්දේ සම්පූර්ණකුල නිවර්තන කලාපීය ඉසිනොපීලියා විෂයයෙහි තතු හැඳෑරු පත්‍රිකාවක් ප්‍රසිද්ධ කිරීම පිණිස ඉදිරිපත් කරන ලදී. සෑම රෝගියෙකුම පිළිබඳව ශායනික රක්තවේදීය මස්තුවේදීය සහ විකිරණ වේදීය පරීක්ෂණ කරන ලද අතර ඩයිතිල්කාබමසීන් සිට්රේට් විවිධ වඩ් කෙරෙහි ඔවුන් පිළිහුරුවූ අයුරු මෙම තතු හදාරීමේ ඇතුලත්වී තිබේ.

"මෝර්පෝලොජී ඔෆ් එමලේරියා පැරසයිට් ඔෆ් ද මන්කි මැකාකා සිනිකා" නමින් පත්‍රිකාවක් පිළියෙළ කොට ප්‍රසිද්ධ කිරීම සඳහා ඉදිරිපත් කරන ලදී.

ප්ලෝරස්න්ට් අනුදක්නයන් යෙදූ නෙමතෝද පරාපෝෂිතයින් කෙරෙහි පරීක්ෂණාගාර සතුන් දක්වන ප්‍රතිශක්තිවේදී පිළිසනු ඉගෙනීම් දිගටම කරගෙන යන ලදී.

සමස්ථානයික රසායනාගාරයේ රසායනික කටයුතු පිළිබඳ පහසුකම්වල වෙනස් වීමක් ඇතිවූ නිසා විකිරණ ශීලී සමස්ථානයික යොදා බරවා පරාපෝෂිත වර්ගයන් පරීක්ෂණාගාර සතුන් වෙත හටගැන්වීම සහ සොයාබැලීම් නතර කිරීමට සිදුවිය.

ප්ලැස්මෝඩියට් බර්ගෙයිවලින් ආසාදිතමීයන්ගේ පරාපෝෂිත ඌනතාවයමත යකෘත්ධූලක ඖෂධවලින් සිදුවන අක්මාහානියේ බලපෑම පැවැතීමේ හැදෑරීම් එසේම කරගෙන යන ලදී.

නැවත වරක් සිරිත් හුරු රෝග විනිශ්චක වැඩ ප්‍රමාණය වැඩිවිය. කෙලින් නැවරීම් සහ ඇම්. අයි. ඇෆ්. සී. ශිල්පිනාහාය අනුව, ඇමීබා, ඩිම්බ සහ කෝෂ්ඨ සඳහා පරීක්ෂා කිරීමට ලැබූ අසූචි පෑලුම් ගණන 4,816කි. මෙය ගිය වර්ෂයට වඩා 1,300 කින් වැඩිය. පෑලුම් බොහෝමයක් ඇම්. අයි. ඇෆ් සී. ශිල්පන්‍යාය අනුව පරීක්සීමට නුසුදුසු ඒවා විය. මේ නිසා පිරික්සීම්වලට ඉතිරුවූයේ පෑලුම් 3,967ක් පමණය. වැඩියෙන්ම සුලබ වූයේ සියයට 28ක්වූ විෂ්-පණු විශේෂයයි. ඊළඟට පිළිවෙලින් නැන් හිමිවූයේ සියයට 16ක් වූ වට පණුවන්ටත්, සියයට 15ක් වූ කොකුපනුවන්ටත්ය. මේවායේ ගිය අවුරුද්දේ ගණන් සියයට 33යි, සියයට 22යි, සහ සියයට 15 බැගින් අනුපිළිවෙලින් දක්වා ඇත. නොයෙකුත් වෙනත් පරාපෝෂිත බෝවීම් ඉතා අඩුවෙන් දක්නා ලදී. වැඩියෙන්ම තිබුනේ සියයට 2.6ක් වූ ගර්ඩිලම්බිලියා කෝෂ්ඨයෝය.

ඇමීබා බෝවීමේ සාක්ෂි තිබේදැයි සොයා බැලීම සඳහා පෑලුම් 156ක වැඩිම පරීක්ෂා කරන ලදී.

මැලේරියා බෝවීම පරීක්ෂා කර බැලීම සඳහා ගන්නා ලද ලේ තහඩු ගණන 42කි. මේවා සියල්ලම නොගැකිය. සියුම් බරවා හඳුනාගැනීම පිණිස ලේතහඩු 116ක් වූ අතර මේවායින් දෙකක් සහගැතිය.

බරවා රෝග මර්ධන ව්‍යාපාරයේ ලේ තහඩු 705ක් හරස් පරීක්ෂණ හැටියට පරීක්ෂා කරන ලදී.

ටොක්සෝප්ලැස්මෝසිස්වලට පරීක්ෂා කිරීම සඳහා ලේ පෑලුම් 28ක් විය. දසැබින් පිල්ඩ්මන්ඩයි ක්‍රමය පාවිච්චි කරන ලදී. කලවම් නොවූ මස්තු සමග සහගතිවූ මස්තු පෑලුම්විය. 18ක් වෙනස් විධි දරණ කලවම් ඒවාය.

පරාපෝෂිතයෙක් නොවූවත් එක සර්පයෙක් හඳුනා ගැනීම සඳහා ලැබීම වාර්තා ගත කිරීම සතුටට කරුණක් යයි සිතමි. මොහු ටයිලොප්ස් ප්‍රරේමිනස් වර්ගයට අයත් පහත රටෙහි දක්නා සර්පයෙකි.

රෝග නිධාන විද්‍යාව

මෙම අංශයේ සිරිත් හුරුවැඩ වැඩිවීම දිගටම පැවතුණි. අවුරුද්ද තුලදී ගර්භණී භාවය සඳහා ගෙමැඩි පරීක්ෂණ 1,572ක් හා චිකිත්සක සහ අනුදක්න පරීක්ෂණයන් සඳහා මුත්‍රා පෑලුම් 1,128ක් ද බලන ලදී. ආර්එල් සාධකය සහ ඒ.බී.ඕ. වර්ගවලට කරන මස්තුවේදී පරීක්ෂණයන්ගේ එකතුව 627කි. කොටස් 180වක් ආරෝග්‍යශාලා සඳහාත්, 125ක් පර්යේෂණ කටයුතු සඳහාත්, ඖතික රෝගනිධානීය වැඩ කරන ලදී. එක් එක් වර්ගයාගෙන් ඉතා සුළු ගණන් ඇති නොයෙක් අන්දමේ තවත් පරීක්ෂණ පවත්වන ලදී.

සාකවේදී අංශයත් සමග සහයෝගයෙන් කටයුතු කරමින් ටෙටනස් ධූලක වලින් මධ්‍ය ස්නායු පද්දතිය කෙරෙහි ඇති බලපෑම් ගැන වැඩිදුර ඉගැනීම් පර්යේෂණ අංශයෙන් කරගෙන ගියේය. ඖතික වේදීය ඉගැනීම්ද මේ අංශයෙන් සිදුවිය.

ගර්භනී භාවය පිළිබඳ අළුත් මස්තුවේදී පරීක්ෂණ දෙකක් ගෙමැඩි පරීක්ෂණයන් වෙනුවට සොයාගන්නා ලදී. ග්‍රැවින්ඩෙක්ස් ස්ලයිඩ් පරීක්ෂණය සහ පියුපෙරෙන් පරීක්ෂණය යනුවෙන් අළුත් පරීක්ෂණ දෙක හැඳින්වේ. ප්‍රතිපල විග්‍රහ කරගෙන යනු ලැබේ.

පොලිස් සේවයට බඳවාගත් ආධුනිකයින් 165 දෙනෙකුගේ රසායනාගාර පරීක්ෂණයන් සහ විකිරණ විද්‍යා අංශයට අයත් මහරගම පිළිකා රෝග ආයතනයේ සේවක මණ්ඩලයේ විකිරණ අභ්‍යාසයන් පිළිබඳ කරුණු සොයා බැලීම, විශේෂයෙන් බාරගත් වැඩ දෙකක්ය.

ඖෂධ ශාස්ත්‍රය

රසායනික වැඩ හැර ඖෂධ ශාස්ත්‍රය පිළිබඳව පමණක් කටයුතු කිරීම පිණිස මෙම අංශය 1964 අගෝස්තු මස ප්‍රතිසංවිධානය කල බව කලින් සඳහන් කර ඇත. ඖෂධවේදීන් දෙදෙනා පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා එතෙර ගොස් සිටි නිසා, වර්ෂයේ පළමු භාගයේදී සුදුසුකම් ලත් ඖෂධවේදීන් කිසිවෙක් මෙහි නොසිටියෝය. කෙසේ හෝ වර්ෂයේ අවසාන භාගයේදී විශේෂඥනය ලැබ ආපසු පැමිණි එක නිලධාරියෙක් ඖෂධ ශාස්ත්‍රීය පිළිබඳ කටයුතු බාරව වැඩ කළේය.

පර්යේෂණ අංශයෙන්, ආයුර්වේද බෙහෙත්වලින් බලගතු යයි ප්‍රසිද්ධ පැලෑටිවල අමුසාරය ඖෂධවේදය අනුව විදහා දක්වන ලදී. දිරිගන්වන මූලික ප්‍රතිඵල ලැබුනේවී මුත්, ඉගෙන ගත් කාලය ඉතා කොට නිසා, රපෝර්තු කිරීමට දැන්ම වේලාසන වැඩිය.

චිකිත්සාගාර රෝග විනිශ්චයන් සඳහා හෝමෝන් සංග්‍රහයෙන් සිරිත්හුරු වැඩට අඩංගුය. මධ්‍යස්ත කෙටොස්ට්‍රොයිඩ්ස් සඳහා මුළුමනින් 86ක් ද, හයිඩ්රොක්සි කෝටිකොස් ට්‍රොයිඩ්ස් 17ට 4ක් ද, කෝටිජිනික් ස්ට්‍රොයිඩ්ස්වලට 1ක් ද, මුළු ගෝනඩොට්‍රොfපීන්වලට 16 හා කැටිකල් ඇමිනස්වලට 2ක් ද විය.

විෂාණුවේදය

(අ) **පිස්සු බලු රෝගය**

ලංකාවේ සෑම පලාතකින්ම ලැබුණාවූ පිස්සු බලු රෝගයෙන් මැරුණේ යයි සැකකල සතුන්ගේ විශේෂයෙන්ම බල්ලන්ගේ මොල මෙම රසායනාගාරයේදී පරීක්ෂා කරන ලදී. අවුරුද්ද තුළදී මොළ 1,002ක් ලැබුණේවී මුත් 128ක් කුණුවී ගොස් තිබූ නිසා පරීක්ෂණවලට නුසුදුසු විය. පරීක්ෂණවලට සුදුසුවූ මොල 874න් සියයට 5ක් පිස්සු බලු රෝගය සඳහා සහගැති ඒවාය. ගිය අවුරුද්දේ මුළු ගණන්ද එක හා සමානය. මේවායින් සියයට 72ක් සහගැතිය. කෙලින්ම සූක්ෂමතුරුවීම් පරීක්ෂණ මොලයේ සිව්වල කොටස් සහ ජෛවී පරීක්ෂණ යන මේවා මීයන් උදෙසා කරන ලද පරීක්ෂණවලට අඩංගුය. ලැබුන මොල අතරෙන් 16ක් බලලුන්ගේ 2ක්, එළුවන්ගේ 8ක්, එල දෙනුන්ගේ සහ වසු පැටවුන්ගේ 4ක්, වඳුරන්ගේ සහ 1ක් මුගටියකුගේ යයි මෙහි සඳහන් කිරීම සතුටට කරුණක් යයි සිතමි.

ප්‍රදේශීය බෙදාහැරීම ගිය අවුරුද්දේ සේමය. කොළඹ නගර සභාවෙන් ලද මොල ගණන සියයට 20ක්, බස්නාහිර පළාතේ ඉතුරු කොටසෙන් සියයට 50ක් හා මධ්‍යම පලාතෙන් සියයට 13කි.

ලංකාවේ ජනතාවට අවශ්‍ය සියලුම පිස්සු බලු එන්නත් සාර මේ අංශය මගින් නිපදවන ලදී. අවුරුද්ද තුලදී නිකුත් කල එන්නත් සාර ප්‍රමාණය ලීටර් 1,054කි. ඊට ඉහත අවුරුදු දෙකේ ලීටර් 1,125ක් හා ලීටර් 1,416ක් නිකුත්කර ඇත. මේ නිකුත් කිරීම්වල දැක්වෙන අඩුවීම ධෛර්‍යයට කරුණකි.

(ආ) වැරියෝලා ගොවසූරිකා

වසූරි රෝගය සඳහා සැකකරන ලද ලෙඩුන්ගෙන් ගත් පැලුම් 24ක් ලැබුණි. මේ ගණන ගිය අවුරුද්දට වඩා එකකින් අඩුය. මේවායින් කිසිත් සහගැති නොවීය. වසූරි රෝගය, පැපොල රෝගයෙන් වෙන්කර විදහාපෑම, පැපොල රෝගීන්ගේ නොයෙක් අවස්ථාවලදී තැවරෙන රිෂ්ටයන් ස්ථිරවම දැනගැනීම ආදී පරීක්ෂණ වලදී මේවායේ ඇතිවන විශේෂ ලක්ෂණ හා යෝධ ශෛලයන් ගැන ක්‍රමානුකූලව ඉගෙනීම් කරගෙන යනු ලැබේ. ඉහතින් කී දැ පැපොල රෝගයේ නිතරම ඇත.

(i) බලවත්කම මනින ලද වසූරි එන්නත් සාර, එන්නත් කිරීමෙන් පෙර හා පසු ගොවසූරිකා ප්‍රතිදේහයන් ඇත්දැයි සොයාබලන පරීක්‍ෂණ අප්‍රියෙල් මාස යේදී කරන ලදී. ලංකා යුධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරි තුමාගේ කාරුණික සහාය ඇතිව හමුදා සේවකයින් 60ක් මේ සඳහා යොදවා ගන්නා ලදී. මේ අයට එන්නත් කිරීමට පෙර ලේ පැලුමක් ගන්නා ලදී. එන්නත් කිරීමෙන් සුමාන දෙකකට සහ හතරකට පසු ලේ පැලුම් ගන්නා ලදී. ඌනපූරක තවුරු පරීක්‍ෂණ සහ පොමොගලව්නේෂන් ඉන්හිබිෂන් පරීක්ෂණ යොදා මස්තුවල මැරියෝලා ගොවසූරිකා ප්‍රතිදේහයින් ඇත්දැයි සොයා බලන ලදී. ඒවායේ ප්‍රතිපලයන් ඉගෙන ගෙන යනු ලැබේ.

(ii) වසූරියට එන්නත් කිරීම සඳහා ලංකාවට අවශ්‍ය සියලුම එන්නත් සාර මෙම අංශය මගින් නිපදවා නිකුත් කරන ලදී. වර්ෂය තුළදී වඩි 8,55,400ක් නිකුත් කරන ලදී. ගිය අවුරුද්දේ වඩි 6,11,616ට වඩා මෙය වැඩිය. මෙම අංශයෙන් එන්නත් කිරීමේ මධ්‍යස්ථානයේදී මුල්වරට 481ක් ද දෙවන වරට 866ක් ද එන්නත් කරන ලදී. අනුපිළිවෙලින් පසුගිය අවුරුදු දෙකට මෙම ගණන් 1,070ක් සහ 1,162ක් වේ.

(ඉ) අනෙකුත් විෂානු වැඩ

පසුගිය අවුරුදු දෙකේදී පටන්ගන්නා ලද ආබර් විෂානු රෝගවල රෝග විනිශ්චිත මස්තුවේදීය පරීක්ෂණයන් තවදුරටත් සංවර්ධනය කරන ලදී. සිරිත් හුරු පරිදි පාවිච්චි කරන ලද ප්‍රතිදේහජන්‍යයන් නම් ජපන්නිධිකර්පරදගය, ඩෙන්ගු 1 හා 2 සහ පසුව ටී. පී. 64. (මැලේසියා මැක්කන් කෑදැල්ලකින් වෙන් කර ගන්නා ලද මැක්කන්ගෙන් ඇතිවූ විෂාණු.)

මස්තු ලබා ගන්නාවූ රෝගීන්ගේ ගණන 110 ක්වූ නමුත් පරීක්ෂණවලට සුදුසු වූයේ 78 ක් පමණි. මෙයින් විෂාණු ප්‍රතිදේහයන්ට සහගැති ප්‍රතිබල පැවැත්වෙන බව රෝගීන් 44 ක ප්‍රතිඵලයන්ගෙන් දැක්වේ.

මෙම වැඩ සඳහා කලින් කියනලද ඒවාට වැඩිමනත් වශයෙන් මේ අංශය විසින් ප්‍රතිදේහජන්‍ය ඇම්. ඇස්. 128 ක් හා සින්ඩ්බිස් සාදන ලදී. මේ දෙක ළඟදීම සිරිත් හුරු වැඩ සඳහා යොදවනවා ඇත.

සුවවේගන එන්නාවූ මස්තුවල දෙවන පැලුම් නිතරම එවන්නේ නැති නිසා, ටයිටර්වල සැලකිය යුතු වැඩිවීමක් දැක්වීම සඳහා මස්තු ජෝඩිරකර සථිර රෝග විනිශ්චයක් ලබාගැනීම් පරීක්ෂණයන් නොකළ හැක.

සිවිය වැඩිම සහ එහි මස්තුවේදය පෝලියෝ විෂාණුවලින් වෙන් කිරීම පිළිබඳ කටයුතු වැඩිදියුණු කිරීමට නොහැකිවූයේ රසායනාගාර දෝෂයන් නිසාය. මේ නිසා පැලුම් මැග්නීෂයම් ක්ලෝරයිඩ්වල පිළියෙළ කර, සවිස්තරව පහදාදීමෙන් සහ භාජනවල ඇසිරීමෙන් පසු සිංගප්පූරුවේ පිහිටි ජ. සෞ. ස. එන්ව්රෝ විෂාණු රසායනාගාරයට යවන ලදී. මුළුමනින් අසූචි මුහුන්තැලි 59 ක් ද, යුගල මස්තු මුහුන්තැලි 22 ක් සහ තිනිමස්තු මුහුන්තැලි 40 ක්ද යවන ලදී.

ස්ටැපිලෝකොකල්ෆේජ්ග්ටයිපින් සඳහා මෙම අංශය විසින් වෙනම කුඩා ඒකකයක් පවත්වන ලදී. රෝගීන් 75 දෙනෙකු ලබාගත ඓන්ද්‍රිකයෝ ටයිප් කරන ලදී. මෙයින් 45 ක් ටයිප් කිරීමට සුදුසු වූ අතර දැනගන්ට ලැබුන සුලබම වර්ගය නම් III වැනි නිකායය.

විදුලි බලය නැතිවීම හා වෝල්ටේජ් වරින්වර වෙනස්වීම නිසා සියලු වැඩවලට විශාල බාධා ඇති වී ශීතකරයටද හානි ඇතිවිය.

අභ්‍යාස පාඨමාලා :

(අ) වෛද්‍ය පර්යේෂණාගාර කාර්මික විද්‍යාඥ සිප්හල

වර්ෂය සඳහා සිප්හල ඉතා සතුටුදායක අන්දමින් කටයුතු කරන ලදී. 1963 ඔක්තෝබර් මාසයේ සිප්හල පටන්ගත්තාවූ වර්ෂයේදී අපේ අංශයේ ආධුනික සිත් හැටියට සිසුන් තිහක් බඳවා ගන්නා ලදී. මීට අමතරව තවත් 6 දෙනෙක් යුධ හමුදාවෙන් එක් අයෙක්ද රාජකීය ගුවන් හමුදා සේවයෙන් එක් අයෙක් ලංකා විශ්ව විද්‍යාලයේ වෛද්‍ය අංශයෙන් එක් අයෙක් පිටරටවලින් ජ. සෞ. ස. යටතේ අධිශිෂ්‍යත්වයන් ලැබූ බුරුමයේ එක් අයෙක් සහ නේපාල යෙන් දෙදෙනෙක්ද මෙහි ඉගෙනුම ලැබීය.

මෙම අධි ශිෂ්‍යත්ව පිරිනැමීමෙන් අවුරුදු හතරක්වූ මෙම සිප්හලට ගෞරව යක් ගෙනදුන් නිසා ජ. සෞ. ස. ස්තුතිවන්ත විය යුතුය.

අවසාන විභාගයේදී මෙම අංශයේ සිසුන් 24 දෙනෙක් හා අනිකුත් අයගෙන් පස් දෙනෙක් ද සමත්විය. සිසුන් නව දෙනෙක් ඔවුන් අතරේ විශිෂ්ඨ සාමාර්‍ථ ලබාගත්තා ලදී.

1963 නේදී පැවැත්වූ අවසාන විභාගයෙන් සමත් වූ සිසුන් 26 දෙනෙක් වර්ෂය තුලදී ඔවුන්ගේ සීමා වාසික කාලය සතුටුදායක ලෙස සම්පූර්ණකරන ලදී.

(ආ) අභ්‍යාස සහ සංස්කරණ පාඨමාලා

ආරෝග්‍යශාලා රසායනාගාරවලට රෝග නිධානඥයෝ පුහුණුකරවීමේ අවුරුදු දෙකක විශේෂ පරිපාටිය සම්බන්ධව වෛද්‍යවරුන් දෙදෙනෙකුට සාකවේදය ගැන හය මසක පුහුණුවක් දෙනලදී.

වෛද්‍ය රසායනාගාර කාර්මිකඥයින් 4 දෙනෙකුට පටු සංස්කරන මාලාවක් දෙන ලදී. එන්වුක් රෝග සඳහා මස්තුවේදිය පරීක්ෂණ ගැන දෙදෙනෙක් සහ ජීව රසායන විද්‍යාව පිළිබඳ දෙදෙනෙක්ද වේ.

සූක්ෂම ඡායාරූප ශිල්පය

මෙම ආයතනයේ අනිකුත් අංශවලට මේ අංශය මගින් ඉතා ප්‍රයෝජනවත් වැඩ කෙරිණ. සූක්ෂම ඡායාරූප ශිල්පය අනුව අරන ලද වැඩ ගණන 620 කි. (ප්ලොර සන්ට් සූක්ෂම ඡායා, කළු බිම සහ පේස්කොන්ට්‍රාස්ට් ඇතුලත්ය) මහා ඡායාරූප 90 කි, නෙරළු තහඩු 480 කි, ශායනිකරෝගීන් ගැන ඡායාරූප 29 කි. සූක්ෂම පටල 32 කි, ඡායානුසාර පිටපත් 720 ක් සහ පොටෝ ඇක්ස්රේ ඇඳීම් සහ සටහන් (නිරුත්තිරූප) 80 කි. විකිරණ ශිලිසමස්ථානික රුගත් කෘමින්ගේ සහ පිලවුන්ගේ ස්වයන් විකිරණ රේඛනද ගන්නා ලදී.

වැඩපොල සහ නඩත්තු අංශ

මේ අංශ දෙක එකකට එකක් නිදහස් වුනත් දෙකටම පොදුවූ වැඩ රාශියක් තිබුණි. රසායනාගාර පවත්වා ගැනීමට සහයවීමෙහිලා ඔවුන් අතින් ඉටුවූ සේවය ඉතා අගනේය.

වෂීය ඇතුළතදී යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියා කිරීම් සහ සාත්තු කිරීම් 602 ක් වැඩ පොලෙන් ඉටුවිය. එයින් 70ක් පිටපළාත්වල රසායනාගාර උදෙසාය. විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ කටයුතු 201 කි. මේ අළුත්වැඩියා කිරීම්වලට අමතරව රසායනාගාර උපකරණවලට සිරිත්හුරු සාත්තුව දීමෙහිද මේ අංශය නියුක්තවිය. වඩුවැඩ සම්බන්ධ යෙන් මේ අංශය බඩු සෑදීමෙහි සහ අළුත්වැඩියා කිරීමෙහි වැඩ 1,272 කරන ලද අතර එන්නත් සාර අසුරා යැවීම සඳහා සම්මත වගීයේ පෙට්ටි 4,056ක් ද සාදන ලදී.

අනුදක්න 168ක් ද වෙනත් උපකරණ වර්ග 33ක් ද නඩත්තු කිරීමේ අංශය විසින් සාත්තු කොට අළුත්වැඩියා කරන ලදී.

සතුන් ගාල

රසායනාගාර කටයුතු සඳහා සතුන් කීප වර්ගයක් ඇති කරන ලදී. එනම් එළුවන්, වසු පැටවුන්, සාවුන්, ගිණි ඌරන්, මීයන්, කුකුලන්, තාරාවුන්, බලලුන්, බල්ලන් සහ වඳුරන් වෙයි. එසේ හෙයින් සෑහෙන ඉඩකඩ මඳ නිසා විශේෂයෙන්ම සතුන් බෝකිරීම සහ සතුන් අතර රෝග බෝවීම වැලැක්වීම අතින් බලවත් අවහිරයක් උනි. එසේද වූවත් කරදරකාරී තත්ත්වයන් මැඩගෙන බොහෝ කටයුතු ඉෂ්ට කරන ලදී.

VIII වැනි පරිච්ඡේදය

අ—පාරිසරික සනීපාරක්‍ෂාව

1. ගැටලුව

මේ රටේ ළමුන්ගෙන් බොහෝ දෙනෙක් වටපණු, කොකු පණු "කසපණු" රෝග වලින් හා ඒ හා සමාන බඩවැල්වල හටගන්නා පිළිලාබාධයන්ගෙන් ද පෙළෙන බැව් අනාවරණය වී ඇත. ඒ නිසාම ඔව්හු නා නා ප්‍රකාරවූ බඩවැලේ රෝගබාධයන්ට පාත්‍රවී ඇත්තාහ. මෙයට හේතුව පාරිසරික සනීපාරක්‍ෂාවේ පහත් තත්ත්වය බැව් පෙනී ගොස් ඇත. මෙම අයහපත් සනීපාරක්‍ෂාව නිසා "තයිපොයිඩ්" උණ, බාලක පක්‍ෂාගාතය හා අතීසාරය යනාදී අනිකුත් රෝගාබාධයන් ද හට ගැනීම සිදුවේ.

2. මෙවැනි රෝග හටගැනීම හා ඒවා පැතිරීයාම වලක්වාලීම පිණිස පාරිසරික සනීපාරක්ෂාව සැලසීම සම්බන්ධයෙන් ගත හැකි සෑම උත්සාහයක්ම ගනු ලබන්නේය. මේ සම්බන්ධයෙන් දැනට දී ගන යනු ලබන ව්‍යාප්තිත සෞඛ්‍ය අධ්‍යාපනය හා ආරක්ෂක අන්දමට උවමනා තරම් ජලය ලබාදීම හැරුණුවිට වැඩිහිටියනට වැසිකිළි ලබාදීමට හා සෑම ගෙදරකම පෙර පාසැල්වියේ පසුවන ළමුන් සඳහා වැසිකිළිය බැගින් ලබාදීමට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු හා අනිකුත් ක්‍ෂේත්‍ර කාය්‍ය මණ්ඩලය උත්සාහ දරත්. මෙම උත්සාහය සාර්ථක කරගැනීම සඳහා අවුරුදු ගණනාවක් ගත වන නමුත් මෙම අංශයෙහි ලා නිශ්චිත ප්‍රගතියක් ලබා ඇත්තේය. මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් තම ප්‍රදේශවල සනීපාරක්ෂාව පිළිබඳ වැඩ පිළිවෙලේ පළමුවන ඒකකයේ වැඩ සම්පූර්ණකර ඇති අතර දැනට ඔව්හු එහි දෙවෙනි ඒකකයේ වැඩ කිරීමෙහි නිරතව සිටිත්. වැසිකිළි තැනවීම සඳහා ගෙහිමියනට ආධාර දුන් අතර "වැසිකිළි තැනවීම සඳහා ආධාර මුදල්" යටතේ රුපියල් 3,00,000ක මුදලක් වෙන් කර ඇත. අවුරුද්ද අවසානයට මෙම මුදලින් රු. 2,93,068ක් ප්‍රයෝජනයට ගෙන තිබුණි. යට සඳහන් මුදලින් 25%ක් වැයකර ඇත්තේ පෙර පාසැල්වියේ ළමුන් සඳහා වැසිකිළි තැනවීම සඳහාය.

3. වැඩ කටයුතු

(අ) **ජලය සැපයීම.**—කිසිදු විශාල යෝජනා ක්‍රමයක් භාර නොගන්නා ලදී. පාරිසරික සනීපාරක්ෂාව නගාලීම පිළිබඳ වැඩ සටහනේ අංශයක් හැටියට ජලය සැපයීමේ ලා දැනට පවත්නා ක්‍රමයක් වැඩිදියුණු කරන ලදී.

(ආ) **මිනිස් මළ මුත්‍ර බැහැර කිරීම.**—බරවා රෝගය පවත්නා ප්‍රදේශවල බාල්දි වැසිකිළි ජල මුද්‍රිත වැසිකිළි බවට හැරවීමේ වැඩ කටයුතු සමාලෝචනයට තුඩුදී ඇති වර්ෂය තුළදී දිගටම කරන්නට යෙදුනි. එසේ හරවනු ලබන එක් වැසිකිළියක් සඳහා සාමාන්‍යයෙන් ගෙවනු ලබන රුපියල් 60 ආධාර මුදල සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් ගෙවන ලදී. ගම්බද පෙදෙස්වල වැඩිහිටියන් හා පෙර පාසැල්වියේ ළමුන් සඳහා වැසිකිළි තැනවීම කර ගන යන ලදී. ආධාර මුදල් අවශ්‍යවූ අවස්ථාවන්හිදී එසේ තනවන ලැබූ එක් වැසිකිළියක් සඳහා රුපියල් 25 බැගින් ආධාර මුදලක් ගෙවී අතර පෙර පාසැල්වියේ ළමුන්ගේ වැසිකිළියක් තැනවීමට භාරගන්නා සෑම ගෙහිමියකුටම ඇණ තියන පෝරුවක් හා පෝච්චියක් නොමිලේ ලබාදෙන ලදී.

(ඇ) **හදිසි අනතුරු.**—වාර්තා කරන ලද සියළුම ගෙදර දොරේ හදිසි අනතුරු ගැන කරුණු විමසා බැලීමෙන් අනතුරුව වැළැක්විය හැකි ඒවා ගැන සුදුසු පරිදි ක්‍රියා කරන ලදී. "ලංකාවේ හදිසි අනතුරු වැලැක්වීමේ සංගමය" මගින් ආරම්භකර ඇති වාර්ෂික රැලියේ වැඩ සටහනට "ගෙදර දෙරේ හදිසි අනතුරු" යන මැයෙන් වැඩ කොටසක් ඇතුළත් කරන ලදී. දෙපාර්තමේන්තුවේ නිලධාරියෙක් ලංකාවේ හදිසි අනතුරු වැළැක්වීමේ සංගමයේ කමිටුවේ සේවය කරයි.

(ඈ) **නිවාස සැපයීම.**—දෙපාර්තමේන්තුව මගින් නිවාස යෝජනා ක්‍රමයන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට භාර නොගත්මුත් මහජන සෞඛ්‍ය පරීක්‍ෂකවරු ගම්බද පෙදෙස්වල නිවාස තත්ත්වය නගාලීමට උත්සාහ ගත්හ.

වතු ගැන නිතිපතා පරීක්ෂණ පැවැත්වූ අතර ඒවායේ ඇති ගෙවල් පේළි සනීපාරක්ෂිත අන්දමට නඩත්තු කරන්නේද කියා විශේෂ උනන්දුවෙකින් යුතුව පරීක්ෂාකර බලන ලදී.

ආ—ආහාර හා ඖෂධ වර්ග පාලනය

පාරිභෝගික ආහාර ද්‍රව්‍ය හා ඖෂධ වර්ග මිළදී ගන්නාට උවමනා සවභාවයෙනුත්, ධාතු බලයෙනුත්, ගුණයෙනුත් හොබනා අන්දමට සකස්වී ඇති දැයි වගබලා ගැනීම සඳහා ආහාර හා ඖෂධ වර්ග පනත හා එයට අදාල අනිකුත් ව්‍යවස්ථා ක්‍රියාත්මක කරවන ලදී.

(අ) **ආහාර වර්ග පාලනය.**—ආහාර ද්‍රව්‍ය සම්බන්ධයෙන් වගකීම පැවරී ඇත්තේ පළාත් පාලන ආයතනයන්ට නිසා පනත හා අදාල ව්‍යවස්ථාවන් ක්‍රියාත්මක කිරීම එම බලධාරීන් විසින් කරන ලදී. නාගරික සභා 8ක්ද, නගර සභා 26ක් හා සුළු නගර සභා 5ක් ප්‍රධාන පනතින් හා අදාල ව්‍යවස්ථාවන්ගෙන් තමන් වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කළාය. තවත් පළාත් පාලන ආයතන 4ක් ආහාර සැම්පල් විග්‍රහ කිරීම සඳහා මහජන රස පරීක්ෂකයින් සහ බලය ලත් නිලධාරීන් පත්කිරීමට කටයුතු කරගන යන්නිය. පවිත්‍රතා මට්ටමක් පනවා ඇති විවිධ ආහාර ද්‍රව්‍යයන්ගෙන් නිදර්ශන ගෙන පරීක්ෂාකර ඇති අතර වැරදි කිරීමෙහි නිරතවූවන්ට විරුද්ධව නීත්‍යානුකූලව ක්‍රියා කිරීම ආරම්භ කර ඇත.

ආහාර පවිත්‍රතාවය ගැන කොළඹ හා නුවර නාගරික සභා ප්‍රදේශවල කරන ලද වැඩ කටයුතු සම්බන්ධයෙන් විස්තර පහත දැක්වේ. කිරි සහ අනිකුත් කෑම ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් බාලකිරීමේ සියේට ප්‍රමාණය

ගිය අවුරුද්දේ ප්‍රමාණයට වඩා වැඩි බැව් එම විස්තරවලින් පැහැදිලිවේ. බාල කිරීම සඳහා පොදුවේ උපයෝගී කරගත් ද්‍රව්‍ය ගිය අවුරුද්දේ ඒවා හා සමාන වේ.

ආහාර පිළිබඳ සවසෘතාව

	1963	1964
කිරි සැපයීම		
විග්‍රහ කරන ලද සැම්පල් ගණන	450	641
බාලකර අසුවූ සැම්පල් ගණන	335	485
ආහාර		
සැම්පල් ගණන	588	687
අයෝග්‍ය ලෙස අයින්කරන ලද ගණන	272	383
ගවයින්		
පරීක්ෂා කරන ලද ගණන...	1,35,876	1,35,871
මස් පිණිස මැරීමට අවසර දුන් ගණන	1,32,558	1,32,873
එළුවන්		
පරීක්ෂා කරන ලද ගණන...	46,316	43,325
මස් පිණිස මැරීමට අවසර දුන් ගණන	45,577	42,866

(ආ) **ඖෂධ වර්ග පාලනය.**—ඖෂධ වර්ග පාලනයෙහි ලා ප්‍රවීණ බලධාරියා වනුයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනය. ඖෂධ වර්ග වෙළඳාමේ යෙදී සිටින්නන් ලියා පදිංචි කිරීම දිගටම කරගෙන ගිය අතර සමාලෝචනයට තුඩුදී ඇති වර්ෂයතුළදී බලපත්‍ර 1,775ක් නිකුත් කරන ලදී.

ඖෂධ වර්ග බාලකිරීම සම්බන්ධයෙන් බලයලත් නිලධාරීන් 4 දෙනෙකු විසින් බෙහෙත් වර්ග 24ක් මත කරන ලද තතු සෙවීමකදී ඉන් බෙහෙත් වර්ග 6ක් බලාපොරොත්තු ප්‍රමාණයට වඩා පහත් තත්ත්වයක තිබුණු බැව් පෙනී ගොස් ඇත.

(ඇ) **ආහාර හා ඖෂධ වර්ග පාලනය ගැන උපදේශක කමිටුව.**—අන්තර් දෙපාර්තමේන්තු කමිටුව හා ඖෂධ කමිටුව වෙනුවට ආහාර හා ඖෂධ වර්ග උපදේශක කමිටුවක් පත්විය. එය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගේ නායකත්වය යටතේ වැඩෙහි නිරතවූවාය.

සාමාන්‍යයෙන් "ගෙවැසි ලැයිස්තුව" නමින් හැඳින්වෙන ලේඛණයෙන් අයිතිකරුවන්ගේ නම් ඉවත්කොට බ්‍රිතාන්‍ය ඖෂධ සංග්‍රහයේ සහ බ්‍රිතාන්‍ය ඖෂධ සූචියේ දැක්වෙන පරිදි ඖෂධ වර්ගවල නිල නාමයන් පමණක් ඇතුළත් කිරීම පිණිස අවශ්‍ය යෝජිත නීති සම්පාදනයේදී ආහාර හා ඖෂධ වර්ග (6 වන) නීති මාලාවේ 1 වන උපලේඛණය බොහෝ දුරට වෙනස් කිරීම සැලකිල්ලට භාජනවී ඇත. මේ සම්බන්ධයෙන් පිළියෙල කරන ලද කෙටුම්පතක් නීති කෙටුම්පත්කරුගේ පරීක්ෂණයට භාජන වෙමින් පවතී. නියත වශයෙන් සඳහන් කර ඇති කෑම ද්‍රව්‍යවලට පාටවර්ග එකතු කිරීම, නරක් නොවනසේ තබාගැනීමට ඉවහල්වන දෑ හා ප්‍රතිඔක්ෂිකාරක ද්‍රව්‍යයන් යෙදීම සම්බන්ධයෙන් අළුත් ව්‍යවස්ථා පැණවීමට තීරණය කර ඇත. ආහාර තතු බැලීමේ හා ලේබල් කිරීමේ කමිටුව මේ සඳහා අවශ්‍ය ව්‍යවස්ථා කෙටුම්පත් පිළියෙල කරගෙන යන අතර සම්මත කරගත් පසු ඒවා දනට බලපවත්නා 1951 හා 1955 ආහාර හා ඖෂධ වර්ග (අංක 2) ව්‍යවස්ථාවන් වෙනුවට නිරායාසයෙන්ම ක්‍රියාත්මක වෙනවා ඇත.

සේවයේ යෙදී සිටින්නන්හට පුහුණුව.—ඖෂධ හා ආහාර වර්ග පිළිබඳ ආඥා පනතේ 40 (1) වගන්තිය යටතේ බලය ලත් නිලධාරීන් හැටියට පත් කරනු සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් 27 දෙනෙකුට කොළඹදී මස් හා අනිකුත් ආහාර ද්‍රව්‍ය පරීක්ෂා කිරීම පිළිබඳ සති 6ක පුහුණුවක් ලබාදී ඇත.

ඇ—මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

සමාලෝචනයට භාජනවූ වර්ෂය තුලදී මෙම අංශයේ වැඩ කොටස අධිකවිය. එකක්, රුපියල් ලක්ෂ දෙකකට අඩුවෙන් ඇස්තමේන්තු කර ඇති සියළුම වෛද්‍ය ආයතන වල වැඩ කොටස් මේ අංශය මගින් කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය භාණ්ඩාගාර අනුමැතිය ලබාගන ඇත.

ඉන්දියාවෙන් හා පකිස්ථානයෙන් ඉංජිනේරුවන් බඳවා ගැනීමට උත්සාහ කරන ලදී. අයදුම් පත් කැඳවන ලදින් ඒවා ලැබුණු පසු නිර්දේශයන් ද කර ඇත. එක් අයදුම්කරුවකු පමණක් ඔහු විසින් ඉදිරිපත් කරන ලද සමහර කොන්දේසි අනුව පත්වීම පිළිගත්මුත් ඒ ගැන අවසාන තීරණයකට බැස ගැනීමට නොහැකිවිය. ඒ අතරතුරදී අනිවාර්‍ය රාජ්‍ය සේවා පනත යටතේ මේ අංශයට ඉංජිනේරුවන් පිට දෙනෙකු පත්කිරීමට භාණ්ඩාගාරය කටයුතු කරගන යයි.

ප්‍රධාන කාර්‍යාලය

ස්ථිර, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන පළමුවෙන් අවුරුද්දක කාල පරිච්ඡේදයක් සඳහා මේ අවුරුද්දේ ජූනි මාසයේදී ලෝක සෞඛ්‍ය සංවිධානය වෙත මුදාහරින ලදී. එවිට ජ්‍යෙෂ්ඨතම සහකාර මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැන වැඩබලන ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන හැටියට පොදු සේවා කොමිෂන් සභාව විසින් පත් කරන්නට යෙදුණි. කාර්‍යාලීය ගොඩනැගිල්ල නඩත්තු කිරීමේ වැඩ කොටස ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව විසින් නොසලකා හරින ලදී. වරින්වර කරන ලද ආයාචනාවලට පසුව, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව මෙම ගොඩනැගිල්ලේ ප්‍රති සංස්කරණ වැඩ දැනට සම්පූර්ණ වශයෙන්ම නිමාවට පත්කර තිබේ. මෙයට පළමු මැලේරියා මර්ධන ව්‍යාපාරයේ අධිකාරිගේ කාර්‍යාලය හැටියට තිබූ මෙම නව කාර්‍යාල යට අවශ්‍ය සනීපාරක්ෂක හා අනිකුත් පහසුකම් ඉක්මණින් ලබාදීමට දැනට කටයුතු කරගන යනු ලැබේ.

ප්‍රාදේශීය පරිපාලනය

කොළඹ, කුරුණෑගල, නුවර, ගාල්ල හා යාපනය යන ස්ථානයන්හි පිහිටා ඇති ප්‍රාදේශීය කාර්යාල මගින් මෙම කොට්ඨාශයේ වැඩ කටයුතු කෙරීගන යයි. දැනට ඇති මෙම කොට්ඨාශ 5 ප්‍රාදේශීය මහජන සෞඛ්‍ය ඉංජිනේරුවන් 5 දෙනෙකුගේ පාලනය යටතේ පවතී. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ යෝජිත ප්‍රතිසංවිධාන කටයුතු ක්‍රියාත්මක වන විට එක් එක් සෞඛ්‍ය සේවා අධිකාරී කොට්ඨාශයක් සඳහා ප්‍රාදේශීය කාර්යාල යක් ඇතිවේය කියා බලාපොරොත්තු විය හැක. විශේෂයෙන්ම වයඹ දිශාව භාර කුරුණෑගල ප්‍රාදේශීය මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනටත් උතුරු දිශාව භාර යාපනේ ප්‍රාදේශීය මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනටත් අනිකුත් ප්‍රාදේශීය මහජන සෞඛ්‍ය ඉංජිනේරුවන්ටත් පැවරී ඇති රාජකාරී ප්‍රදේශය ඉතා විශාල බැවින් ඒවායේ පාලන කටයුතු කරගනයාම ඉතා අසීරුය. ඉඩකඩ ප්‍රශ්නය නිසා දැනට ඇති ප්‍රාදේශීය කාර්යාල පවත්වාගන යන්නේ ඉතා දුෂ්කර අන්දමිනි. එහෙයින් ඒ සඳහා ඉඩකඩ ඇති ස්ථාන ලබාගැනීමට උත්සාහ දරනු ඇත. වයඹ දිශාවේ කුරුණෑගල ප්‍රාදේශීය මහජන සෞඛ්‍ය ඉංජිනේරු කාර්යාලය විදේශාධාර යටතේ දැනට තනවාගන යන අතර ඊළඟ වර්ෂයේ මුල් කාර්තුවේදී එය පාවිච්චියට ගත හැකි වන්නේය.

වෛද්‍ය ආයතනවලට ජලය සැපයීම, පල්දෝරු ක්‍රමය හා මතුපිට කානු සම්බන්ධයෙන් සමීක්ෂණ හා විමර්ශන මෙහෙයවීම ප්‍රාදේශීය ඉංජිනේරුවන් සතු වගකීමකි. කුඩා ආයතන සම්බන්ධයෙන් වැඩ සැලැස්ම සම්පූර්ණයෙන්ම ඔහුගේ කාර්යාලයේදී පිළියෙලවී හරිවැරදි බලා අනුමත කරනු පිණිස මධ්‍යම සිතුවම් කාර්යාලයට යවනු ලැබේ. විශාල වැඩ සැලසුම් සම්බන්ධයෙන් නම් අවශ්‍ය ක්ෂෙත්‍රවස්තු සලකුණු වී ඒවා මධ්‍යම සිතුවම් කාර්යාලයට යැවීමෙන් අනතුරුව එහිදී සැලැස්ම නිමාවට සිතුවම් වෙයි.

මහජන සෞඛ්‍ය ඉංජිනේරු ශිල්පි ගැටළු සම්බන්ධයෙන් සෞඛ්‍ය සේවා අධිකාරීන්ට උපදෙස් දීම ප්‍රාදේශීය ඉංජිනේරුවන්ගේ වගකීමකි. රජයේ අනිකුත් දෙපාර්තමේන්තු හා පළාත් පාලන ආයතනවල බලධාරීන්ට මහජන සෞඛ්‍ය ඉංජිනේරු වැඩ සම්බන්ධයෙන් උපදෙස්දීමේ කටයුතුවලට ඔව්හු නිරත වෙනවා ඇත.

මෙම කොට්ඨාශයේ රසායනාගාරය පර්යේෂණ හා සිතුවම් අංශය යටතේ ක්‍රියාත්මක වන අතර නා නා වෛද්‍ය ආයතනවලට ජලය සැපයීමේ හා කැත කුණු බැහැර කිරීමේ ගුණ පාලනය කරගන යයි.

වෛද්‍ය පර්යේෂණාගාර කාර්මික විද්‍යාඥයා කලින් කලට ගොස් ඒ ඒ වෛද්‍යායතන පරීක්ෂා කිරීමෙහි නිරතවන අතර උවමනා පරිදි ක්ලෝරීන් ශේෂය පරීක්ෂා කර බලා අවශ්‍ය ප්‍රමාණය ලබා දී ඒ ඒ ආයතනවල ප්‍රයෝජනය සඳහා ලබාදෙන ජලයෙහි තත්ත්වය බීමට සුදුසු ලෙස තබාගැනීමට වග බලාගනී. දෙනු ලබන සාත්තුවේ ශක්තිය උරගා බලනු පිණිස පල්දෝරු හා කැලි කසල දෝරු විෂයයන් සම්බන්ධයෙන් ද මොහු විසින් පරීක්ෂණ පවත්වනු ලබයි. අපවිත්‍ර ජලය ඇතැයි සැක කෙරෙන ළිංවල ජලය සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන මෙම පර්යේෂණාගාර කාර්මික විද්‍යාඥයා පොළොවෙන් ලැබෙන ජලය පාවිච්චිය සඳහා හිතකරද යන වග දැනගනු වස් ක්ෂෙත්‍ර පරීක්ෂණවලද යෙදෙන්නේය.

බටහිර දිශාවේ ප්‍රාදේශීය කාර්යාලය—කොළඹ

මෙය විශාලතම ප්‍රදේශයයි. මෙම කොට්ඨාශයට කොළඹ, කළුතර, කෑගල්ල සහ රත්නපුරය යන සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ පරිපාලනය යටතේ පවත්නා ප්‍රදේශ අයත්වේ.

සමාලෝචනයට භාජනවූ වර්ෂය තුළදී පහත සඳහන් වැඩ කොටස් නිමාවට පත් කරන ලදී :—

(අ) මොරටුව රෝහල—ජල සම්පාදන යෝජනා ක්‍රමය
(ආ) මීගහතැන්න රෝහල—ජල සම්පාදන යෝජනා ක්‍රමය
(ඇ) කරවනැල්ල රෝහල—බෙදාහැරීමේ ක්‍රමය
(ඈ) ගොඩිගමුව පයඕන්ත ඒකකය—දනවන මඩුව
(ඉ) වැලිසර හෙදි අභ්‍යාස පාසැලේ පල්දිය පොළොවට ඉරවීමේ වළ
(ඊ) කෑගල්ල නගර සභාවේ මතුපිට කාණු ක්‍රමය
(උ) වතුපිටිවෙල රෝහලේ මතුපිට කාණු ක්‍රමය
(එ) වැසිකිළි තැනවීමේ ආධාර ක්‍රමය යටතේ හොරපේගමේ වැසිකිළි 76ක් සාදා නිමාවට පත්කිරීම

අදාළ වර්ෂය තුළදී පහත දැක්වෙන වැඩ කොටස් කරගන යමින් තිබුණි :—

(අ) කරවනැල්ල රෝහලේ ජල සම්පාදන ක්‍රමය
(ආ) අංගොඩ උණ රෝහලේ ජල සම්පදාන ක්‍රමය
(ඇ) ගම්පහ රෝහලේ ජල සම්පාදන ක්‍රමය
(ඈ) අංගොඩ මානසික රෝහලේ පල්දෝරු ක්‍රමය
(ඉ) කොලොන්නාව නගර සභාවේ පල්දෝරු ක්‍රමය
(ඊ) රාගම රෝහලේ පල්දෝරු ක්‍රමය

බටහිර කොට්ඨාශයෙන් පහත දැක්වෙන ඇස්තමේන්තු ලැබී ඇත :—

(අ) ගොඩිගමුව ග්‍රාමීය රෝහලේ ජල සම්පාදන ක්‍රමය
(ආ) දොම්පෙ රෝහලේ ජල සම්පාදන ක්‍රමය
(ඇ) මිනුවන්ගොඩ රෝහලේ ජල සම්පාදන ක්‍රමය
(ඈ) කරවනැල්ල රෝහලේ දිය බෙදා හැරීම
(ඉ) හැඳල ලාදුරු රෝහලේ ජල සම්පාදන ක්‍රමය
(ඊ) අල්ගම මාතෘ නිවාසයේ හා මධ්‍ය බෙහෙත්ශාලාවේ ජල සම්පාදන ක්‍රමය
(උ) අරනායක රෝහලේ ජල සම්පාදන ක්‍රමය
(ඌ) මීගමුව රෝහලේ ජල සම්පාදන ක්‍රමය
(එ) කඳාන ළය රෝහලේ දිය බෙදා හැරීමේ මාර්ග
(ඒ) මිතුපිටිවෙල රෝහලේ පල්දෝරු ක්‍රමය
(ඔ) වැලිසර ළය රෝහලේ පල්දෝරු ක්‍රමය
(ඕ) රක්වාන රෝහලේ පල්දෝරු ක්‍රමය
(ක) අංගොඩ උණ රෝහලේ පල්දෝරු ක්‍රමය
(කා) රාගම රෝහලේ බාල්දි වැසිකිළි ජල මුද්‍රිත වැසිකිළි බවට හැරවීම
(කැ) රත්නපුර නගර සභාවේ මතුපිට කාණු ක්‍රමය (ඉතිරි වැඩ කොටස්)
(කෑ) තලගොල්ල රෝගෝපසම නිවසේ කැලිකසළ පිටකිරීමේ කාණු

පහත දැක්වෙන විමර්ශණයන් භාරගත්තා ලදුව නිමාවට පත් කර ඇත :—

(අ) අල්ගම මධ්‍ය බෙහෙත්ශාලාවට හා මාතෘ නිවාසයට ජලය සැපයීම
(ආ) දේදුගල මධ්‍ය බෙහෙත්ශාලාවට ජලය සැපයීම

වයඹ දිශාවේ ප්‍රාදේශීය කාර්යාලය—කුරුණෑගල

කුරුණෑගල, මාතලේ, මඩකළපුව හා පුත්තලම යන සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ පරිපාලනය යටතේ පවත්නා ප්‍රදේශ මෙම කොට්ඨාශයට අයත්වේ.

පාරිසරික සනීපාරක්ෂා වැඩ පිළිවෙල දිගටම කරගන යෑම සඳහා වැය කරනු පිණිස අවශ්‍ය මුදල් නොමැති නමුත් එම කාර්‍යය ඒ ඒ කොට්ඨාශවල සෞඛ්‍ය සේවා අධිකාරීන් විසින් කරගන යනු ලැබේ. පාරිසරික සනීපාරක්ෂක ක්‍රමය ආධුනික මහජන සෞඛ්‍ය පරීක්ෂකයින්ට න්‍යායානුකූලවූ ද ප්‍රායෝගිකවූ ද පුහුණුවක් ලබාදීමට උපකාර වෙයි. දනට සේවයේ නියැලි කාර්ය මණ්ඩලයද පුහුණු කරවීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වෙමින් පවතී.

පහත දක්වෙන වැඩ කොටස් භාරගන්නා ලදුව සහ/නොහොත් නිමාවට පත් කරන ලදී :—

(අ) කෝන්ගහවෙල ග්‍රාමීය රෝහලේ ජල සම්පාදන ක්‍රමයේ වැඩ අවසන් කරන ලදී.
(ආ) මාවතගම වෛද්‍ය නිලධාරි නිල නිවාසයට ජලය සැපයීමේ වැඩ කිරීමට භාර ගන්නා ලදී.
(ඇ) දඹුල්ල දිස්ත්‍රික් රෝහලේ ජල සම්පාදන වැඩ කිරීමට භාරගන්නා ලදී.
(ඈ) කුරුණෑගල රෝහලේ ජල සම්පාදන ක්‍රමය (දෙපාර්තමේන්තුව මගින් කර ගත යනු ලැබේ.)
(ඉ) පොල්ගහවෙල පයණීන්ත ඒකකයේ මතුපිට කාණු ක්‍රමයේ වැඩ කිරීමට භාරගන්නා ලදී.

(ඊ) දඹදෙණිය දිස්ත්‍රික් රෝහලේ කුණු දවනය (වැඩ අවසන් කරන ලදී)
(උ) ප්‍රාදේශීය මහජන සෞඛ්‍ය ඉංජිනේරු කාර්‍ය්‍යාලයීය ගොඩනැගිල්ල (වැඩ කිරීමට භාරගන්නා ලදී).

පහත දැක්වෙන යෝජනා ක්‍රමයන් ගැන කරුණු විමසාබලා ඇස්තමේන්තු පිළියෙල කර ඇත :—

(අ) පුත්තලම රෝහලේ ජල සම්පාදන ක්‍රමය
(ආ) මාතලේ රෝහලේ ජල සම්පාදන ක්‍රමය
(ඇ) ඇඹැටුවැව මධ්‍ය බෙහෙත් ශාලාවේ මාතෘ නිවාසයේ ජල සම්පාදන ක්‍රමය
(ඈ) කොට්ටන්තිවූ මධ්‍ය බෙහෙත් ශාලාවේ ජල සම්පාදන ක්‍රමය
(ඉ) මුන්ඩාල් පයනීන්ත ඒකකයේ ජල සම්පාදන ක්‍රමය
(ඊ) සඳලංකාව මාතෘ නිවාසයට ජලය සැපයීම
(උ) මහනන්නේරිය මධ්‍ය බෙහෙත් හලට හා මාතෘ නිවාසයට ජලය සැපයීම
(ඌ) තලම්පිටිය පයනීන්ත ඒකකයට ජලය සැපයීම
(එ) වාලච්චෙනෙයි පයනීන්ත ඒකකයට පොම්පයක් හා ක්ලෝරීනිකරණයක්
(ඒ) නිකවැරටිය රෝහලට ජලය සැපයීම
(ඔ) ඇඹැටුවැව මතුපිට කාණු ක්‍රමය
(ඕ) පොල්පිතිගම පයනීන්ත ඒකකයේ මතුපිට කාණු ක්‍රමය
(ක) පොලොන්නරුව නව නගරයේ පල්දෝරු ක්‍රමය

පාරිසරික සනීපාරක්ෂාව

වයඹ දිශාවේ ප්‍රාදේශීය මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන විසින් තිසව කෝරළේ යෝජනා ක්‍රමයේ ළිං 196කට සවිකර ඇති අත්පොම්ප නඩත්තු කිරීම දිගටම කර ගන යනු ලැබේ. මෙම නඩත්තු කිරීමේ වැඩ ඔවර්සියර් කෙනෙකු, කාර්මිකඥයකු කම්කරුවෙක් හා මුරකරුවන් දෙදෙනකු විසින් කරගන යනු ලැබේ. එම සේවකයින්ට දෙපාර්තමේන්තුවෙන් වැටුප් ගෙවනු ලැබේ. ඇණතියන පෝරු 1,290ක් හා ජල මුද්‍රිත පෝච්චි 1,302ක් කුරුණෑගල සෞඛ්‍ය සේවා අධිකාරි වෙත සපයන ලදුව ඒවා ක්ෂේත්‍ර මහජන සෞඛ්‍ය පරීක්ෂකයින් වෙත බෙදා දෙන ලදී.

මධ්‍යම දිශාවේ ප්‍රාදේශීය කාර්යාලය

මෙම කොට්ඨාශය නුවර, මාතලේ හා බදුල්ල යන සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ පරිපාලනයට යටත් ප්‍රදේශවලින් සමන්විතය.

වර්ෂය තුළදී පහත දැක්වෙන වැඩ කොටස් නිමාවට පත්කරන ලදී :—

(අ) මාවුගොඩ රෝහලට ජලය සැපයීම
(ආ) රිකිල්ලගස්කඩ රෝහලට ජලය සැපයීම
(ඇ) අගරපතාන රෝහලට ජලය සැපයීම
(ඈ) තෙල්දෙණිය රෝහලේ පල්දෝරු ක්‍රමය
(ඉ) නමුණුකුල ආගන්තුක නිවාසය

පහත දැක්වෙන වැඩ දැනට කරගනයමින් පවතී :—

(අ) නුවර රෝහලේ ජල සම්පාදනය වැඩිකිරීමේ යෝජනා ක්‍රමය
(ආ) හපුතලේ රෝහලේ ජල සම්පාදන ක්‍රමය
(ඇ) වැලිමඩ රෝහලේ ජල සම්පාදනය (දෙපාර්තමේන්තුව මගින්)
(ඈ) බදුල්ල රෝහලේ පල්දෝරු ක්‍රමය

පහත දැක්වෙන ක්ෂේත්‍ර විමර්ශණයන් නිමාවට පත්කර ඇත :—

(අ) කටුගස්තොට පයඊන්ත ඒකකයේ පල්දෝරු ක්‍රමය

(ආ) කොටුගොඩ රෝහලේ පල්දෝරු ක්‍රමය

(ඇ) පුස්සැල්ලාව රෝහලේ පල්දෝරු ක්‍රමය

(ඈ) බඩල්කුඹුර රෝහලේ ජල සම්පාදන ක්‍රමය

(ඉ) මාම්පිටිය රෝහලේ ජල සම්පාදන ක්‍රමය

(ඊ) අංකුඹුර රෝහලේ ජල සම්පාදන ක්‍රමය

කොට්ඨාශය තුළ ඇති කරන ලද ජල සම්පාදන හා පල්දෝරු ක්‍රමයන් නඩත්තු කිරීම ප්‍රාදේශීය කායඊාලයේ වගකීම විය. කොට්ඨාශය තුළ ප්‍රවාහණ පහසුකම්වල හිඟකම, කරුණු විපරම්කර බැලීමේ වැඩවල ප්‍රගතියට ඉමහත් බාධාවක් විය.

උතුරු දිශාවේ ප්‍රාදේශීය කාර්යාලය—යාපනය

මෙම ප්‍රදේශය යාපනය, වව්නියාව හා අනුරාධපුර සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ පරිපාලනයට යටත් කොට්ඨාශවලින් සමන්විතවේ.

මෙම ප්‍රදේශය මගින් භාරගන්නා ලද ප්‍රධාන වැඩ, එනම්—

(අ) යාපනේ රෝහලේ ජල සම්පාදන ක්‍රමය

(ආ) හෙදි අභ්‍යාස විද්‍යාලය, යාපනය

(ඇ) යාපනේ රෝහලේ පල්දෝරු ක්‍රමය

නිමාවට පත්කිරීමට නොහැකිවූයේ පළමුවැනි කොටස් දෙකේ වැඩකිරීම භාරගත් කොන්ත්‍රාත්කරුවා එම කොන්දේසි කඩකළ නිසාය. නාගරික සභාව විසින් ඉදිරිපත් කරන්නට යෙදුණු විරුද්ධතාවයන් නිසාත් ප්‍රසිද්ධ වැඩ දෙපර්තමේන්තුව විසින් පන්නායිහි පැන්නුම් පාලම උඩින් සැලෙන පාලමක් තනවාගෙන යාම නිසාත් එය වෙනස් කිරීමට සිදුවූ හෙයින් තුන්වැනි වැඩ කොටස සම්පූර්ණ කළ නොහැකිවිය. කෙසේ වෙතත්, නාගරික සභාවෙ පොම්ප කාමරයේ කෙළවරට අවශ්‍ය විදුලිබලය සපයා දී නොමැත. පළමු කොන්ත්‍රාත්තු දෙක අවලංගුකර ඇති අතර යාපනේ රෝහලට ජලය සැපයීමේ යෝජනා ක්‍රමයේ වැඩ දෙපාර්තමේන්තුවෙන්ම නිමකිරීමට කටයුතු කරගන යන්නේය. යාපනේ හෙදි අභ්‍යාස පාසැලේ ඉතිරි වැඩ වෙනත් කොන්ත්‍රාත්කරුවකුට පවරා ඇති අතර එහි වැඩ දැනට නිමාවට පත්වෙමින් පවතී.

පහත දැක්වෙන වැඩ දැනට කරගන යනු ලැබේ :—

(අ) යාපනේ රෝහලේ හෙදි අභ්‍යාස පාසලේ නිවාස ඉතිරි වැඩ කොටස් සම්පූර්ණ කිරීම.

(ආ) යාපනේ රෝහලේ ජල සම්පාදන ක්‍රමය

(ඇ) චාවකච්චේරියේ රෝහලේ ජල සම්පාදන ක්‍රමය

(ඈ) පුංගුඩුතිව් පයඊන්ත ඒකකයේ ජල සම්පාදන ක්‍රමය

(ඉ) කින්යා පයඊන්ත ඒකකයේ ජල සම්පාදන ක්‍රමය

(ඊ) මන්ඩාතිව් මධ්‍ය බෙහෙත් හලේ හා මාතෘ නිවාසයේ ජල සම්පාදන ක්‍රමය

(උ) යාපනේ රෝහලේ පල්දෝරු ක්‍රමය

පහත දැක්වෙන වැඩ කොටස් අවසන් කර ඇත :—

(අ) නයිනාතිව් මධ්‍ය බෙහෙත් හල හා මාතෘ නිවාසයේ ජල සම්පාදන ක්‍රමය

පහත දැක්වෙන නඩත්තු කිරීමේ වැඩ භාරගන්නා ලදුව අවසන් කොට ඇත:—

(අ) පල්ලෙයි පයවීන්ත ඒකකයේ ජල සම්පාදන ක්‍රමය
(ආ) කෝපායි පයවීන්ත ඒකකයේ ජල සම්පාදන ක්‍රමය
(ඇ) චන්කානෙයි පයවීන්ත ඒකකයේ ජල සම්පාදන ක්‍රමය
(ඈ) නයිනාතිව් මධ්‍ය බෙහෙත් හලේ හා මාතෘ නිවාසයේ ජල සම්පාදන ක්‍රමය
(ඉ) හොරොව්පතාන මධ්‍ය බෙහෙත් හලේ ජල සම්පදන ක්‍රමය

මරිච්චිකට්ටි මධ්‍ය බෙහෙත් හල හා ඇපොතිකරි නිවාසය තැනවීමේ කාර්‍යය මෙම ප්‍රදේශයට භාරදී ඇත. මන්නාරම් දිස්ත්‍රික්කයේ බටහිර වෙරළබඩ පිහිටා ඇති මෙය කුඩා ගමෙකි. එයට පහසුවෙන් යාහැකි පාරක් නොමැත. මහජන ප්‍රවාහණ පහසුකම් එහි නොමැති නිසා මේ වැඩ කොටස සම්බන්ධයෙන් කරුණු විමසා බැලීමේදී ප්‍රාදේශීය මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනට ඉමහත් දුෂ්කරතාවයන්ට මුහුණ පාන්නට සිදුවී ඇත. උතුරු ප්‍රදේශයට ප්‍රවාහණ පහසුකම් අඩුවීම නිසා තතු සොයා බැලීමේ වැඩවල ප්‍රගතිය බොහෝ දුරට පිරිහී ගොස් ඇත.

ප්‍රාදේශීය කාර්යාලය (දකුණු කොට්ඨාශය)—ගාල්ල

මෙම කොට්ඨාශයට ගාල්ල, මාතර යන සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශ දෙක හා බදුල්ල හා රත්නපුරය යන සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශවලින් ද කොටස බැගින් ඇතුලත් වේ.

පහත දැක්වෙන වැඩ සම්පූර්ණකර ඇත:—

(අ) කඹුරුපිටිය පයවීන්ත ඒකකයේ දනවන ගෙය තැනවීම
(ආ) බෙලිඅත්ත මධ්‍ය බෙහෙත් හලේ ජල සම්පාදන ක්‍රමය
(ඇ) දෙණියාය රෝහලේ ජල සම්පාදන ක්‍රමය
(ඈ) හම්බන්තොට ඇපොතිකරි නිවාසයේ ජල සම්පාදන ක්‍රමය
(ඉ) කිරිමාවෙලන්ගොඩ පාසැලේ ජල සම්පාදන ක්‍රමය

පහත සඳහන් වැඩ දැනට කරගෙන යමින් පවතී:—

(අ) පල්ලේගම මාතෘ නිවාසයේ ජල සම්පාදන ක්‍රමය
(ආ) ඇල්පිටිය රෝහලේ ජල සම්පාදන ක්‍රමය
(ඇ) මීගහජුන්දුර ග්‍රාමීය රෝහලේ ඇපොතිකරි නිවාසයේ ජල සම්පාදන ක්‍රමය
(ඈ) බද්දේගම පයවීන්ත ඒකකයේ බාල්දි වැසිකිළි ජල මුද්‍රිත වැසිකිළි බවට හැරවීම
(ඉ) හික්කඩුව පයවීන්ත ඒකකයේ බාල්දි වැසිකිළි ජල මුද්‍රිත වැසිකිළි බවට හැරවීම

පහත සඳහන් යෝජනා ක්‍රම ගැන කරුණු විමර්ශනය කර බැලීමත් අනතුරුව සිතියම් හා වැය ඇස්තමේන්තු සකස් කොට ටෙන්ඩර් කැඳවා ඇත:—

(අ) අකුරැස්ස පයවීන්ත ඒකකයේ ජල සම්පාදන ක්‍රමය
(ආ) ගාල්ලේ රෝහලේ ජල සම්පාදන ක්‍රමය
(ඇ) දෙවුන්දර මාතෘ නිවාසයේ ජල සම්පාදන ක්‍රමය
(ඈ) තණමල්විල පයවීන්ත ඒකකයේ ජල සම්පාදන ක්‍රමය
(ඉ) ඉදුරුවේ පයවීන්ත ඒකකයේ බාල්දි වැසිකිළි ජල මුද්‍රිත වැසිකිළි බවට හැරවීම

පහත දැක්වෙන වැඩ කොටස් සම්බන්ධයෙන් කරුණු විමර්ශනය කිරීමෙන් පසු අදාල ඇස්තමේන්තු දනට පිළියෙල කරගත යුතු ලැබේ:—

(අ) හබරාදුව පයසීන්ත ඒකකයේ ජල සම්පාදන ක්‍රමය
(ආ) රත්න රෝහලේ ජල සම්පාදන යෝජනා ක්‍රමය
(ඇ) බොරකන්ද පයසීන්ත ඒකකයේ ජල සම්පාදන ක්‍රමය
(ඈ) කොටපොල මාතෘ නිවාසයේ පල්දෝරු ක්‍රමය
(ඉ) කඹුරුපිටිය මාතෘ නිවාසයේ පල්දෝරු ක්‍රමය
(ඊ) අම්බලන්ගොඩ නිවාස ක්‍රමයේ පල්දෝරු ක්‍රමය
(උ) වීරවිල ළය රෝහලේ ජල සම්පාදනය නාගා සිටුවීමේ ක්‍රමය

IX වැනි පරිච්ඡේදය

මහජන සෞඛ්‍ය අධ්‍යාපනය

I. සමාලෝචනයට භාජන වූ කාලය තුළ ජාතික සෞඛ්‍ය අධ්‍යාපන යෝජනා ක්‍රමය බලයෙන් බලයට පත්විය.

සෞඛ්‍ය අධ්‍යාපන යෝජනා ක්‍රමයේ වැදගත් අංගයක් වූයේ කොළඹ මහ රෝහලේ සහ රිජ්වේ ආයසීා ළමා රෝහලේ ආරම්භ කරන ලද අධ්‍යාපන යෝජනා ක්‍රමය සහ ගැමි රෝහල්වල සහ මාතෘ නිවාසයන්හි අධ්‍යාපනික කටයුතු වැඩි දියුණු කිරීම ද වේ. සම්පූර්ණ කාලීන සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රථම වරට මහජන සෞඛ්‍ය හෙදියන් දෙදෙනෙකු රිජ්වේ ආයසීා ළමා රෝහලට පත්කරන ලදී. මේ වර්ෂය තුළදී ප්‍රජා සංවර්ධන සෞඛ්‍ය වැඩ සටහන තවදුරටත් ඒකාබද්ධ කරන ලදී. ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ, ජාතික සේවා අංශය, ඉඩම් දෙපාර්තමේන්තුවේ සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රජා සංවර්ධන වැඩ සටහනට කායසීශීලීව රුකුල් දෙන ලදී. ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පේරාදෙණියේ පුහුණු කිරීමේ සහ පයෙසීෂන මධ්‍යස්ථානයේ සංවිධානය කරන ලද රජයේ දෙපාර්තමේන්තුවල නිල ධාරීන් සඳහා වූ ඒකාබද්ධ පුහුණු කිරීමේ වැඩ සටහන මගින් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන් කණ්ඩායම් ගණනාවකටම පුහුණුවක් ලබාදීමට හැකි විය. මාවනැල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශයේ සියළුම රජයේ නිලධාරීන්ට පේරාදෙණියේ පුහුණු වක් ලබාදීමට හැකිවීම තවත් දියුණුවකි. මේ නිසා ප්‍රදේශයේ රජයේ සියළුම දෙපාර්තමේන්තු සහභාගිවන මනාලෙස ඒකාබද්ධ වූ සහ ඒකාරාශිවූ ප්‍රජා කටයුතු වැඩ සටහනක් සංවිධානය කිරීමට හැකිවනවා ඇත.

අත්තනගල්ල චන්ද කොට්ඨාශයේ සංවිධානය කරන ලද ප්‍රජා සංවර්ධන නියමු යෝජනා ක්‍රමය ප්‍රජා සංවර්ධනයේ අනිකුත් විශේෂ ලක්ෂණයක් විය.

මෙම වැඩ සටහන් මගින් ජනතාව ඇක්ස්රේ පරීක්ෂණයට භාජන කිරීම කෑම ද්‍රව්‍ය සමීක්ෂණය කිරීම, වට පණු රෝගයට ප්‍රතිකාර කිරීම, පාරිසරික සෞඛ්‍ය වැඩ සටහන් සහ සෞඛ්‍ය අධ්‍යාපන දීම සාර්ථක අන්දමින් කරගෙන යාමට හැකිවිය. ප්‍රජා සංවර්ධන වැඩ සටහන්වල දී මූලිකත්වය ගෙන ක්‍රියා කළ හැකි යව්වන ස්වේච්ඡා සේවකයින් දෙසීයකට වැඩි සංඛ්‍යාවක් තෝරා පුහුණු කිරීම මෙම වැඩ සටහනේ වැදගත් අංගයක් විය.

පාසැල් සෞඛ්‍ය අධ්‍යාපන අංශයෙන් සෞඛ්‍ය සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුවල ජ්‍යෙෂ්ඨ නියෝජිතයින්ගෙන් සමන්විත ජාතික ඒකාබද්ධ පාසැල් සෞඛ්‍ය මණ්ඩලය පිහිටුවා ලන ලදී. ප්‍රාදේශීය සහ පාසැල් සෞඛ්‍ය කමිටු තවදුරටත් ස්ථාවර කරන ලදී. සාර්ථක ලෙස ඒකාබද්ධ කිරීමෙන් පාසැල් දන්ත අධ්‍යාපනය, පාසැල් දිවා

ආහාරය, පරිසර සෞඛ්‍යය, බී. සී. ජී. එන්නත් කිරීම සහ පාසැල් අධ්‍යාපනය යන වැඩ සටහන් තවදුරටත් පුළුල් කිරීමට හැකි වූ බව කෘතඥ පූර්වකව සඳහන් කළ යුතු ය. වාර්ෂික පාසැල් සෞඛ්‍ය තරඟ මගින් උනන්දුව දියුණු කරන ලදී.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජාතික ශ්‍රමදාන ව්‍යාපාරය සමඟ මෙම දෙපාර්ත මේන්තුව සහයෝගයෙන් කටයුතු කරන ලදී. දිවයින පුරා මහජන සෞඛ්‍ය වැඩ සටහන් වල දී ශ්‍රමදාන වැඩ කඳවුරු ප්‍රබෝධගන්වන අංගයක් විය. දීප ව්‍යාප්ත වැසිකිළි සෑදීමේ වැඩ සටහන්, සුද්ධ පවිත්‍ර කිරීමේ වැඩ සටහන්, මංමාවත් තැනීම, පොදු ගොඩනැගිලි තැනීම, වාරිචු තීන්ත ගෑම ආදී ශ්‍රමදාන වැඩ කටයුතු කරන ලදී. බරවා මර්දන ව්‍යාපාරය මගින් මාතර, වැලිගම සහ අම්බලන්ගොඩ යන සෞඛ්‍ය වෛද්‍ය කොට්ඨාශතුල සංවිධානය කරන ලද පුළුල් ශ්‍රමදාන ව්‍යාපාරය අතිශයින් සාර්ථක විය.

1. ජනතාවගේ පෝෂණ තත්ත්වය නගාලීමට කටයුතු කරන කුසගින්නෙන් මුදවාලීමේ ජාතික ව්‍යාපාරය සහ දස ලක්ෂයකට ආහාර සැපයීමේ ජාතික ව්‍යාපාරය දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාශීලී ලෙස සහභාගි වූ අනිකුත් වැඩ සටහන් ය.

දිවයින පුරා පවත්වන ලද සෞඛ්‍ය ප්‍රදර්ශන වලට දෙපාර්තමේන්තුව සහභාගි විය. මාතෘ දරක සෞඛ්‍යය, සනීපාරක්ෂාව, වටපනු රෝගය පැතිරයාම, ක්ෂය රෝගය, සහ පෝෂනය සම්බන්ධයෙන් විශේෂ ප්‍රදර්ශන ඡායාරූප මධ්‍යම නිෂ්පාදන අංශයේ නිපදවන ලදී.

හෙදි ඇබෑසි විදුහල් අවේ පුහුණුව ලබන සිසු හෙදියන් සඳහා පූර්ව සේවා සෞඛ්‍ය අධ්‍යයන පුහුණු වැඩසටහනක් ද සේවයේ සිටින හෙදියන් සහ හෙද පාලිකාවන් සඳහා පශ්චාත් පුහුණු හෙද පාසැලේ දී සෞඛ්‍ය අධ්‍යායන වැඩ සටහන් ද මහජන සෞඛ්‍ය සේවාවේ නියුතු සියළුම ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා කළුතර සෞඛ්‍ය මධ්‍යස්ථා නයේ සෞඛ්‍ය අධ්‍යායන වැඩ සටහනක් ද සංවිධානය කිරීමේ දී සෞඛ්‍ය අධ්‍යාපන උප අංශය පුරෝගාමීව කටයුතු කරන ලදී. ළමා රෝහලේ දී ද කොළඹ මහ රෝහලේ දී ද ප්‍රාදේශීය සහ දිස්ත්‍රික්ක රෝහල් බොහෝ ගණනක දී ද සේවයේ නියුතු අය සඳහා පුහුණුවක් දෙන ලදී. මෙයට අමතරව ගුරු අභ්‍යාස විද්‍යාල, ගොවිකම් පාසැල් සහ ග්‍රාම සංවර්ධන පුහුණු මධ්‍යස්ථාන වැනි රජයේ අනිකුත් දෙපාර්තමේන්තුවල නිලධාරීන් පුහුණු කිරීමේ භාරදූර වැඩ සටහනක් ද මෙහෙයවන ලදී.

උප අංශය ජාතික ස්වේච්ඡා ආයතනය, ලංකා ක්ෂය රෝග නාශක ජාතික සංග මය, ලංකා පිළිකා සංගමය, බාලදක්ෂිකා සංගමය, සෞඛ්‍යදාන ව්‍යාපාරය, ලංකා අමධ්‍යප සංගමය, ලංකා මහිලා සමිති සංගමය, ලංකා හදිසි අනතුරු වැළැක්වීමේ සංගමය, ලංකා පවුල් සංවිධාන සංගමය, කණිෂ්ඨ වෙළඳ සංගමය සහ තව නොයෙ කුත් ආයතනයන් සමග උද්යෝගීව සහයෝගයෙන් කටයුතු කර ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානය, යුනෙස්කෝව, එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන ළමා හදිසි අරමුදල, ඇදිහැස යනාදී ජාත්‍යන්තර ආයතන සමග කිට්ටු සම්බන්ධතාවයක් පවත්වාගෙන යන ලදී.

උප අංශය මධ්‍යම උපදේශක වෛද්‍ය සේවා නව යෝජනා ක්‍රමය ද දෙපාර්තමේන් තුව ප්‍රති සංවිධානය කිරීමේ යෝජනා ක්‍රමය ද සම්බන්ධව කිට්ටුවෙන් කටයුතු කරන ලදී. දෙපාර්තමේන්තුව මගින් ප්‍රසිද්ධ කරන ලද පත්‍රිකා සහ දෙපාර්තමේන්තුවේ සඟරා ප්‍රවෘත්ති පත්‍ර යනාදිය සම්බන්ධයෙන් වගකීම භාරගන්නා ලදී.

II කාර්ය මණ්ඩලය

කොළඹ ක්‍රමය යටතේ සෞඛ්‍ය අධ්‍යාපන පශ්චාත් පුහුණුව සඳහා සෞඛ්‍ය ශික්ෂක වරුන් දෙදෙනෙක් එක්සත් රාජධානියට යවන ලදී. සෞඛ්‍ය අධ්‍යාපන පශ්චාත් පුහුණුව සඳහා සෑම වර්ෂයක් තුළදීම සෞඛ්‍ය ශික්ෂකයින් දෙදෙනා බැගින් එතෙර යැවීමට යෝජනා කර ඇත.

III. කරනලද වැඩ කටයුතු

(1) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රජා සංවර්ධන වැඩ සටහන.

මහජන සෞඛ්‍ය ප්‍රශ්න නිරාකරණය කිරීමේදී ප්‍රජා ආයතන මාර්ගය පසුගිය අවුරුදු කිපය තුළදී සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් උපයෝගී කරගන්නා ලදී. පරිසර සනීපාරක්ෂාවේ ඒකක ක්‍රමය යනුවෙන් හැඳින්වෙන මෙම ක්‍රමය පසුගිය අවුරුදු තුන තුළ ක්‍රියාත්මක වූ අතර ප්‍රජා ගැටළු නිරාකරණය කිරීමේ ප්‍රබල මාර්ගයක් වශ වශයෙන් මෙම ක්‍රමයේ ඇති වටිනාකම අත්දැකීමෙන් අවබෝධවී තිබේ.

මෙම යෝජනා ක්‍රමයේ වැදගත් ලක්ෂණ නම් :—

(අ) මහජන සෞඛ්‍ය පරීක්ෂක ගේ කොට්ඨාශය පහසු අන්දමට ඒකකවලට බෙදාගනු ලැබේ. සාමාන්‍ය වශයෙන් ප්‍රදේශය ගෙවල් සීයක සහ ජනගහ නය පන්සීයක් පමණ වන සේ කොටස් 5 සිට 10 දක්වා ඒකකයන්ට බෙදනු ලැබේ.

(ආ) තෝරා ගත් ඒකකයක පෘථුල ලෙස අධ්‍යාපන සහ මහජන සෞඛ්‍ය වැඩ කටයුතු පටන් ගෙන අවුරුද්දක පමණ කාලය තුළදී එම ඒකකයේ වැඩ කොටස නිමාවට පත්කරනු ලැබේ. (ඒකක එක, දෙක තුන යනාදී වශයෙන් අංක කර අනුපිළිවෙලට වැඩ පටන් ගනු ලැබේ.) දශ අවුරුද් අවුරුද්දක පමණ කාලය තුළදී මුළු කොට්ඨාශයේම වැඩ කටයුතු නිමාවට පත්කළ හැකියයි ගණන් බලා තිබේ.

(ඇ) මෙම යෝජනා ක්‍රමය අනුව සෑම අවුරුද්දකදීම එකවරකට ගම් ඒකක 700 ක පමණ වැඩ පටන් ගනු ලැබේ. සෑම අවුරුද්දකදීම ගම් ඒකක 700 ක සෞඛ්‍ය කටයුතු නිමාවට පත් කරනු ලැබේ. මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයා වෙන ඒකකයකට මාරුවූ විට වැඩ කටයුතු නොකඩවා කරගෙනයාමේ වගකීම යම් කිසි ප්‍රජා ආයතනයක් විසින් භාරගන්නවා ඇත. මේ අනුව මුළු දිවයිනම දස අවුරුදු කාලසීමාව තුළදී නිමාවට පත් කරනු ඇතැයි ගණන් බලා ඇත.

(ඈ) දැනට අනුගමනය කරන ක්‍රියා පිළිවෙල මෙසේ ය.

(i) සෑම ඒකකයක්ම සමීක්ෂණයට භාජන කරනු ලැබේ. මෙම සමීක් ෂණයේදී ස්වේච්ඡා සේවකයන් සහාය වනු ඇත.

(ii) සමීක්ෂණයේ ප්‍රතිඵල ජනතාවට දැනගැනීමට සලස්වනු ලැබේ.

(iii) ජනතාව කොට්ඨාශයෙන් කොට්ඨාශයට වෙනස් වන සුළු ප්‍රජා ආයතනවලට සංවිධානය වේ. දැනට ක්‍රියාත්මක වන ආයතන නම් :—

(අ) දැනට පවතින ග්‍රාම සංවර්ධන සමිති මගින් ක්‍රියා කිරීම. ග්‍රාම සංවර්ධන සමිති නැති ප්‍රදේශයන්හි සමිති පිහිටුවීමට කටයුතු කරනු ලැබේ.

(ආ) ගමේ දැනට පවතින ස්වේච්ඡා ආයතනවල නියෝජිතයින් ගෙන් සෑදුම් ලත් ගොවිපලවල් සහ ගම් සංවර්ධන කොමිටි.

(iv) අරමුණ කුමක්දැයි ජනතාව විසින් තීරණය කරනු ලැබේ. ප්‍රශ්නයේ ප්‍රමුඛත්වය ගැන ක්‍රියාකාරී කමිටුව නැතහොත් සමහර විට ග්‍රාම සංවර්ධන කමිටුව විසින් තීරණය කරනු ලැබේ.

(අ) කෙටි කාලීන

(ආ) දිගු කාලීන

(ඇ) වැඩ සටහන පහත සඳහන් අයුරු තවදුරටත් අනු කොටස්වලට බෙදනු ලැබේ :—

(i) ජනතාව විසින්ම නිරාකරණය කළ හැකි ගැටළු.

(ii) ජනතාව සහ සෙච්ඡා ආයතන සහ පළාත් පාලන මණ්ඩලවල සහයෝගයෙන් නිරාකරණය කළ හැකි ගැටළු.

(iii) රජයේ අයතනවල සහයෝගයෙන් නිරාකරණය කළ හැකි ගැටළු.

(v) මෙම ඒකකවල සිටින ගුරු මහතුන්, වෙල් විදානේ මහතුන්, ග්‍රාම සේවක මහතුන්, ප්‍රා. ආ. නිලධාරි මහතුන්, ආහාර නිෂ්පාදන ඕවර්සියර් මහතුන් යනාදී රජයේ දෙපාර්තමේන්තුවල නිලධාරීන්ගෙන් සැදුම් ලත් අනුසාසක මණ්ඩලය මහජනතාව සමග කිට්ටු සහයෝගයෙන් කටයුතු කරන්නේය. සමහර අවස්ථාවල දී ඔවුන් මහජන ක්‍රියාකාරී මණ්ඩලවලටම බැඳී කටයුතු කරන්නේ ය.

(vi.) මෙම ප්‍රජා වැඩ සටහන් වලදී සෑම විටම ප්‍රමුඛත්වය දී කටයුතු කරන්නේ සෞඛ්‍ය ගැටළු වලට පමණක් නොවීම විශේෂ අංගයකි.

(vii) කලින් කලට කරන ලද වැඩ ප්‍රමාණය මැනීම ද ක්‍රියා මාර්ග තීරණය කිරීමද කරනු ලැබේ. අවශ්‍ය තැන්හිදී පුලුල් ලෙස අධ්‍යාපන කටයුතු ද කරනු ලැබේ. රජයේ නිලධාරීන්ගේ අනුගාමිකත්වය යටතේ ප්‍රජාවට මුහුණ පෑමට ඇති ප්‍රශ්න ගැන ජනතාවට අවබෝධයක් ඇතිකර ගැනීමට අවස්ථාව සලසා දී ස්වයං ආධාර ක්‍රමය යටතේ එම ප්‍රශ්න නිරාකරණය කරගැනීමට සැලැස්වීම මෙම වැඩ සටහනේ වැදගත් පරමාර්ථයකි. වැඩ කිරීමේදී ඒකක ක්‍රමයේ ඇති වටිනාකම පසුගිය අවුරුදු කීපය තුළදී දෙපාර්තමේන්තුව විසින් නියත වශයෙන්ම දක්නා ලදී. ජනතාව ගැටළු ගැන අවබෝධයක් ලබා ගන්නා අතර ඒවා නිරාකරණය කිරීමේ වගකීම ඔවුන් වෙතම පවරා ගනී. ගැටළු තමාගේම දෙයක් වශයෙන් හඳුනා ගන්නා අතර බොහෝ අවස්ථා වල දී ප්‍රජා කොටස් වශයෙන් සංවිධානය වීමේ වැදගත් කම අවබෝධකර ගනී.

දැනටමත් ග්‍රාම සංවර්ධන සහ කෘෂිකර්ම වැනි රජයේ දෙපාර්තමේන්තු ඒකීය ක්‍රමයේ දී සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමග සහයෝගයෙන් කටයුතු කරන්නෝය. එක ඒකකයක් තුළ ඇති සියලුම ප්‍රජා සුභසාධක දෙපාර්තමේන්තු විසින් වඩවඩාත් ඒක රාශිව සැලැස්මක් අනුව කටයුතු කිරීම ඉතා අගනේය යි හැඟීගොස් ඇති අතර ඒ අනුව කටයුතු කරගෙන යනු ලැබේ.

2. මහජන සෞඛ්‍ය නියමු යෝජනා. අත්තනගල්ලේ ප්‍රජා සෞඛ්‍ය යෝජනා ක්‍රමය.

1962 දී ආරම්භ කරන ලද ප්‍රජා සෞඛ්‍ය යෝජනා ක්‍රමය සැලැස්මට අනුකූලව දියුණුවූ අතර සමාලෝචනයට භාජනය වූ අවුරුද්ද තුලදී නිම කිරීමට බලාපොරොත්තු වූ වැඩ කටයුතු කොටස් සාර්ථක අන්දමින් නිමාවට පත්විය.

ප්‍රධාන කාර්යාලයේ සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරීන් ගේ මාර්ගෝපදේශකත්වය ද සෞඛ්‍ය ශික්ෂක තැන සම්බන්ධතා නිලධාරි වශයෙන් ද ප්‍රාදේශීය මට්ටමේ නිලධා රීන් ගේ සහයෝගතාවය ද ඇතිව කිරිදිවැල සහ ගම්පහ සෞඛ්‍ය කොට්ඨාශවල සෞඛ්‍ය නිලධාරි මණ්ඩලය විසින් මූළු වැඩ සටහනම සංවිධානය කර ක්‍රියාත්මක කරන ලදී. ක්ෂය රෝග මර්දන ව්‍යාපාරයේ නිලධාරීන් විසින් සමූල ඇක්ස්රේ වැඩ සටහන ක්‍රියාත්මක කරන ලදී. වෛද්‍ය පර්යේෂණායතනයේ පෝෂණ වෛද්‍ය නිලධාරි මහතා ගේ සහ ලංකා විශ්ව විද්‍යාලයේ ළමාරෝග අංශයේ මහාචාර්ය වරයාගේ මාර්ගෝපදේශකත්වය ඇතිව පනු රෝග පැතිරයාම පෙරදැරි කර ගෙන පෝෂණය සහ ළමා රෝග ගැන කටයුතු කරන ලදී.

පළමුව වැඩ සටහන් කටයුතු වල දී සමූහ මූලිකව සහාය වීම පුහුණුකිරීම ද දෙවනුව ජනතාවගේ වැඩ කටයුතු නොකඩවා කරගෙන යාමේ වඩාත් වගකිව යුතු වැඩ භාරගැනීමට පුහුණු කිරීම ද මෙම යෝජනා ක්‍රමයේ වැදගත් අංශයක් විය. පුහුණු කිරීමේ වැඩ සටහන පුද්ගලික සහ ප්‍රජා සෞඛ්‍යය සහ ප්‍රජා සංවිධාන වැඩ ගැන වඩා සැලකිල්ලෙක් දක්වන අන්දමින් සති ගණනාවක් තුල පැතිරයනසේ පැය 24 ක වැඩ කොටසක් සපයන ලදී. ගම්වල අධ්‍යාපනික අභ්‍යාසයක් වශයෙන් ද ලබන ලද දියුනුවේ සටහන් තැබීමක් වශයෙන් ද පවුලේ සෞඛ්‍ය සටහන් පත් භාවිතය පටන් ගන්නා ලදී. දර්ශනීය අන්දමින් මුද්‍රණය කරන ලද මෙම සටහන් පත් යෝජනා ක්‍රමය ක්‍රියාවේ යොදවන ප්‍රදේශයේ සෑම ගෘහයක් පාසාම සපයන ලදී.

යෝජනා ක්‍රම වැඩ කටයුතු ඉදිරි වර්ෂවලදී ද නොකඩවා කරගෙන යනවා ඇත. මේ දක්වා ජනතාව විසින් ක්‍රියාශීලීව සහයෝගය දක්වා ඇති අන්දම ගැන සලකා බලන විට වර්තමානය සඳහා සකස් කර ඇති වැඩ පිළිවෙලවල් සාර්ථක අත්දමින් ක්‍රියාත්මක කිරීමට හැකිවේය යි බලාපොරොත්තු වේ. ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා විසින් දක්වන ලද පුද්ගලික උනන්දුව මෙම යෝජනා ක්‍රමය සාර්ථක කර ගැනීමට ඉමහත්සේ උපයෝගි වූ බව අවධාරනයෙන් පැවසිය යුතුය.

3. ප්‍රජා සංවර්ධන පුහුණුව.

පේරාදෙනියේ ප්‍රජා සංවර්ධන පුහුණු කිරීමේ සහ පයෙවීෂණායතනයේ දී රජයේ දෙපාර්තමේන්තු පහක ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පවත්වන ලද පුහුණු කිරීමේ වැඩ සටහනට මෙම දෙපාර්තමේන්තුව සහභාගි විය. කෘෂිකර්ම, ග්‍රාම සංවර්ධන, ගොවිජන සේවා සහ ඉඩම් කොමසාරිස් තුමාගේ දෙපාර්තමේන්තුවල නිලධාරීන්ට අමතරව මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ද පුහුණුව ලැබූහ. රජයේ දෙපාර්තමේන්තුවල ක්ෂේත්‍ර නිලධාරීන් කණ්ඩායම් වශයෙන් ගෙන එකට පුහුණු කරන ලද ප්‍රථම අවස්ථාව මෙය වේ.

4. සෞඛ්‍ය අධ්‍යාපන පුහුණුව. කාර්ය මණ්ඩලය පුහුණුව.

රෝහල්වල සෞඛ්‍ය අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවය වර්ෂය තුළදී තව දුරටත් හුවා දක්වන ලදී. සෑම තරාතිරමකම වෛද්‍ය ආයතන මගින් සලසන ලද සේවාවන්හි අධ්‍යාපනික අංශය වැඩි දියුණු කිරීම සඳහා පියවර ගණනාවක්ම ගන්නා ලදී. හෙදි පුහුණු පාසැල් අවේම සෞඛ්‍ය අධ්‍යාපන පූර්ව සේවා පුහුණුව සම තත්වයට ගෙන ඒමට ක්‍රියා කරන ලදී. මහරගම දත් හෙදි ඇබෑසි විදුහලේ දී සෞඛ්‍ය අධ්‍යාපනය පුහුණුව සඳහා පැය අසූවක පමණ කාලයක් මිඩංගු කරන ලදී. දැන්වීම්, පත්‍රිකා රූප සටහන්, ප්නෙල් සටහන් ආදී දන්ත චිකිත්සාගාරවලදී උපයෝගී කරගත හැකි අධ්‍යාපනික භාණ්ඩ දියුණු කිරීම සහ සෑදීම ගැන විශේෂ වශයෙන් මෙම පුහුණුවේ දී සඳහන් කරන ලදී. මනෝ වෛද්‍ය හෙදියන්ට සහ දිවයිනේ නොයෙකුත් ප්‍රදේශයන්හි රෝහල්වල දෙවන පංතියේ හෙද පාලිකාවන් සඳහා පශ්චාත් පුහුණු හෙද පාසැලේ දී පවත්වන ලද සංස්කරන පාඨ මාලාවලදී සෞඛ්‍ය අධ්‍යාපනය ගැන ප්‍රමුඛත්වය දෙන ලදී.

කොළඹ මණ්ඩලීය රෝහල්වල වාට්ටු භාර සියළුම හෙදියන් සහ හෙදි සොහොයුරියන් සඳහා තෙදිනක සෞඛ්‍ය අධ්‍යාපන සංස්කරණ පාඨමාලාවක් පවත්වන ලදී.

කොළඹ රිජ්වේ ළමා රෝහලේ සේවයේ නියුතු 120 ක් වූ සියළුම හෙදියන් සඳහා පැය 6 ක සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහනක් සම්පාදනය කරන ලදී.

කළුතර පුහුණු මධ්‍යස්ථානයේ දී මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් පූර්ව සේවා පුහුණු කිරීමේ දී සෞඛ්‍ය අධ්‍යාපනය ගැන ප්‍රමුඛත්වය දෙන ලදී. වෛද්‍ය නිලධාරීන්, මහජන සෞඛ්‍ය හෙදියන්, පරිපාලන මහජන සෞඛ්‍ය වින්නඹු සේවිකාවන්, මහජන සෞඛ්‍ය වින්නඹු සේවිකාවන් ආදී මෙහි පුහුණු වූ සියළුම කොට්ඨාශවල පුහුණුව ලැබූවන්ට සෞඛ්‍ය අධ්‍යාපනය ගැන ද පුහුණුවක් දෙන ලදී. වින්නඹු සේවිකාවන්

පුහුණු කරන සියළුම මධ්‍යසථානවල දී ඔවුන්ට සෞඛ්‍ය අධ්‍යාපනය දීම ගැන අවධාරණයෙන් කරුණු සැලකර ඇත.

ආයතනවල පුහුණු කිරීමේ මෙම වැඩ කටයුතුවලට අමතරව ක්ෂේත්‍රයේ සිටින සියළුම මහජන සෞඛ්‍ය නිලධාරීන්ට පුහුණු අභ්‍යාසයක් ලබාදීම ප්‍රදේශීය සෞඛ්‍ය ශික්ෂකයින් ගේ ප්‍රධාන වගකීමක් වශයෙන් සලකන ලදී. මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන්ගේ සහ මහජන සෞඛ්‍ය වින්නඹු සේවිකාවන් ගේ යහපත සඳහා මෙවැනි පුහුණුවීමේ කටයුතු රාශියක් වර්ෂය තුලදී කරන ලදී.

මහජනයා පුහුණු කිරීම

සංවිධානය වූ නා නා තරාතිරමේ මහජන කණ්ඩායම් සඳහා සෞඛ්‍ය අධ්‍යාපන පුහුණුවක් ලබාදීම සෞඛ්‍ය අධ්‍යාපන අංශය විසින් කරන ලද තවත් වගකිවයුතු වැඩ කොටසකි. ගුරු අභ්‍යාස විද්‍යාලවල ග්‍රාම සංවර්ධන පුහුණු මධ්‍යස්ථානවල සෞඛ්‍ය අධ්‍යාපන පුහුණු කිරීමේ වැඩ කටයුතු වලට අමතරව සංවිධානය වූ කමිටු මගින් ප්‍රදේශයේ සෞඛ්‍ය කටයුතු භාරගැනීම සඳහා නායකත්වය පුහුණු අභ්‍යාසයක් දීම සඳහා තෝරාගත් පුද්ගලයින් දහස් ගණනකගේ අභිවෘද්ධිය තකා සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු සංවිධානය කර පවත්වාගෙන යන ලදී. සෞඛ්‍ය අධ්‍යාපන අංශය මගින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනා ක්‍රමය ප්‍රජා අධ්‍යාපන වැඩ කටයුතු දියුණු කිරීම සඳහා ප්‍රබල පියවරක් බව ප්‍රත්‍යක්ෂ විය.

5. විශේෂිත ව්‍යාපාරවල සෞඛ්‍ය අධ්‍යාපන වැඩ

බරවා රෝග මර්ධන ව්‍යාපාරය

බරවාරෝග මර්ධන වැඩ කටයුතු පුලුල් කිරීමත් සමගම සෞඛ්‍ය අධ්‍යාපන වැඩ කටයුතු ද පුලුල් කරන ලදී. යෝධ ශුද්ධ පවිත්‍ර කිරීමේ ශ්‍රමදාන වැඩ කඳවුරු සඳහා ස්වේච්ඡා සේවකයින් විශාල ගණනක් යොදවා ගැනීම මෙම යෝජනා ක්‍රමයේ විශේෂ අංගයක් විය. මාතර, වැලිගම, ගාල්ල, අම්බලන්ගොඩ, කළුතර, දෙහිවල සහ මීගමුව යන නගරවල යෝධ ශ්‍රමදාන වැඩ කටයුතු සංවිධානය කරන ලදී. අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව, ඉඩම් දෙපාර්තමේන්තුව සහ අම්බලන්ගොඩ සුළු නගර සභාවේ උද්යෝගී සහයෝගය මත අම්බලන්ගොඩ ප්‍රදේශයේ ආරම්භ කරන ලද නගරය ශුද්ධ පවිත්‍ර කිරීමේ ශ්‍රමදාන ව්‍යාපාරය සඳහා 2,000 කට අධික ස්වේච්ඡා සේවක කණ්ඩායමක් සහභාගී වීම මෙම යෝජනා ක්‍රමයේ කැපී පෙනුන ලක්ෂණයක් විය. මීගමුව නගර සභා ප්‍රදේශයේ ද මෙවැනි ශ්‍රමදාන ව්‍යාපාරයක් සංවිධානය කරගෙන යනු ලැබේ.

ක්ෂය රෝග මර්ධන ව්‍යාපාරය

මෙම වර්ෂය තුල දී ක්ෂය රෝග මර්ධන ව්‍යාපාරයේ ද සෞඛ්‍ය අධ්‍යාපන වැඩ කටයුතු නව මුහුණුවරක් ගන්නා ලදී. ක්ෂය රෝග රෝහල්වල සහ චිකිත්සාගාර වල කරන ලද සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු මෙන්ම දීප ව්‍යාප්ත බී.සී.ජී. එන්නත් කිරීමේ සහ සමූල කුඩා විකිරන සේයා වැඩ සටහන සමග සෞඛ්‍ය අධ්‍යාපනය දීම මෙම වැඩ සටහනේ විශේෂ ලක්ෂණයකි. අත්තනගල්ල නියමු යෝජනා ක්‍රමයේ දී විශේෂිත සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලදී. පාසැල් ළමුන් සඳහා වූ අවුරුදු 3 ක බී.සී.ජී. වැඩ සටහන නිමාවට පත්කිරීමට අවුරුද්ද තුලදී හැකි විය. වර්ෂය තුලදී ගුරුවරුන් සඳහා ඇක්ස්රේ ව්‍යාපාරයක් ආරම්භ කළ අතර බස් රියැදුරන් සහ කොන්දොස්තර වරුන් සඳහා සමාන ඇක්ස්රේ සහ බී.සී.ජී. ව්‍යාපාරයක් ඇතිකිරීමට යෝජනා කර ඇත. ජාතික ක්ෂය රෝග මර්ධන ව්‍යාපාරය සහ ශාඛා සංගම් සමග කිට්ටු සම්බන්ධතාවයක් ඇති කර ගන්නා ලදී. පත්‍රිකා, චිත්‍ර පටි, සහ ප්‍රදර්ශන භාණ්ඩ ගණනාවක්ම වර්ෂය තුලදී නිපදවන ලදී.

මැලේරියා නාශක ව්‍යාපාරය

දිවයිනෙන් මැලේරියා සමූලෝත් ඡේදනයට ලඟාවීම සමගම ජනතාවට තවදුර ටත් සුපරීක්ෂාකාරීව සිටීමේ අවශ්‍යකත්වය ගැන කරුණු අවබෝධ කරදීමට සෞඛ්‍ය අධ්‍යාපන වැඩ කටයුතු යොදන ලදී. ව්‍යාපාරය ප්‍රදර්ශන වලට සහභාගි වූ අතර සෞඛ්‍ය අධ්‍යාපන භාණ්ඩ ගණනාවක්ම නිෂ්පාදනය කරන ලදී. ව්‍යාපාරයට සම්බන්ධ සෞඛ්‍ය ශික්ෂකතැනට සමාජ රෝග ව්‍යාපාරයේ සහ මහරගම දත් විදුහලේ වැඩ අර්ධ කාලීන වශයෙන් පවරන ලදී.

මැලේරියා නාශක ව්‍යාපාරය

සෞඛ්‍ය ශික්ෂක තැන ඉල්ලා අස්වීමෙන් සමාජ රෝග මර්ධන ව්‍යාපාරයේ සෞඛ්‍ය අධ්‍යාපන වැඩ කටයුතු වලට බාධා පැමිනුනේ ය. අර්ධ කාලීන වශයෙන් පමණක් වැඩ කරන ලදී. විශේෂයෙන් කොළඹ වරායේ හා කාර්මික සහ වානිජ ආයතනවල සේවකයින් සඳහා නොකඩවා සෞඛ්‍ය අධ්‍යාපන වැඩ කටයුතු කරගෙන යන ලදී. 1963 දෙසැම්බර් මාසයේ දී සේවයේ නියුතු මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන් සඳහා පුහුණු කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලදී. කොළඹ හෙදි ඇබෑසි විදුහලේ ද පුහුණු කිරීමේ වැඩ ක්‍රියාත්මක කරන ලදී. ලබන වර්ෂයේ දී පූර්න කාලීන සෞඛ්‍ය ශික්ෂකයන් පත් කරනු ලැබේ.

6. කොළඹ මණ්ඩලීය ආරෝග්‍යශාලා වල සෞඛ්‍ය අධ්‍යාපනය වැඩ කටයුතු

කොළඹ මණ්ඩලීය රෝහල් වල සෞඛ්‍ය අධ්‍යාපන වැඩ කටයුතු නැවත පටන් ගැනීමේ පරමාර්ථය පිට වර්ෂය මුලදී කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරි තුමාගේ කාර්යාලයට සෞඛ්‍ය ශික්ෂකයෙක් පත් කරන ලදී. කාසල් වීදියේ කාන්තා රෝහලේ සහ සොයිසා ආර්යා කාන්තා රෝහලේ වින්නඹු ශිෂ්‍යාවන් සඳහා සෞඛ්‍ය අධ්‍යාපනය ගැන පූර්ව සේවා පුහුණුවක් සම ලෝචනයට භාජනය වූ වර්ෂය තුලදී දෙන ලදී. හෙදියන් සඳහා පුහුණු වැඩ කටයුතු කරන ලද අතර කොළඹ මණ්ඩලීය රෝහල්වල හෙදි සොහොයුරීන් සැම දෙනා සඳහා දින තුනක විශේෂ සම්මේලන යක් පවත්වන ලදී. රෝහල් සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන්වලදී පොදු මූලධර්ම, මාර්ග සහ ශිල්පනියාමය ගැන ද 2. සේවක මණ්ඩලය රෝහල් සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන් මගින් පාලනයට උපකාරවිය හැකි අන්දම ගැන ද 3. කාර්ය මණ්ඩල —රෝගීන්—අමුත්තන් අතර මානුසික සම්බන්ධතාවය ද 4. රෝහල් සෞඛ්‍ය අධ්‍යාපන වැඩ කටයුතු වලදී වෛද්‍ය සහ අර්ධ වෛද්‍ය නිලධාරීන් සතු වැඩ කොටස ගැන ද කරන ලද සාකච්ඡා මෙම සම්මේලනයට සහභාගි වූ සියලු දෙනාගේම අර්ථාන්විත අත්දැකීම් වශයෙන් සලකන ලදී. සියළුම ආයතනවල සැම වර්ගයකම සේවක මණ්ඩලවලට ප්‍රයෝජනවත් වන අන්දමේ අධ්‍යාපනික අගය ඇති චිත්‍රපටි ප්‍රදර්ශන වැඩ සටහන් පවත්වන ලදී.

රෝගීන්ට අධ්‍යාපනය දීම

පුද්ගලික සාකච්ඡා, සාමූහික සාකච්ඡා සහ චිත්‍ර පටි ප්‍රදර්ශන මගින් සොයිසා කාන්තා රෝහලේ සහ කාසල් වීදියේ කාන්තා රෝහලේ සිටින ඔබිනොබ යා හැකි රෝගීන් සඳහා අධ්‍යාපනික අත්දැකීම් මාලාවක් සකස් කර ක්‍රියාත්මක කරන ලදී. මහාරෝග්‍යශාලාවේ සහ රිජ්වේ ළමා රෝහලේ රෝගීන් සඳහා ද සමාන වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

මහජනයාට තොරතුරු සැපයීම

රෝගීන් යා යුතු නියම චිකිත්සාගාරය ඔවුන්ටම සොයා ගැනීමට පහසු වන අන්දමට කොළඹ මහ රෝහලේ බාහිර අංශයේ රෝගීන් ඇමතීමේ උපකරන කට්ටලයක් සවිකරන ලදී. මේ නිසා රෝගීන්ට අප්‍රමාදව ප්‍රතිකාර ලබාගැනීමට හැකි වූ අතර බාහිර අංශයේ තද බදය බොහෝ සෙයින් අඩු වීමට උපකාර විය.

7. රිජ්වේ ළමා රෝහලේ සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු

වර්ෂය මුලදී රිජ්වේ ළමා රෝහල පෘතුල සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු සඳහා යොදා ගන්නා ලදී. විශේෂ මාර්ගයක් වශයෙන් සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහනක් නිෂ්පාදනය කිරීමේ වගකීම සහිතව සම්පූර්ණ කාලීන සේවය යෙදවිය හැකි මහජන සෞඛ්‍ය හෙදියක් පත්කරන ලදී. කාර්ය මණ්ඩලයට සෞඛ්‍ය අධ්‍යාපනය දීම ද බාහිර අංශයේ රෝගීන් සහ අමුත්තන් සඳහා සෞඛ්‍ය අධ්‍යාපන වැඩ කටයුතු සකස් කිරීම සහ සංවිධානය කිරීම ද මෙම වැඩ සටහනේ ප්‍රධාන අංග විය. මෙම වැඩ සටහනට මගපෙන්වීම සඳහා උපදේශක කමිටුවක් පත්කරන ලදී. වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා දෙවන මහජන සෞඛ්‍ය හෙදියක් ද පත්කරන ලදී. වැඩ කටයුතු කර ගෙන යාමට සහයෝගය ලබා ගැනීම සඳහා මූලික පියවරක් වශයෙන් නොයෙකුත් වර්ගවල කාර්ය මණ්ඩල සමග රැස්වීම් ගණනාවක්ම පවත්වන ලදී.

මහජන සෞඛ්‍ය හෙදියන් (සෞඛ්‍ය ශික්ෂක) වෛද්‍ය නිලධාරීන් විසින් ඔවුන් වෙත යොමු කරන ලද බාහිර අංශයේ මව්වරු සඳහා පුද්ගලික සාකච්ඡා මගින් ද සාමූහික සාකච්ඡා මගින් ද අධ්‍යාපනික අත්දැකීම් විස්තර කර දෙන්නීය. මන්ද පෝෂක චිකිත්සාගාරය පවත්වාගෙන යාමට උපකාරී වීම ද වාට්ටුවල නතරවී සිටින රෝගී බිළිඳුන්ගේ මව්වරුන්ට ද නැවැතීමේ ශාලාවේ සිටින මව් වරුන්ට ද සෞඛ්‍ය අධ්‍යාපනය දීම මොවුන් විසින් කරනු ලැබේ. ළමයින් අතර බහුල වශයෙන් පැතිර යන බෝවෙන රෝග සහ පෝෂණය සම්බන්ධ අධ්‍යාපනික භාණ්ඩ එලදායි අන්දමින් ප්‍රයෝජනයට ගනු ලැබේ.

ළමා රෝහලේ සේවකයන්ගේ ළමයින් සඳහා විශේෂ නිරෝගී ළදරු ශායනයක් පැවැත්වීමට උත්සාහ ගත් නමුත් එය එතරම් ජනප්‍රිය නොවීය. බාහිර අංශයෙන් ප්‍රතිකාර ගැනීමට එන ළමුන්ට පෝලියෝ සහ අනිකුත් එන්නත් දීම මහජන සෞඛ්‍ය හෙදියන් (සෞඛ්‍ය ශික්ෂිකා) විසින් නොකඩවා කරගෙන යනු ලැබේ.

රෝහලේ සියළුම ඇඳන් සුද්ධ පවිත්‍රකර තීන්ත ගෑමේ ශ්‍රමදාන ව්‍යාපාරයන් සමාලෝචනයට භාජනයවූ අවුරුද්ද තුල සංවිධානය කරන ලදී. සේවයේ සිටින සියළුම මාණ්ඩලික හෙදියන් පුහුණු කිරීමේ වැඩ සටහනක් කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ සිටින සෞඛ්‍ය ශික්ෂක විසින් පටන් ගන්නා ලදී. දිනකට පැය බැගින් සතියක් තුල පැවැත්වෙන පංති වලට හෙදියන් 20 ක පමණ කණ්ඩායමක් සහභාගි වේ. දැනමට කණ්ඩායම් දෙකක් පුහුණුව අවසන් කර ඇත. උපස්ථායක යින්, කෝකීන් සහ කම්කරුවන් ආදී සුළු සේවකයින්ට ද මේ අන්දමින් සෞඛ්‍ය අධ්‍යාපනය දීම සඳහා මූලික පියවර දැනටම ගෙන ඇත.

මහජනයාට තොරතුරු සැපයීම

ලබාගත හැකි සේවාවන්ගේ විස්තර සහ විශේෂිත චිකිත්සාගාර වල විස්තර අඩංගු දර්ශනීය පොත් පිංචයක් මුද්‍රණය කර මහජනයා අතර බෙදා හරින ලදී.

8. ලේ බැංකු සේවයේ සෞඛ්‍ය අධ්‍යාපනය ලේ බැංකු සේවා සඳහා පූර්ණ කාලීන සෞඛ්‍ය ශික්ෂකයෙකු යොදවා ඇත. ලේවල අවශ්‍යතාවය මහජනයාට වටහා දීමත් ජංගම වැන් රථය මගින් ලේ එකතු කිරීම සඳහා ලේ දන්දීමේ ස්වේච්ඡා සේවක කණ්ඩායම් සංවිධානය කිරීමත් ඔහුගේ ප්‍රධාන වගකීමය. ජීවිත බේරාගැනීම සඳහා ලේ දන්දීමේ ඇති අගය අවබෝධ කරවීමට ග්‍රාමසංවර්ධන සමිති, කාන්තා සමිති, මහිලා සමිති, දායක සභා වැනි ස්වේච්ඡා ආයතන ද යුද්ධ හමුදාව, බන්ධනාගාරය, අභ්‍යාස විද්‍යාල, පාඨශාලා ආදී රජයේ ආයතන ද සමග බැඳී කටයුතු කර ඇත.

ජනතාව අතර බෙදා හැරීම සඳහා සෞඛ්‍ය අධ්‍යාපනික පත්‍රිකා ගණනාවක්ම මුද්‍රණය කරන ලදී. අධ්‍යාපනික සහ ප්‍රචාරක වැඩ කටයුතු සාර්ථක වූ බව ලේ බැංකුවට ලැබුන ලේ ප්‍රමාණයේ විශාලත්වයෙන් මොනවට පැහැදිලි විය.

4——ආර් 12680 (66/3)

9. දන්ත අධ්‍යාපන වැඩ සටහන

දන්ත අධ්‍යාපනික වැඩ සටහන අවුරුද්ද තුල දී දියුණු කරන ලදී. අවුරුද්ද තුල දී දන්ත සෞඛ්‍ය අධ්‍යාපනය ගැන විශේෂ දැකුම් පත් දෙකක් සහ පත්‍රිකා පෙලක්ම මුද්‍රණය කරන ලදී. පාඨශාලාවල අධ්‍යාපනික වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ගැන පාඨශාලා දත් හෙදියන්ට මග පෙන්වීමක් කරන ලදී.

10. බිලිඳුන පෝෂණය කිරීමේ අධ්‍යාපනික වැඩ සටහන

" ඔබගේ දරුවාට ආහාර දීම " යන ශීර්ෂය යටතේ කොටස් 13 කින් යුත් පත්‍රිකාවක් සකස් කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් පත්කරන ලද කමිටුව ගැබිණි සහ කිරිදෙන මවුන් අතර බෙදාහැරීම සඳහා එය මුද්‍රණය කරවන ලදී. මාතෘ නිවාසය, ප්‍රසූතිකාගාර සහ මහජන සෞඛ්‍ය වින්නඹුවන් මගින් මෙම පත්‍රිකා බෙදාහැරීම සඳහා වැඩ කටයුතු යොදන ලදී. මෙම පත්‍රිකා ප්‍රශස්ත අන්දමින් භාරගත් අතර ඒවායේ අවශ්‍යතාවය ඉතා ප්‍රබල අන්දමින් වැඩිවිය.

11. භික්ෂුන් වහන්සේලාට සෞඛ්‍ය අධ්‍යාපන

පිරිවෙන් ගණනාවකම සෞඛ්‍ය අධ්‍යාපනික පුහුණු කටයුතු නොකඩවා කරගෙන යන ලදී. රත්මලානේ පිහිටි බෞද්ධ භික්ෂුන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ නිති පතා සෞඛ්‍ය පන්ති පවත්වන ලදී. කොළඹ වජිරාරාම විහාරස්ථානයේ ගරු මඩිහේ පඤ්ඤාසීහ මහානායක හිමියන් ගේ අනුගාමිකත්වය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි සවිස්තර ප්‍රජා සංවර්ධන වැඩ සටහනක් සකස් වෙමින් පවතී. මෙම නියාමක වැඩ සටහනින් පෝෂණය සහ පරිසර සෞඛ්‍යය ගැන සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති අතර අනාගතය සඳහා මෙවැනි වැඩ සටහන් අති ප්‍රයෝජන වත් වේ.

12. වතුවල සෞඛ්‍ය අධ්‍යාපනය

සෞඛ්‍ය අධ්‍යාපන අංශයේ ක්ෂෙත්‍ර නිලධාරීන් විසින් විශේෂයෙන්ම බදුල්ල, මහනුවර සහ රත්නපුර යන සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශ තුල පිහිටි වතුවල සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු අරඹන ලදී. ලින්දුල දිස්ත්‍රික්කයේ වතුවල ඇපොතිකරිවරුන් සහ ඖෂධ සංයෝජකයින් සඳහා තලවාකැලේ නගර සභා කාර්යාලයේ දී විශේෂිත පුහුණු වැඩ සටහනක් පටන් ගන්නා ලදී. වතු 14 කම වෛද්‍ය සේවාවට අයත් වූවන් මෙම පුහුණුවට සහභාගි විය.

13. ප්‍රචාරක සහ චිත්‍රපටි වැඩ සටහන්

සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුල ප්‍රචාරක වැඩ සටහන් තවදුරටත් වැඩි දියුණු කරන ලදී. ජනතාවට සෞඛ්‍ය අධ්‍යාපනය බෙදාදීමේ මාර්ගයක් වශයෙන් ගුවන් විදුලිය සහ ප්‍රවෘත්ති පත්‍ර හැකි තරම් දුරට උපයෝගී කරගන්නා ලදී. ත්‍රෛමාසික ගුවන් විදුලි වැඩ සටහන් සකස් කළ අතර යටගිය වර්ෂයේ මෙන්ම ඒවා උසස් තත්ත්වයෙන් පවත්වාගෙන යන ලදී. විවිධ අංශ, ජවනිකා සහ සාකච්ඡා මණ්ඩල සහ කථා ප්‍රචාරය කෙරිනි. අවස්ථානුරූපව ඒවායේ තේමාව වෙනස් විය. ජනප්‍රිය වූ වැඩ සටහන් අතුරින් එකක් හැටියට " ඔබගේ සෞඛ්‍ය ප්‍රශ්නයට පිළිතුරු " යන්න සඳහන් කළහැකි අතර, නොයෙක් විශේෂඥයින් විසින් පිළිතුරු සැපයීම සඳහා ප්‍රේක්ෂකයින් බොහෝ ගණනාවකින් සෞඛ්‍ය ප්‍රශ්න ලැබිනි. අමධ්‍යප සතිය හා සෞඛ්‍ය සතිය අලලා විශේෂ ගුවන් විදුලි වැඩ සටහන් ප්‍රචාරය කරන ලදී.

" සැපත "

ත්‍රෛමාසික සඟරාවක් වූ " සැපත " මගින් සුගම අවබෝධයක් ලබාගත හැකි අන්දමින් සෞඛ්‍ය දැනුම බෙදා හැරීම තවදුරටත් කෙරිනි. නොමිලයේ බෙදාදීම සඳහා

දිනට මින් පිටපත් අටදාහක් පමණ මුද්‍රණය කරනු ලැබේ. සෑම ප්‍රජා මණ්ඩලයක ටම, ග්‍රාම සංවර්ධන සමිතියකටම, මහිලා සමිතියකටම, මධ්‍ය මහා විද්‍යාලයකටම සහ මහා විද්‍යාලයකටම මෙම සඟරාවේ පිටපත බැගින් ලැබේ.

සුප්‍රසිද්ධ වෛද්‍යවරු සහ විශේෂඥවරු සැපත සඟරාවට ලිපි සපයති.

"සුවපුවත්"

දෙපාර්තමේන්තුවේ ප්‍රවෘත්ති පත්‍රය වන "සුවපුවත්" මෙම අවුරුද්දේ ජූනි මාසය දක්වා ප්‍රසිද්ධ කරවන ලදී. මුද්‍රණ කඩදාසිවල හිඟකම නිසා මෙය තාවකාලිකව නවතාලීමට සිදුවිය. 1965 වර්ෂයේ සිට මෙය මුද්‍රණය කිරීමට වැඩ පිළිවෙලක් යොදා ගෙන යනු ලැබේ.

සෞඛ්‍ය පත්‍රිකා

නොමිලයේ බෙදාදීම සඳහා නා නා අන්දමේ රෝග ගැන ලිවූ විශේෂ සෞඛ්‍ය පත්‍රිකා සංශෝධනය කර මුද්‍රණය කරවන ලදී. බඩවැලේ රෝග ගැන පත්‍රිකා පෙළක් වර්ෂය තුලදී මුද්‍රණය කරවන ලද අතර තවත් පත්‍රිකා සකස් වෙමින් පවතී.

රෝහල් ගැන පොත් පිංචක්

ප්‍රාදේශීය රෝහල් වලින් සලසනු පහසුකම් සහ අනිකුත් සේවාවන් ගැන මහජනයාට අවබොධයක් ලබා ගැනීමට හැකිවන අයුරු රෝහල්වල පිහිටීම සහ පවත්වනු ලබන ශායනයන්ගේ විස්තර ද සහිතව පොත් පිංචයන් මුද්‍රණය කරවන ලදී. ලමා රෝහල, ගාලු රෝහල, මහනුවර රෝහල ගැන පොත් පිංචයන් ප්‍රසිද්ධකර ඇති අතර, ඉතිරිවා ළඟදීම බෙදාහැරීම සඳහා ලැබෙනවා ඇත.

ජාතික සෞඛ්‍ය ව්‍යාපාරවලදී විශේෂයෙන් දෙපාර්තමේන්තුවට කාලය දී සහාය දැක්වූ ගුවන් විදුලි දෙපාර්තමේන්තුව ගැන විශේෂයෙන් සඳහන් කළ යුතුව ඇත. මෙම ජාතික ව්‍යාපාරවල ඇති වටිනාකම ගැන අවබෝධකරගත් ලංකා ගුවන් විදුලි සේවයේ වෙළඳ අංශය එම ස්ථානවලදීම ප්‍රචාරයන් ගෙනයන ලදී. සෞඛ්‍ය සතිවල දී සහ අනිකුත් ජාතික සෞඛ්‍ය ව්‍යාපාරවලදී විශේෂ අතිරේකයන් මුද්‍රණය කරමින් පුවත්පත් සෑම විටම දෙපාර්තමේන්තුව සමග සහයෝගයෙන් කටයුතු කරන ලදී.

14. සෞඛ්‍ය ප්‍රදර්ශන

ගාල්ල, බදුල්ල, කොළඹ, පුත්තලම, මඩකලපුව, කළුතර කුරුණෑගල සහ යාපනය යන කොට්ඨාශවලදී ප්‍රධාන පෙලේ සෞඛ්‍ය ප්‍රදර්ශන තිහකට වැඩිය පවත්වන ලදී. දිනෙන් දින වැඩිවන ප්‍රදර්ශනයන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා පෝෂණය, පරිසර සනීපාරක්ෂාව ලමා සහ මව්වරුන් ගේ සෞඛ්‍ය සහ ක්ෂයරෝගය ගැන විශේෂයෙන් එහා මෙහා ගෙනයා හැකි ප්‍රදර්ශන භාණ්ඩ නිෂ්පාදනය කරවන ලදී.

15. මහජන සෞඛ්‍ය සතිය

1964 ජූනි මාසයේ 8 වනදා සිට 14 වනදා දක්වා වූ සතිය තුල මහජන සෞඛ්‍ය සතිය ඉතා උත්කෘෂ්ඨ අන්දමින් මුළු දිවයින පුරාම පවත්වන ලදී. සුපුරුදු අන්දමට සකස් කිරීම, සංවිධානය කිරීම සහ උත්සව පැවැත්වීම මහජන සෞඛ්‍ය සති කමිටුව විසින් කරන ලදී.

16. 1964 නිදහස් දින උත්සවය

ගාල්ලේ පවත්වන ලද නිදහස් දින උත්සවයට දෙපාර්තමේන්තුව ද සහභාගි විය. ගාල්ලේ නව නගර සහා ගොඩනැගිල්ලේ ඉඩ කඩ මදිවීම නිසා ගාල්ලේ ශාන්ත ඇලෝසියස් විද්‍යාලයෙහි විශේෂ සෞඛ්‍ය ප්‍රදර්ශනයක් පවත්වන ලදී.

17. ජාත්‍යන්තර ප්‍රදර්ශන

1963 ඔක්තෝබර් මාසයේ පකිස්තානයේ පවත්වන ලද එක්සත් ජාතීන්ගේ සතියේ උත්සවයට සනීපාරක්ෂාව ක්ෂයරෝග මර්ධනය, බරවා රෝග මර්ධනය, මාතෘ සහ ළදරු සෞඛ්‍ය සේවාවන්, වෛද්‍ය පර්යේෂණය, පිළිකා, මානසික සෞඛ්‍ය සේවාවන්, පාසැල් සෞඛ්‍ය සේවාවන් සහ පුහුණු කිරීමේ වැඩ සටහන් පිළිබඳ ප්‍රදර්ශන භාණ්ඩ යැවීමෙන් සහභාගි විය. ඡායාරූප ප්‍රදර්ශන භාණ්ඩ සහ වැඩ කෑලි පකිස්ථානයේ මහ කොමසාරිස් වෙත සපයන ලදී.

18. ලංකා වෛද්‍ය සංගමයේ ප්‍රදර්ශණය

1964 සැප්තැම්බර් 11 නදා සිට 15 වන දා දක්වා ද 18 වන දා සිට 20 වන දා දක්වා ද කොළඹ වෛද්‍ය විද්‍යාලයේ දී පවත්වන ලද ප්‍රදර්ශනයට ලංකා වෛද්‍ය මණ්ඩලයේ ඉල්ලීම පිට මීට සහභාගි වන ලදි. සනීපාරක්‍ෂාව, බරවාරෝග මර්ධනය සහ වට පණු රෝගය පැතිර යාම යන අංශ දෙපාර්තමේන්තුවේ ප්‍රදර්ශනාගාරයේ විය.

IV. අනිකුත් දෙපාර්තමේන්තුවලට කරන ලද සේවාවන්.

1. **රජයේ දෙපාර්තමේන්තු සමග ඒකාබද්ධ වීම.**—අධ්‍යාපන, කෘෂිකර්ම, ග්‍රාම සංවර්ධන, ඉඩම් සංවර්ධන, පරිවාස සහ ළමා සුභසාධක සේවා, සමාජ සේවා, සමුපකාර, පළාත් පාලන, ජලසැපයීම, ගුවන් විදුලි ප්‍රචාරක සහ ප්‍රවෘත්ති යන දෙපාර්තමේන්තුවල පුහුණු කිරීමේ වැඩ සටහන් සහ ප්‍රජා සංවර්ධන සහ සමාජ සුභසාධක වැඩ කටයුතුවල දී ක්‍රියාශීලී අන්දමින් සහයෝගතාවය දැක්විය.

2. **ගුරුවරුන්ගේ සංස්කරන සම්මේලන.**—සෞඛ්‍ය අධ්‍යාපන උප අංශය මගින් 1964 ජනවාරි 17 වන දා සිට 20 වන දා දක්වා බිබිලේ මධ්‍ය මහා විද්‍යාලයේ දී බිබිලේ සෞඛ්‍ය කොට්ඨාශයේ 200ක් පමණ ස්වෙච්ඡා සේවකයින් සඳහා සංස්කරන සම්මේලනයක් පවත්වන ලදී. තම කොට්ඨාශවල ප්‍රජා සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන් වල දී ක්‍රියාකාරී ලෙස සම්බන්ධ විය හැකිවන අන්දමට ස්වෙච්ඡා සේවකයින් සඳහා සෞඛ්‍ය අධ්‍යාපන පුහුණුවක් ලබා දීම මෙම පුහුණුවීමේ සංස්කරන සම්මේලනයේ පරමාර්ථය විය.

3. **ඒකාබද්ධ ජාතික පාඨශාලා සෞඛ්‍ය කමිටුවේ වැඩ කටයුතු.**—පාඨශාලා සෞඛ්‍ය සේවා වල දී අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව ඒකාබද්ධ කිරීමේ ආයතනයක් වශයෙන් ඒකාබද්ධ ජාතික පාඨශාලා සෞඛ්‍ය කමිටුව ක්‍රියාකරන ලදී. ඒකාබද්ධ ජාතික කමිටුව විසින් ක්‍රියාත්මක කිරීමට භාර ගන්නා ලද වැදගත් කටයුතු අතර පහත සඳහන් දෑ විය :—

(i) පාඨශාලා දන්ත සේවා වැඩ සටහනේ වැඩ කටයුතු ඒකාබද්ධ කිරීම.

(ii) පාඨශාලා ශිෂ්‍යයින් සඳහා යෝධ බී.සී.ජී. එන්නත් ව්‍යාපාරයක් සංවිධානය කිරීම.

(iii) වාර්ෂික පාසැල් සෞඛ්‍ය තරඟ සංවිධාන කිරීම.

(iv) පාඨශාලා සෞඛ්‍ය අත්පොත සකස් කිරීම.

(v) "ඇදිහැස" දිවා ආහාර වැඩ සටහන ප්‍රතිශෝධනය කිරීම.

(vi) පෝෂණ සමීක්ෂණයන් සහ පෝෂණ අධ්‍යාපන වැඩ සටහන් සංවිධානය කිරීම.

(vii) පාඨශාලීය පරිසර සනීපාරක්ෂාව වැඩ සටහන් සංශෝධන කිරීම.

(vii) කසිප්පු විරෝධී පාඨශාලීය අධ්‍යාපනික වැඩ සටහන සංවිධානය කිරීම.

(ix) පාඨශාලා වෛද්‍ය පරීක්ෂණ සංශෝධන කිරීම.

(x) ජාතික පෝලියෝ ප්‍රතිශක්තීකරන ව්‍යාපාරය සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ක්‍රියාශීලී සහයෝගය ලබා ගැනීම.

(xi) පාඨශාලීය ශිෂ්‍යයින්ට නොමිලයේ ඇස් කන්නාඩි සැපයීම නැවත සංවිධානය කිරීම.

(xii) ගුරුවරුන්ට සහ කායික අභ්‍යාසාචාර්යවරුන්ට සංස්කරන සම්මේලන සංවිධානය කිරීම.

(xiii) පාඨශාලීය සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන සංවිධානය කිරීම.

(xiv) දිවයිනේ ගුරු අභ්‍යාස විද්‍යාලවල ගුරුවරුන්ට සෞඛ්‍ය අධ්‍යාපන පුහුණුවක් දීමේ වැඩ සටහන සංශෝධනය කිරීම.

(xv) සෞඛ්‍ය සතිය, අමද්‍යප සතිය වැනි ජාතික ව්‍යාපාරවලදී අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහයෝගය ලබා ගැනීම.

(xvi) පාඨශාලා සෞඛ්‍ය සේවාවේ සෑම අංශයකින්ම සැලසෙන පහසුකම් වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම.

ඒකාබද්ධ ජාතික පාඨශාලා සෞඛ්‍ය කමිටුව සහ කොට්ඨාශමය, ප්‍රාදේශීය, සහ පාඨශාලා සෞඛ්‍ය කමිටු සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුව අතර වැඩදායී වූ ප්‍රබල සම්බන්ධතාවයක් ඇති බව ඔප්පු කළ අතර මනාලෙස ඒකාබද්ධ වූ ප්‍රබල පාඨශාලීය සෞඛ්‍ය වැඩ සටහනකට මග පෑදී ය.

4. **ආරක්ෂක භූමිතෙල් ලාම්පු තැනීම.**—ගෘහ අනතුරු වැලැක්වීම සඳහා ලාභවූත් අනතුරු රහිත වූත් භූමිතෙල් කුප්පි ලාම්පුවක් නිෂ්පාදනය කිරීමේ පරිශ්‍රමය සෞඛ්‍ය අධ්‍යාපන උප අංශය විසින් තවදුරටත් ගෙනයන ලදී. අනතුරු රහිත ලාම්පුවක් නිෂ්පාදනය කිරීම ගැන කණිෂ්ඨ වෙළඳ සංගමය විසින් ද තදබල උනන්දුවක් දක්වන ලදී. "ස්ටෑන්ඩඩ් ඉන්ස්ටිටියුට් ඔෆ් ඊස්රායෙල්" නම් ආයතනය විසින් නිෂ්පාදිත ලාභ සහ අනතුරු රහිත කුප්පි ලාම්පුවක් ලංකාවේ පිහිටි ඊස්රායෙල් සමූහාණ්ඩුවේ තානාපති කාර්යාලය මගින් මෙහි එවන ලදී. මෙරට නිෂ්පාදිත තවත් කුප්පි ලාම්පු ගණනාවක් සමග ඊස්රායෙල් ලාම්පුව ද පරීක්ෂා කර බලා වාර්තාවක් සැපයීමට ලංකා විද්‍යාත්මක සහ කර්මාන්ත පර්යේෂණායතනය වෙත යවන ලදුව එම වාර්තාව ගැන බලාපොරොත්තුවෙන් සිටී. ලංකා විද්‍යාත්මක සහ කර්මාන්ත පර්යේෂණායතනය, සමුපකාර තොග වෙළඳ ආයතනය, ලංකා මහිලා සමිතිය, පරිවාස සහ ළමා සුභසාධක සේවා දෙපාර්තමේන්තුව, ග්‍රාම සංවර්ධන සහ සුළු කර්මාන්ත දෙපාර්තමේන්තුව, ලංකා ෂෙල් සමාගම යන ආයතනවල නියෝජිතයින්ගෙන් සැදුම් ලත් සුරක්ෂිත භූමිතෙල් ලාම්පු කමිටුවක් පත් කරන ලදී. සුරක්ෂිත ලාම්පුවක් නිෂ්පාදනය කිරීමේ වැඩ පිළිවෙලේ දියුණුව ගැන සලකා බැලීම සඳහා මෙම කමිටුව වරින් වර රැස්වන්නේ ය.

5. **ලංකා ගමනාගමන මණ්ඩලයට සහාය වීම.**—ලංකා ගමනාගමන මණ්ඩලයේ රියැදුරන්ට සහ කොන්දොස්තරවරුන්ට ප්‍රථමාධාරදීම ගැන පුහුණුකිරීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට ආධාර වශයෙන් ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා ප්‍රථමාධාර දීම ගැන සවිස්තර පොතක් සකස් කරන ලදී.

V. **සෙවච්ඡා ආයතන සමග සම්බන්ධතාවය**

සමාජ සේවා සෙවච්ඡා ආයතනවලින් ආධාර.

රෝහල්වල නැවතී ප්‍රතිකාර ලබන රෝගීන්ට අවශ්‍ය උපකාර කිරීම සඳහා කොළඹ පිහිටි නා නා තරාතිරමේ සමාජ සේවා ආයතනවල නියෝජිතයින්ගෙන් සැදුම් ලත් කමිටුවක් සංවිධානය කරන ලදී. කොළඹ මණ්ඩලීය රෝහල්වල ද මෙවැනි කටයුතු කරගෙන යාම සඳහා උප කමිටු පිහිටුවන ලදී.

2. **ජොයිස් සෞඛ්‍ය පත්‍රිකා තරඟය.**— දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පිට දිවයින පුරා සෞඛ්‍ය පත්‍රිකා තරඟයක් කණිෂ්ඨ වෙළඳ මණ්ඩලය මගින් සංවිධානය කරන ලදී. පාසැල් ශිෂ්‍යයින් සහ ආධුනික මෙන්ම වෘත්තීය චිත්‍ර ශිල්පීන් සඳහා විවෘතවූ මෙම තරඟයට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නොමසුරු සහාය ලැබිණ. පත්‍රිකා 1,500 ක් පමණ ලැබුණ අතර මුලටම තේරුණු චිත්‍ර 200 ක් පමණ ලයනල් වෙන්ඩ්ට් කලා ශාලාවේ දී මහජනයා සඳහා ප්‍රදර්ශනය කරන ලදී. 1964 රේ අගෝස්තු මස 14 වන දා ගරු අධ්‍යාපන ඇමතිතුමා විසින් මෙම ප්‍රදර්ශනය උත්සවාකාරයෙන් විවෘත කරන ලදී. දිවයින මුහුණ පා ඇති සෞඛ්‍ය ගැටළු ගැන සෞඛ්‍ය අධ්‍යාපනයක් දීමට අවශ්‍ය ප්‍රදර්ශන පත්‍රිකා රාශියක්ම මෙම තරඟ ප්‍රදර්ශනයෙන් ලබාගැනීමට දෙපාර්තමේන්තුවට හැකිවිය. ජාතික සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන් වලදී ප්‍රයෝජනයට ගැනීම සඳහා ප්‍රයෝජනවත් වියහැකියයි සිතන පත්‍රිකා රජයේ මුද්‍රණාලය මගින් අච්චුගස්වා ගැනීමට කටයුතු යොදන ලදී.

3. **දශලක්ෂයකට ආහාර සැපයීමේ වැඩ සටහන.**—අමෙරිකා එක්සත් රාජ්‍යයේ දශලක්ෂයකට ආහාර සැපයීමේ ආයතනයේ විධායක අධ්‍යක්ෂ තැන්පත් ෆ්ලෝරන්ස් රෝස් මහත්මිය ලංකාවට පැමිණි අවස්ථාවේ දී සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, කෘෂිකම්, ආහාර, ඉඩම් සංවර්ධන, ග්‍රාම සංවර්ධන, ජාතික ක්‍රම සම්පාදන සහ අධ්‍යාපන යන දෙපාර්තමේන්තුවල ද ඇදිහැස, ලංකා වෙළඳ සංගමය සහ ලංකා විශ්ව විද්‍යාලයය යන ආයතනවල නියෝජිතයන් සමඟ 1964 සැප්තැම්බර් 23 වන දා සාකච්ඡා සම්මේලනයක් පවත්වන ලදී. බෝන්චි, රටකජු වැනි මෙරටින්ම ලබාගතහැකි මාංශජනක ධාතුවලින් පෝෂිත බහුකාර්ය ආහාරත් නිෂ්පාදනය ගැන කරන ලද පර්යේෂණ සහ අධ්‍යාපනික කටයුතු ගැන සවිස්තරාත්මක සාකච්ඡා පවත්වන ලදී. විධායක අධ්‍යක්ෂවරිය විසින් විවිධ වර්ග ආහාරවල ප්‍රයෝජනත්වය ගැන විස්තර කරන ලදී. දශලක්ෂයකට ආහාර සැපයීමේ ප්‍රාදේශීය කමිටුවක් පිහිටුවා ගැනීම මෙම සම්මේලනයේ ප්‍රතිඵලය විය. කුසගිනි නිවීමේ ජාතික ව්‍යාපාර කමිටුවේ පෝෂණ උප කමිටුව විසින් තවදුරටත් මේ ගැන දිගින් දිගටම කටයුතු කිරීමට තීරණය කරගන්නා ලදී. මෙරටේම නිෂ්පාදනය කරන විවිධ කෑම ද්‍රව්‍ය නිෂ්පාදනයේ තවදුරටත් ප්‍රගතිය ළමයින් අතර බහුලව පවතින මන්දපෝෂණය වැළැක්වීම සඳහා ප්‍රයෝජනවත් වේයයි බලාපොරොත්තු වනු ලැබේ.

4. **1964 රේ ජාතික අමද්‍යප ව්‍යාපාරය.**—නොවැම්බර් මාසයේ මුල් සතියේ පවත්වන ලද ජාතික අමද්‍යප ව්‍යාපාරය උත්සවශ්‍රීයෙන් පැවැත්වීම සඳහා ජාතික අමද්‍යප සංගමය සමඟ දෙපාර්තමේන්තුව සහයෝගතාවයෙන් හා උනන්දුවෙන් කටයුතු කරන ලදී. විෂ සහිත මත් ද්‍රව්‍යයක් වන කසිප්පු වලින් ඇතිවිය හැකි අනිෂ්ඨ විපාක ගැන දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය අධ්‍යාපන සහ ප්‍රචාරක වැඩ කටයුතු වලින් ප්‍රබල ප්‍රචාරයක් ගෙනයන ලදී. අමද්‍යප සතිය සඳහා සිංහලයෙන් සහ දෙමලෙන් විශේෂ පත්‍රිකාවක් මුද්‍රණය කරන ලදී. ග්‍රාම සංවර්ධන සහ සුරාබදු දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව ගුවන් විදුලි වැඩ සටහන් සම්පාදනය කරන ලදී. කසිප්පුවලින් ජනතාවගේ සෞඛ්‍යයට සිදුවිය හැකි හානිය ගැන කරුණු අවබෝධ කරදීම සඳහා ප්‍රදේශවල රුස්වීම් ගණනාවක්ම සංවිධානය කරවන ලදී.

5. **කුසගිනි නිවීමේ ජාතික කමිටුව.**—ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද ජාතික කුසගිනි නිවීමේ කමිටුවේ පෝෂණය සහ අධ්‍යාපනික සහ වැඩි දියුණුකිරීමේ උප කමිටුවල වැඩ කටයුතුවලට දෙපාර්තමේන්තුව සම්පූර්ණ සහයෝගය දෙන ලදී. ජාතික කුසගිනි නිවීමේ ව්‍යාපාරයේ කෘෂිකම් ව්‍යාප්තිය සහ අභ්‍යාස වැඩ සටහන්වලදී දෙපාර්තමේන්තුවේ සහයෝගය දී කටයුතු කිරීම නොනවත්වාම කරගෙන යන ලදී.

6. **ජාතික ශ්‍රමදාන සේවය.—ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජාතික සේවා අංශය යනුවෙන් සංවිධානය කරන ලද වැඩ කඳවුරු ව්‍යාපාරය ජාතික ශ්‍රමදාන**

ව්‍යාපාරය යනුවෙන් යලි නම් කරන ලදී. දිසාපතිවරුන් යටතේ දිසා ශ්‍රමදාන කමිටු සංවිධානය කරමින් ශ්‍රමදාන ව්‍යාපාරයේ බලාපොරොත්තු සහ කාර්යයන් තව දුරටත් පුළුල් කරන ලදී. දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරියා ජාතික කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරන ලදී. යෝධ ශුද්ධ පවිත්‍ර කිරීමේ ව්‍යාපාර, සනීපාරක්ෂක ව්‍යාපාර ශ්‍රමදාන වැඩ පිළිවෙල යටතේ පවත්වාගෙන යාමට පුළුවන් වී ඇත. ශ්‍රමදානය දනට ජන ජීවිතයේ වැදගත් අංශයක් බවට පත්වී ඇත.

7. **ලංකා මහිලා සමිති ව්‍යාපාරය.**—සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව ප්‍රජා සුභසාධක සහ පුහුණු කිරීමේ වැඩ සටහන්වලදී ලංකා මහිලා සමිති ව්‍යාපාරයට ආධාර කරන ලදී. කඩුවෙල පිහිටි මහිලා සමිති අභ්‍යාස මධ්‍යස්ථානයේ දී මහිලා සෙවජා සේවකයින් පුහුණු කිරීම සඳහා සෞඛ්‍ය අධ්‍යාපන ක්ෂෙත්‍ර නිලධාරීන් සහාය විය.

7. **ලංකා මහිලා සමිති ව්‍යාපාරය.**—සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව ප්‍රජා සහ සේවාවන් සලසාදීමෙන් ලංකා කණිෂ්ඨ වෙළඳ මණ්ඩලය දෙපාර්තමේන්තුවට සහයෝගය දක්වීය. කොළඹ ළමා රෝහලේ ඇඳන් සුද්ධ පවිත්‍ර කර තීන්ත ගෑමේ ව්‍යාපාරයට කොළඹ කණිෂ්ඨ වෙළඳ මණ්ඩලය සහභාගිවිය. ළමයින්ගේ ප්‍රයෝජනය සඳහා පුස්තකාලයක් ද මෙම මණ්ඩලය මගින් පටන් ගන්නා ලදී. අන් තැනක සඳහන් කරන ලද සමස්ත ලංකා සෞඛ්‍ය තරඟය සංවිධානය කිරීම ලංකා කණිෂ්ඨ වෙළඳ මණ්ඩලයේ කොළඹ ශාඛාව විසින් කරන ලදී. රෝහල් සේවා සහ ප්‍රජා සංවර්ධන වැඩ වලදී මොරටුවේ සහ පානදුරයේ ශාඛාවන් සහභාගි විය.

9. **ජාත්‍යන්තර සෞඛ්‍ය අධ්‍යාපනය සඳහා බ්‍රිතාන්‍ය සංගමය.—**ජාත්‍යන්තර සෞඛ්‍ය අධ්‍යාපනය සඳහා බ්‍රිතාන්‍ය සංගමයේ ආරාධනය පිළිගෙන ලංකාව අමුත්තන් පිළිගැනීමේ රට වශයෙන් කටයුතු කරමින් 1965 වර්‍ෂයේ දී දකුණු දිග ආසියා රටවල් සඳහා ලංකාවේදී සෞඛ්‍ය අධ්‍යාපන අභ්‍යාස වැඩ සටහනක් සම්පාදනය කිරීමේ වැඩ කටයුතු සංවිධානය කර නිමාවට පත් කරන ලදී. ජාතික සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන්වලදී මුහුණ දීමට වන බරපතල ගැටලු ගැන සාකච්ඡා කිරීමට දකුණු දිග ආසියා රටවල සෞඛ්‍ය අධ්‍යාපන විශේෂඥයින්ට මෙම සම්මේලන මගින් අවස්ථාව සැලසේයයි විශ්වාස කරනු ලැබේ.

10. **ලංකා පිළිකා සංගමය.**—ලංකා පිළිකා සංගමයේ සෞඛ්‍ය අධ්‍යාපන සහ ප්‍රචාරක වැඩ කටයුතුවලට සහයෝගය දෙන ලදී. බුලත් විට හැපීමෙන් වන විනාශකාරී ප්‍රතිඵලය ගැන කරුණු සඳහන් පත්‍රිකාවක් සකස් කළ අතර පිළිකා රෝගය මුල් අවස්ථාවලදී හඳුනා ගැනීම සහ ප්‍රතිකාර කිරීම ගැන ගුවන් විදුලි වැඩ සටහන් සම්පාදනය කරන ලදී.

11. **ලංකා පවුල් සංවිධාන සංගමය.**—ලංකා පවුල් සංවිධාන සගමයේ ප්‍රචාරක සහ සෞඛ්‍ය අධ්‍යාපනික වැඩ කටයුතුවලදී දෙපාර්තමේන්තුව ක්‍රියාශීලීව සහයෝගය දෙන ලදී. මෙම සංවිධානය සඳහා දෙපාර්තමේන්තුව විසින් භාෂා තුනෙන්ම පත්‍රිකා සහ විශාල දැන්වීම් ගණනාවක්ම මුද්‍රණය කරවන ලදී.

චිත්‍රපටි ප්‍රදර්ශන ප්‍රොජෙක්ටර් යන්ත්‍ර සැපයීමෙන් ද ඔවුන් ගේ ප්‍රචාරක වැඩ සටහනට අමතරව චිත්‍රපටි දර්ශන පැවැත්වීමෙන් ද දෙපාර්තමේන්තුවේ සහයෝගය දක්වන ලදී. 1953 සැප්තැම්බර් මාසයේ පැවැති සෞඛ්‍ය ප්‍රදර්ශනයට ද උප අංශය සහභාගි විය. චිත්‍රපටියක් මෙරටෙහිම නිෂ්පාදනය සඳහා පවුල් සංවිධාන සංගමයට උපකාර වූ අතර මෙම චිත්‍රපටිය මිලිමීටර් 16 යේ පටියක් වශයෙන් සකස් කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලදී.

12. **සමස්ත ලංකා බෞද්ධ ශිෂ්‍ය බල මණ්ඩලය.**—ආරෝග්‍යශාලාවල සාමජ සේවා වැඩ සඳහාත් ගම්වල මහජන සෞඛ්‍ය වැඩ සටහන් සඳහාත් 4,00,000 ක සාමාජික සංඛ්‍යාව යොදා ගැනීම ගැන සමස්ත ලංකා බෞද්ධ ශිෂ්‍ය බලමණ්ඩලයේ විධායක කමිටුව සමඟ මූලික සාකච්ඡා පවත්වන ලදී. ප්‍රාදේශීය සෞඛ්‍ය අධිකාරීන් ගේ උද්යෝගී සහයෝගය ඇතිව ප්‍රදේශයේ රෝහල් සේවා වැඩ කටයුතු බල මණ්ඩලයේ ශාඛා සංගම් විසින් කළයුතුයයි තීරණය කරන ලදී. ලබන මුදල් වර්ෂය තුළ මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ.

VI. පුස්තකාල සේවය

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ පිහිටි පුස්තකාලය සහ අනිකුත් ආයතන වල පිහිටි පුස්තකාල 65 මගින් පුස්තකාල පහසුකම් ලබා දුන්නේය. වර්ෂය තුළදී මනා ලෙස ඒකාබද්ධ වූ පුස්තකාල සේවයක් සංවිධානය කරන ලදී. අදාල ආයතනයේ නිලධාරීන් ගේ මෙන්ම කොට්ඨාශවල සිටින නිලධාරීන් ගේ ද ප්‍රයෝජනය සඳහා සෑම ප්‍රාදේශීය ආරෝග්‍යශාලාවකම පුස්තකාලය බැගින් පිහිටුවීමට කටයුතු කරන ලදී. ගණනින් අඩු වුවත් වඩා දියුණු සේවයක් දිය හැකි පුස්තකාල ඇති වීමෙන් පුස්තකාල සේවය වැඩි දියුණු කළහැකිවේයයි බලාපොරොත්තු විය. ප්‍රාදේශීය පුස්තකාලයන් පිහිටුවීමේ ප්‍රථම පියවරක් වශයෙන් මහනුවර, රත්නපුරයේ, ගාල්ලේ, යාපනයේ සහ බදුල්ලේ පුස්තකාල සඳහා පොත් මිලයට ගන්නා ලදී. මහනුවර සහ රත්නපුරයේ පුස්තකාල දෙකක් පිහිටවූ අතර අප්‍රමාදව අනිකුත් පුස්තකාල ද පිහිටුවීමට කටයුතු කරගෙන යනු ලැබේ.

අනුරාධපුරයේ නව හෙදි ඇබෑසි විදුහලෙහි අලුතින් පුස්තකාලයක් පටන් ගන්නා ලදී. මෙම පුස්තකාලය හෙදි ඇබෑසි විදුහල් සඳහා ආදර්ශ පුස්තකාලයක් වශයෙන් වැඩි දියුණු කිරීමට අදහස් කරනු ලැබේ. මෙම වර්ෂය තුළදී දකුණු කොළඹ රෝහලෙහි සුභසාධක පුස්තකාල සේවයක් පටන්ගන්නා ලදුව ඉතා කෙටි කාලයක් තුළදී මෙය සීඝ්‍ර අන්දමින් දියුණුවට පත්විය.

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පුස්තකාල සේවය සපයන ලද්දේ නොමිලයේය. පුස්තකාල සේවය ජනප්‍රිය කිරීම සඳහා කටයුතු කරන ලදී. මෙම වර්ෂය තුළදී මධ්‍යම පුස්තකාලයේ සාමාජික සංඛ්‍යාව පස් ගුණයකින් පමණ වැඩිවී ඇත. මධ්‍යම පුස්තකාලයට මෙන්ම අනිකුත් පුස්තකාලවලටද පොත් විශාල ගණනාවක්ම සපයන ලද අතර ප්‍රයෝජනවත් විය හැකි මාසික සඟරා රාශියක් ද සපයනලදී.

දෙපාර්තමේන්තුව විසින් සලසන පුස්තකාල සේවය ගැන සොයා බලා එය වැඩි දියුණු කිරීමේ යෝජනා ක්‍රම ඉදිරිපත් කිරීම සඳහා ක්‍රියා කරගෙන යන කමිටුවක් ඇත්තේය. වෛද්‍ය වෘත්තියට අදාල වූ කරුණු ගැන මනා ලෙස ඒකාබද්ධ වූ පුස්තකාල සේවාවක් ඇති කිරීමට අදහස් කර ඇති අතර මෙම විෂයය ගැන ඇති ලංකා වෛද්‍ය පුස්තකාලය වැනි පුස්තකාලයන් සමඟ කිට්ටු සම්බන්ධතාව යෙන් යුතුව කටයුතු කර මේ සඳහා යෝජනා ක්‍රමයක් මෙම අවුරුද්ද තුළදීම සකස් කරනු ලැබේ.

පුස්තකාලයට අලුතින් එක් කරන ලද නවතම පොත් පත් ගැන වෛද්‍ය සහ අර්ධ වෛද්‍ය වෘත්තියේ යෙදී සිටින්නවුන්ට දැන්වීම සඳහා පුස්තකාල ප්‍රවෘත්ති නමින් ත්‍රෛමාසිකයක් නිකුත් කිරීම සඳහා මෙම වර්ෂය තුළදී කටයුතු කරන ලදී.

VII. මධ්‍යම උපදේශක වෛද්‍ය සේවය

මධ්‍යම උපදේශක වෛද්‍ය සේවයේ නව යෝජනා ක්‍රමය ගැන අධ්‍යාපන සහ ප්‍රචාරක වැඩ සටහනක් සෞඛ්‍ය අධ්‍යාපන උප අංශය මගින් සංවිධානය කරන ලදී. ප්‍රවෘත්ති පත්‍රවල පළකරවන ලද විශේෂ ලිපිවලට අමතරව ගරු ඇමතිතුමා

වෙනුවෙන් ගුවන් විදුලි වැඩ සටහන් ද පිළියෙල කරන ලදී. මධ්‍යම උපදේශක වෛද්‍ය සේවා යෝජනා ක්‍රමය ගැන ප්‍රශ්න සහ පිළිතුරුවලින් යුත් පොත් පිංචයක් භාෂා තුනෙන්ම මුද්‍රණය කරවා මහජනයාට බෙදා දෙන ලදී.

X වැනි පරිච්ඡේදය

අභ්‍යාස පරිපාටි

කළුතර සෞඛ්‍ය මධ්‍යස්ථානයේ පුහුණුව ලැබූ මහජන සෞඛ්‍යය හදාරන්නන් 48 දෙනෙක්, 1964 මාර්තු මාසයේ දී පැවැත් වූ රාජකීය සෞඛ්‍ය සංගමයේ අවසාන විභාගයෙන් සමත් වූහ. මෙම 48 දෙනාගෙන් 46 දෙනෙක් දෙපාර්තමේන්තුවේ මහජන පරීක්ෂකවරුන් ලෙස 1964.6.16 වන දින සිට පත්කරනු ලැබූහ. අනික් දෙදෙනා මහජන සෞඛ්‍ය කටයුතු කරනු වස්, යුද හමුදාවේ ඔවුන්ගේ පළමු තනතුරුවලටම පෙරළා ගියහ.

1964 අප්‍රියෙල් මාසයේ දී මහජන සෞඛ්‍යය හදාරන්නන් 40 දෙනෙක් පුහුණුව සඳහා කළුතර සෞඛ්‍ය මධ්‍යස්ථානයට යවනු ලැබූහ.

XI වැනි පරිච්ඡේදය

පරිපාලනය හා සේවක සංඛ්‍යාව

1. පරිපාලනය

භාණ්ඩාගාරයේ ආධාරය ඇතිව මෙම වර්ෂයේ ද අභ්‍යාස පන්ති සංවිධානය කරන ලදී. කලින් පුහුණුවක් නොලත් කොට්ඨාශ ලේකම්වරුන්ට ද, ගණකාධිකාරීන්ට ද, පාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන්ට ද පරිපාලනය ගැන පුහුණුවක් ලබා දින.

2. සේවක සංඛ්‍යාව

අනුමත කරන ලද සේවක සංඛ්‍යාව වර්ෂය අගදී 34,165 ක් විය. එය සෑදී ඇත්තේ මෙසේය.

1.	වෛද්‍ය සේවය	...	...	25,859
2.	මහජන සෞඛ්‍ය සේවය	...	...	6,298
3.	රසායනාගාර සේවය	...	...	884
4.	ඒකාබද්ධ සේවය	...	...	1,124
				34,165

3. වෘත්තීය සංගම්

දෙපාර්තමේන්තුවේ විවිධ ශ්‍රේණිවලට අයත් සේවකයින් නියෝජනය කරන වෘත්තීය සංගම්, ගිය වසර අගදී 61 ව තිබී මේ වසරේ 78 දක්වා ඉහල නැංගේය. මේ හේතුවෙන් දෙපාර්තමේන්තුවට ලැබුණ හා අවශ්‍ය කටයුතු කරන ලද ඉල්ලීම් අධිකවිය.

4. රාජ්‍ය භාෂාව

රාජ්‍ය භාෂාව ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සතුටුදායකය. සමාලෝචිත වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවේ ගණන් තැබීමේ කටයුතු බොහොමයක් රාජ්‍ය භාෂාවෙන් කරන ලදී. සාමාන්‍ය ලිපිගනුදෙනුවට ද, රාජ්‍ය ලිපි ලේඛන තබාගැනීමට ද, වාර්තා ලිවීමට ද සිංහල පාවිච්චි කිරීම තව තවත් වැඩි කරන ලදී.

නිලධාරීන්ගෙන් සියයට වැඩි ගණනක් ප්‍රවීණතා පරීක්ෂණවලට පෙනී සිටිය අතර ප්‍රතිඵල දිරිගන්වනසුලුය. නා නා මට්ටම්වල ප්‍රවීණතා විභාගයන් සමත් වූ නිලධාරීන්, ඔවුන් ගේ රාජකාරි වැඩ කටයුතු, කොයිතරම් දුරට රාජ්‍ය භාෂාවෙන් කළ යුතුදැයි පැහැදිලි කරන ලදී. රාජ්‍ය භාෂාව පාවිච්චි කිරීමට තව තවත් වැඩි යෙන් දිරි ගන්වනු වස්, දෙපාර්තමේන්තුවේ රෝහල්වල හා අනෙක් ආයතනවල පාවිච්චි කෙරෙන නොයෙකුත් ආකෘති පත්‍ර සිංහලට පරිවර්තන කෙරිත.

විශාල වශයෙන්ම ශිල්පීය අංශය හා සම්බන්ධ වූ දෙපාර්තමේන්තුවක වැඩ කටයුතු සියලුම නිලධාරීන් සිංහල ප්‍රවීණත්වයක් ලබා ගන්නා තුරු රාජ්‍ය භාෂාවට පෙරලීමට නුපුලුවන.

XII වැනි පරිච්ඡෙදය

සෞඛ්‍ය සභාව

1963-64 මුදල් වර්ෂය අවසානයේ දී පහත නම් සඳහන් අය සෞඛ්‍ය සභාවේ සාමාජිකයින් වූහ :—

සභාපති : වෛද්‍ය වී. ටී. හේරත් ගුණරත්න මහතා, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක

වෛද්‍ය බී. කේ. ද සිල්වා මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ (මහජන සෞඛ්‍ය සේවා)

වෛද්‍ය ඇම්. ජේ. ද ඇස්. ජයසේකර මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂක (වෛද්‍ය සේවා)

වෛද්‍ය ඩී. බී. ගුණසේකර මහතා, වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂක (රසායනාගාර සේවා)

වෛද්‍ය පී. ආර්. ඇන්තනීස් මහතා, කොළඹ මහ රෝහලේ ශල්‍ය වෛද්‍ය

වෛද්‍ය ඊ. ඩබ්. ජයරත්නම් මහතා, කොළඹ 8, කාසල් වීදියේ කාන්තා රෝහලේ ප්‍රසව වෛද්‍ය

වෛද්‍ය ලුෂියන් ගුණසේකර මහතා

වෛද්‍ය ඒ. බෝගොඩ මහතා, හෝමාගම දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරි

වෛද්‍ය ඩී. ජේ. ආටිගල මහතා, කොළඹ මහ රෝහලේ වෛද්‍ය

මහාචාර්ය, ඕ. ඊ. ආර්. අබේරත්න මහතා, කොළඹ වෛද්‍ය විද්‍යාලයයේ වෛද්‍ය විද්‍යා මහාචාර්‍ය

වෛද්‍ය ඇම්. ඇස්. ඇම්. රෆායි මහතා.

ලේකම් : අයි. පිල්ලෙයි මහතා.

සේවා කාලය අවසන් වීමෙන් පහත සඳහන් අයට අවුරුද්ද තුළදී සාමාජිකත්වය අහිමි විය :—

වෛද්‍ය ඕ. ඊ. ආර්. මැඩොන්සා මහතා.

වෛද්‍ය පී. වී. ද කෲස් මහතා.

මහාචාර්ය ජී. එච්. කුරේ මහතා.

වෛද්‍ය හිලරි ගුණවර්ධන මහතා.

ඒ වෙනුවට පහත නම් සඳහන් අය සාමාජිකයින් වශයෙන් පත්කරනු ලැබූහ :—

වෛද්‍ය ඩී. ජේ. ආටිගල මහතා.

වෛද්‍ය ඒ. බෝගොඩ මහතා.

මහාචාර්ය ඕ. ඊ. ආර්. අබේරත්න මහතා.

වෛද්‍ය ඇම්. ඇස්. ඇම්. රෆීපායි මහතා.

අවුරුද්ද තුළ දී රැස්වීම් වාර හතරක් පැවැත් වින.

වෛද්‍ය නිලධාරි ගුණවර්ධන මහතා—සභාපති.

වෛද්‍ය බී. කේ. ද සිල්වා මහතා.

මහාචාර්ය ජී. එම්. කුරේ මහතා.

වෛද්‍ය පී. ආර්. ඇන්තනීස් මහතා.

වෛද්‍ය ලූෂියන් ගුණසේකර මහතා.

වෛද්‍ය ඊ. ඩබ්ලිව්. ජයරත්නම් මහතා සහ

අයි. පිල්ලෙයි මහතා (ලේකම්) යන අයගෙන් සමන්විත අනුකාරක සභාව පත් කරන ලද්දේ දෙපාර්තමේන්තුව ප්‍රති සංවිධානය කිරීම උදෙසා සම්පාදිත "ජයසිංහ වාර්තාව" ක්‍රියාත්මක කිරීමේ හැකියාවන් සොයා බැලීමටය. අනුකාරක සභාව රැස්වීම් වාර 3ක් පවත්වා වාර්තාව සෞඛ්‍ය සභාව වෙත ඉදිරිපත් කළාය. සෞඛ්‍ය සභාව 1964.6.15 වන දින පවත්වන ලද රැස්වීම් වාරයේ දී මෙම වාර්තාව සාකච්ඡාවට භාජනය කර ඒකච්ඡන්දයෙන් පිළිගෙන සෞඛ්‍ය අමාත්‍යාංශයට ඉදිරිපත් කළාය.

ජයසිංහ වාර්තාවේ සඳහන් නිර්දේශයන් පිළිගත නොහැකි බවත්, අනුකාරක සභා වෙන් කරන යෝජනා ක්‍රියාත්මක කරන්නේ නම් ප්‍රතිසංවිධානය කිරීමක් අනවශ්‍ය බවත් අනුකාරක සභාව ඇරූ මතය යි.

XIII වැනි පරිච්ඡේදය

ප්‍රවාහන සේවය

1963-64 වර්ෂය තුළ දී ගිලන් රථ 8ක්ද ජීප් රථ 3ක්ද වීරක් රථයක් ද ලැබී ඇනට පවත්නා වාහන කණ්ඩායමට එකතු කරන ලදී. මීට අතිරේකව ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් ලෑන්ඩ් රෝවර් රථයක් ද ප්‍රදානය කරන ලදී. මේ නිසා දෙපාර්තමේන්තුව සතුව ඇති ගිලන් රථ, බස්රථ හා වෑන් රථ ආදී වාහන සංඛ්‍යාව 335 ක් විය.

2. වර්‍ෂය තුළදී ගිලන් රථ හතක් ද, වෑන් රථ දෙකක් ද ප්‍රයෝජනයට ගත නොහැකි හෙයින් ඉවත් කොට ටෙන්ඩර් මගින් විකුණන ලදී. විකුණා ලත් මුදල රු. 29,325 කි. මෙයින් (යුනිසෙෆ්) වෑන් රියක් විකුණා ලබා ගත් රු. 4,025 ක් වූ මුදල එක්සත් ජාතීන්ගේ හදිසි ළමා අරමුදලේ (යුනිසෙෆ්) ගිණුමට බැරකරන ලදී.

3. ගිලන් රථ පහක් ද, වෑන් රථ තුනක් ද, ලොරි දෙකක් ද ලබා ගැනීමට වර්‍ෂය තුළදී කටයුතු ඇරඹිනා. මේ සම්බන්ධයෙන් ක්‍රියා කරගෙන යන අතර දැනට පවත්නා මුදල් වර්‍ෂය තුළ දී මෙම වාහන ලබා ගත හැකිය යි අපේක්ෂා කෙරේ.

4. වර්‍ෂය තුළ දී වාර්තා කරන ලද අනතුරු වලින් වැඩි හරියක් නොවැළැක්විය හැකි ඒවා විය. රියැදුරාගේ නොසැලකිලිමත් කමෙන් අනතුරු සිදුවූ අවස්ථාවල, අලාභය ඔහුගෙන් අයකරගනු ලැබේ.

5. වාහන අලුත් වැඩියා කිරීම සඳහා විශාල මුදලක් වියදම් කරනු ලැබේ. අලුත් වැඩියා කිරීම්වලට අය කරන මුදල සාමාන්‍ය වශයෙන් ඉතාමත්ම අධික බව පෙනී ගොස් ඇත. මේ ගැන විමසූ විට ලැබෙන පිළිතුර නම් දැනට අමතර කොටස්වල මිල ඉහළ බවය. මෙම දුෂ්කරතාවය මග හැර වනු වස් දෙපාර්තමේන්තුව සතු සියලුම රථ වාහන අලුත් වැඩියා කිරීම පිණිස කලින් මැලේරියා මර්ධන ව්‍යාපාරයේ වැඩපොළ තිබූ තැන මධ්‍යම වැඩපොලක් පිහිටුවීමට යෝජනා කොට ඇත්තේ ය.

1964-65 වර්ෂයේ දී වැඩ පටන් ගත හැකිවෙන පරිදි මේ ගැන ක්‍රියාකරගෙන යනු ලැබේ. මෙම වැඩ පල පිහිට වූ පසු වාහන නඩත්තු කිරීම සඳහා වෙන්කළ වැය ශීර්ෂයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ඉතිරි වනවා ඇත.

XIV වැනි පරිච්ඡේදය

ජාත්‍යන්තර සම්මේලන

1. ලෝක සෞඛ්‍ය සංවිධානයේ, විධායක මණ්ඩලයේ 33 වන හා 34 වන සභාවාර ස්විට්සර්ලන්තයේ ජිනිවා නුවර දී පිළිවෙලින් 1964.1.14 සහ 1964.5.26 වන දිනවල දී පැවැත්වින. දැනට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැන්පත් වී. ටී. හේරත් ගුණරත්න මහතා මෙම සභාවාරවලදී ලංකාව නියෝජනය කළේය.

2. ජිනිවා නුවර දී 1964 මාර්තු 3 වන දින සිට 20 වන දින දක්වා පවත්වන ලද ලෝක සෞඛ්‍ය මුලුවේ ලංකාව නියෝජනය කරන ලද්දේ,

(i) ජර්මන් සමූහාණ්ඩුවේ ලංකා තානාපති තැන්පත් බී. ඇෆ්. පෙරේරා මහතා ප්‍රධානකොට

(ii) සහකාර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෛද්‍ය පී. ඒ. සී. පෙරේරා මහතා විසිනි.

මෙම මුලුවේදී කරන ලද ශාස්ත්‍රීය සාකච්ඡාවේ ප්‍රධාන මාතෘකාව වූයේ "ප්‍රජාව සඳහා ජලසම්පාදන වැඩ පිළිවෙල සෞඛ්‍යයට හා සමාජ ප්‍රගතියට කරන බලපෑම" යන්න යි. බොහෝ සාකච්ඡා කිරීමෙන් පසු සාමාජික රාජ්‍යවලට පහත සඳහන් නිර්දේශයන් කිරීමට තීරණය කර ගන්නා ලදී.

(i) සුරක්ෂිතවත්, අවශ්‍ය ප්‍රමාණයටත්, ප්‍රජාවට ජලය සැපයීම සඳහා ජාතික වැඩ පිළිවෙලේ වැඩි සැලකිල්ලක් දැක්විය යුතු ය.

(ii) ජලසම්පාදන වැඩ පිළිවෙල ගෙනයාම සඳහා, බහු විධ හෝ ද්විධ ක්‍රමයන් ගෙන් ලබාගත හැකි යම් උපකාරයක් වේතොත් එහි සම්පූර්ණ ප්‍රයෝජනය ලබාගත යුතුය.

ලංකා නියෝජිත කණ්ඩායමේ ප්‍රධානියා වූ බී. ඇෆ්. පෙරේරා මහතා කථාකරමින්, මැලේරියා සමූල ඝාතනය, ක්ෂය රෝගයට විරුද්ධව බී. සී. ජී. ප්‍රතිශක්ති කරණය කිරීම, බාලක පක්ෂාගාත ප්‍රති ශක්ති කරණය දීම, බැක්ටීරියාවලින් හා පාචනයෙන් සෑදෙන රෝග හැදෑරීම, ප්‍රජාව සඳහා ජලසම්පාදනය, සනීපාරක්ෂිත ආයතනයක් පිහිටුවීම ආදි නා නා විධ කාර්යයන් සඳහා අපේ රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කෙටියෙන් විස්තර කළේ ය. තවද ඔහු අපේ කටයුතු සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ලැබුණ අගය කළ නොහැකි උපකාර ගැන ද එම ආයතනයට ස්තුති කළේ ය.

3. 1964 සැප්තැම්බර් මාසයේ 22 වන දින සිට 28 දින දක්වා ලෝක සෞඛ්‍ය සංවිධානයේ අග්නිදිග ආසියාව පිළිබඳ ප්‍රාදේශීය කමිටුවේ දහත්වන සභාවාරය නව දිල්ලියේදී පැවැත්වින. මෙහි දී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෛද්‍ය වී. ටී. හේරත් ගුණරත්න මහතා ලංකාව නියෝජනය කළේ ය.

වෛද්‍ය වී. ටී. හේරත් ගුණරත්න මහතා සාක්ෂ්‍ය පත්‍ර පිළිබඳ අනුකාරක සභාවේ සභාපති ධුරයට ද, ප්‍රාදේශීය කමිටුවේ සභාපති ධුරයට නිතරගයෙන් ද පත්කර ගන්නා ලදී.

මෙම රැස්වීම් වාරයේ පැවැත් වූ ශාස්ත්‍රීය සාකච්ඡාව "වසූරිය සමූලඝාතනය කිරීම" යන්නයි.

වෛද්‍ය ගුණරත්න මහතා ලංකා නියෝජිතයා ලෙස කථාකරමින් පහත සඳහන් දේවලට ලැබෙන ලෝක සෞඛ්‍ය සංවිධානයේ ආධාර වල වැදගත්කම මතුකොට දැක්විය :—

(i) ක්ෂය රෝග මර්ධනය සඳහා මාර්ගෝපදේශක ව්‍යාපාරයක්.
(ii) බාලක පක්ෂාගත ප්‍රතිශක්ති කරණ වැඩ සටහන් අගයකිරීම.
(iii) පාචන රෝග හැදෑරීම.
(iv) මාලදිවයින්වල මැලේරියා මර්ධනය.
(v) දැනට පවතින අනු-අංගයක් වන සෞඛ්‍ය අධ්‍යාපනයේ වැඩ කටයුතු අගය කිරීම.

4. 1964 ජනවාරි මාසයේ උතුරු ඉන්දියාවේ බිහාර් ප්‍රදේශයේ අගනුවර වන පැට්නාහි දී පවුල් සංවිධානය ගැන 5 වන සමස්ත ඉන්දියානු සම්මේලනය පවත්වන ලදී. එහිදී ලංකාව නියෝජනය කරන ලද්දේ ස්වීඩන්-ලංකා පවුල් සංවිධාන නියමු යෝජනා ක්‍රමයේ ලංකා නියෝජිත වෛද්‍ය ආර්. ඒ. රබෙල් මහතා විසිනි. "සාමාන්‍ය මිනිසුන් සහ වෛද්‍යවරුන් උදෙසා අධ්‍යාපනය දීම හා ඔවුන් පුහුණු කිරීම" යන මැයෙන් එහි දී ලිපියක් කියවීය.

5. ආමාශ-අතුණුරෝග විද්‍යාව පිළිබඳ දෙවන ආසියානු සම්මේලනය ඉන්දියාවේ, පන්ජාබයේ චන්දිගාර්හි දී 1964 ජනවාරි 26 වන දින සිට 31 වන දින දක්වා පැවැත්විණ. මෙහිදී වෛද්‍ය ඩී. ඇෆ්. ද ඇස්. ගුණවර්ධන, වෛද්‍ය ඇස්. තනබාල සුන්දරම්, වෛද්‍ය පී. ආර්. වල්පිට හා වෛද්‍ය ඇස්. වයි. ඩී. සී. වික්‍රමසිංහ යන මහත්වරු ලංකාව නියෝජනය කළහ.

6. ඉන්දියානු පිළිකා සංගමයේ මෙහෙයීමෙන්, දෙවන සමස්ත ඉන්දියානු පිළිකා සම්මේලනය, 1964 ජනවාරි 11 වන දින සිට 14 වන දින දක්වා මදුරාසියේ දී පැවැත්විණ. මහරගම පිළිකායතනයේ විකිරණ වෛද්‍ය, වෛද්‍ය එච්. කේ. ටී. ප්‍රනාන්දු මහතා ද, එහිම ශල්‍ය වෛද්‍ය ආර්. කුක් මහතා ද ලංකාව නියෝජනය කළහ.

7. එක්සත් රාජධානියේ රාජකීය සෞඛ්‍ය සංගමයේ මෙහෙයීමෙන් ඩිවොන් හි, ටෝර්ක්වේහිදී, 1964 අප්‍රියෙල් 27 වන දින සිට මැයි 1 වන දින දක්වා පැවැත් වූ සෞඛ්‍ය සම්මේලනයේ දී ලංකාව නියෝජනය කරන ලද්දේ, දැනට එක්සත් රාජධානියේ පශ්චාත් උපාධි හදාරණ වෛද්‍ය පී. දුරෙයිඅප්පා මහත්මිය විසිනි.

8. 1964 පෙබරවාරි 23 වන දින සිට මාර්තු 7 වන දින දක්වා නැගෙනහිර පකිස්තාන යේ කොමිලා නගරයේ පැවැත්වුන සුභද ප්‍රජා සංවර්ධනය පිළිබඳ මුලුවේ ලංකාව නියෝජනය කළ පිරිසේ දෙපාර්තමේන්තු නියෝජිතයා වූයේ සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි පී. ගනේවත්ත මහතාය. ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ පද්මිණි ද සිල්වා මෙනෙවිය හා ක්‍රම සම්පාදන කාර්යාලයේ සී. ඇම්. ජේ. වැලිකල මහතා ලංකාවෙන් ගිය අනෙක් නියෝජිතයෝ වූහ.

9. 1964.8.20 වන දින පීකිං නගරයේ පැවැත්වුන ලෝක විද්‍යා කාර්මිකයින්ගේ සමුලුවේ සාකච්ඡා සභාව සඳහා කොළඹ මහාරෝහලේ රෝග නිධානඥ වෛද්‍ය ඩබ්ලිව්. ඩී. රත්නවේල් මහතා ද, වෛද්‍ය පර්යේෂණායතනයේ පර්යේෂණ නිලධාරි වෛද්‍ය සෙන්ති ෂන්ගමුගනාදන් මහතාද ලංකාව වෙනුවෙන් ගියහ. මෙම සාකච්ඡා සභාවේ දී "මිනිස් බරවා" යන මැයෙන් ලිපියක් වෛද්‍ය ඩබ්. ඩී. රත්නවේල් මහතා විසින් කියවන ලදී.

10. 1964 අගෝස්තු 31 වන දින සිට සැප්තැම්බර් 4 වන දින දක්වා, ජීවානු විද්‍යාව ජීව විද්‍යාව "කියුලෙක්ස් පිපියන්ස්" නමැති මදුරුවා නැසීමේ පිළිවෙත් පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානයේ සම්මේලනයක් ජිනීවාහි දී පැවැත්විණ. එහි දී බරවා නාශක ව්‍යාපාරයේ අධිකාරි වෛද්‍ය මු. හ. මු. අබ්දුල් කාදර් මහතා ලංකාව නියෝජනය කළ අතර උප සභාපති වශයෙන් ඒ මහතා නිතරගයෙන් පත්කර ගන්නා ලදී. ලංකාවේ "කියුලෙක්ස් පිපියන්ස් පැටිගන්ස් වෙඩ්මන්" ප්‍රශ්නයේ වැදගත් කම යන මැයෙන් ලිපියක් සභාවේ සාකච්ඡා කිරීම පිණිස වෛද්‍ය අබ්දුල් කාදර් මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

XV වැනි පරිච්ඡේදය

සුභසාධක කටයුතු

1963-64 මුදල් වර්ෂය තුළදී භාණ්ඩාගාරය මගින් සුභසාධක කටයුතු සඳහා වෙන් කර දුන් මුදල රු. 35,000කි.

මෙම මුදල නව සුභසාධක අංශයන් දියුණු කිරීමට ද, පවතින අංශයන් සඳහා අත්‍යාවශ්‍ය දේවල් ලබා ගැනීමට ද වියදම් කරන ලදී.

ක්‍රීඩා.—කොළඹ හා ඒ අවට පෙදෙස්වල සාමාජිකයින්ට විනෝදවීමේ පහසුකම් සලසා දීම සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා සංගමය දිගටම කරගෙන ගියේය. පිට පළාත්වල සිටින සාමාජිකයෝද කොළඹ පැමිණි අවස්ථාවල දී මෙම පහසුකම් කලින් ප්‍රයෝජන ගත්හ.

වෙනදා මෙන්ම මෙම අවුරුද්දේ ද තරඟ හා සමාජ උත්සව සංවිධානය කරන ලදී,

සැකසුරුවම් කම.—දෙපාර්තමේන්තුවේ සමුපකාර සැකසුරුවම් හා සුභසාධක සංගමයේ කටයුතු සතුටුදායක පරිදි කළ අතර මුදල් ආධාර අවශ්‍ය සාමාජිකයින්ට සහනය සපයන ලදී.

XVI වැනි පරිච්ඡේදය

ගොඩනැගිලි

1963-64 මුදල් වර්ෂය තුළ දී, වෛද්‍ය ගොඩනැගිලි සඳහා රුපියල් 1,18,66,190ක මුදලක් අංක 161 දරණ ශීර්ෂයේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ 5 වන වැය ශීර්ෂය යටතේ වෙන් කරන ලදී. මෙම මුදලින් රුපියල් 39,02,500 ක් රජයේ වැඩ දෙපාර්තමේන්තුව විසින් වියදම් කරන ලදී.

වෛද්‍ය ගොඩනැගිලි වලට ජලය උපකරණ හා පල්දෝරු ක්‍රම සම්පාදනය උදෙසා රුපියල් 47,52,082ක්, අංක 155 දරණ ශීර්ෂයේ අංක 5 දරණ වැය ශීර්ෂය යටතේ වෙන් කෙරිනි. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන, ජල සම්පාදනය හා පල්දෝරු ක්‍රම ආදිය සඳහා රු. 6,64,028 ක මුදලක් වියදම් කළේ ය. මේ සඳහා වෙන් කරනු ලැබූ මුදල රු. 11,12,500කි. ලුණුවලින් අයඩින් නිපදවීම අත්හදා බැලීමේ යන්ත්‍රයක් සඳහා ලුණු කොමසාරිස් වරයා රුපියල් 226ක මුදලක් වියදම් කළේ ය. මේ සඳහා වෙන් කරනු ලැබූ මුදල රු. 5,000කි.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව සහ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සම්පූර්ණ කළා වූත් දැනට ගොඩ නැගීමට භාරගෙන ඇත්තාවූත් ගොඩනැගිලි වැඩ විස්තරයක් ද මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන විසින් කරගෙන යන ජල සම්පාදන හා පල්දෝරු ක්‍රම ගැන විස්තරයක් ද II හා III වන පරිශිෂ්ටවලින් දැක්වේ.

XVII වැනි පරිච්ඡේදය

මිල මුදල්

1963-64 වර්ෂය සඳහා වැය කිරීමට වෙන් කළ මුදලින් රුපියල් කෝටි 15.04ක් දෙපාර්තමේන්තුව වියදම් කළාය. 1962-63 වර්ෂයේ වියදම රුපියල් කෝටි 14.69කි. අවුරුදු දෙක තුළදී ඇතැම් විෂයයන් සඳහා කළ වියදම්වල වෙනස පහත දැක්වේ :—

	වැඩිවීම රුපියල් දශ ලක්ෂවලින්	අඩුවීම රුපියල් දශ ලක්ෂවලින්
පුද්ගලික වේතන	—	·03
විදුලි බලය	·09	—
නිල ඇඳුම් හා නිල ඇඳුම් වෙනුවට දීමනා	·08	—
ඖෂධ	·2	—
ආහාර	—	·19
ගබඩා බඩු හා අවශ්‍ය සැපයීම්	—	·02
ප්‍රවාහනය	·06	—
ක්‍රියා කිරීමේ වියදම්	—	·48
මූල ධන වියදම්	—	—
	·43	·72

2. (අ) වැය ශීර්ෂ යටතේ ද, සේවාවන් යටතේ ද, මූල ධන වියදම් යටතේ ද කළ වියදම් වෙන වෙනම පහත දැක්වේ :—

	1962–63 නියම වියදම රුපියල්	1963–64 නියම වියදම රුපියල්
අංක 1 සහ 4 දවණ වැය ශීර්ෂ		
ඒකාබද්ධ සේවා	47,86,758	48,62,090
වෛද්‍ය සේවා	10,90,04,489	11,26,05,759
මහජන සෞඛ්‍ය සේවා	2,56,29,699	2,57,92,261
රසායනාගාර සේවා	34,79,145	34,07,573
අංක 4 දරණ වැය ශීර්ෂය—		
දීමනා හා අඩු කිරීම්	18,28,498	15,22,860
අංක 2 දරණ වැය ශීර්ෂය—		
ආධාර ගෙවීම්	2,15,552	1,73,529
අංක 5 දරණ වැය ශීර්ෂය—		
මූලධන වියදම්	20,10,338	20,16,223
එකතුව	14,69,54,477	15,03,80,295

(ආ) නව ගොඩනැගිලි සඳහා ද, ගොඩනැගිලිවලට අලුත් කොටස් වැඩි කිරීම හා වැඩි දියුණු කිරීම හා පවත්වාගෙන යාම උදෙසා ද ගිය වියදම පහත දැක්වේ :—

	1962–63 වර්ෂය තුළ වියදම රුපියල්	1963-64 වර්ෂය තුළ වියදම රුපියල්
අංක 153 දරණ ශීර්ෂය—සෞඛ්‍ය දෙපාර්තමේන්තුව අංක 5 දරණ වැය ශීර්ෂය-මූලධන වියදම්	20,56,064	2,21,855
අංක 161 දරණ ශීර්ෂය රජයේ වැඩ දෙපාර්තමේන්තුව-වැය ශීර්ෂය අංක 2—වරින්වර කෙරෙන පරිපාලන ගාස්තු—15 වන උප ශීර්ෂය—ගොඩනැගිලි පවත්වාගෙන යාම—අංක (3) දරණ විෂයය—වෛද්‍ය ගොඩනැගිලි පවත්වාගෙන යාම	8,79,564	9,11,143
අංක 161 දරණ ශීර්ෂය—රජයේ වැඩ දෙපාර්තමේන්තුව වැය ශීර්ෂය අංක 3—පාලන ගාස්තු—මූලධන වියදම් 9 වන උපශීර්ෂය—ගොඩනැගිලි වැඩි දියුණු කිරීම හා අලුත් කොටස් ගැනීම අංක (2) දරණ විෂයය—වෛද්‍ය ගොඩනැගිලි	1,56,151	1,79,482
	30,91,779	13,12,480

(3) විදේශ ආධාර.—විදේශ රාජ්‍යවලින් හා ජාත්‍යන්තර ආයතන මගින් ලැබුණු මුදල් ආධාර හා දෙපාර්තමේන්තුව විසින් 1964.9.30 වන දින දක්වා කළ වියදම් ලැයිස්තුව පහත දැක්වේ :—

1964.9.30 වන වන දිනට මුළු ආධාර රුපියල්		ආධාර ලැබුණු මාර්ගය	1964.9.30 වන දිනට මුළු වියදම රුපියල්
79,34,690	...	(1) ලය චිකිත්සාගාර සඳහා කොළඹ ක්‍රමය යටතේ ඕස්ට්‍රේලියා රජයෙන් ලැබුණ මුදල් ආධාර	44,44,160
20,40,000	...	(2) සනීපාරක්ෂක ආයතනය සඳහා කොළඹ ක්‍රමය යටතේ ඕස්ට්‍රේලියා රජයෙන් ලැබුණ මුදල් ආධාර	7,07,936
13,49,021	...	(3) ක්ෂය රෝග සඳහා ඖෂධ ගැනීමට කොළඹ ක්‍රමය යටතේ ඕස්ට්‍රේලියා රජයෙන් ලැබුණ මුදල් ආධාර	—
7,11,499	...	(4) මහරගම දන්තවෛද්‍ය අභ්‍යාස විද්‍යාලය හා නේවාසිකාගාරය සඳහා කොළඹ ක්‍රමය යටතේ නවසීලන්ත රජයෙන් ලැබුණ මුදල් ආධාර	5,97,595
2,42,522	...	(5) කොබාල්ට් චිකිත්සා යන්ත්‍රයක් ලබා ගැනීම සඳහා කොළඹ ක්‍රමය යටතේ කැනඩාවෙන් ලැබුණ මුදල් ආධාර	2,19,328
11,90,500	...	(6) 1957 අගෝස්තු 5 වන දින දරණ ස්ථාවර සන්දේශය යටතේ අමෙරිකාවේ ජාත්‍යන්තර සමුපකාරය හා පාලනයෙන් (අයි.සී.ඒ.) අංක 85-51-015 දරණ මැලේරියා සමූල නාශක ව්‍යාපාරයට ලැබුණ අමෙරිකානු ආධාර	11,90,499
16,55,247	...	(7) අමෙරිකාවේ ජාත්‍යන්තර සමුපකාරය හා පාලනයෙන් (අයි.සී.ඒ.) පීඑල් 480 (අංක 1 දරණ විෂයය) යටතේ මැලේරියා නාශක ව්‍යාපාරයට ලැබුන දීමනා	6,67,860
5,22,500	...	(8) අමෙරිකාවේ ජාත්‍යන්තර සමුපකාරය හා පාලනයෙන් (අයි.සී.ඒ.) පීඑල් 480 (අංක1 දරණ විෂය) යටතේ පාරිසරික සෞඛ්‍යය සඳහා ලැබුන දීමනා	3,44,440
47,380	...	(9) අමෙරිකාවේ ජාත්‍යන්තර සමුපකාරය හා පාලනයෙන් (අයි.සී.ඒ.) පීඑල් 480 (අංක 1 දරණ විෂය) මහජන සෞඛ්‍ය පුහුණුව හා සෞඛ්‍ය අධ්‍යාපනය සඳහා ලැබුණ දීමනා	29,630
2,00,004	...	(10) මැලේරියා නාශක ව්‍යාපාරය සඳහා ලෝක සෞඛ්‍ය ආයතනයෙන් ආධාර	2,14,250*
1,58,90,363			84,15,698

* වැඩියෙන් කළ වියදම පියවීම සඳහා ලෝක සෞඛ්‍ය ආයතනයෙන් තව මුදලක් බලාපොරොත්තුවනු ලැබේ.

අංක 7 දරණ ආදායම් ශීර්ෂය යටතේ 1962-63 හා 1963 64 යන වර්ෂවල සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් එකතු කරන ලද මුලු ආදායම් පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුවක් පහත දැක්වේ :—

1962–63 රුපියල්			1963–64 රුපියල්
12,15,317	...	රෝහල් වලින් හා බෙහෙත් හල් වලින් ලැබුන ගාස්තු	15,01,933
6,640	...	ඖෂධ විකිණීම	6,305
14,483	...	අබින් විකිණීම	12,254
34	...	වෛද්‍ය අවශ්‍යතා ආඥාපනත යටතේ ඖෂධ විකිණීම	34
2,70,047	...	වෛද්‍ය අවශ්‍යතා ආඥාපනත යටතේ ආගමන කම්කරුවන්ගෙන් ලැබුණ රෝහල් ගාස්තු හා බැලීමට යාමේ ගාස්තු	3,16,912
36,046	...	බැක්ටීරියා විද්‍යා ගාස්තු	34,353
2,73,493	...	නිරෝධායන ගාස්තු	2,53,242
23,821	...	ඇපොතිකරි වරුන්ගෙන් හා වින්නඹු මාතා වන්ගෙන් ලැබුන ගාස්තු ...	18,647
2,700	...	පුද්ගලික රෝහල් ලියාපදිංචි කිරීමේ ගාස්තු	3,100
2,47,754	...	විවිධ ආදායම්	1,47,699
20,90,435			22,95,479

I වන සටහන — සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශ අනුව ජනගහනය
TABLE I—CENSUS POPULATION BY S. H. S. AREA

සෞ. සේ. අධි. කොට්ඨාශය *S. H. S. Area*	දිස්ත්‍රික්කය *District*	1953 සංගණනයේදී ජනගහනය *Population at Census 1953*	1963 සංගණනයේදී ජනගහනය *Population at Census 1963*	සියයට වැඩිවීම *% Increase*	දස අවුරුදු වැඩිවීම *Ten Years Increase*
අනුරාධපුරය Anuradhapura	අනුරාධපුරය Anuradhapura	171,268	280,188	63·6	108,920
	ත්‍රිකුණාමලය Trincomalee	83,917	137,878	64·2	53,961
බදුල්ල Badulla	බදුල්ල Badulla	356,611	533,142	49·5	176,531
	මොණරාගල Monaragala	117,907	132,396	12·3	14,489
මඩකලපුව Batticaloa	මඩකලපුව Batticaloa	132,745	197,022	48·4	64,277
	අම්පාරෙයි Amparai	130,126	212,100	62·4	81,974
කොළඹ Colombo	කොළඹ Colombo	1,282,599	1,702,239	32·7	419,640
	කොළඹ න.ස.Colombo M. C.	426,127	510,947	19·9	84,820
ගාල්ල Galle	ගාල්ල Galle	468,521	579,161	23·6	110,640
	ගාලු න.ස. Galle M. C.	55,848	64,942	16·3	9,094
යාපනය Jaffna	යාපනය Jaffna	491,849	612,995	24·6	121,146
කළුතර Kalutara	කළුතර Kalutara	523,550	632,222	20·7	108,672
මහනුවර Kandy	මහනුවර Kandy	783,182	982,382	25·4	199,200
	මහනුවර න.ස. Kandy M. C.	57,200	67,768	18·5	10,568
	නුවරඑළිය Nuwara Eliya	325,254	405,591	24·7	80,337
කෑගල්ල Kegalle	කෑගල්ල Kegalle	471,605	581,174	23·2	109,569
කුරුණෑගල Kurunegala	කුරුණෑගල Kurunegala	626,336	854,339	36·3	228,003
මාතලේ Matale	මාතලේ Matale	201,049	255,195	26·9	54,146
	පොලොන්නරුව Polonnaruwa	58,014	114,104	96·7	56,090
මාතර Matara	මාතර Matara	413,431	514,992	24·5	101,561
	හම්බන්තොට Hambantota	191,508	274,686	43·4	83,178
පුත්තලම Puttalam	පුත්තලම Puttalam	228,892	302,743	32·3	73,851
රත්නපුරය Ratnapura	රත්නපුරය Ratnapura	421,555	547,494	29·9	125,039
වවුනියාව Vavuniya	වවුනියාව Vavuniya	35,112	68,712	95·7	33,600
	මන්නාරම Mannar	43,689	60,095	37·6	16,406
		8,097,895	10,624,507	31·2	2,526,612

II වන සටහන—1946–1963 පිළිබඳ උපත් සහ මරණ
TABLE II—BIRTHS AND DEATHS—1946–1963

වර්ෂය *Year*	මධ්‍යවාර්ෂික ජනගහනය *Mid-year Population*	ලියාපදිංචිකළ උපත් සංඛ්‍යාව *No. of Births registered*	ජනගහන යෙන් 1,000ට උපත් සංඛ්‍යාව *Birth rate per 1,000 population*	ලියාපදිංචි කළ මරණ සංඛ්‍යාව *Deaths registered*	ජනගහන යෙන් 1,000ට මරණ සංඛ්‍යාව *Death rate per 1,000 population*	සජීව උපත් 1,000ට ළදරු මරණ සංඛ්‍යාව *Infant Mortality rate per 1,000 live births*	සජීව උපත් 1,000ට මාතෘ මරණ සංඛ්‍යාව *Maternal Mortality rate per 1,000 live births*
1946–50*	7,253,600	282,320	38·9	103,044	14·3	101	9·3
1951–55†	8,296,600	315,596	38·1	93,107	11·2	75	5·0
1956	8,929,000	325,067	36·4	87,561	9·8	67	3·8
1957	9,165,000	334,135	36·5	92,759	10·1	68	3·7
1958	9,388,000	335,690	35·8	90,815	9·7	64	3·9
1959	9,625,000	356,336	37·0	89,971	9·1	58	3·4
1960	9,896,000	361,702	36·6	84,918	8·6	57	3·0
1961	10,168,000	363,677	35·8	81,653	8·0	52	2·6
1962	10,443,000	370,762	35·5	88,928	8·5	53	3·0
1963	10,712,000†	363,918†	34·0	91,066†	8·5†	—	—

* තාවකාලික සංඛ්‍යා. Provisional figures.

† පස්වර්ෂයක් පාසාවූ සාමාන්‍ය ගණන. Five year averages.

III වන සටහන—ලංකාවේ සහ රටවල් සමහරෙක ළදරු මරණ සංඛ්‍යාව

TABLE III—INFANT MORTALITY RATES* IN CEYLON AND CERTAIN OTHER COUNTRIES

	1945–1949	*1950–1954*	*1955**	*1956*	*1957*	*1958*	*1959*	*1960*	*1961*	*1962*	*1963*
ලංකාව Ceylon	111	77	72	67	68	64	58	57	52	53	—
එංගලන්තය සහ වේල්සය England and Wales	39	28	25	24	23	23	22	22	21	22†	21†
ස්කොට්ලන්තය Scotland	51	35	30	29	29	28	28	26	26	27	—
ඕස්ට්‍රේලියාව Australia	28	24	22	22	21	20	22	20	20	20	20
කැනඩාව Canada	47	37	31	32	31	30	28	28	27	28	—
නවසීලන්තය New Zealand	31	27	24	23	24	23	24	23	23	20	20
ප්‍රංශය France	72	46	39	36	34	32	30	27	26	26	27†
ජර්මන් සමූහාණ්ඩුව The Federal Republic of Germany	75	49	42	39	36	36	34	34	32	29†	27†
ඉතාලිය Italy	79	61	51	49	50	48	45	44	40	41†	40†
නෙදර්ලන්තය Netherland	40	23	20	19	17	17	17	16	15	17	16†
ස්විඩනය Sweden	26	20	17	17	18	16	17	17	16	15†	15†
අමෙරිකා එක්සත් ජනපදය U. S. A.	33	28	26	26	26	27	26	26	25	25	25†

* ආසන්න සම්පූර්ණ ගණන දක්වා. Corrected to nearest whole number.

† තාවකාලික සංඛ්‍යා. Provisional figures.

IV වන සටහන—උපතේදී බලාපොරොත්තු විය හැකි ආයුෂ ප්‍රමාණය

TABLE IV—EXPECTATION OF LIFE AT BIRTH

වර්ෂය *Year*	පිරිමි *Males*	ගැහැණු *Females*
1920–22	32·7	30·7
1948	54·9	53·3
1949	56·1	54·8
1950	56·4	54·8
1951	56·1	54·0
1952	57·6	55·5
1953	58·8	57·5
1954	60·3	59·4
1960	61·9	61·4
1961	63·0	62·4
1962	61·9	61·4

V වන සටහන—ප්‍රමාණානුකූල මරණ සංඛ්‍යා දර්ශනය

(අවුරුදු 50ට හා ඊට වැඩි වයස් වූවන්ගේ සියයට මරණ ගණන සම්පූර්ණ මරණ සංඛ්‍යාව හා සැසඳීම)

TABLE V—PROPORTIONAL MORTALITY INDICATOR (PERCENTAGE OF DEATHS OF AGE 50 AND OVER TO TOTAL DEATHS)

වර්ෂය *Year*	සම්පූර්ණ මරණ සංඛ්‍යාව *Total Deaths*	අවු. 50 හෝ ඊට වැඩිවූ අයගේ මරණ සංඛ්‍යාව *No. of Deaths of those 50 years of age and over*	ප්‍රමාණානුකූල මරණ සංඛ්‍යා දර්ශනය *Proportional Mortality indicator*
1953	89,003	29,403	33·0
1954	86,794	29,101	33·5
1955	94,368	33,374	35·4
1956	87,561	32,229	36·8
1957	92,759	34,587	37·3
1958	90,815	34,112	37·6
1959	87,971	35,090	40·8
1960	84,918	34,189	40·3
1961	81,653	34,672	42·5
1962	88,928	39,696	44·6
1963	91,066	—	—

VI වන සටහන—රජයේ ආයතනවලින් ප්‍රතිකාර කළ අභ්‍යන්තර රෝගීන් වර්ෂ අනුව

TABLE VI—IN-PATIENTS TREATED IN GOVERNMENT INSTITUTIONS BY YEARS

වර්ෂය Year	අභ්‍යන්තර රෝගීන්ගේ මුලුගණන Total No. of In-Patients	වාර්ෂික වැඩිවීමේ සියයට ගණන Percentage Annual Increase
1953	904,956	7·41
1954	913,034	9·89
1955	1,042,581	14·19
1956	1,144,710	9·80
1957	1,352,720	18·17
1958	1,277,706	5·55*
1959	1,354,549	6·01
1960	1,391,867	2·76
1961	1,429,304	2·69
1961–62	1,609,218	12·59
1962–63	1,667,414	3·62
1963–64	1,614,664	3·16*

* අඩුවීමේ සියයට ගණන. Percentage decrease.

VII වන සටහන—මධ්‍යවාර්ෂික ජනගහනය සහ ප්‍රතිකාර කළ රෝගීන් වර්ෂ අනුව

TABLE VII—MID-YEAR POPULATION AND PATIENTS TREATED BY YEARS

වර්ෂය Year	ගණන් බලන ලද මධ්‍ය වාර්ෂික ජනගහනය Estimated Mid-Year Population	අභ්‍යන්තර රෝගීන් In-patients	බාහිර රෝගීන් (පළමුවන පැමිණීම) Out-patient Visits (First)	අභ්‍යන්තර හා බාහිර රෝගීන්ගේ මුලු ගණන Total In-patients and Out-patients	ජනගහනය අනුව රෝගීන්ගේ පැමිණීමේ සියයට ගණන % of Total (patients'visits population)
1953	8,290,000	904,956	13,946,794	14,851,750	179·15
1954	8,520,000	913,034	15,416,023	16,329,057	191·66
1955	8,723,000	1,042,581	17,631,826	18,674,407	214·08
1956	8,929,000	1,144,710	20,633,779	21,778,489	243·91
1957	9,165,000	1,352,720	21,245,125	22,579,845	246·57
1958	9,388,000	1,277,706	21,444,851	22,722,557	242·04
1959	9,625,000	1,354,549	25,109,533	26,464,082	274·95
1960	9,896,000	1,391,867	23,217,623	24,609,490	248·68
1961	10,168,000	1,429,304	24,484,925	25,914,229	254·87
1961–1962	10,443,000	1,609,218	26,249,901	27,859,119	266·71
1962–1963	10,712,000	1,667,414	26,266,701	27,934,115	262·41
1963–1964	—	1,614,664	26,167,540	27,782,204	—

ප්‍රතිකාර කරන ලද රෝගීන්ගේ ගණන මෙම සංඛ්‍යාවලින් පැහැදිලි නොවේ. එකම රෝගියාගේ වරින්වර පැමිණීම් අලුත් රෝගියකුගේ පැමිණීම ලෙස ගණන් ගෙන ඇත.

These figures do not indicate the number of patients treated. Repeated visits of the same patient after short intervals have been regarded as new cases.

VIII වන සටහන—සියලුම ආයතනවල සහ පළාත් අනුව අභ්‍යන්තර රෝගීන්ගේ සංඛ්‍යාවන්

TABLE VIII—IN-PATIENTS STATISTICS OF ALL INSTITUTIONS BY TYPE AND AREA

සෞ. සේ. අධි. කොට්ඨාශය S. H. S. Division	සාමාන්‍ය GENERAL: ප්‍රාදේශිය, මූලික, දිස්ත්‍රික් හා ගෘහ රෝහල් *Provincial, Base, District and Cottage Hospitals* — ප්‍රතිකාර කළ ගණන No. Treated	මරණ Deaths	සම්පූර්ණ පර්යන්ත ආයතන *Complete Peripheral Units* — ප්‍රතිකාර කළ ගණන No. Treated	මරණ Deaths	ග්‍රාමීය රෝහල් *Rural Hospitals* — ප්‍රතිකාර කළ ගණන No. Treated	මරණ Deaths	විශේෂ SPECIAL: මාතෘ රෝහල් *Maternity Hospitals* — ප්‍රතිකාර කළ ගණන No. Treated	මරණ Deaths	ලයරෝහල් හා විවේකාගාර *Chest Hospitals and Sanatoria** — ප්‍රතිකාර කළ ගණන No. Treated	මරණ Deaths	මානසික රෝහල් *Mental Hospitals** — ප්‍රතිකාර කළ ගණන No. Treated	මරණ Deaths	ලාදුරු රෝහල් *Leprosy Hospitals** — ප්‍රතිකාර කළ ගණන No. Treated	මරණ Deaths
අනුරාධපුරය Anuradhapura	40,721	664	12,106	20	8,795	2	—	—	—	—	—	—	—	—
බදුල්ල Badulla	115,026	1,803	16,901	139	3,860	8	—	—	—	—	—	—	—	—
මඩකලපුව Batticaloa	34,718	577	8,840	40	2,375	12	—	—	—	—	—	—	76	5
කොළඹ Colombo	163,133	1,840	2,183	—	10,957	27	—	—	11,954	313	15,953	351	1,277	46
ගාල්ල Galle	69,144	1,532	15,024	37	2,984	8	—	—	—	—	—	—	—	—
යාපනය Jaffna	55,148	841	8,565	38	3,472	10	—	—	726	3	—	—	—	—
කලුතර Kalutara	83,677	1,097	3,966	5	6,866	30	—	—	—	—	461	4	—	—
මහනුවර Kandy	115,958	3,235	29,912	74	7,680	16	—	—	—	—	—	—	—	—
කෑගල්ල Kegalle	75,782	800	8,020	5	5,040	8	—	—	—	—	—	—	—	—
කුරුණෑගල Kurunegala	116,076	1,908	39,649	146	6,753	28	—	—	—	—	—	—	—	—
මාතලේ Matale	47,205	723	16,179	82	3,942	10	—	—	—	—	—	—	—	—
මාතර Matara	80,842	1,184	20,640	107	11,028	21	—	—	681	8	—	—	—	—
